

THE SECRET FILES OF SHERLOCK HOLMES - 4
අබිරහස් දොස්තර
සහ
ෂර්ලොක් හෝම්ස්
සහ
අතුරුදන් වූ
නෞකාව
චන්දන මෙන්ඩිස්

# ඇබ්රහස් දොස්තර
## සමග
# ෂර්ලොක් හෝම්ස්
## සහ
## අතුරුදන් වූ නෞකාව



www.sinhalaelibrary.com


## පටුන


1 අතුරුදන් වූ නෞකාව "සොෆී ඇන්ඩසන්" 09

2 අබිරහස් දොස්තර සමග ෂර්ලොක් හෝම්ස් පූර්විකාව 59

1 පුදුමාකාර උරුමක්කාරයා 61
2 ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණය භාරගනියි 72
3 සොහෝ හි දී හමුවීමක් 83
4 ප්‍රාකාරයක් අබියස 94
5 හයිඩ් රැඳුණු තැන් 102
6 අටර්සන් අදහස වෙනස් කර ගනියි 109
7 කෑරූ මිනීමැරුම 119
8 ආකර්ෂණීය අනුග්‍රාහකයන් 132
9 අටර්සන්ට සිහිනැතිවෙයි 141
10 කුලීරියේ හුන් මිනිසා 154
11 මිනීමරුවෙකු හමුවෑම 161
12 ගැඹුරු දියේ 164
13 විද්වතුන් අතර 173
14 තවත් හෝඩුවාවක් පසුපස 183
15 ග්‍රිම්පෙන්ලෙර්රා නිවසේදී 189
16 පැටළුණු අවුල් 199
17 වෙනසක් නමිනක 209
18 කම්පනයක් 218
19 දොස්තර ජෙකිල් සහ එඩ්වඩ් හයිඩ් 223
20 උපුවදන 241


www.sinhalalibrary.com



ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්

# අතුරුදන් වූ නෞකාව
## "සොෆී ඇන්ඩසන්"

මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා යෙදුණු පරීක්ෂණ ගැන නැවත කියවා බැලීමේදී, 1887 වසර වැදගත් තැනක් ගනී. මේ කාලයේ ඔහු පරීක්ෂණයේ යෙදුණු රයිගේට් ප්‍රහේලිකාව, පැරඩෝල් කුටියේ වික්‍රමය, ලොඩර්හි මේරි ස්ටුවට් මහත්මියගේ අභිරහස් මරණය පිළිබඳ කථාව, උගා දූපතේ කළු අවතාරය, ආදී වික්‍රමයන් මා දැනටමත් ඔබ වෙත ඉදිරිපත් කර ඇත. මහා සාගරය මැද දී විස්මයජනක ලෙස අතුරුදන් වූ, "සොෆී ඇන්ඩසන්" නම් බ්‍රිතාන්‍ය රුවල් නැව පිළිබඳ කථාන්තරය 1887 ට අයත්වන්නකි. මෙපමණ කාලයක් ඔබ වෙත ගෙන ඒමට නොහැකි වූ එය, දැන් ඔබට ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

එක් සවස් යාමයක මගේ මිත්‍ර තර්ස්ටන් සමග බිලියඩ් ක්‍රීඩාකිරීම සඳහා, මම ක්‍රීඩා සමාජ ශාලාව වෙත පිටත්වී ගියෙමි. මා ආපසු එද්දී සවස පහ පමණ වී තිබිණි. ගිම්හාන සෘතුව බැවින්, ඒ වෙලාවේ බේකර් වීදියේ තිබුණේ දීප්තිමත් හිරු එළියකි. මා නිවසට ඇතුළුවීමට සූදානම් වූවා පමණි. කුලීරියක් පැමිණ අපේ නිවස ඉදිරියේ නවත්වන ලදී. එයින් බිමට බැස්සේ කාන්තාවන් දෙදෙනෙකි. ඔවුන්ගේ පෙනුම අනුව ඒ, මව සහ දුව විය යුතුයයි මම නිශ්චය කළෙමි. මැදිවියේ සිටි මව, පළමුවෙන් රියෙන් බිමට බැස්සාය. මිළඟට ඇය දැත් දිගුකොට, දියණිය අතේ සිටි කුඩා දරුවෙකු වඩාගත්තාය. අවුරුදු 25 ක් පමණවූ තරුණ කාන්තාව බිමට බැස්සේ, ඉන් අනතුරුවය. ඔවුන් පැමිණියේ හෝම්ස් හමුවීමට වියයුතු යයි මම අනුමාන කළෙමි. කුලීරථයේ රියැදුරා, බේකර් වීදිය අවට සැරිසරණ, දැකපුරුදු පුද්ගලයකු බැව් මම දුටුවෙමි.

"මේ නෝනලා ආවේ ෂර්ලොක් හෝම්ස් මහත්මයා හොයාගෙන" රියැදුරා කීය. "ඒ මහත්මයා ගෙදර ඉන්නවා නේද?"

"දවල් මං ගෙදරින් යද්දි නම් ඔහු සිටියා" මම කීවෙමි. "හදිසි ගමනක් නොගියා නම් මේ වෙලාවේ ඇති."

www.sinhalaelibrary.com

වැඩිමහල් කාන්තාව තුලිරියේ ගාස්තුව ගෙවන අතරේ, කුඩා දරුවා රැගත් තරුණිය මා අසලට ආවාය. "හෝම්ස් මහත්මයා හමුවෙන්න, අපි කල් ඇතුව දිනයක් සහ වේලාවක් වෙන්කරගත්තෙ නෑ." ඇය කීවාය. "එහෙම උවමනාද කියල විස්තර අපි හරිහැටි දන්නෙ නෑ"

"කලින් වෙලාවක් යොදාගෙන තිබුණා නම් වැඩිය හොඳයි" මා කීවේ, අපේ උඩුමහලට පිවිසෙන දොර විවෘත කිරීමට සූදානම් වෙමිනි. "එහෙම තිබුණා නම් හෝම්ස් මහත්මයා කොහේවත් නොගිහිං, ඔබ එනතුරු බලාගෙන ඉන්නවා. අපි බලමු මේ වෙලාවෙ........"

මා සීනුව නාද කළ ශබ්දය ඇසී, අපේ සේවක ළමයා පැමිණ දොර විවෘත කළේය. හෝම්ස් නිවසේ සිටින බැව් ඔහු පැවසීය. එය කාන්තාවන් දෙදෙනාට ඉමහත් සැනසීමට කරුණක් බැව් ඔවුන්ගේ මුහුණු වලින් පෙනිණ. අමුත්තන් උඩුමහලට කැඳවාගෙන ගොස්, අපේ විසිත්ත කාමරයේ අසුන් ගැනීමට සලස්වා, මම මගේ මිත්‍රයාගේ කාමරයේ දොරට තට්ටු කළෙමි.

"ඇතුළට එන්න වොට්සන්" ඔහු කීය. "ඔබ කාන්තාවන් දෙදෙනෙකු සමඟ නිවසට පැමිණි බව මා දන්නවා. තරප්පු පෙළේ ඔබේ පා ගැටෙන හඬට අමතරව ඇසුණු හඬ, කාන්තාවන් දෙදෙනෙකුගේ පාවහන් වලින් නැගුණු ඒවා. හොඳයි අපි අහල බලමු ඔවුන්ගේ ගැටලුව මොකක්ද කියලා" හෝම්ස් කීය. මඳ වේලාවක් ගතවෙද්දී ඔහු ඇඳුමෙන් පැළඳුමෙන් සැරසී විසිත්ත කාමරයට පැමිණියේය.

ඔවුනට හිස නමා ආචාර කොට, හෝම්ස් ඔහුට සුපුරුදු හාන්සිපුටුවේ හිඳගත්තේය. තරුණ කාන්තාවගේ ඇකයේ සිටි කුඩා දරුවා තවමත් නිදමින් සිටි බව මම දුටුවෙමි. කාන්තාවන් දෙදෙනා හැඳ පැළඳ සිටි ඇඳුම් වලින් පෙනුණේ ඔවුන් දුප්පත් අය බවයි.

"මේ ෂර්ලොක් හෝම්ස් මහත්තය නේද?" තරුණ කාන්තාව විමසුවේ දරුවා ඇගේ මවට භාරදෙමිනි. "මං මුහුණදීල තියෙන්නේ ලොකු ගැටලුවකට. මගේ අසල්වැසි කාන්තාවක් වන වයලට් හන්ටර් මෙනෙවියට මං ඒක ගැන කිව්වා. වහාම ඇවිත් ඔබතුමා හමුවී, මගේ ප්‍රශ්නය ගැන කියන්න කිව්වේ හන්ටර් මෙනෙවිය යි. ඇය මුහුණ දුන් ගැටලුවක් ඔබතුමා විසඳා දුන්නාලු.........."



අබිරහස් දොස්තර සමඟ ෂර්ලොක් හෝම්ස්

වැඩිමහල් කාන්තාව තුලිරියේ ගාස්තුව ගෙවන අතරේ, කුඩා දරුවා රැගත් තරුණිය මා අසලට ආවාය. "හෝම්ස් මහත්මයා හමුවෙන්න, අපි කල් ඇතුව දිනයක් සහ වේලාවක් වෙන්කරගත්තෙ නෑ." ඇය කීවාය. "එහෙම උවමනාද කියල විස්තර අපි හරිහැටි දන්නෙ නෑ"

"කලින් වෙලාවක් යොදාගෙන තිබුණා නම් වැඩිය හොඳයි" මා කීවේ, අපේ උඩුමහලට පිවිසෙන දොර විවෘත කිරීමට සූදානම් වෙමිනි. "එහෙම තිබුණා නම් හෝම්ස් මහත්මයා කොහේවත් නොගිහිං, ඔබ එනතුරු බලාගෙන ඉන්නවා. අපි බලමු මේ වෙලාවෙ........"

මා සීනුව නාද කළ ශබ්දය ඇසී, අපේ සේවක ළමයා පැමිණ දොර විවෘත කළේය. හෝම්ස් නිවසේ සිටින බැව් ඔහු පැවසීය. එය කාන්තාවන් දෙදෙනාට ඉමහත් සැනසීමට කරුණක් බැව් ඔවුන්ගේ මුහුණු වලින් පෙනිණ. අමුත්තන් උඩුමහලට කැඳවාගෙන ගොස්, අපේ විසිත්ත කාමරයේ අසුන් ගැනීමට සලස්වා, මම මගේ මිත්‍රයාගේ කාමරයේ දොරට තට්ටු කළෙමි.

"ඇතුළට එන්න වොට්සන්" ඔහු කීය. "ඔබ කාන්තාවන් දෙදෙනෙකු සමඟ නිවසට පැමිණි බව මා දන්නවා. තරප්පු පෙළේ ඔබේ පා ගැටෙන හඬට අමතරව ඇසුණු හඬ, කාන්තාවන් දෙදෙනෙකුගේ පාවහන් වලින් නැගුණු ඒවා. හොඳයි අපි අහල බලමු ඔවුන්ගේ ගැටලුව මොකක්ද කියලා" හෝම්ස් කීය. මඳ වේලාවක් ගතවෙද්දී ඔහු ඇඳුමෙන් පැළඳුමෙන් සැරසී විසිත්ත කාමරයට පැමිණියේය.

ඔවුනට හිස නමා ආචාර කොට, හෝම්ස් ඔහුට සුපුරුදු හාන්සිපුටුවේ හිඳගත්තේය. තරුණ කාන්තාවගේ ඇකයේ සිටි කුඩා දරුවා තවමත් නිදමින් සිටි බව මම දුටුවෙමි. කාන්තාවන් දෙදෙනා හැඳ පැළඳ සිටි ඇඳුම් වලින් පෙනුණේ ඔවුන් දුප්පත් අය බවයි.

"මේ ෂර්ලොක් හෝම්ස් මහත්තය නේද?" තරුණ කාන්තාව විමසුවේ දරුවා ඇගේ මවට භාරදෙමිනි. "මං මුහුණදීල තියෙන්නේ ලොකු ගැටලුවකට. මගේ අසල්වැසි කාන්තාවක් වන වයලට් හන්ටර් මෙනෙවියට මං ඒක ගැන කිව්වා. වහාම ඇවිත් ඔබතුමා හමුවී, මගේ ප්‍රශ්නය ගැන කියන්න කිව්වේ හන්ටර් මෙනෙවිය යි. ඇය මුහුණ දුන් ගැටලුවක් ඔබතුමා විසඳා දුන්නාලු.........."

10

www.sinhalaelibrary.com

"ආ........... වයලට් හන්ටර් මෙනෙවිය" හෝම්ස් කීවේ මා දෙස බලමිනි. "අපට අර කොපර් බීචස් අබිරහසේදී නේද වොට්සන්, වයලට් හන්ටර් මෙනෙවිය හමුවුණේ.ඉතින් කියන්න. ඔබ මුහුණදී තිබෙන ගැටලුව ගැන. මේ මගෙ මිත්‍රයා දොස්තර වොට්සන්. ඔහු තමයි මගේ පරීක්ෂණ කටයුතු වලදී මට සහාය වෙන්නේ. පළමුව මට ඔබේ නම කියන්න."

"මගේ නම ක්ලෙයා විලර්" තරුණ කාන්තාව කීවාය. "මේ මගේ අම්මා ඩොරිස්. අපි පදිංචි බ්‍රිස්ටල් නගරයට මදක් ඔබ්බෙන් පිහිටි ටිට්ස්බරි ගමේ, කාල්විල් පෙදෙසේ"

හෝම්ස් එම කරුණු පොතක සටහන් කර ගත්තේය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මගේ ප්‍රශ්නය ගැන ඔබට කියන්න පටන්ගන්න ඕන කොතනකින්ද කියල, මට හිතාගන්නවත් බෑ" කතාව නැවැත්වූ ඇයගේ දෙනෙත් වලින් කඳුළු වැගිරෙන්නට විය. මිනිත්තුවක් හෝ දෙකක් නිහඬව සිටි ඇය යළිත් කතාව ඇරඹුවාය.

"මගේ තාත්තා මියගියේ මං කුඩා කාලෙදි. ඒ කාලෙ සිට මෑතක් වෙනතුරුම අම්මා, බ්‍රිස්ටල් නගරයේ රෝහලක උපස්ථායිකාවක් ලෙස සේවය කළා. ඒ නිසා මටත් රෝහලේ පිරිසිදු කරන්නියක් ලෙස රැකියාවක් ලබාගන්න පුළුවන් වුණා. ඔහු මට මුලින්ම හමුවුණේ දෙව්මැදුරෙදි. එයාගෙ නම බිලී විලර්. එයා දැන් කාලෙ හැදෙන අනිත් තරුණ අය වගේ නෙමෙයි. ආගමට අනුව ජීවත්වෙන, බොහොම කරුණාවන්ත පුද්ගලයෙක්. නමුත් ඒ තරම් ඉහළට ඉගෙන ගෙන නෑ. අපි දෙන්නාම ඊට කලින් අවුරුද්දෙ නත්තල් කැරොල් කණ්ඩායමට හිටියා. ඒ කාලෙ සහාබස් කළාට අප අතරේ ප්‍රේම සම්බන්ධයක් තිබුණේ නැහැ. පස්සේ අපි අතරේ ඇතිවුණු හිතවත්කම, ප්‍රේම සම්බන්ධයක් වෙද්දි, ඔහු මට විවාහ යෝජනාවක් කළා. මං ඔහුට කිව්වා, අපේ ගෙදර ඇවිත් අම්මාගෙන් අහන්න කියලා. ඒ මොකද බිලීට කිසිම රැකියාවක් තිබුණේ නෑ.

ඔහුගේ දෙමව්පියන් මියගිහින් තියෙන්නේ, ඔහු කුඩා කාලෙදිමයි. ඊටපස්සේ ඔහු හැදිලා වැඩිලා තියෙන්නේ, පුංචිඅම්මා කෙනෙකු ළඟ. මෑතකදී ඇයත් මියගියාලු. බිලීගේ වයස විසිදෙකයි. ඔහු නොයෙක් රැකියාවලට ඉල්ලුම්පත්‍ර යවමින් හිටියේ. බිලීට උවමනාව තිබුණේ නැවක රැකියාවක් ලබාගන්න. රැකියාවක්





කරලා පළපුරුද්දක් නැතිවුණත්, නැවක කම්කරුවෙකු හැටියට බැඳෙන්න පුළුවන් බව ඔහු කිව්වා. නැව්වල රැකියාවලට හොඳ වැටුප් ගෙවන නිසා, බිලීගේ හිත ගිහින් තිබුණේ ඒ ක්ෂේත්‍රයටම යි. අපේ අම්මා ඔහු ගැන පැහැදිලා ඇගේ කැමැත්ත දුන්නා. ඒ වුණත් ඔහුට රැකියාවක් ලැබෙන තුරු විවාහය කල්දාන්න, අපි දෙන්නාම එකඟවුණා. ඔය අතරෙදි තමයි බිලීට සම්මුඛ පරීක්ෂණයකට එන්න කියලා ලියුමක් ආවේ."

"ඒ කොහෙන්ද?" හෝම්ස් ඇසීය. "ඒ ලියුම ලැබුණ අවුරුද්ද හා මාසය මට කියන්න"

"ඒ ලියුම ලැබුණේ 'වයිට් ස්ටා' නැව් සමාගමෙන්. ඒ ලිවර්පූල් නගරයෙන්. ලියුම ලැබුණේ මට මතක හැටියට '84 අවුරුද්දේ ඔක්තෝබර් අන්තිමේ, නැත්නම් නොවැම්බර් මුල"

"හෝම්ස් එම කරුණු සටහන් කර ගත්තේය.

"ඔහු ගියේ සම්මුඛ පරීක්ෂණයකට" ඇය කීවාය. "නමුත් ඔහු ගැන පැහැදිලා ඔවුන්, බිලීව එදාම රැකියාවට බඳවාගෙන තිබුණා. එදා ඔහු අපේ ගෙදර ආවේ හරි සන්තෝෂයෙන්.

"වයිට් ස්ටා" නැව් සමාගම සතුව, රුවල් නැව් හතරක් තියෙනවාලු. එයින් එකක කම්කරුවෙකු ලෙස තමා, බිලීව බඳවාගෙන තිබුණේ. ඔහු යාමට නියමිත නැව, දුර ගමනක පිටත්වෙලා ගිහින්. මේ කාලය වෙනකොට ආපහු ඇවිත් තිබුණෙ නැහැ. නමුත් පුළුවන් ඉක්මනින් ලිවර්පූල්හි ඔවුන්ගේ නැව් කාර්යාලයේ රැකියාවට එන්න කියා ඔවුන් නියම කළාලු."

"ඔහු බඳවාගත්තෙ මොන නැවේ සේවයටද කියල ඔවුන් කිව්වාද?"

"ඔව් මහත්මයා. ඒ නැවේ නම "සෝෆි ඇන්ඩසන්............"

ඒ නම සඳහන් වූවාත් සමගම, හෝම්ස්ගේ මුහුණ වෙනස් වූ අයුරු මම දුටුවෙමි. කාන්තාව ද ඇගේ කථාව නවත්වා නිහඬ වූයේ, මගේ මිත්‍රයාගේ සිදුවූ වෙනස දැකීමෙන් විය යුතුය. මිනිත්තුවක් හෝ දෙකක් නිහඬව සිටි හෝම්ස් යළිත් ඇය ඇමතුවේය.

"............... හොඳයි. ඔබේ කථාව දිගටම කියන්න"

"ඔව් මහත්මයා. '84 නොවැම්බර් වල රැකියාව ලැබුණාම, ඒක අපට ලොකු සතුටක් වුණා. ඒ නැව '85 මැයි විතර ලිවර්පූල් වෙත



www.sinhalaelibrary.com

ඒවි කියලයි, නැව් සමාගමේ අය කියා තිබුණේ. ඉතින් අපි දෙන්නා............'85 ජනවාරි මාසයේ අපි විවාහ වුණා............"

යළිත් වරක් ඇගේ දෙනෙත් වලින් කඳුළු කඩා හැළෙන්නට පටන්ගත් බැව් මම දුටුවෙමි. කෙසේ වෙතත් ඇය තම කථාව ඉක්මනින් ඇරඹුවාය.

"රැකියාවට බඳවාගැනීමේදී, මෙයාලට තිබුණු එක සුදුසුකමක්, අවිවාහකවීම. ඊළඟට කොන්දේසියක් තිබුණාලු. රැකියාවට බැඳිලා අවුරුදු දෙකක් යනතුරු විවාහ වෙන්න බැහැ කියලා. ඒ නිසා අපි විවාහවුණා වුණත්, ඒක රහසක් හැටියට තියාගත්තා.

ලිවර්පූල් නගරය කිට්ටුව පුංචි කුලීගෙයක් හොයාගන්න, බිලීට හැකිවුණා. ඉතින් අපි දෙන්නා ඒ ගෙදර පදිංචියට ගියා. '85 මැයි මාසෙ වෙනකොට ඒ නැව එංගලන්තයට ළඟාවේවි කියා තිබුණත්, ඒ කාලෙ වෙද්දිත් නැව ආවෙ නැහැ. අපට ඒකෙන් ප්‍රශ්නයක් වුණේ නැහැ. අපි බොහොම සන්තෝෂයෙන් කාලය ගතකළා. අපේ අම්මත් ඇයට විවේක වෙලාවලදී ඇවිත් අපිව බලල ගියා.

බිලී සමග "බ්‍රයිට් ස්ටා" නැව් සමාගමේ සේවයට බැඳුණු තවත් කෙනෙකුත්, අපි පදිංචි ගෙවල් කිට්ටුව හිටියා. වැඩිහිටි කෙනෙක් වුණු ඔහු හිටියේ, ගෙයක කාමරයක් කුලියට අරගෙන. එයාගෙ නම ටොම් කෝබට්. ඔහු වයස හතළිස් පහක පමණ කෙනෙක්. ඔහුගේ බිරිඳ සහ එකම පුතා, කලකට පෙර මියගිය බව අපට අහන්න ලැබුණා. ඔහු වැඩි කතාබහක් නැති, නිහඬ කෙනෙක්. තමන් විවාහක බව සමාගමට නොකියන්න, කෝබට්ව පොරොන්දු කරවාගන්න බිලීට හැකිවුණා. වයසේ ලොකු පරතරයක් තිබුණත්, බිලීගේ හොඳම යාළුවා වුණේ ටොම් කෝබට්. ඔහුත් බිලීට කතා කළේ "පුතා" කියල ආදරයෙන්. ඔහු කලකට පෙර නැව් කිහිපයකම රැකියාව කරලා ලෝකය වටේ ගිය කෙනෙක්.

"සොෆී ඇන්ඩසන්" නෞකාව ලිවර්පූල් වෙත ළඟාවුණේ '85 සැප්තැම්බර් මාසය මුලදී. ගෙන ආ බඩුතොගය බෑව ඉක්මනින්, නැව ආපසු පිටත්ව යන්න සූදානම් වුණා."

"මොනවද එයාලා ගෙන ආව බඩු?"

"ඔවුන් චිලී රටේ වැල්පරයිසෝ සහ ලිවර්පූල් අතරයි යාත්‍රා කළේ. ඔවුන් ප්‍රවාහණය කළේ පෙට්‍රල් බව මට අහන්න ලැබුණා.

"ඉතින්?"





"නැව ආපසු ආව ගමන්, එහි කාර්ය මණ්ඩලයේ සිටි අයගෙන් බාගයකට වැඩිය, නැවේ සේවයෙන් ඉවත් කළාලු." ඇය කීවාය. "මට ඒක කිව්වෙ බිලී. ඒකට හේතුව මම දන්නෙ නෑ. නමුත් අලුතෙන් බැඳුණු සේවකයන් තමයි, ඒ අඩුවට නැවට බඳවාගත්තේ. මගේ සැමියා බිලී සහ ටොම්ස් කෝබට් දෙදෙනාත්, ඒ අතරට ඇතුළත් වුණා. ඔවුන් වැල්පරයිසෝ වෙත ගිහින් ආපසු එන්න ගතවෙන කාලය, සාමාන්‍යයෙන් මාස 7 ක් හෝ 8 ක්ලු. '86 මැයි මාසෙ අන්තිම වෙද්දී, ආපසු එංගලන්තයට ළඟාවෙන්න පුළුවන් බවයි ඔවුන් කිව්වේ. ඒ ඉතින් මුහුදු කාලගුණය යහපත් වුණොත්; මුහුදුපුළං සතුටුදායක විදියට හැමුවොත්. ඔවුන්ට කුණාටු වලට මුහුණදෙන්න වුණොත්, තමන් ප්‍රමාදවීමට ඉඩ ඇති බව මං දැනගිටියා. නමුත් මහත්මයා.............." ඇය කථාව නවත්වා යළිත් කඳුළු සැලීමට පටන්ගත්තාය. මෙතෙක් වේලා නිහඬව සිටි ඇගේ මවගේ දෙනෙතට ද කඳුළු ඉණු අයුරු මම දුටුවෙමි.

විලර් මහත්මිය කථාවේ ඉතිරිහරිය කීවේ, මිනිත්තු කිහිපයකට පසුව ය.

"............ බඩු පටවාගෙන ආපසු එන අතරේ දී, අත්ලන්තික් සාගරයේ කොහේදි හරි, නැව අනතුරකට මුහුණ දී ඇති බවයි අපට අහන්න ලැබුණේ. එයින් කිසිම කෙනෙකු ජීවිත ගලවාගෙන නැති බව, නැව් සමාගම පුවත්පත්වලට කියා තිබුණා. රක්ෂණ මුදල් ලැබුණු වහාම, නාවිකයන්ගේ පවුල්වල අයට වන්දි ගෙවන බවත් ඔවුන් කියා තිබුණා. නමුත් අවාසනාවකට වගේ, බිලී විලර් අවිවාහකයෙක් හැටියටයි, ඔවුන්ගේ පොත්පත්වල සඳහන් වෙලා තිබුණේ. නැව අනතුරට ලක්වෙලා, බිලී මෙලොවින් සමුගනිද්දී, මගේ දරුවාට යාන්තම් මාස හතරයි මහත්මයා. අවුරුද්දක් පිරෙන්නත් කලින් මේ දරුවා අනාථයෙක් වුණා!"

මිනිත්තු කිහිපයක නිහඬතාවයකට පසු මගේ මිත්‍රයා කතාව ඇරඹුවේය.

"සොෆී ඇන්ඩසන් නෞකාව මුහුදුබත් වුණු පුවත්තිය, මමත් පුවත්පත්වල කියෙව්වා. ජීවිත සැහෙන ගණනක් විනාශ කරමින්, ඒ වුණු සිදුවීම අහල අපිත් කම්පා වුණා. ඔබේ සැමියාත් ඒ අනතුරින් වියෝ වූ කෙනෙක් බව, මට අහන්නත් කණගාටුයි. ඒ අනතුර වෙලා දැන් අවුරුද්දකටත් වඩා වැඩියි. ඉතින් ඔබ මා හොයාගෙන ආවෙ මොන කරුණක් සම්බන්ධයෙන් ද?"



www.sinhalaelibrary.com

"හෝම්ස් මහත්මයා. මං මේ සුදානම් වුණේ, ඔබට ඒ ගැන කියන්න. මගේ සැමියා නැව් නැගිලාගියාම, මං ලිවර්පූල් වල පදිංචිය අතහැරලා, බ්‍රිස්ටල්හි පදිංචියට ආවා. ඒ මගේ අම්මා සමග ඇගේ නිවසේ ජීවත්වෙන්න. පාදවල සන්ධි ආබාධයකින් පෙළෙන නිසා, ඇයටත් රැකියාව කරන්න අමාරු තත්ත්වයක් තමා උදාවුණේ. ඉතින් මං තීරණය කළා, දරුවා අම්මා ළඟ දමලා රැකියාවකට යන්න. මං කලිනුත් රෝහලේ පිරිසිදු කරන්නියක ලෙස රැකියාවක් කර තිබූ නිසා, යළිත් එතැන රැකියාවට බැඳීම මට අපහසු වුණේ නැහැ. උදේ පාන්දරින්ම රැකියාව සඳහා පිටත්වී එන මං, ආපසු යද්දී ඇඳිරි වැටිලා. දින හතරකට කලින් දුම්රිය පොළේදී මං මුහුණදුන්නේ පුදුමාකාර අත්දැකීමකට..........

ඒ දිනවල ලිවර්පූල්වල ඉද්දී, මගේ සැමියාගෙ හොඳම මිතුරා වුණේ, තෝමස් හෙවත් ටොම් කෝබට් බව මං ඔබට කියුවා. ඔහුත් මගේ සැමියා සමග "සොෆී ඇන්ඩසන්" නැවේ කාර්යමණ්ඩලයේ කෙනෙකු හැටියට, චිලී රටට ගිය කෙනෙක්. අනතුරෙන් මියගිය අයගේ නම් ලැයිස්තුවේ, ඔහුගේ නමත් තිබුණා"

"ඉතින්?"

"නමුත් දින හතරකට කලින්, මං ටොම් කෝබට්ව මගේ ඇස්දෙකෙන්ම දුටුවා!"

අපි තරමක පුදුමයකට පත්වීමු. මිනිත්තු දෙක තුනකට පසු මගේ මිත්‍රයා කථා කළේය.

"එක වගේ මුහුණුවර තියෙන පුද්ගලයින් සමාජයේ ඕනතරම ඉන්න පුළුවනි. ඔබ දුටු ඔය තැනැත්තා කෝබට්ගේ පෙනුම තියෙන්න වෙනත් කෙනෙකු වෙන්න ඇති..........

"ඒක නම් කොහොමටවත් වෙන්න විදියක් නෑ හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "ඔහු මුහුණ පුරා රැවුලක් වවලා හිටියේ. ඒක හුඟක්ම දිග එකක් නොවෙයි, කළු - සුදු - මිශ්‍ර ඒ කියන්නේ අළුපාට රැවුලක්."

"ඔබ දුටු තැනැත්තා කෝබට්ම බව ඔබ විශ්වාසෙට හඳුනාගත්තේ කොහොමද?"

"කෝබට් උසින් අඩි හයකට මදක් අඩු. සෑහෙන සිහින් සිරුරක් තිබුණු කෙනෙක්. ඔහුගේ කන්පෙති හාවෙකුගේ වගේ දෙපැත්තෙන් මදක් ඉදිරියට නැමිලා. නැහැයගිරාහොටක් වැනි එකක්. ඔහුගේ දෙනෙත් නිල් පාටයි.........."





"ඔය ලකුණු යම් පුද්ගලයෙකුට සුවිශේෂවූ ලක්ෂණ කියලා අපට භාරගන්න අමාරුයි" හෝම්ස් කීය. "ඒ මොකද ඔය විදියේ අංගෝපාංග තියෙන අය සමාජයේ ඕනෑතරම් ඉන්න පුළුවනි"

"නමුත් කෝබට්ගේ මුහුණේ වම් පැත්තේ, තුවාල කැළලක් තිබුණා.......... මං දින කිහිපයකට පෙර දුටු තැනැත්තාගේ මුහුණේත් තුවාලයක් හොඳ වූ කැළලක් තිබුණා" ඇය කීවාය.

"කැළලක් වුණත් වැදගත් වෙන්නේ, ඉතාම විශේෂ ආකාරයකට පිහිටියොත් පමණයි" හෝම්ස් කීය. "නැව්වල රැකියාව කරන අයගේ මුහුණුවල, සණ්ඩුසරුවල හෝ හදිසි අනතුරු නිසා ඇතිවූ තුවාල කැළැල් සුලභව දකින්න පුළුවනි."

"නැහැ හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "මේක බොහොම කලාතුරකින් දකින්න ලැබෙන කාලයේ එකක්. මම ජීවිතේටම ඒ වගේ දෙයක් දැකලා නැහැ. ඒක වක්‍රාකාර කැළලක්"

"වක්‍රාකාර කැළලක්?"

"ඔව් මහත්මයා" වීලර් මහත්මිය කීවාය. "කෝබට්ගේ මුහුණේ තිබුණු එම කැළල මං ඉතා පැහැදිලිව, ළඟටම දැක තිබෙනවා. ඒ කාලයේ ඔහු රැවුලක් වවලා හිටියේ නැහැ, මගේ සැමියා රැකියාවට ගිහින් ආපසු ගෙදර එද්දී, හවසට මං ඉන්නේ ගෙදර දොරකඩ. ඔහොම - මෙහෙම දුටින්, මං කෝබට්ව ඕන තරම් දැකල තියෙනවා. මුහුණේ වම් පැත්තේ ඇහැට ටිකක් පහළින් කම්මුල මත, මේ කැළල තියෙන්නේ අඩ කවයක හැඩයට. හරියට ලොකු C අකුරක් වගෙයි. නැතිනම් තේ කෝප්පයක යටම කොටසේ තැවරී තිබුණු දියර පැල්ලමක්, මේසය මත සලකුණු වෙන විදියට"

සිය වම් අතේ මහපටැඟිල්ල හා දබරැඟිල්ල, කැපිටල් C අකුරක හැඩය ගන්නා ලෙස වක්‍ර කළ ඇය, එය අප දෙසට හරවා, දකුණු අතේ දබරැඟිල්ලෙන් ඒ මත ඇඳ පෙන්වූවාය.

"........... රැවුල වවන්න උත්සාහ කළත්, කැළල තිබෙන හරියේ එකම රැවුල් ගහක්වත් වැවිලා නැහැ. ඒ නිසා මම ඒ සලකුණ, පැහැදිලිවම ළඟටම දුටුවා."

"කෙනෙකුගේ මුහුණේ, ඔබ කියන ආකාරයේ සලකුණක් තිබුණා නම්, එය ඉතාම දුර්ලභ දසුනක් තමයි" හෝම්ස් කීය. "එය ඇතිවුණේ කොහොමද කියා, ඔබේ සැමියා කවදා හරි කෝබට්ගෙන් ඇසුවාද?"



www.sinhalaelibrary.com

"ඔව් මහත්මයා" ඇය කීවාය. "කෝබට් තුඩා කාලයේ ඔහුගේ මව, ඔහුට බීමට එළකිරි දමා දුන්නේ, තුඩා බෝතලයකටලු. ඔහු එය රැගෙන නිවස තුළ දිවයද්දී බිම ඇද වැටී, බිඳුණු බෝතලයේ අඩියෙන් මුහුණ කැපී, චන්ද්‍රාකාර තුවාලයක් ඇතිවුණාලු."

"විශිෂ්ටයි" හෝම්ස් කීවේ තම දෑත් සතුටෙන් පිරිමදිමිනි. "මිනිස් සිරුරේ සැදුණු කැළැල්වල, සුවිශේෂ හැඩ ගැන, ප්‍රමාණ ගැන, මා පොත් පිංචක් ලියන්න පටන් අරගෙන හුඟක් කල්. ඒකට අනිවාර්යයෙන්ම ඇතුළු කළයුතු කරුණක් මේක. හොඳයි. ඔබේ කතාව දිගටම කියන්න ඔබ ඊළඟට මොකද කළේ?"

"දුම්රිය පොළේ සෙනග අතරේ මේ මිනිහා දුටුව ගමන්, මං පුදුමයට පත්වුණා." ඇය කීවාය. "මට හොඳටම විශ්වාසයි, ඔහු මා දුටුව බව. දුම්රියට නගින්න සෙනග පොරපෙන අතරේ, ඔහු හිස් වැස්ම ගලවලා අතට ගත්තා. ඒ නිසයි මං ඔහුගේ මුහුණ පැහැදිලිවම දුටුවේ. ඔහු, හිසේ මුදුන විතරක් තට්ටය පැදුණු කෙනෙක්. "ටොම් කෝබට්" කියා මට එක්වරම කෑගැහුණා. එය ඇසුණු වහාම ඔහු තිගැස්සුණා. අතේ තිබුණු දුඹුරුපාට රෙදි තොප්පිය ඉහළට ඔසවා මුහුණ වසාගත්තා. ඒ ගමන් හොරෙන්ම මා හිටී පැත්ත බැලුවා. ඔහු මාව ළඟටම දකින්න ඇති. දුම්රියට නැගීමේ අදහස අත්හැර දැමූ ඔහු, අනික් පැත්තට හැරිලා සෙනග අතරින් රිංගා යන්න ගියා. මාත් දුම්රියට නොනැග, ඔහු ගිය පැත්තට, සෙනග අතරින් රිංගා ගෙන ගියා. නමුත් ඒ වෙනකොට ඔහු නොපෙනී ගිහින්. හෝම්ස් මහත්මයා. මං අහන්නේ මේකයි. ඔහු ටොම් කෝබට් නොවෙයි නම්, ඇයි තම නම කිව්ව වහාම තිගැස්සුණේ? ඇයි පැන දිව්වේ?"

"ඔව්. ඔබ නිවැරදියි" මගේ මිත්‍රයා කීය. "ඔහු හිස්වැස්ම ඔසවා මුහුණ වසාගන්න උත්සාහ කළ එක, අපේ හිත්වල සැකයක් ඇතිකරනවා. ඒකෙන් පෙනෙන්නේ ඔහු තම අනන්‍යතාවය වසන්කර ගැනීමට උත්සාහ දැරූ බව. හොඳයි ඊළඟට ඔබ මොකක්ද කළේ?"

"මහත්මයා අපට අහන්න ලැබුණේ "පොලී ඇන්ඩසන්" නැව සමග, එහි සිටි සැම දෙනෙක්ම මුහුදුබත් වුණා කියලයි." ඇය කීවාය. "නමුත් මේ හිටියේ නම් ටොම් කෝබට් බව මට හොඳටම විශ්වාසයි. එහෙම නම් මගේ සැමියා බිලීට මොකද වුණේ? මට දැනගන්න උවමනා එපමණයි. ඔවුන්ගේ නැව රුවල් කැඩී ගිහින්





ඈත මුහුදේ ගසාගෙන ගියාද? කොහේ හරි පාළු දූපතකට ගොඩ බැහැලා, කලක් රොබින්සන් ක්‍රූසෝ වගේ ඉඳලා ආපසු ආවද? එහෙම නම් බිලී ආවේ නැත්තේ ඇයි? මේ වගේ ප්‍රශ්න ගණනාවක් මගේ හිතට ආවා.

ඉතින් මම දැන් දවස් තුනක් ම, ඒ වෙලාවට දුම්රිය පොළට ඇවිත්, ඒ දුම්රියට නගින්න ඉන්න සෙනග අතරේ, ඔහු ගැන පරීක්ෂා කළා. නමුත් ඔහුව දකින්න ලැබුණේ නැහැ. අන්තිමේදී මං මේ අවුල ගැන, මගේ අසල්වාසී වයලට් හන්ටර් මෙනෙවියට කිව්වා. ඇය තමයි මට උපදෙස් දුන්නේ ඔබ හමුවෙන්න කියලා"

"බොහොම හොඳයි" හෝම්ස් කීය. "මට පෙනෙන්නේ මේක, බොහොම සිත් ඇදගන්නා ගැටලුවක් වගෙයි. විලර් මහත්මිය මට මුලින්ම කියන්න, මේ ටොම් කෝබට්ගේ පෙනුම කොහොමද කියලා" කියූ හෝම්ස් තම සටහන් පොත ළංකර ගත්තේය.

"ඔහුගේ උස?"

"අඩි හයකට වඩා අඟල් දෙක තුනක් අඩුයි" ඇය කීවාය. "මගේ සැමියා බිලී අඩි හයක කෙනෙක්. ටොම් ඊට වඩා මිටි බව මට මතකයි"

"ඔබ කන්දෙකේ හැඩය ගැන අපට කිව්වා." හෝම්ස් කීය. "නාසය ගිරාහොටක් වැනි උල් වකුටු එකක් බව කිව්වා. ඇස්වල පාට - නිල් පාට බව කිව්වා. හිසකෙස් හා රැවුල අළු පැහැතියි. ඊළඟට හිස මුදුනේ පමණක් තට්ටයක් ඇති බවත් කීවා. ඔහුගේ මුහුණේ හැඩය වඩාත් ළංවන්නේ මෙයින් මොන මුහුණටද?"

ලාච්චුවක් එළියට ඇද, එහි තිබූ ලිපිගොනුවක් විවෘත කළ හෝම්ස්, අපරාධකරුවන්ගේ විශාල කළු ඡායාරූප කිහිපයක් ඇයට ඉදිරිපත් කළේය. ඉතා උනන්දුවෙන් ඒවා පරීක්ෂා කළ කාන්තාව අන්තිමේදී එයින් එකක් තෝරා ගත්තාය.

"යම් පමණකට හරි සමාන කමක් තියෙනවා නම්, ඒ, මෙන්න මේ මුහුණේ හැඩයට." ඇය කීවාය. "ඒ දවස්වල ඔහු රැවුල සම්පූර්ණයෙන්ම මුඩුකරලා හිටියේ"

"මං කැමතියි ඔහුගේ මුහුණේ ඇති කැළලේ හැඩය හා ප්‍රමාණය හරියටම දැනගන්න." හෝම්ස් කීවේ, පුද්ගලයෙකු මුහුණ පැත්තකට හරවාගෙන සිටින ඡායාරූපයක්, ඇය වෙත ලබා දෙමිනි. "කරුණාකරලා මේ පැන්සල අරගෙන, ඔබ එය දුටු ආකාරය ඡායාරූපය මත අඳින්න"



www.sinhalaelibrary.com

ඇය ඉතා උනන්දුවෙන් එම කටයුත්තේ යෙදුණාය. පාසලේදී චිත්‍රයක් අඳින කුඩා දරුවෙකු මෙන්, මකන කැබැල්ලෙන් වරින් වර මකමින්, එය ඇන්ද අයුරු අපි බලා සිටියෙමු. 'c' අකුරේ හැඩයට තිබූ එම සලකුණේ විවෘත කොටස, ඔහුගේ මුඛයට ළංව පිහිටා තිබිණි.

"මෙ ලකුණුවලට අමතරව, ඔහුගේ මොනවා හරි කැළැල් ඔබ දුටුවාද?" හෝම්ස් විමසුවේය.

"එහෙම දුටු බවක් මට මතක නෑ"

"ඔහුගේ කටහඬේ අමුත්තක්.......... නැත්නම් ඉංග්‍රීසි උච්චාරණයේ අමුත්තක්..........?"

"කියන්න තරම් අමුත්තක් මා දුටුවේ නැහැ මහත්මයා" ඇය කීවාය. "ඊට එක හේතුවක් ඔහු හරි නිශ්ශබ්ද කෙනෙක්. මට අහන්න ලැබී තිබෙන්නේ, ඔහු මගේ සැමියාට කියූ වදන් හත අටක් පමණ යි."

හෝම්ස් මේ කරුණු සියල්ල, තම පොතේ සටහන් කර ගත්තේය.

"ඔහු නාවිකයෙක් නිසා, නිසැකවම දුම්පානය කරන්න ඇති." හෝම්ස් කීය. "ඒ ගැන මොනවාද ඔබට මතක?"

"වෙඩ්ම අධික ලෙස දුම්පානය කළ බව නම්, මට හොඳට මතකයි." ඇය කීවාය. "ඔහු බිව්වේ සුරුට්ටු"

හෝම්ස් ලාච්චුව තුළින් ගත්තේ, තරමක් දුර්වර්ණ වූ, පොතකි. එහි පිටු කිහිපයක් පුරා විවිධ හැඩ හා ප්‍රමාණවල සුරුට්ටු, සිගරට් රාශියක වර්ණ සිතුවම් තිබිණි. මේ හෝම්ස්, දුම්කොළ, දුම්වැටි හා සුරුට්ටු අළු පිළිබඳව ලියූ පොත බව මම හඳුනාගතිමි.

"වීලර් මහත්මිය මට කියන්න" හෝම්ස් කීය. "ඔබ ඔය කියන සුරුට්ටු වල පෙනුම, වඩාත් ළංවන්නේ, මෙයින් කුමන වර්ගයට ද කියා"

එම වර්ණ සිතුවම් සහිත පිටු කිහිපවාරයක් එහා මෙහා පෙරළූ ඇය, අන්තිමේදී මෙසේ කීවාය. "ඒ ගැන නම් මට හරියටම කියන්න අමාරුයි මහත්මයා. ඒ සුරුට්ටුවල පාට නම් ලා දුඹුරු පාටයි. හැඩයෙන් නම්, මෙන්න මේ පින්තූර දෙකේම තියෙන ඒවා වගෙයි මතක"

"කමක් නෑ" හෝම්ස් කීය. "ඔබ කියන ඒවා රොටර්ඩෑම්හි මතක "හේග්" හා හාලම් හි "ටියුලිප්" කියන වර්ග දෙක - මොනවා වුණත්





ඕලන්ද සුරුට්ටු. ඒ කරුණ මට හුඟක් ප්‍රයෝජනවත් වෙන්න ඉඩ තියෙනවා. දැනට ඒ තොරතුරු ප්‍රමාණවත්. සමහරවිට තවත් දවස් කීපයක් ගතවෙද්දී, ඔබට ඔහු ගැන තවත් තොරතුරු මතක් වේවි. එහෙම වුණොත් මට දැනුම් දෙන්න. ඒ අතරේ මං ඔහුව සොයායෑමේ කටයුතු අරඹනවා"

"හෝම්ස් මහත්මයා මට මේ කරුණ කියන්න" ඇය ඉල්ලා සිටියාය. "බිලී නැවෙන් යන්න මගෙන් සමුගනිද්දී, මං හිටියේ දරුවා ලැබෙන්න ළංවෙලා. ඒ වෙලාවෙ ඒ ගමන පිටත්වෙලා යන්න, බිලීගේ මොනම කැමැත්තක්වත් තිබුණෙ නෑ. නැව් සමාගමේ රැකියාව දමලා ගහලා, වෙනත් රැකියාවක් හොයාගන්න හිතයි කියමින්, ඔහු දෙගිඩියාවෙන් සිටියේ. නමුත් රැකියාවල් හොයලා හොයලා හෙම්බත්වෙලා හිටි ඔහුට, මේ රැකියාව ලේසියෙන් අත්හැර දමන්න හිතුණෙත් නෑ. ගතවුණු මාස කිහිපයට ඔහුට නැව් සමාගමෙන් හොඳ වැටුපක් ලැබී තිබුණා. ඒ මාස කීපයේ සෑහෙන මුදලක් ඉතිරිකරගන්නත් අපට හැකිවුණා.

මං දන්නවා; බිලී මේ ලෝකයේ කොහේ හරි ජීවතුන් අතර ඉන්නවා නම්, ඔහු කොහොම හරි මාත් දරුවාත් හොයාගෙන එනවා. ඒක මට සහතිකයි. ඔහු දෙවියන් වහන්සේ ළඟට යන්න ඇති කියලා, මං හිත හදාගෙනයි සිටියේ. ඔහු විතරක් නොවෙයි, නැවේ ගමන්කළ හැමදෙනෙකුටම ඒ ඉරණම අත්වුණා කියල තේ අපි හිතුවේ. එහෙම හිත හදාගෙන දැන් සෑහෙන කලක් වෙනවා. මේ අතරේදියි මට ටොම් කෝබට්ව දකින්න ලැබුණේ. මං ඒ නම කියා කතා කළාම, මිනිහා පුදුමයෙන් වගේ බලලා යන්න ගියා නම් ප්‍රශ්නයක් නෑ. "ඔබට වැරදීමක්; මං කෝබට් නොවෙයි" කීවා නම් ප්‍රශ්නයක් නෑ. නමුත් ඒ නම කියනවා ඇහුණු ගමන්, තිගැස්සිලා, කලබල වෙලා පැන දුවපු එකෙන් තේරෙන්නේ මොකක්ද? මෙතැන මොකක් හරි අපට තේරුම් ගන්න බැරි අවුලක් තියෙනවා කියන එක නේද?"

"ඔබ කියන හැම දෙයක්ම නිවැරදියි වීලර් මහත්මිය." හෝම්ස් කීය. "ඔබ කථාව කියාගෙන යද්දී, මගේ හිතටත් නැඟුණේ ඔය සිතිවිලිම යි. අවසාන වශයෙන් මට මෙන්න මේ කරුණත් කියන්න. නෞකාව විනාශවුණා කියල පුවත්පත් වල පළවුණාම, ඔබ නැව් සමාගමට යන්න ඇති. ඔබ වීලර්ගේ බිරිඳ බව කිව්වාම, ඔවුන්ගෙන් ලැබුණු ප්‍රතිචාරය මොකක්ද?"



www.sinhalaelibrary.com

"ඔවුන් පොත් පෙරළා බැලුවා" ඇය පිළිතුරු දුන්නාය. "බිලි විලර් අවිවාහක කෙනෙක් කියල අපේ පොත්වල සඳහන් වෙනවා කිව්වා. එපමණක් නොවෙයි, අවුරුදු දෙකක් යනතුරු විවාහ නොවෙන්න කොන්දේසියකට, ඔහු අත්සන් කරල තිබෙන බව කිව්වා. අපි ඇත්තෙන්ම විවාහ වුණු බව ඔප්පු කරන්න, මං විවාහ සහතික පත්‍රය ඔවුනට පෙන්නුවා. එතකොට මගේ තත්ත්වය ගැන සානුකම්පිතව සලකා බලලා, නැවට රත්තණ වන්දි ලැබුණු කාලෙක, මට සානුකම්පිත දීමනාවක් ගෙවන්න, සලකා බලන්නම් කියලා, මගේ ලිපිනය ලබාගත්තා."

"එහෙම ගෙවීමක් ඔවුන්ගෙන් ඔබට ලැබුණාද?"

"නැහැ මහත්මයා"

"හොඳයි. මං මේ පරීක්ෂණය භාරගන්නවා." හෝම්ස් කීය. "ඔබේ සැමියා ඇතුළු නාවිකයන්ටත්, නෞකාවටත් අත්වූ ඉරණම මොකක්ද කියා, මං හොයා බලන්නම්. යමක් හොයාගන්න හැකිවුණොත් මං ඔබට දැනුම් දෙන්නම්. ඒ නිසා ඔබේ නිවැරදි ලිපිනයත් මට දෙන්න"

ඔවුන්ගේ ලිපිනය හෝම්ස් සටහන් කරගත් පසු, කාන්තාවෝ අපෙන් සමුගත්හ. මගේ මිත්‍රයා ගැඹුරු කල්පනාවකට වැටුණේ, කටේ ගසාගත් පයිප්පය දල්වා ගැනීමට ද අමතකව ය. ඔහුගේ සිහිවිලි දාමයට බාධා නොකොට, මම පවස පුවත්පතක් කියවීමට පටන්ගත්තෙමි.

"ක්ලෙයා විලර් මහත්මිය කියූ කතාව ගැන ඔබට මොනවද වොට්සන් හිතෙන්නේ?" මගේ මිත්‍රයා විමසුවේ පැයෙන වෙලාවකට පසුවය.

"මට හිතෙනවා ඇයට දකින්නට ලැබුණු පුද්ගලයා, ඇත්තටම ටොම් කෝබට් කියලා" මම කීවෙමි.

"ඔබේ ඒ අදහසට මමත් එකඟයි වොට්සන්." ඔහු කීය. "ඔහුගේ නම කියූවාම කලබලවුණු හැටියෙනුත්, මුහුණේ තිබෙන පුව්ශේෂ හැඩයේ කැළලෙනුත්, ඒ බව ඔප්පුවෙනවා. අපි හිතමු ඔහු ගමන් කළ නෞකාව යම් අනතුරකට මුහුණදුන්නා කියල. බිලි විලර් තරුණයා ඒකෙදි මරණයට පත්වෙලා, කෝබට් පණ බේරාගෙන, එංගලන්තයට ආවා කියල හිතමු. එහෙනම් ඔහු කළ යුත්තේ මොකක්ද? වහාම විලර් මහත්මිය හමුවීමට ගිහිං, විලර්ට අත්වුණු ඉරණම හා අනතුර ගැන දැනුම් දීම. විලර් මහත්මිය ගැන අමතක





කළත්, තමන් සේවය කළ නැව් සමාගමට ඔහු ඒ ගැන දැනුම් දියයුතු වෙනවා. නමුත්.......... නමුත් "සෝෆි ඇන්ඩසන්" නෞකාවේ ගිහිං පණබේරාගත් කෙනෙක් ගැන, පුවත්පත් වල අද වෙනතුරුත් කිසිම ආරංචියක් පළවුණේ නෑ. ගැටලුව තියෙන්නේ අන්න එතැනයි.

අනතුර ගැන දැනුම්දීම වෙනුවට, ඔහු තමන්ව හඳුනාගැනීමට නොහැකි වෙන විදියට, මුහුණ පවා ආවරණය වෙන හිස්වැස්මක් පළඳිනවා. පදිංචියත් වෙනස් කරලා වෙන්න පුළුවනි. ඔහුව බ්‍රිස්ටල්හි දකින්න ලැබුණු පමණින්, පදිංචිය වෙනස් කරලද කියල සහතික වෙන්න බැහැ. නමුත් ලිවර්පූල්හි ඔහුගේ පරණ ලිපිනයේ, කෝබට් නොහිටියොත් මං පුදුම වෙන්නේ නෑ.

විලර් මහත්මියට මුහුණදෙන්න බැරි විදියේ වැරැද්දක්, ඔහු අතින් බිලි විලර්ට සිදුවුණාද? එහෙමත් නැත්නම් අනතුරට ලක්වීම නිසා, සිහිවිකල්වීමක් හෝ මතකය ගිලිහී යාමක් සිදුවුණා ද? මුහුදුබත් වී විනාශවුණා කියල අත්හැර දැමූ නැව් වලින්, දිවි ගලවාගත් නාවිකයන් ගැන, අපට ඉඳහිට වුණත් අහන්න ලැබෙනවා. නමුත් තමන්ගේ රටට ආව ගමන් ඔවුන් මොකක්ද කරන්නේ? තමන්ගේ අත්දැකීම, දිවි ගලවාගත් හැටි ගැන, පුවත්පත් සාකච්ඡා පවත්වනවා; පොත් ලියනවා. එතකොට අර අභිරහස විසඳෙනවා. නමුත් මේ මිනිහා මොකද කරන්නේ? මුළු සමාජයෙන්ම හැංගෙන්න උත්සාහ කරනවා.

"සෝෆි ඇන්ඩසන්" නෞකාව හදිසියේම මුහුදේදී අතුරුදහන්වීම ගැන ඇතිවුණු කලබැගෑනිය, ඔබට මතක ඇති වොට්සන්. ඔය ගැන පුවත්පත්වල පළවුණු විස්තර කපලා, මං මගේ "ස්ක්‍රැප්" පොතේ අලවා ගත්තා. බලමු ඒකෙ තියෙන්නේ මොනවද කියලා.

පුවත්පත්වල පළවන වැදගත් පුවෘත්ති කපා, ලොකු පොතක අලවා එකතුකිරීම, මගේ මිත්‍රයාගේ විනෝදාංශයක් විය. ඒවා අසුරා තිබූ රාක්කය පිරික්සූ ඔහු '86 වසරේ අප්‍රේල්, මැයි ජූනි, මාස සඳහා වූ පොත අතට ගත්තේය. ඔහු එම පිටු පෙරළද්දී පුවත්පත් කිහිපයකින්ම කපාගත් පුවෘත්ති තිබුණත්, සවිස්තරම වාර්තාව පළවී තිබුණේ, "ද වර්ල්ඩ්" නම් සතිඅන්ත පුවත්පතකය. එහි සංක්ෂිප්ත සටහනක් ඔබ වෙත ඉදිරිපත් කරමි.



www.sinhalaelibrary.com

## ඛේදජනක සමුගැනීමක්
### (විශේෂ වාර්තාකරුවෙකු විසිනි)

ලිවර්පූල් හා වැල්පරයිසෝ අතර වෙඩිලුණු (පොටෑසියම් නයිට්‍රේට්) ප්‍රවාහණයේ යෙදුණු "සොෆී ඇන්ඩසන්" නම් රුවල් නෞකාව, මහ සයුර මැදදී අතුරුදන්වූ ආකාරය ඇත්තෙන්ම ඛේදජනකය.

1876 දී ස්කොට්ලන්තයේ ක්ලයිඩ්හි නෞකා කර්මාන්ත-ශාලාවක තැනුණු මෙය, කුඹගස් හතරේ රුවල් නැවකි. මෙහි අයිතිකරුවන් වූයේ "බ්‍රයිට් ස්ටා" නම් නැව් සමාගමය. එහි ප්‍රධාන කාර්යාලය ග්ලාස්ගෝ නුවර පිහිටි අතර, ශාඛා ලිවර්පූල් හා ලන්ඩන් නගරවල පිහිටා ඇත. මෙම යාත්‍රාව සෑමවිටම යාත්‍රා කළේ, එංගලන්තයේ ලිවර්පූල් හා චිලී දේශයේ වැල්පරයිසෝ අතරයි. ඒ වෙඩිලුණු එංගලන්තයට ගෙනඒම සඳහාය.

මගීන් 64 දෙනෙකු සහ 12 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලය සමග, මෙම නෞකාව ලිවර්පූල් වරායෙන් පිටත්වී ගියේ, පසුගිය සැප්තැම්බර් 28 වැනිදායි. එහි රැගෙන ගිය මගීන්ට අමතරව, සීනි, වියළි පලතුරු, විස්කෝතු, තේ කොළ සහ වයින් ද මෙහි රැගෙන ගිය බවට වාර්තා වේ. නෞකාව පිළිබඳව "බ්‍රයිට් ස්ටා" නැව් සමාගමෙන් කළ විමසීමකට පිළිතුරු ලෙස, වැල්පරයිසෝ නගරයේ වරාය අධිකාරිය විසින් කේබල් පණිවුඩයක් එවා තිබිණ. ඔවුන් කියා තිබුණේ, "සොෆී ඇන්ඩසන්" දෙසැම්බර් 20 වැනිදා වැල්පරයිසෝ වෙත නිරුපද්‍රිතව ළඟාවූ බවයි. නැවේ සිටි මගීන් පිටවී ගිය පසු, ගෙන ආ බඩු බෑම නිසිලෙස සිදුවී ඇත. අනතුරුව පොටෑසියම් නයිට්‍රේට් සහිත ලී පෙට්ටි විශාල ප්‍රමාණයක් නැවට පටවාගත් අතර, මගීන් ලෙස යාත්‍රා කිරීමට කිසිවෙකුටත් අවසර ලැබී නොමැත. ඊට හේතුව වූයේ, වෙඩිලුණු ප්‍රවාහණය අන්තරායකාරී කටයුත්තක් වීමයි. එවැනි නැවක මගී ප්‍රවාහණය කිසිසේත් සුදුසු නොවේ. මීට පෙර හදිසි අවස්ථාවලදී මෙවැනි නැව්වල, හදිසි මගීන් ප්‍රවාහණය කර ඇති බැව් සැබෑය. එහෙත් මෙවර, නෞකාවේ කපිතාන් ජෝස්ෆ් හැෆර්, මගීන් භාරගැනීම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර ඇත.

'86 ජනවාරි 17 වැනිදා වැල්පරයිසෝ වරායෙන් ඔවුන් ගමන් අරඹද්දී, නැවේ කිසිදු යාන්ත්‍රික දෝෂයක් තිබූ බවට සාක්ෂි





නොමැත. වෙඩිලුණු ගෙන ඒම සඳහා පිටත්ව ගිය "ඉසබෙලා" නම් ස්පාඤ්ඤ නෞකාව, "මාක් ඇන්ටනි" නම් ඉතාලි නෞකාව සහ "ෆිලඩෙල්ෆියා" නම් එක්සත් ජනපද නෞකාව යන යාත්‍රා, "සොෆී ඇන්ඩසන්" දුටු බවට සාක්ෂි ඇත. පිටුපසින් හැමූ වේගවත්, එහෙත් සෞම්‍ය සුළඟක් සමග, ඇය නිරුපද්‍රිතව යාත්‍රාකළ බව පැවසේ.

"සොෆී ඇන්ඩසන්" පැනමා ඇල හරහා යාත්‍රාකර ඇත්තේ මාර්තු 31 වැනි දින බව තහවුරුවී තිබේ. අත්ලන්තික් සාගරයට පිවිසි පසු ඇය දකින්නට ලැබී ඇත්තේ "ඩියුක් ඔෆ් යෝක්" නම් මගී නෞකාවට පමණි. ඒ බහමාස් දූපත් අසලදීය. ඉන්පසු උතුරු අත්ලන්තික් සාගරය හරහා ගමන්කළ "සොෆී ඇන්ඩසන්", මැයි මාසයේ අවසන් සතියේ ලිවර්පූල් වෙත ළඟාවීමට නියමිතව තිබිණ. එහෙත් කිසිදු සලකුණක් ඉතිරි නොකොට "ඇය" වායුගෝලය තුළට මුසුවී ගොසිනි. "ඇයට" සිදුවූයේ කුමක්ද?

පසුගිය මාස හතර පුරාම මෙම ප්‍රදේශයේ තිබුණේ යහපත් කාල ගුණයකි. එම නිසා කුණාටුවකට අසුවී නැව මුහුදුබත් වූවා යන කරුණ, සම්පූර්ණයෙන්ම බැහැර කළ හැකි බැව්, තතු දන්නෝ පවසති.

මේ පිළිබඳව අපි "බ්‍රයිට් ස්ටා" නැව් සමාගමේ අයිතිකරුවන් වන, ජැමී සහ ඩන්කන් මැක්නීල් සොහොයුරන්ගෙන් විමසා බැලුවෙමු. නැවට අත්වූ ඉරණම ගැන කිසිත් සිතාගත නොහැකිව, ඔව්හු, මවිතයට මෙන්ම කම්පනයට ද පත්වී සිටිති. ඔවුන් සතු තවත් රුවල් නැව් කිහිපයක් ඇති අතර, "සොෆී ඇන්ඩසන්" නෞකාව ගැන සතුටුදායක තොරතුරක් ලැබෙන තුරු, අනෙක් නෞකාවල ගමන් ද තාවකාලිකව අත්හිටුවා ඇත.

නාවික රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් වන ලොයිඩ්ස් සමාගමෙන් අපි මීළඟට විමසා බැලුවෙමු. නිලවශයෙන් කිසිවක් ප්‍රකාශකිරීම ඔවුහු ප්‍රතික්ෂේප කළහ. වෙඩිලුණු ප්‍රවාහණය ඉතාම අන්තරායකාරී කටයුත්තක් බව රහසක් නොවේ. ඒ කුමක් නිසාද යත්, කුඩා ගිනි පුපුරකින් වෙඩිලුණු වලට ගිනි ඇවිළුණොත්, මුළු නෞකාවම පිපිරී යාමට ඇති අවදානමයි. මේ නිසා නැව සහ එහි ගමන්ගන්නන්ගේ ජීවිත ද, ප්‍රවාහණය කෙරෙන බඩුද, ඉතා ඉහළ මුදලක් ගෙවා රක්ෂණය කිරීම, අනිවාර්යයයෙන්ම සිදුවන්නකි. කෙසේ වෙතත් ගිනි ඇවිළෙනසුලු ද්‍රව්‍ය, නෞකාවේ ගබඩා අසල



www.sinhalaelibrary.com

පරිහරණය, සම්පූර්ණයෙන්ම තහනම්ය. නාවිකයනට දුම්පානය කිරීමට අවසර ඇත්තේ ගබඩාකාමර වලට අඩි 40 ක් ඈතින් පිහිටි නැව්තට්ටුව මතදී පමණි. කපිතාන් ජෝසප් හැෆර් සැමවිටකම, නීතිරීති දැඩිව ක්‍රියාත්මක කළ පුද්ගලයකු බව ප්‍රසිද්ධ කරුණකි. එසේ තිබියදීත් කිසිවෙකු අමතක වීමෙන්, සුරුට්ටුවක් දල්වාගෙන ගබඩාකාමර දෙසට පිය නැගුවා වත්ද? එසේත් නැතිනම් කුස්සියේ ආහාර පිළියෙල කිරීමේදී ඇතිවූ ගින්නක්, ගබඩා වෙත පැතිර ගොස්, වෙඩිලුණු වලට ගිනිඇවිළුණාද?

එසේත් නැතිනම් මුහුදු කොල්ලකරුවන්ගේ වෙඩි ප්‍රහාර නිසා, නැව විනාශයට පත්වුණාද? අත්ලාන්තික් සාගරයේ, බටහිර යුරෝපීය ද්‍රෝණිය නමින් හැඳින්වෙන කොටසේ ඉහළ කෙළවර, මුහුදු කොල්ලකරුවන්ගේ පාරාදීසයක් බව පැවසේ. මීට පෙර කිහිපවතාවක්ම ඔවුන් ස්පාඤ්ඤ නැව් වලට පහරදී කොල්ලකෑම් සිදුකර ඇති බැව් ඔප්පු වී ඇත. පරීක්ෂණ කටයුතු දිගින් දිගටම සිදුවේ. කෙසේ වෙතත් "සොෆී ඇන්ඩසන්" නෞකාව හෝ එහි කාර්යමණ්ඩලය ගැන, තවදුරටත් බලාපොරොත්තු තබාගැනීමට නොහැකි බව, නම සඳහන් කිරීමට අකමැති නාවික විශේෂඥයෙක් මේ ලියුම්කරු සමග පැවසුවේය."

"දැනට අපට දැනගන්න තියෙන තොරතුරු එපමණයි. එහෙම නේද වොට්සන්?" හෝම්ස් විමසුවේ තම හාන්සි පුටුව මත දිගාවෙමිනි. "මේ පිළිබඳව තවදුරටත් කළයුතු භාරී ඇවිස්සීම තියෙනවා. ඊට අමතරව අපි හොයලා බලන්න ඕන, ටොම් කෝබට් ගැන. නැව එංගලන්තයට ළඟාවෙන්න කලින් මුහුද මැද්දී විනාශවුණා. නමුත් නැවේ කාර්ය මණ්ඩලයට අයත් මේ පුද්ගලයා, ආපහු එංගලන්තයට ආ බවට සාක්ෂි තියෙනවා. මේක කොහොමද සිද්ධවුණේ? මොකක්ද වොට්සන් ඔබ, ඒ පිළිබඳව දරන මතය?"

"නැව් සමාගම ස්ථිරවශයෙන්ම කියනවා, නැවේ කාර්ය මණ්ඩලයේ කෝබට් හිටියා කියල" මම කීවෙමි. "ඒ මොකද අනතුරට පත් අයගේ ලේඛනයේ, ඔහුගේ නමත් තියෙන බව විල්ප් මහත්මිය දැක තිබුණා. පුවත්පත්වලත් එය සඳහන් වුණා. එහෙම නම් ඔහු වැල්පරයිසෝ වරායේ නැව නැංගුරම් දැමූ වෙලාවේ, නැවෙන් පිටවෙලා ගිහින්, ආපහු නැවට නැගල නැහැ. වෙනත් නැවකින් එංගලන්තයට ඇවිත්."





"ඔව් ඔබ කියන දේට මම එකඟයි" හෝම්ස් කීය. "ඊට අමතරව ඔහු පැනමා වලදී නැවෙන් පැනගියා වෙන්නත් පුළුවනි. පැනමා ඇල හරහා යද්දී ආහාර ද්‍රව්‍ය හා ජලය ලබාගන්න, පැනමා වරායෙදී ටික වෙලාවකට හරි, නැව නැංගුරම් දමනවා නේ. එහෙමත් නැත්නම්? කවුද දන්නේ නැව අනතුරකට ලක්වෙද්දී, ඔහු ජීවිතාරක්ෂක බෝට්ටුවක නැගිලා බේරුණාද කියලා?"

"හොඳයි ඔහු ජීවිතය බේරාගත්තේ එහෙමයි කියල හිතමු," මම කීවෙමි. "එහෙනම් ඇයි ඔහු ආපහු ආවාම, නැව් සමාගමට ඒක දැනුම් නොදුන්නෙ?"

"ඔව්. ඒක තමයි අපට විසඳන්න තියෙන ලොකුම ගැටලුව." හෝම්ස් කීය. "කොහොම වුණත් මේ ගැන හොයා බැලීම අපි පටන්ගත යුත්තේ, "ලූසිට ස්ටා" නැව් සමාගමෙන් සහ ලොයිඩ්ස් ආයතනයෙන්. අර අසරණ ගැනි කුඩා දරුවෙකුත් එක්ක අනාථ වෙද්දී, නැව් සමාගම් ඔවුනට පිහිට වේවි කියල හිතන්න අමාරුයි"

පසුවදා උදෑසන මා අවදිවීමටත් පෙර, හෝම්ස් නිවසෙන් පිටවී ගොස් සිටියේය. මම පුවත්පත් කියවමින් කාලය ගතකළෙමි. කුඩා දරුවෙකු සමග අනාථ වූ ක්ලෙයා විල්ප් මහත්මිය ගැන, මගේ සිතේ ඇතිවූයේ කණගාටුවකි. තරුණියා සමග ඔයතරම් හිතවත් වුවා නම්, විල්ප් මහත්මිය මගහැර යාමට තරම් කෝබට් සැහැසි වූයේ ඇයි? තරුණයා හා කෝබට් අතර යම් අමනාපයක් ඇති වී තිබුණා ද? නැව්වල සේවකයන් අතර එවැනි අමනාපකම් හා සණ්ඩුසරුවල් ඇතිවීම එතරම් දුර්ලභ දෙයක් නොවන බව මම අසා ඇත්තෙමි. කෝබට් නමින් පෙනී සිටියාට, මොහු විදේශික රහස් ඔත්තුකාරයෙක්ද? ඉංග්‍රීසි ජාතිකයෙකු ලෙස පෙනී සිට, නැවේ සේවයට බැඳී, ආපහු එන ගමනේදී නැව පුපුරවා හැරි, විදේශික රහස් ඔත්තුකරුවෙක්ද? එංගලන්තය වෙත ගෙන එනු ලබන වෙඩිලුණු, විශාල තොගයක් සහිත නැවක් විනාශකිරීමෙන්, වාසියක් සැලසෙන්නේ කාටද? එංගලන්තය සමග දැනටමත් අමනාප ජර්මනියයි. එයින් ඔවුනට සැලසෙන වාසිය සුළුපටු නොවේ. නෞකාව තුළ කාල බෝම්බයක් අටවා, ඔහු රහසිගතව බෝට්ටුවකින් පිටවී ගියාවත් ද? එහෙත් කෝබට් එවැනි විදේශික රහස් ඔත්තුකරුවෙකු නම්, ඔහු තවදුරටත් එංගලන්තයේ නොරැඳෙනු ඇත. විල්ප් මහත්මියගේ අවධානයට ලක්වූ පසු නම්, ඔහු කිසිසේත් මෙරට රැඳී නොසිටිනු ඇත.



www.sinhalaelibrary.com

හෝම්ස් ආපසු නිවහන වෙත පැමිණෙද්දී සවස්වී තිබිණි. ඔහු බොහෝ සෙයින් විඩාපත්වී සිටි බැව් මම දුටුවෙමි.

"හෝම්ස්, ඔබ දවල් කෑමටවත් ආවෙ නෑ?" මම ඇසීමි.

"ඒකටවත් වෙලාවක් තිබුණෙ නෑ වොට්සන්" කී ඔහු සීනුව නාදකොට, සේවක ළමයා කැඳෙව්වේය. හරක්මස්, චීස් සමග පාන් පෙති කිහිපයක් ගෙන එන මෙන්, සේවකයාට දැනුම්දුන් මගේ මිත්‍රයා, මුහුණකට සෝදාගැනීමට සඳහා ගියේය. පැය කාලකට පමණ පසු අප කතාබහේ යෙදුණේ, ඔහු ආහාරගන්නා අතරතුරය.

"මං මුලින්ම ගියේ ස්කොට්ලන්ඩ්යාඩ් එකට" හෝම්ස් කීවේ චීස් පෙත්තක් සමග පාන් අනුභව කරමිනි. "අපරාධකාරයන්ගේ නාම ලේඛනවල සහ ඡායාරූප එකතුවේ, බිලී වීලර් සහ තෝමස් කෝබට් යන නම් සඳහන්වෙලා තියෙනවද කියලයි, මං මුලින්ම බැලුවෙ. එහෙම මොකුත් නැහැ. ඊළඟට වීලර් මහත්මිය අපට දුන්නු විස්තරය අනුව, වෙනත් කෙනෙකුගේ ඡායාරූපයක් වෙනස් කරලා, කෝබට්ගේ පෙනුම මේ විය යුතුයයි කියන රූපයක් සකසාගත්තා. ඒ විදියේ මුහුණේ හැඩය, රැවුල් ගස්, කොණ්ඩය පින්තූරෙට යොදලා, රවුම් තුවාල කැළලකුත් ඇන්දා. කොහොම වුණත්, මේ කියන විදියේ විදේශික රහස් ඔත්තුකරුවෙකුගේ වත්, අපරාධකාරයෙකුගේ වත් තොරතුරු, ස්කොට්ලන්ඩ්යාඩ් එකේ නැහැ. මං ඔබට කලිනුත් කිව්වා වගේ, මුහුණේ තිබෙන මේ කැළල හරිම සුවිශේෂයි. මිනිසුන් දශලක්ෂයක් ගත්තොත්, ඉන් එක් අයෙකු ගේ වත් මුහුණේ, මේ විදියේ ලකුණක් දකින්න ලැබේවි කියල මං හිතන්නේ නෑ."

කෑම කා අවසන් කළ ඔහු කෝපි බීමට පටන්ගත්තේය. කථාව යළි ඇරඹුවේ කෝපි කෝප්ප දෙකක් බී අවසන් කළ පසු ය.

"මම ලොයිඩ්ස් හි ප්‍රධාන කාර්යාලයට සහ "බ්‍රයිට් ස්ටා" නැව් සමාගමේ කාර්යාලයට ගියා. නමුත් අපි දැනටමත් දන්නා තොරතුරුවලට අමතරව, ඒ හැටිදෙයක් සොයාගන්න හැකිවුණේ නැහැ. "සොෆී ඇන්ඩසන්" මුහුදුබත්වීමෙන් ජීවිතක්ෂයට පත්වුණු, දොළොස්දෙනාගේ නම් ඇතුළත් ලේඛනයක්, නැව් සමාගමේ තිබුණා. එයින් බිලී වීලර්ගේ නම වගේම ටොම් කෝබට්ගේ නමත් තිබුණා.

මං බලාපොරොත්තුවෙනවා හෙට, බ්‍රිස්ටල් සහ ලිවර්පූල් නගරවලට ගිහිං තොරතුරු සොයා බලන්න." හෝම්ස් කීය. "ඒකට





කොයිතරම් කාලයක් ගතවේද, ඒක කොයිතරම් සාර්ථක වේද කියන එක නම් මට කියන්න බැහැ. මුලින්ම මගේ අවධානය යොමුකරන්නේ බ්‍රිස්ටල් වලට. ඒ මොකද කෝබට්ව දකින්න ලැබිල තිබුණෙ එහෙදි නේ. ඔහු එහේ පදිංචිද, නැත්නම් ඒ නගරයේ කොහේ හරිහියාද, නැත්නම් කවුරු හරි හමුවෙන්න බ්‍රිස්ටල් වෙත ආවද? මේ කිසිදෙයක් අපි දන්නේ නෑ. වීලර් මහත්මියට නොපෙනෙන්න පැනදුවන්න තරම් හේතුවක් තිබුණා නම්, ඔහු තවදුරටත් එහේ ඉඳීවිද කියන එකත් සැකයි. නමුත් උත්සාහයක් කරල බලන්න වටිනවා. වෙලා තිබුණොත් මම ලිවර්පූල් වලටත් ගිහින් එනවා. වොට්සන්, ඔබටත් විවේකයක් තියෙනවා නම්......."

"හෙට නම් ඔබ සමග එන්න මට අපහසුයි හෝම්ස්" මම කීවෙමි. "හෙට තමයි නොදම්බලන්ඩ් හෝටලයේදී, සේවාමුක්ත හමුදා නිලධාරීන්ගේ, වාර්ෂික සුහද හමුව පැවැත්වෙන්නේ. මං ඒකට යන්න බලාපොරොත්තුවෙන් හිටියේ. ඉන්දියාවේ මා සමග එකට සේවය කළ මිතුරන් හමුවෙන්න........."

"හරි හරි මිත්‍රයා" හෝම්ස් කීය. "ඔබගේ ඒ කටයුත්තට බාධාකරන්න, මං කොහොමටවත් කැමැති නෑ. මා සමග ගියා වුණත් ඔබට කරන්න සිදුවෙන්නේ, හරි හැටි කෑමක් බීමක් නැතිව, අවශේ එහා මෙහා ඇවිදීම පමණයි. පරණ මිතුරන් හමුවී ආගිය තොරතුරු කතාබහ කිරීම, වඩාත් සිත්ඇදගන්නා කටයුත්තක් වේවි. හෙට හැන්දෑවෙද්දි ආපහු එන්න මං බලාපොරොත්තු වෙනවා. සොයාගැනීමට හැකිවුණු තොරතුරු ගැන, අපි හෙට රෑට සාකච්ඡා කරමු."

මගේ මිත්‍රයා පසුවදා උදෑසනින්ම නිවසෙන් පිටවීගියේය. උදේ දහයයි තිහ වෙද්දී මම, නොදම්බලන්ඩ් හෝටලය වෙත ළඟාවූයෙමි.

මහා බ්‍රිතාන්‍ය වෙනුවෙන් ඉන්දියාවේ විවිධ ප්‍රාන්තවල, හමුදා කඳවුරුවල සේවයකොට, විශ්‍රාම ගෙන සිටි නිලධාරීයෝ, මෙයට සහභාගී වූහ. වාර්ෂිකව පැවැත්වුණු මෙම උත්සවයට, සමහරු රටේ ඈත පෙදෙස්වලින් පවා පැමිණ සිටියහ. ඔවුන් සමග කතාබහ කරමින්, පැරණි සිදුවීම් සිහිකරද්දී, කාලය ගෙවී යනු නොදැනිණ. මා ආපසු බේකර් වීදියේ නිවහන වෙත ළඟාවෙද්දී ඇඳිරි වැටෙන්නට පටන්ගෙන තිබිණ. එහෙත් මගේ මිත්‍රයා ආපසු

පැමිණ සිටියේ නැත. තොරතුරු සෙවීම සඳහා ඔහු, ලිවර්පූල් බලා යන්නට ඇතැයි මම සිතුවෙමි.

හෝම්ස් ආපසු ආවේ ඊළග දවසේ දහවල් එකොළහට පමණය.

"මං ඊයෙ රෑම ආපහු ආවෙ නැති නිසා, ඔබ පුදුමවෙන්න ඇති වොට්සන්?" ඔහු ඇසීය.

"නෑ. මං හිතුවා ඔබ වැඩිදුර පරීක්ෂණ සඳහා, ලිවර්පූල් බලා ගිහිං, රැවෙන්න ඇති කියලා"

"ඔබ හිතුවා වැරැද්දියි" මගේ මිත්‍රයා කීය. "මං ඊයෙ දවසම ගතකළේ බ්‍රිස්ටල් වල. මුලින්ම මං නගරය අවට අවන්හල් හා තැබෑරුම් වලට ගිහිං හොයා බැලුවා. කෝබට්ගේ මුහුණේ ලක්ෂණ සඳහන් කරමින්. ඒ මොකද ඒවා නාවිකයන් නොවරදවාම පැමිණෙන තැන් නේ. ඒත් පැහැදිලි තොරතුරක් කොහෙන්වත් ලබාගන්න හැකිවුණේ නෑ. ඊළඟට මං කල්පනා කළා, යා යුත්තේ කොහේටද කියලා. යම් කෙනෙකු මුහුණට මුහුණ හමුවී, සමීපව ඉඳගෙන, මිනිත්තු කිහිපයක් හරි කතාබහ කරන්න ලැබෙන වෘත්තිකයන් කවුරුන්ද? නීතිඥවරු, වෛද්‍යවරු, දන්ත වෛද්‍යවරු සහ කරණවෑමියන්. මුලින් සඳහන් වෘත්තීන් තුනේම අය ඊයේ හමුවුණා. නමුත් සාර්ථක ප්‍රතිඵල ලැබුණේ නැහැ.

අන්තිමේදී අද ගියා කරණවෑමියන් හමුවෙන්න. බාබර් සාප්පු කිහිපයකට. මං ඔවුනට කිව්වේ, කාලයකට ඉස්සර වෙලා මා එක්ක එකට නැවක රාජකාරී කළ මිත්‍රයෙක්, මේ බ්‍රිස්ටල් නගරයේ පදිංචියට ඇවිත් ඉන්න බව ආරංචිවුණා; මට මගේ මිත්‍රයාව හොයාගන්න, උදව් උපකාර කරන්න කියලා. ඔහුගේ හිස මුදුනේ තට්ටය, නිතරම පළඳින [illegible] නිස්වැස්ම, දුම්බීමට යොදාගන්නා ඕලන්ද සුරුට්ටුව ගැන කිව්වා. ඊට අමතරව කම්මුලේ C අකුරු හැඩයේ කැළල ගැනත් කිව්වා. බාබර් සාප්පු දහයකට ගියත් සතුටුදායක ප්‍රතිචාරයක් ලැබුණේ නෑ. මං හිතුවේ කෝබට්, මුහුණේ දෙපැත්තේ රැවුල වවන්න පටන් අරගෙන නිසා, ඔහු උඩුරැවුල [illegible] ඇලිපිහියකින් බාගන්නවා වෙන්නත් පුළුවනි කියලා. කොහොම වුණත් එකොළොස්වැනි බාබර් සාප්පුවේදී මට සතුටුදායක ප්‍රතිඵල ලැබුණා.

මං හිතූ හැඩහුරුකම තිබුණු කෙනෙක්, උඩුරැවුල බෑමට හා මුහුණ දෙපැත්තේ රැවුල්ගස් කොට කිරීමට, එම ස්ථානයට එන





බව මට කරණවෑමියා කිව්වා. නමුත් ඒ එන්නේ දින තුන හතරකට සැරයක්ලු. අනෙක් වැදගත්ම කරුණ වුණේ, මේ පුද්ගලයා අවුරුදු හතලිස් පහක පමණ කෙනෙකු වුණත්, මේ බාබර් සාප්පුවට එන්න පටන්ගෙන තිබෙන්නේ මෑතකදී. ඔහුගේ වම් කම්මුලේ කැළල ගැනත්, දුඹුරු පැහැති ඕලන්ද සුරුට්ටුව ගැනත්, කරණවෑමියාට හොඳට මතක තිබුණා. මම අද උදේ වරුවම ඒ ඉදිරිපිට පාරේ රැඳී හිටියත් ඔහු ආවේ නැහැ. මේ විස්තර වල හැටියට, කෝබට් දැන් බ්‍රිස්ටල් අවට කොහේ හරි පදිංචිවී. ඒ ගැන සැකයක් නෑ."

"ඉතින් මීළඟට ඔබ මොනවද කරන්න බලාපොරොත්තුවෙන්නෙ?" මම ඇසීමි.

"මං ඊයෙ රෑ නැවතුණේ බ්‍රිස්ටල් හෝටලයේ" හෝම්ස් කීය. "දින කිහිපයක් භාවිතකළ ඇඳුම් පැළඳුම් සූදානම් කරගෙන, අද හැන්දෑවට ආයෙමත් බ්‍රිස්ටල් වෙත යනවා. මේ විදියට ටයිකෝට් ඇඳලා, මහත්මයෙකු වගේ පෙනුම තියෙන කෙනෙකු වීමේ, අවාසියකුත් තියෙනවා. එහෙම අය එක්ක කතාකරන්න සමහර මිනිස්සු බයයි. ඒ නිසා පොඩි වෙස්මාරු කිරීමක් දමාගත්තොත්, ඒකත් මට ප්‍රයෝජනවත් වේවි. හොඳට කලිසම් කබා ඇඳගත් අය පාරේ රස්තියාදු වෙන හැටි දැක්කාම, මිනිස්සු සැක හිතනවා. ඒකට ගැළපෙන විදියේ ඇඳුම් ඇඳගෙන හිටියොත්, ප්‍රශ්නයක් වෙන්නෙ නෑ. වොට්සන් ඔබට එන්න කියල මං කරදර කරන්නෙ නෑ. ඒ මොකද ඒ පදික වේදිකාවේ දවස් කීයක් මට ගත කරන්න වේවි ද දන්නෙ නෑ."

ලොකු ගමන්මල්ලු තුනක් අසුරාගත් හෝම්ස්, කුලීරියක් ගෙන්වා ගෙන පිටත්ව ගියේ, මහවැසි කඩාහැළෙද්දී ම ය.

ඊට පසු දින කිහිපය මා ගෙවාදැමුයේ ඉතා අපහසුවෙනි. මගේ මිත්‍රයාගේ කටයුතු සඳහා දින කීයක් ගතවේද යන්න, මම දැන නොසිටියෙමි. මේ අතරේ හෝම්ස් හමුවීමට කිහිපදෙනෙක්, අපේ නිවහන වෙත පැමිණියහ. ලන්ඩන් නගරයේ ව්‍යාපාරිකයෙක්, විශ්‍රාමලත් හමුදා නිලධරයෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඒ අතර වූහ. මගේ මිත්‍රයා ආපසු පැමිණෙන දිනය ගැන ඔවුනට නිශ්චිතව කීමට, මට හැකියාවක් නොතිබිණ. බලාපොරොත්තු කඩවීම නිසා ඇතිවූ සිත් තැලැම්මෙන්, ඔවුහු ආපසු ගියහ. ඔවුන්ගේ ආගන්තුක පත්‍ර මා අතට දී, හෝම්ස් ආපසු පැමිණි වහාම, ඔවුන් වෙත විදුලිපුවත් එවීමට කටයුතු කරන මෙන්, ඔවුහු ඉල්ලා



www.sinhalaelibrary.com

සිටියහ. මගේ මිත්‍රයා ආපසු පැමිණියේ දින හතරකට පසු දිනයක දහවල් දොළහට පමණය. ඔහුගේ මුහුණ අව්වට පිලිස්සී තිබුණු අතර, බොහෝ විඩාපත් බවක් මුහුණෙන් පෙනිණ. එහෙත් දෙනෙත් වල තිබුණේ දීප්තියකි.

"වැඩේට හුඟක් මහන්සි වෙන්න වුණා වොට්සන්" ඔහු කීවේ පයිප්පය දල්වාගෙන හාන්සි පුටුවේ වැතිරෙමිනි. "එදා රෑ මෙහේට වැස්සට, බ්‍රිස්ටල්වලට වැස්සෙ නෑ. ඒක මගේ හොඳ වෙලාව. ඔබ දකින්න ඇති මම ගමන්මලු කිහිපයක් අරගෙන ගිය බව. මගේ ඇඳුම්වලට අමතරව ඒවල තිබුණේ, මං වරින්වර පදික වේදිකාවෙන් මිලට ගත් පරණ පොත්. අර බාබර්සාප්පුව ඉදිරිපිට පාරෙන් අනෙක් පැත්තට වෙලා සෝදිසියෙන් ඉඳීමටයි, මට ඕනෑවෙලා තිබුණේ. ඒකට සුදුසුම ක්‍රමය මොකක්ද කියලා මං තීරණයකට ඇවිත් හිටියේ. එදා රෑ බ්‍රිස්ටල් හෝටලයේ නැවතිලා, පහුවදා උදේ කෑමෙන් පස්සේ, වෙස්මාරුකරගෙන, මං හෝටලයෙන් පිටවුණා. මං සැරසුණේ පදික වේදිකාවේ බඩු අලෙවි කරන්නෙකුගේ ඇඳුම් පැළඳුම් වලින්. මං හිතුවා අලෙවි කිරීමට සුදුසුම දේ, පරණ පොත් බව. ඒ මොකද මිල ටිකක් වැඩියෙන් කිව්වාම, කවුරුවත් ඒවා මිලට ගන්නෙ නෑ. පදික වේදිකාවේ පරණ වැගි කබා දෙකක් එළලා, පොත් දහයක් පහළොවක් පිළිවෙළට තියලා, පිටිපස්සෙන් තිබුණු ආප්පෙට හේත්තුවෙලා මං බලාගෙන හිටියා. පොත් කිහිපයක් විකිණුනා, මං නොහිතූ මිලට. ඒත් මට හමුවෙන්න ඕන කරන මිනිහා නම් බාබර් සාප්පුවට ආවෙ නෑ. ශේක්ස්පියර්ගේ නාට්‍ය පොත්, ජෝන් මිල්ටන්ගේ, චෝසර්ගේ පොත් සොයාගෙන, හරියට මිනිස්සු ආවා. ඔවුන් සමග කතාබහ කරන අතරේ, මගේ දෙනෙත් වැඩියෙන්ම යොමුවුණේ පාරේ අනෙත් පැත්තට. දින තුනක් රස්තියාදු වුණත්, අන්තිමේදී අද උදේ මගේ බලාපොරොත්තු ඉෂ්ට වුණා."

"හැබෑට?" මා ඇසුවේ ඉමහත් පුදුමයටත් සතුටටත් පත්ව ය.

"ඔහු, මං හිතුවාටත් වඩා වයස්ගත පෙනුමක් තිබුණු අයෙක්." හෝම්ස් කීය. "ඒ හැමතැනම මුහුණපුරා වැවුණු, අඩක් පැසුණු රැවුල නිසා වෙන්න ඇති. නාවිකයෙකුටම උරුම ගමනින්, සුරුට්ටුවක් උරමින් ආ ඔහු, බාබර් සාප්පුවට ඇතුළුවෙන හැටි මං බලාගෙනයි හිටියේ. එස්වරම මට හිතුණේ මාත් ඒක ඇතුළට ගිහිං, ඔහු සමග කතාබහක් පටන්ගන්නයි. නමුත් එහෙම වෙලාවට ඔහුගෙන් කිසිම





දෙයක් හෙළිකරගන්න බැරිවේවි; ඔහු මා ගැන සැක සිතා පැනයාවි කියන අදහස මට ඇතිවුණා. ඉතින් මං තීරණය කළා මේ ප්‍රශ්නය විසඳීමට, වෙනත් ක්‍රමයක් අනුගමනය කරන්න. මං කඩයකින් ඕලන්ද සුරුට්ටුවක් මිලටගෙන, මගේ පොත් 'කැටලොග්' වෙලා, ඔහු එළියට එනතුරු බලාසිටියා. ඔහු එළියට බැස්සෙත් සුරුට්ටුව දල්වාගෙන දුම් දමමින්. මං පාරෙන් අනෙක් පැත්තට පැනලා, සුරුට්ටුව දල්වාගන්න, ගින්දර ටිකක් ඔහුගෙන් ඉල්ලුවා. මං හිතුවා වගේම ඔහු කළේ, සාක්කුවෙන් ගිනිපෙට්ටියක් ගෙන මා දෙසට දිගු කිරීමයි. මං මගේ සුරුට්ටුව දල්වන ගමන් ඔහුගේ මුහුණ දෙසට බැල්මක් හෙළුවේ පුදුමයෙන් වගේ.

"මිත්‍රයා. ඔහේ නම් පුදුමාකාර වාසනාවන්තයෙක්" මං කිව්වේ ඔහුගේ මුහුණේ කැළල දෙස බලමින්. "ඔය තියෙන්නේ පරණ තුවාල කැළලක් නේද?"

"ඇයි?" ඔහු කිව්වේ මා දිහා සැකයෙන් වගේ බලමින්. "ඉතින් මං කොහොමද වාසනාවන්තයෙක් වෙන්නෙ? කියනවා බලන්න ඒක"

"මහේට ඔය කැළල නිසා, හොඳ මුදලක් හම්බකරගන්න පුළුවන්" මං කිව්වා. "ලන්ඩන් නගරයේ ඉන්නවා මං අඳුනන වෛද්‍ය විශේෂඥයෙක්. ඒ තමයි මහාචාර්ය ජෝන් වොට්සන්!" කී මගේ මිත්‍රයා නොනවත්වාම සිනාසෙන්නට පටන්ගත්තේය. මගේ මුහුණ ලැජ්ජාවෙන් රතුවිය.

"ඔබ මාව විහිළුවකට අරගෙන හෝම්ස්........" මම කණගාටුවෙන් කීවෙමි. "මහාචාර්ය නනතුරක් ලබාගන්න තරම් ඉහළට වෛද්‍ය විද්‍යාව ඉගෙනගන්න, මං දක්ෂයෙක් වුණේ නැතිබව ඇත්තයි........"

"ඔබේ හිත රිදුණා නම් මට සමාවෙන්න වොට්සන්" ඔහු කීය. "ඔබව උපහාසයට ලක්කරන්න මං අදහස් කළේ නෑ. මගෙ කතාවෙ ඉතිරි හරියටත් කන්දීල බලන්න. මං මෙහෙම කිව්වා.

මහාචාර්ය වොට්සන් ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ අංශ එකේ විද්වතෙක්. වෛද්‍ය ශිෂ්‍යයන්ට පොතක් ලිවීම සඳහා, ඔහු සෑහෙන කාලෙක සිට, තුවාල කැළැල් ගැන විශේෂ අධ්‍යයනයක් කරනවා. දුර්ලභ ආකාරයේ තුවාල කැළැල් සොයාගැනීමට, ඔහුට තියෙන්නේ පුදුමාකාර උනන්දුවක්. මේ කැළල දුටුගමන් ඔහු ඔබට, පවුම් දහයක් ගෙවාවි"



www.sinhalaelibrary.com

"මොනවා පවුම් දහයක්?" ඔහු ඇසුවා.

"ඔබට කරන්න තියෙන්නේ ලන්ඩන් නගරයේ බේකර් වීදියට ගිහිං, මහාචාර්ය වොට්සන් හමුවෙලා, මේ තුවාල කැළල පෙන්වා, එය ඇතිවුණු ආකාරය ඔහුට විස්තර කිරීම පමණයි. ඔහු පදිංචි බේකර් වීදියේ අංක 221B දරන ස්ථානයේ. මං කියන දේ විශ්වාස නැද්ද?"

"තමුසෙ ඔය හදන්නේ මාව රවට්ටලා ගණනක් වංචා කරගන්නද?" ඔහු ඇසුවා. "එහෙම නම් ඒව හරියන්නෙ නෑ මිත්‍රයා"

"තමුසෙට පිස්සුද?" මං ඇහුවා. "මට තමුසෙගෙන් නම් කාසියක්වත් එපා. එච්චර විතරක් නෙමෙයි. මං තමුසෙට ගමන්ගාස්තු හැටියට පවුම් බාගයක් දෙනවා. මහාචාර්ය වොට්සන් මට නියමකරල තියෙන්නේ එහෙමයි. එයා ඒ මුදල මට ආපහු ගෙවනවා විතරක් නෙමෙයි. තමුසෙව හොයලා එව්වට මටත් පවුම් දෙකක් දෙනවා. ඒ නිසා මහාචාර්යතුමාට මගේ නම කියන්න අමතක කරන්න එපා"

"කවදා කොයි වෙලාවෙද එයාව හමුවෙන්න පුළුවන්?" ඔහු ඇසුවා.

"අද සවස ගියත් පුළුවනි." මං කිව්වා. "හැන්දෑවෙ හතර වෙද්දී යන්න. ඒ වෙලාව වෙනකොට මහාචාර්යතුමා විශ්වවිද්‍යාලෙ ඉඳන් ආපහු ඇවිත් ඉඳීවි. මගේ නම ජේම්ස් බුවර්. කියන්න මෙයි එව්වා කිව්වෙ කියල. මෙන්න ඔයාගේ ගමන්ගාස්තුව පවුම් බාගයක්."

"හෝම්ස් ඔබ හිතන්නේ ඔහු මෙහේ ඒවි කියලද?" මම ඇසීමි.

"කිසිම සැකයක් නෑ. ඔහු ඒවි." හෝම්ස් කීය. "පවුම් දහයක් කියන්නේ දුප්පත් මිනිහෙකුට ලොකු මුදලක්. කොයි මිනිහට ද මේ කාලෙ අතඇරිට තියානැත්තේ? ඒ නිසා නොවැරදීම අද හවස හතරට ඔහු ඒවි"

"ඔහු මෙහේ ආවම මොනවද මට කරන්න තියෙන්නේ?" මා ඇසුවේ සිතේ කැලඹීමෙනි.

"ඔහු එන වෙලාවට, මං මගේ කාමරය ඇතුළේ හැංගිලා ඉන්නේ" හෝම්ස් කීය. "ඔහු ඇතුළට ආව වහාම අපේ විසිත්ත කාමරයේ දොර, පිටතින් අගුළු දමන්න කියා, මං අපේ සේවක ළමයාට කිව්වා. ඔහු මුදල් ගැන ඇසුවොත්, වහාම ඔහුගේ අතට පවුම් දහය දෙන්න. මෙන්න ඒ මුදල වොට්සන්. ඔබට තියෙන්නේ





ඔහුගේ මුහුණේ කැළල පරීක්ෂා කිරීමට ටික වෙලාවක් ගතකිරීම පමණයි. ඔහුගේ නම අහන්නවත් එපා. එච්චරයි"

සවස හතරට ලංවෙද්දී හෝම්ස් තම කාමරයට වැදුණේය. අපේ අමුත්තා පිළිගැනීමට සූදානමෙන්, මම හැඳපැළඳ ගත්තෙමි. හරියටම සවස හතර වෙද්දී ගෙදර සීනුව නාදකරන ශබ්දය ඇසිණ.

අපේ සේවක ළමයා දොර විවෘත කළේය. අමුත්තෙකු යමක් විමසන අයුරුත්, එයට ලැබුණු පිළිතුරු සමග ඔහු නිවස තුළට පිවිසුණු හඬත්, තරප්පු පෙළ දිගේ උඩුමහලට නැගුණු ශබ්දයත් අසන්නට ලැබිණ. මීළඟට ඔහු අපේ විසිත්ත කාමරයේ දොරට තට්ටු කරද්දී, මම එය විවෘත කළෙමි. "මහාචාර්ය ජෝන් වොට්සන් ඉන්නෙ මේ ගෙදරද?" අමුත්තා විමසුවේය.

දුඹුරු පැහැති කොට්ටෝරුයි රෙද්දෙන් මැසූ තිස්වැස්මක් පැළඳ සිටි ඔහු, එය ඉවත්කිරීමට තැත් නොකෙළේය.

"ඔව්, මං තමයි මහාචාර්ය වොට්සන්. මොනවද මගෙන් කෙරෙන්න ඕන?" මා විමසද්දී අපේ සේවකයා දොර පිටතින් අගුළු දමන ශබ්දය මට ඇසිණි.

"මහත්මයා" ඔහු කීය. "අද උදේ බ්‍රිස්ටල් නගරයේදී මට හමුවුණා ජේම්ස් බුවර් කියල මිනිහෙක්. ඔහු කිව්වා ඔබතුමා, මුහුණේ තියෙන තුවාල කැළැල් ගැන පර්යේෂණ කරනවා කියල.........."

"හරි හරි! ඒක හරි!" මම කීවෙමි. "මං තුවාල කැළැල් ගැන විශේෂ අධ්‍යයනයක යෙදෙනවා තේන්නම්" මා ගොතගසමින් කීවේ හෝම්ස්ගේ නියමය පරිදි මා කටපාඩම් කරගත් වාක්‍යයයි.

"මට ඉස්සරවෙලා දැනගන්න ඕන එක කාරණයක්" අමුත්තා කීය. "ඒ මිනිහා මට කිව්වෙ මාව පරීක්ෂා කරල බලනවා විතරයි; මට පවුම් දහයක් ගෙවනවා කියලා. ඒක ඇත්තද?"

"ඒක සම්පූර්ණ ඇත්ත" මම කීවෙමි. "මට උවමනා කරන්නේ ඔබේ තුවාල කැළල පරීක්ෂා කරල, එහි සටහනක් ඇඳගෙන විස්තර ටිකක් දැනගැනීම පමණයි. මෙහෙන් වාඩිවෙන්න මහත්මයා" මම පුටුවක් දෙසට සංඥා කළෙමි.

"ඉස්සර වෙලාම මං මුදල් ගෙවනවා" මම කීවෙමි. "මේ පවුම් දහය ඔබේ අතට අරගෙන හිටින්න. අන්න හරි. දැන් ඔබේ හිස්වැස්ම ඉවත්කරලා, මුහුණ ටිකක් මේ පැත්තට හරවන්න. ඔය වැඩේට මිනිත්තු දහයක් ගතවෙන්නෙ නෑ"



www.sinhalaelibrary.com

"හරි. තවත් එක කොන්දේසියක් තියෙනවා." අමුත්තා කීවේ මුදල්, තම ඇතුළු කබායේ සාක්කුවට දමාගන්නා අතරේදී ය. "මගේ මුහුණේ ඡායාරූප ගන්නා වැඩ නම් මෙතුන් බෑ"

"වා ඡායාරූපයකුත් ගන්න තිබුණා නම් තමයි හොඳ" මම කීවෙමි. "මං ඒකට අමතර මුදලක් ගෙවන්නම්!"

"බෑ! බෑ!" ඔහු කීය. "කීයක් ගෙව්වත් ඒකට නම් මං කැමති නෑ. ඔහේලා ඒව පොත්පත් වල දැම්මාම, මිනිස්සු මට හිනාවෙන්න ගනීවි. ඡායාරූප නම් ගන්න එපා"

"හරි හරි. ඔබ කැමති නැත්නම්, මං ඡායාරූප ගන්නෙ නෑ. මෙහෙන් වාඩිවෙන්න. මට මුලින්ම කියන්න, මේ කැළල ඇතිවුණේ කොහොම ද කියල"

ඔහුගේ මුහුණ ඉතා කඩවසම් එකක් බැව් මම දුටුවෙමි. හිරා හොටක් වැනි නාසයත් සහ පුළුල් නළල් තලයත් නිසා, එහි තිබුණේ බුද්ධිමත් මෙන්ම තේජාන්විත පෙනුමකි. උවමනාවෙන්ම බලන්නෙකුට, වම්පැත්තේ කම්මුල මත තිබූ, 'C' අකුර හැඩයේ කැළල පැහැදිලිවම දිස්විය. එහෙත් ඔහුගේ කඩවසම් පෙනුමට එයින් හානියක් නොවිණි. අමුත්තාගේ පැහැදිලි නිල්පැහැති දෙනෙත් නිසා මට සිතුණේ, ඔහු අවංක, එමෙන්ම අවිහිංසක පුද්ගලයෙකු බවය.

කැළල ඇතිවූ ආකාරය විස්තර කිරීමට, ඔහු මිනිත්තු කිහිපයක් ගතකළේය. හෝම්ස් මට දී තිබූ උපදෙස් අනුව, ඔහුගේ උත්තල කාචය ද යොදාගෙන, මම කැළල පරීක්ෂා කර බැලුවෙමි. එම ප්‍රදේශයේ රැවුල නොවැවුණු නිසා, ඔහුට එය ආවරණය කරගතහැකි ආකාරයක් නොතිබුණු බැව්, මට පෙනී ගියේය.

මගේ මිත්‍රයා එක් ක්ෂණයකින් විසිත්ත කාමරය තුළට කඩා වැදුණේ, මා ද මවිතයට පත්කරමිනි. කලබල වූ අමුත්තාට අසුනෙන් නැගිටීමට වත් කාලයක් නොවීය. මීළඟට හෝම්ස් අමුත්තාගේ උරහිස මතින් තම අත තැබුවේ, අමුත්තා සන්සුන් කිරීමට ය.

"මහත්මයා. මං ඔබ අඳුනනවා" හෝම්ස් කීය. "ඔබ නේද තෝමස් රොබට්? මිතුරන් ඔබව හඳුන්වන්නේ ටොම් කියල. එහෙම නේද?"

"මං කවුරු වුණත් ඔහේට මොකද?" අමුත්තා ඇසුවේ කැලැඹුණු කටහඬකිනි. "ඔහේ කවුද? මොකක්ද මේ වැඩේ තේරුම?" අමුත්තා අන්තිම ප්‍රශ්නය එල්ල කළේ මටයි.





"මහත්මයා කලබල වෙන්න එපා" හෝම්ස් කීවේ කාරුණික හඬෙකිනි. "අර "වයිට් ස්ටා" නැව් සමාගමට අයත් "සොෆී ඇන්ඩසන්" නෞකාවේ යාත්‍රා කළ ටොම් රොබට් ඔබ නේද?"

අමුත්තාගේ මුහුණ සුදුමැලි විය. ඔහු ක්ලාන්ත වී පුටුවෙන් බිමට ඇද වැටෙතැයි මට සිතිණි.

"ඔහේ කවුද? වංචාවෙන් මාව රවටලා, මෙහාට අරගෙන ආවෙ ඔව අහන්නද?" අමුත්තා කෝපයෙන් කෑගැසුවේ අසුනෙන් නැගිටිමිනි.

"මම තමයි ෂර්ලොක් හෝම්ස්" මගේ මිත්‍රයා කීවේ අමුත්තාට අසුනෙන් හිඳගන්නා ලෙසට සංඥා කරමිනි. "රොබට් මහත්මයා. ඔබ අසරණ වුණු කෙනෙක් බව මං දන්නවා. ලිවර්පූල් සිට වැල්පරයිසෝ බලා යාත්‍රා කළ "සොෆී ඇන්ඩසන්" නෞකාවේ, කාර්යමණ්ඩලයේ ඔබ සේවය කළා. ඒ දොළොස්දෙනාගෙන් ඔබ එක් කෙනෙක්. ඒ වුණත් නෞකාව සාගරය මැදදී මුහුදුබත් වෙද්දී, ඔබ කොහොමද ජීවිතය ගලවා ගත්තේ? අන්න ඒ හරිය මම දන්නෙ නෑ. කාරුණිකරල මට ඒ තොරතුරු සම්පූර්ණයෙන්ම කියන්න."

"මගේ පෞද්ගලික කාරණා ඔහේලාට හෙළිකරන්න, මට කිසිම උවමනාවක් නෑ" අමුත්තා කීය. "ඒවා නාඳුනන මිනිස්සුන්ට හෙළිකරන්න කියලා නීතියක් කොහේවත් නෑ............"

"රොබට් මහත්මයා. ඒවා තවදුරටත් පෞද්ගලික කාරණා නොවෙයි." හෝම්ස් කීය. "ඔබ ගිය නෞකාව මුහුද මැදදී අතුරුදන් වුණු ආකාරය, මෙතෙක් කල් තිබුණේ අබිරහසක් හැටියට. නමුත් දැන් කාරණා එකින් එක හෙළිවෙන්න, පටන් අරගෙනයි තියෙන්නේ. නැවේ කාර්යමණ්ඩලයට බඳවාගත්තේ අවිවාහකයන්. ඒ වුණාට, එයින් එක් කෙනෙක් හොර රහසේම විවාහ වුණු බව ඔබ දන්නවා. ඒ බිලී විලර්. ඔහුගේ බිරිඳ සහ කුඩා දරුවෙක්, ඔය සිද්ධියෙන් අනාථ වුණා.

නෞකා ගමනාගමනය පිළිබඳ ආඥාපනත සහ සාගර නීතිය, ඔබ විස්තර සහිතව දන්නවාද? මං හිතන්නේ නෑ. ඒ ආඥාපනතේ වගන්ති හැම එකක් ගැනම, ඔබට තේරුමක් ඇති කියල. ඒ ගැන මං ඔබට දොස් කියන්නේ නෑ. ඒ නීතියට අනුව, මුහුද මැදදී තමන් ඇසින් දුටු අනතුරක් පිළිබඳව, වගකිව යුත්තන්ට දැනුම් නොදීම බරපතළ වරදක්. දියේ ගිලෙන යාත්‍රාවක හෝ මුහුදේ පාවෙන



www.sinhalaelibrary.com

ජීවිතාරක්ෂක බෝට්ටුවක, අසරණව සිටින මිනිසුන් බේරා නොගැනීම වරදක්. මුහුදේදී කෙනෙකු මරණයට පත්වූ බව දැන දැනම, නොකියා සිටීම වරදක්. මේ චෝදනා කොයි මොහොතේ හෝ ඇදී එන්න ඉඩ තියෙනවා. ඊට කලින් හැමදෙයක්ම හෙළි කරල ඔබ බේරී සිටීම වැදගත් වේවි. එහෙම නේද?"

හෝම්ස් ඉදිරිපත් කළ කාරණා වටහාගත් අමුත්තා, දෑතින් මුහුණ වසාගෙන, හිස ඉදිරියට පහත් කරගත්තේය. තමා මුහුණ දී ඇති තත්ත්වයේ බරපතළ බව, ඔහුට ද වැටහෙන්නට ඇතුවා නොඅනුමානය.

"කෝබට් මහත්මයා" හෝම්ස් කීය. "ඔබ කිසිම අපරාධයක් නොකළ පුද්ගලයෙකු බව මට විශ්වාසයි. නමුත් ඔබ නිහඬව සිටින්නේ, එවැනි දෙයක් කළ පුද්ගලයෙකු වෙනුවෙන්. අපරාධය හෙළිවෙද්දී, ඔබත් ඔහු සමග වරද කරුවෙකු වී, ජීවිත කාලයක් වන්දි ගෙවනවාද? නැත්නම් සිදු වූ සියල්ල දැන් හෙළිකර, ඔබේ හද සාක්ෂියෙනුත් නිදහස් වී, දඬුවම් වලිනුත් නිදහස් වෙනවාද? සියල්ල තීරණය කිරීම තියෙන්නේ ඔබ අතේ"

මුහුණ බිමට යොමුකරගෙන සිටි අමුත්තාට, බිමට යමක් දෙන මෙන්, හෝම්ස් මට සංඥා කළේය. මම බ්‍රැන්ඩි බෝතලය හා වීදුරුව රැගෙන විත්, එය පිරෙන්නට බ්‍රැන්ඩි පුරවා අමුත්තා අතට දුන්නෙමි. එයින් උගුරක් පානය කළ ඔහු හෝම්ස් ඇමතුවේය.

"මහත්මයා" කෝබට් කීය. "ඔබ හිතාගෙන ඉන්නේ අපරාධකාරයා මේ මම කියලද? එහෙම නම් ඔබට වෙලා තියෙන්නේ ලොකු වැරැද්දක්. මං කිසිම දේකට සම්බන්ධ නොවුණු අහිංසකයෙක්."

"ඔබ කියන දේ මං විශ්වාස කරනවා කෝබට් මහත්මයා." හෝම්ස් කීය. "නමුත් කරුණු හෙළි නොකර ඇත්ත සඟවාගෙන හිටියොත්, නොකළ වරදකට ඔබත් පටලැවෙනවා"

"මේක කවදාහරි හෙළිවෙන බව මං දැන හිටියා" අමුත්තා කීවේ හිස්කළ වීදුරුව මේසය උඩින් තබමිනි. "ඔව් මං තෝමස් කෝබට් තමයි. යහළුවන්ට ටොම් කෝබට්. ඔබ මේ හැමදෙයක්ම දැනගත්තේ කොහොමද කියල, මට හිතාගන්නවත් බෑ. නමුත් ඒක ඇත්තයි. වෙනත් කෙනෙකු කළ අපරාධයක් වසන් කරගෙන ඉඳලා, මං මොකටද දඬුවම් විඳින්නේ? ඔවුන් මගේ ඥාතීන්වත් යහළුවන්වත් නෙමෙයි. මහත්මයා. මං ඔබට හැමදෙයක්ම කියන්නම්. ඒක මගේ හිතටත් හොඳයි.





"සෝෆි ඇන්ඩසන්" නෞකාව, තුඹගස් හතරේ ලොකු නැවක්. මේකෙ අයිතිකරුවන් වුණේ "බ්‍රයිට් ස්ටා" නැව් සමාගම. ඔවුන්ගේ ප්‍රධාන කාර්යාලය හා නැව්තොට තිබුණේ, ග්ලාස්ගෝ නගරයේ. සමාගමේ සම අයිතිකරුවන් වුණේ සහෝදරයන් දෙදෙනෙක්. ඒ ජැමී සහ ඩන්කන් මැක්නීල්. නැවේ කපිතාන් තනතුර දැරූ ජෝසෆ් ෂෙෆර්, මැක්නීල්ලගේ ඥාතියෙක්.

ගල්අඟුරු යොදාගන්නා, වාෂ්ප නැව් ක්‍රමය එන්න පටන්ගත්තට පස්සෙ, ඒවා එක්ක තරග කිරීම රුවල් නැව්වලට අමාරුවුණා. මේ හේතුව නිසා "බ්‍රයිට් ස්ටා" නැව් සමාගම බංකොළොත් වෙන්නගිය බවයි අපට ආරංචි වුණේ. කොහොම හරි, මැක්නීල් සොහොයුරන්, ග්ලාස්ගෝ නුවර බැංකුවලට විශාල ලෙස ණයවී තිබුණු බව නම් ඇත්තයි. ඒ කාරණාව නිසා මෙවැනි කූට සැලැස්මක් ක්‍රියාත්මක කරන්න කටයුතු සූදානම් වෙමින් තිබුණා. මොකක්ද ඒ කටයුත්ත?

'සෝෆි ඇන්ඩසන්' නැව ලිවර්පූල් සිට වැල්පරයිසෝ ගිහින්, නැව පිරෙන්නම වෙඩිලුණු පටවාගන්නවා. නමුත් මගීන් කිසි කෙනෙක් බාරගන්නේ නැහැ. ඔවුන් මේ කටයුත්ත සැලසුම් කරලා තිබුණේ මාස ගණනකට කලින්. නැවේ කාර්යමණ්ඩලය ගැන ඔවුන් සූක්ෂම ලෙස සොඳිසිකරලා තිබුණා. නැව වැල්පරයිසෝ බලා පිටත්වෙන්න කලින්, කටවහගෙන ඉන්න බැරි අය කියල, ඔවුනට හිතුණු කිහිප දෙනෙකු, මේ නැවේ රස්සාවෙන් ඉවත්කරල වෙනත් නැව් වලට දැම්මා. අර පුරප්පාඩු වලට, අලුතෙන් බඳවාගත් කිහිපදෙනෙකු දැම්මා. ඔබට තේරෙනවා නේද?

නැව් සමාගම අයිතිකරුවන්ගේ සැලැස්ම වුණේ, නැව මුහුදුබත් වුණා ය කියලා ප්‍රචාරයක් කරලා, ඒකට ලැබෙන ලක්ෂ ගණනක රක්ෂණ මුදල ලබාගැනීම. මෙයින් කොටසක්, අනතුරෙන් "මියගියා" කියන කාර්ය මණ්ඩලය අතරේ බෙදා දෙනවා. ඒ මුදල වෙනුවෙන් සේවකයන් තමන්ගේ නමත්, පෙනුමත් වෙනස් කරගෙන, අලුත්ම තැනක පදිංචියට ගිහිං අලුත් ජීවිත ඇරඹිය යුතුයි. මෙන්න මේ හේතුව නිසා, නැව් සමාගම තෝරාගත්තේ අවිවාහක, නැත්නම් පවුල් සම්බන්ධකම් නොතිබුණු සේවකයන්.

මගේ බිරිඳ මියගිහින් අවුරුදු ගණනක් ගතවුණා. මට හිටි එකම පුතා මියගියේ ඔහුට වයස අවුරුදු දොළහේදී. ඒ නිසා මං ගමන් කළ නැව මුහුදුබත් වෙලා, මං ජීවිතක්ෂයට පත්වුණා කිව්වොත්,



www.sinhalaelibrary.com

අඩන්න කවුරුවත් මේ ලෝකෙ හිටියෙ නෑ. 'සෝෆී ඇන්ඩසන්' නැව පිටත්වෙන්න කලින්දා, මේ ගැන ඔවුන් ඉඟියක් කළා. ඒක කිව්වේ මෙහෙමයි. මේ නැව බොහොම අබලන් නිසා, දකුණු ඇමරිකාවේ රටක නැව් සමාගමකට, හැකිවුණොත් නැව විකුණගන්න බලාපොරොත්තු වෙනවා. එහෙම වුණොත් කාර්ය මණ්ඩලයට සෑහෙන කාලයකට, ආපහු එංගලන්තයට එන්න ලැබෙන එකක් නැහැ; ඒකට වන්දියක් ලෙස විශාල මුදලක් ලැබේවි. ඒකට අකමැති කවුරු හරි ඉන්නවා නම්, වහාම නැවේ රැකියාවෙන් ඉවත්වෙන්න කිව්වා. කවුරුවත් මේ ගැන බරපතලව හිතුවෙ නෑ. නැවේ රැකියාවෙන් ඉවත්වුණෙත් නෑ. මට නම් මේ ගැන දෙපාරක් හිතන්න උවමනාවක් තිබුණේ නෑ.

ගමන පිටත්වෙලා යද්දියි, සිදුවෙන්න යන දෙය ගැන අපට හරි දැනුමක් ලැබුණේ. නමුත් මට ඒක ප්‍රශ්නයක් වුණේ නැහැ. රක්ෂණ වන්දි මුදලෙන් මට ලැබෙන කොටස අරගෙන, කෝන්වෝල් පැත්තට ගිහිං, පුංචි ඉඩම් කෑල්ලක් මිලටගෙන මොනවා හරි වවන්න මගේ හිතේ තිබුණා.

මැක්නීල් සහෝදරයන් ඇත්ත වශයෙන්ම කරන්න බලාපොරොත්තුවුණේ මොකක්ද? 'සෝෆී ඇන්ඩසන්' නැව මුහුදුබත් වුණා කියල ප්‍රකාශයට පත්කරන ගමන්, එය පාළු දූපතකට අරගෙන යනවා. ඒ ගිහිං, නැවේ බාහිර පෙනුම සම්පූර්ණයෙන්ම වෙනස් කරනවා. ඊළඟට එය "හෙන්රියටා" නම් අලුත් නැවක් විදියට ලියාපදිංචි කරන්න, ඔවුන් බලාපොරොත්තු වුණා. එතකොට නැව යාත්‍රා කරන්නේ, ලිවර්පූල් හා වැල්පරයිසෝ අතර නෙමෙයි. ඩන්ඩී හා හල් වරාය වලින් ඈත පෙරදිගට. ඒ ක්‍රමයෙන් ඔවුනට, නැව ගමනාගමනයෙන් මුදල් උපයාගන්නත් පුළුවනි. සේවකයන්ට වැටුපත් ලැබෙනවා. වෙඩිලුණු ප්‍රවාහණය කරන නැව් රක්ෂණය කෙරෙන්නේ, ඉතා ඉහළ මුදලකට. ගමන්බඩු වල වටිනාකමත් එකතුවුණාම, එය පවුම් ලක්ෂගණනක මුදලක් වේවි කියලයි කතාව තිබුණේ. ඒක අවුරුදු දෙකක් තිස්සේ සත්සමුදුරේ ඉහළ පහළ යාත්‍රා කරලා, නැවකට හොයාගන්න පුළුවන් මුදලටත් වැඩියි.

අපි ලිවර්පූල් සිට වැල්පරයිසෝ දක්වා ගිය ගමන, ප්‍රමාදයක් හෝ කරදරයක් නැතිව සිදුවුණා. ඊළඟට මං කලින් කිව්වා වගේ, වැල්පරයිසෝ වලින් වෙඩිලුණු පටවාගෙන, අපි ආපහු එන්න පිටත් වුණා. ඒ මගීන් කවුරුවත් නොමැතිව. අපි එහෙන් පිටත් වුණු





දිනය '86 ජනවාරි 17 වැනිදා. අපේ ගමනට උදව් වෙන විදියට, මුහුදු සුළං දිගටම ලැබුණා. සැලැස්මේ හැටියට නියමව තිබුණේ එංගලන්තයට ළංවුණාම, නැව ලිවර්පූල් වෙත ගෙනයාමෙන් නැතිව, තවත් උතුරට යාත්‍රා කරන්න. දවස් 128 ක් ගතවෙද්දී, ඒ කියන්නේ, '86 මැයි අන්තිමේදී අපි ළඟාවුණා, ඩන්ක්‍රේග් නම් ඉතා කුඩා දූපතට. මේක මිනිස් වාසයක් නැති ඉතා කුඩා දූපතක්. එය පිහිටා තිබෙන්නේ පිටත හෙබ්‍රිඩීස් දූපත් වලට තිරිත දිගින්. කලින් මුහුදු ගමනකදී, කුණාටුවකින් බේරෙන්න, එතැන රැඳී සිටීම නිසා, කපිතාන් ඇෆ් ඇතුළු අනෙක් අය, මේ දූපත ගැන හොඳින් දැනසිටියා.

මේක උස් ගල්කඳුවලින් සැදුණු දූපතක්. මෙහෙ බටහිර වෙරළ තීරයම, ඉතාම අනතුරුදායක ගල්පර සහිත එකක්. උතුරු අත්ලාන්තික් සාගරයේ එන ප්‍රචණ්ඩ මුහුදු රැල්ල නිසා, වෙරළට ළංවීම, වඩාත් භයානක වුණා. ඊට අමතරව වේගයෙන් ගලාගිය දියවැල් තිබුණා. මේ හේතුන් නිසා, නාවික ශාස්ත්‍රය හරිහැටි දන්නා නැව් කපිතාන් වරයෙක්, ඩන්ක්‍රේග් දූපත පැත්ත පළාතට ළංවුණේ නැහැ. නමුත් වෙරළ තීරයේ පිහිටීම හොඳින් දන්නා, හිතේ ධෛර්යය හා උවමනාව තියෙන කෙනෙකුට, කුඩා නැවක් යාත්‍රා කරගෙන යන්න පුළුවන් දොරටු වෙරළ තීරයේ තියෙනවා. දොරටු කියන එකෙන් මං අදහස් කළේ, රෞද්‍ර කළුගල් තීරය, ස්වාභාවිකව නොපිහිටි තැන්. නැවක් වඩදිය සමග මෙවැනි මෝයකින් ඇතුළට ගියාම, අනික් යාත්‍රාවලට නොපෙනී හැංගී සිටින්න පුළුවන් තැන් තිබුණා. මං ඔබට කලින් කිවූ උස් ගල්පර්වත නිසා, ඒ කළපු වැනි ස්වාභාවික වරායවල්, හොඳින් ආවරණය වුණා. ඒ වගේ තැනකට නැව ගෙනිහිං නැංගුරම් දැම්මොත්, කාටවත් නොපෙනී, සති ගණනක් වුණත් ගතකරන්න පුළුවනි. කපිතාන් ඇෆ්ට පළපුරුද්ද, ධෛර්යය හා නිර්භීතකම අඩුවක් නැතිව තිබුණා. ඉතින් අපි "සෝෆී ඇන්ඩසන්" නැව මෝයකටකින් දූපත ඇතුළට අරගෙන, පිටත ලෝකයට නොපෙනෙන්න හංගාගත්තා.

වැල්පරයිසෝ වලින් නැවට වෙඩිලුණු පටවන අතරේ, තවත් දේවල් පටවාගන්න අපි අමතක කළේ නෑ. ඒ නෞකාවලට ආලේප කරන තීන්ත අඩංගු පීප්ප, ලෑලි සහ විශාල ලී කොට ආදිය. ඩන්ක්‍රේග් දූපතේ නැංගුරම් දැම්මට පස්සේ, කාර්ය මණ්ඩලයේ හැමෝම වැඩට බැස්සා. නැවේ වඩුබාස්වරයා වුණු



www.sinhalaelibrary.com

මොරිසන්ගේ උපදෙස් යටතේ, අපි නැවේ පෙනුම වෙනස් කළා. නැවේ තිබුණු පරණ අළුපාට වෙනුවට, අපි නැවම දීප්තිමත් නිල් පාටින් පින්තාරු කරලා, බඳ වටේට සුදු පටියකුත් ඇන්දා. ඊට අමතරව නැව්තට්ටුව මුදුනේ තිබූ පාලක මැදිරිය ගලවා ඉවත් කරලා, අලුත්ම හැඩයක පාලක මැදිරියක් හදලා, ඒකට සුදුපාට තීන්ත ආලේප කළා. නැවේ බඳ වටේ ඇන්ද සුදුපාට පටියේ, "හෙන්රියටා" කියන නම පින්තාරු කළා.

තීන්ත වේළිලා මේ ඔක්කොම අවසන් කළාම, අපි කාටත් දැනුණේ ලොකු සතුටක්. කපිතාන් මැෆර් අපි හැමදෙනාටම එන්න කියලා, නැව්තට්ටුව උඩ රැස්වීමක් පැවැත්තුවා. "හෙන්රියටා" නැවට අප හැමදෙනාම සාදරයෙන් පිළිගන්නා බව කියූ ඔහු, ඉදිරිගමන් වලදී වේගයෙන් සහ ආරක්ෂා සහිතව යාත්‍රා කරන්න, දෙවියන් වහන්සේගේ ආශිර්වාදය පැතුවා. ඊට පස්සේ ෂැම්පේන් බෝතල් විවෘත කරලා, පුංචි උත්සවයකුත් පැවැත්තුවා. මීළඟට නැවේ හැමදෙනෙකුම වෙන වෙනම කැඳවා, ඔවුනට අලුත් නම් සහිත අලුත් පත්වීම් ලියවිලි ලබාදුන්නා. කලින් තිබූ පත්වීම් ලියවිලි, ගමන් සටහන් ආදිය, නැව්තට්ටුව උඩදීම පරණ යකඩ තාච්චියක පුළුස්සා දැම්මා.

අපි කාටත් බොන්න ඇති තරම් රම් ලැබුණා. මේ කාලයේදී කවුරුත් එකිනෙකා ළඟට ගිහිං කතාබස් කළේ, අලුත් නම්වලට හුරුපුරුදු වෙන්න. කපිතාන්ට ලැබුණු අලුත් නම, මයිකල් ලොෆ්ට්හවුස්. මට ලැබුණේ ජෝසෆ් නලී කියන නම. නමුත් මට ජීවිත කාලයක් හුරුපුරුදු තෝමස් හෝවඩ් කියන නම වගේ, ඒ අලුත් නම මොළේට වැදුණේ නැහැ.

කොහොම වුණත් නම්ගම් වෙනස් කරලා, පරණ ලියකියවිලි පුළුස්සා දැම්මාට පස්සේ, හැමදෙයක්ම තීන්දුවී අවසන් බව අපට වැටහුණා. ආපහු පරණ මනුස්සයා විදියට, සමාජය ඉදිරියට එන්න කිසිම ක්‍රමයක් තිබුණේ නැහැ. හුඟක් දෙනෙකුට මේක ප්‍රශ්නයක් වුණේ නැහැ. නමුත් මගේ තරුණ මිත්‍රයා බිලී වීලර් නම්, මෙකෙන් ඔළුව අවුල් කරගත්තා. නැවේ සේවයට අලුතෙන් බඳවාගත්තේ අවිවාහකයන්. අවුරුදු දෙකකට විවාහ නොවෙන බවට කොන්දේසියකට අත්සන් කරන්නත් අපට සිදුවී තිබුණා. නමුත් බිලී ඔහුගේ පෙම්වතිය සමග හොර රහසේම විවාහ වූ බව මං දැනහිටියා. මං ඒක රහසක් ලෙස ආරක්ෂා කළා. අප





එංගලන්තයෙන් පිටත්වෙලා එද්දී, ඔහුගේ බිරිඳ දරුවෙකු බලාපොරොත්තුවෙන් සිටි බව, ඔහු මට කිව්වේ රහසින්. බිලීට තිබුණේ මේ හැමදෙයක්ම, නිශ්ශබ්දව විඳ දරාගෙන ඉන්නයි. ටික කාලයක් ගතවෙද්දී, අලුත් අලුත් දේවලට වලට හැඩගැහෙන එක ඉබේම සිදුවෙනවා. කවදාවත් මුහුදු රස්සාවක් නොකළ ඔහුට, සාගරය මැද්දේ තනිකම, හුඟක්ම දැනෙන්න ඇති. තමන්ගේ ආදරණීය බිරිඳ සහ දරුවා ගැන මතක්වෙලා ඔහුට ඉවසා දරාගන්න බැරිවෙන්න ඇති. ඔහු හිතාගෙන හිටියේ මැයි අන්තිම වෙද්දී ඔවුන් ළඟට යන්න හැකිවෙනවා නේද කියලයි. නමුත් "සොෆී ඇන්ඩසන්" අතුරුදන් වෙලා, "හෙන්රියටා" උපන්නාම සැලසුම් ඔක්කොම වෙනස්වුණා. දෙවැනි තුන්වැනි දවස්වෙද්දී බිලී වීලර්ට පිස්සු නොවැටුණා විතරයි.

"හෙන්රියටා" නැවේ මීළඟ නැවතුම්පොළ වුණේ ලිවර්පූල් නෙමෙයි. අප ඕලන්දයේ රොටර්ඩෑම් වරාය වෙත යායුතු බවට නැව් සමාගමේ අයිතිකරුවන් දැනුම්දී තිබුණා. එදා රෑ බිලී වීලර් හොඳටම ඉක්මවා මත්පැන් පානය කළේ පිස්සුවෙන් වගේ. අන්තිමේදී ඔහු වෙරිමතින් කෑගහන්න පටන්ගත්තා.

"මට ආපහු ගෙදර යන්න ඕනෑ!" ඔහු බෙරිහන් දුන්නා. "රොටර්ඩෑම්වලදී මං වෙනිං නැවක නැගලා, ලිවර්පූල් වලට යනවා. රක්ෂණ මුදල් වලින් එක පැන්සයක්වත් මට එපා. ඔයගොල්ලට ඕන නම් මගේ කොටස අරගෙන, දමනවා මුහුදට! මට ඕන කරන්නේ ගෙදර යන්න!" ඔහු නොනවත්වාම කෑගහන්න පටන්ගත්තා.

මහත්මයා, ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැ, මෙකෙන් සිද්ධවුණේ වෙඩි බෙහෙත් පීප්පයකට ගිනි අඟුරක් දැම්මා වගේ වැඩක්. බිලී ඇරුණාම නැවේ අනෙක් කවුරුත් හිටියේ, පුදුමාකාර සතුටකින් හා උද්යෝගයකින්. කවුරුත් හීන මැව්වේ, රක්ෂණ සමාගම ගෙවන මුදල් සම්භාරයෙන්, අපට ලැබෙන කොටස අරගෙන, අලුත් ජීවිතයක් අරඹන්න. නාවිකයො හැටියට අපි කවුරුවත්, බැංකුවල මුදල් ඉතිරි කළ අය නෙමෙයි. අනෙක මේ නැව්වල රස්සාව වයසට යනකුරු කරන්න පුළුවන් එකකුත් නෙමෙයි. ඒ නිසා රක්ෂණ මුදල වංචාකරගෙන, ඒක බෙදාගැනීම කාටත් පෙනුණේ, හදිසියේ මතුවුණු රත්තරන් ඉල්ලමක් වගේ.



www.sinhalaelibrary.com

එහෙම ඉන්න වෙලාවේදී තරුණයා වෙරිමතින් කළ ප්‍රකාශයට, අනෙත් අය කෝපාවිෂ්ඨ වුණා. මේ වගේ කොන්ද පණ නැති එක මිනිහෙක්, මේ රහස හෙළිකළොත්, අපි හැමදෙනාටම යන්න වෙන්නෙ හිරගෙදරට. තරුණයාගේ කමිසයෙන් ඇදලා ගත්තු මොරිසන්, තරුණයාට කම්මුල් පහර දෙකක් දුන්නා.

"කාලකණ්ණියා. ඇයි උඹ මෙක කල් ඇතුව, අපට කිව්වෙ නැත්තෙ" මොරිසන් කිව්වා. "එහෙම නම් අපට තිබුණා උඹව එක්කරගෙන නොඑන්න. දවස් තුනක් යන්න කලින් මෙහෙම කියන උඹ ගැන, අපට විශ්වාසයක් තියන්න බෑ. තව මාසයක් යද්දී උඹ මොනවා කරාවිද කියාවිද අපි දන්නෙ නෑ. වහාම උඹේ අදහස වෙනස් කරගනිං. නැත්නම් උඹට මැරුම්කන්නයි වෙන්නේ"

"මං මගේ අදහස වෙනස්කර ගන්නේ නැහැ, නැහැ ම යි!" බිලී පිළිතුරු දුන්නා. "උඹල නමයි ගෙදරක් කියල තැනක් නැති කාලකණ්ණි. මගේ ගෑනි මං එනතුරු මඟ බලාගෙන ඉන්නවා. මං මගේ දරුවගේ මූණ බලන්න ගෙදර යන්න ඕන. උඹලට ලොකු සල්ලි. ඒ වුණාට ජීවිතය කියන්නේ සල්ලි නෙමෙයි. මෙහෙම දෙයක් කලින් දන්නවා නම්, මං මේ නැවේ එන්නෙත් නෑ"

නාවිකයන් කියන්නේ බොහොම දරුණු මිනිස්සු ජාතියක්. ඒක ප්‍රසිද්ධ කාරණාවක් නේ. කෘරෙ මුහුදු කොල්ලකාරයන් බවට පත්වෙන්නෙත් නාවිකයන්. මත්පැනින් සිහි විකල් වුණාම, උන් යක්ෂයින්ටත් අන්තයි. නැවේ හිටිය උන් වටවෙලා, අතට අහුවුණු දෙයින්, බිලී තරුණයාට පහර දෙන්නු පටන්ගත්තා. මේ පහරදෙන එක නවත්වන්න අපි උත්සාහ කළා. ඒකෙදී වුණේ අපටත් පහරකෑමට ලක්වෙන්න.

බිලී තරුණයාට විරුද්ධව එක අතක් උස්සන්න, මට හැකියාවක් තිබුණෙ නෑ මහත්මයා. මගේ මැරිච්ච පුතා වොම ජීවත්ව හිටියා නම්, උාත් මේ බිලීගේ වයසේ. අනෙක බිලීට තිබුණේත් මගේ මැරිච්ච පුතාගෙ වගේ, නිල්පාට ඇස් දෙකක් එක්ක ලස්සන මූහුණක්. ඒව මුල් දවසෙ ඉඳන් මගේ හිතේ බිලී ගැන ඇතිවුණේ, මගේ දරුවෙකුට වගේ ආදරයක්. තමන්ගේ බිරිඳ හා දරුවා දකින්න යන්න ඕන කියන මේ අසරණ තරුණයා, මරාදමන්න ඉඩ ඇරලා බලාගෙන ඉන්න, මට හැකියාවක් තිබුණේ නෑ. නැවේ කෝකියා ඇන්ඩ්‍රියස් නෙල්. ඔහුත් මගේ වයසෙ හිටි කරුණාවන්ත හිතක්





තිබුණු මනුස්සයෙක්. කපිතාන් ෆ්‍රැෆ්ව නැඳවාගෙන ඇවිත්, අපි තුන්දෙනාම මැදිහත් වෙලා, කෝපාවිෂ්ඨ මැරයන්ව පැත්තකට ඇදල දැම්මෙ බොහොම අමාරුවෙන්. ඒ වෙනකොට කොල්ලා නැව් තට්ටුව මත ඇදවැටිලා හිටියේ සිහියක් නැතිව. ඔහුගේ මූහුණ සහ හිස, ලෙයින් නැහැවී තිබුණා. කපිතාන් ෆ්‍රැෆ් ඒ ළඟ දණගසාගෙන බිලීගේ බෙල්ලට අත තියලා, හෘද ස්පන්දනය පරීක්ෂා කළා. අන්තිමේදී ඔහු නැගිට්ටේ සුසුමක් හෙළමින්.

"මේ අහපල්ලා" කපිතාන් කිව්වේ නැවේ මිනිසුන්ට "බිලී මැරිලා. නිකං මැරුණා නෙමෙයි; උඹල එකතුවෙලා ඌව මැරුවා. දැන් ඉතින් කරන්න දෙයක් නෑ. මිනිය මුහුදට විසිකරනවා ඇරෙන්න, අපට වෙන කරන්න දෙයක් ඉතිරිවෙලා නෑ!"

කපිතාන් ෆ්‍රැෆ් කී දෙය ඇහුණාම උන්ගේ වෙරි හිඳුණා.

"එහෙම දෙයක් කරන්න අපට උවමනාවක් තිබුණේ නෑ........" කිව්වත් කියන්න සූදානම් වුණා. ඔහුගේ ඇස් කඳුළෙන් පිරී තිබුණා.

"කට වහගනිං මෝඩ බූරුවා!" කපිතාන් කෑගැසුවේ කෝපයෙන්. "උඹලා කළ අපරාධයට, නිස්කාරණේ මාවත් පැටලෙනවා.......... දැන් ඉතින් පහළ ගබඩාවට ගිහිං, කැන්වස් රෙද්දකුයි, කඹයකුයි අරගෙන වරෙං."

නිව්ටන් ගබඩාකාමරයෙන්, ලොකු කැන්වස් රෙද්දක් හා කඹයක් අරගෙන ආවා. ඔවුන් සූදානම් වුණේ, මිනිය රෙද්දෙන් ඔතා මුහුදට විසිකරන්නයි. මං ඒ කටයුත්ත මොහොතකට නැවැත්තුවා.

ඒ වෙලාවෙ මට එහෙම හිතුණෙ ඇයි කියන්න, මං දන්නෙ නැහැ මහත්මයා. බිලී වීලර් කොයිවෙලෙත්, සිනාමුසු මූහුණෙන් හිටි, විහිළු තහළු කරමින් විනෝදයෙන් ජීවත්වුණු තරුණයෙක්. මගේ පුතා ජීවත්ව හිටියා නම්, උාත් ඒ වගේ වෙන්න ඉඩ තිබුණා කියල මගේ හිත කිව්වා. මේ කොල්ලාගේ මළසිරුර, බැටළුවෙකුගේ මළකුණක් වගේ, මුහුදට විසිකරන්න ඉඩදෙන්නේ කොහොමද?

මං මුලින්ම මුහුදු යන දවසේ මගේ අම්මා, රිදී දම්වැලක එල්ලූ රිදී වලින් හැදූ, සාන්ත ක්‍රිස්තෝපර් කුරුසියක් මගේ බෙල්ලට දැම්මා. ඒ, මුහුදු ගමන් වලදී මට වාසනාව හා ආරක්ෂාව ලැබෙන්න කියලා. මෙච්චර කාලයක් ඒ කුරුසියෙන් මට දෙවියන්



www.sinhalaelibrary.com

වහන්සේගේ බැල්ම ලැබුණා. බිලි විලර් වෙනුවෙන් මට කරන්න ඉතිරිවෙලා තිබුණේ එකම දෙයයි. මං ඒ දම්වැල මගේ බෙල්ලෙන් ගළවලා අරගෙන, බිලීගේ බෙල්ලේ ගැටගැහුවේ, කුරුසිය ඔහුගේ පපුව උඩට වැටෙන විදියට. කැන්වස් රෙද්දෙන් ඔතලා, කඹයෙන් ගැට ගැහුවේ ඊට පස්සේ......."

මේ මොහොතේ කථාව නැවැත්වූ ටොම් කෝබට්, ඉකිගසමින් හඬා වැලපෙන්නට පටන්ගත්තේය. මිනිත්තු කිහිපයක් හැඬූ ඔහු, දෙඅත්වලින් මුහුණ තෙරපාගෙන, හෝම්ස් දෙස බලාසිටියේය.

"......... දෙවියන් වහන්සේ මට සමාකරන සේක්වා! මහත්මයා, කොල්ලා ඒ වෙද්දී මියගිහින් හිටියෙ නෑ!"

"මොනවා? මියගිහින් හිටියෙ නෑ? ඔබට හොඳටම විශ්වාසද?" හෝම්ස් විමසීය.

"මට විශ්වාසයි මහත්මයා. මට විශ්වාසයි" කෝබට් කීය. "කුරුසිය ඔහුගේ පපුව උඩින් තියලා, මං ඒක අහකට නොයන්න, හදවත පැත්තට තද කළා. එතකොට බිලීගේ පපුවේ ගැස්ම මට දැනුණා. ඉතින් මං මොකද කළේ? කැන්වස් රෙද්දට අස්සෙන් අත දමලා, මගේ අත බිලීගේ හදවත කෙළින්ම තියලා තදකරගෙන, මිනිත්තුවක් දෙකක් හිටියා. අනිත්වුන් හිතුවේ, මං යාච්ඤා කරනවා කියලයි. හෘදයේ ස්පන්දනය මට පැහැදිලිවම තේරුණා. මං බැලුවේ කපිතාන් ෆෑර් දිහාව. ඔහු නැව් තට්ටුව අසල සිටගෙන සිටියේ, කොලුවා මුහුදට විසිකරන්න අණදෙන සූදානමින්......."

"ඉතින්?"

"මං ෆෑර්ගේ මුහුණ දිහා බැලූ හේතුව, ඔහු තේරුම් ගත්තා." කෝබට් කීය. "දෙවියනේ! බිලි තවමත් පණ පිටින් බව දැන දැනම නේද, බිලි මියගිහින්; මුහුදට විසිකරමු කියලා ඔහු කිව්වේ. මං ඔබට කිව්වා නාවිකයන් කියන්නේ ඉතාම කෲර මිනිසුන් බව. මං ෆෑර්ගේ මුහුණ දිහා බලා ඉද්දී, ඔහුගේ මුහුණේ මතුවුණේ කෝපාවිෂ්ට රාක්ෂ බැල්මක්. ඔහු තමන්ගේ දකුණු අතේ දබරැඟිල්ල ඔසවලා, එය තමන්ගේ උගුර හරහට බොහොම හෙමින් ගෙනගියේ, මං දිහා බලාගෙනම. ඒකෙන් ඔහු අදහස් කළේ මොකක්ද කියන එක මට තේරුණා. ඔහු කිව්වේ, මං කටවහගෙන නොහිටියොත් මට අත්වන්නේ මරණය බව!"

"ඒ කියන්නේ බිලි ඒ වනවිට මියගිහින් නොමැති බව, ෆෑර් හොඳින්ම දැනහිටියා?"





වචනයක් හෝ කථා නොකළ කෝබට්, හිස ඉහළ පහළ සොලෙව්වේ, හෝම්ස් කියූ දෙය නිවැරදි බව ස්ථිර කරමිනි.

"ඊළඟට බිලීව මුහුදට විසිකරන්න කියලා, කපිතාන් ෆෑර් අණදුන්නේ එක් ක්ෂණයකින්"

මිනිත්තු කිහිපයක් යන තුරු අප විසින්ම කාමරයේ පැවැතියේ නිහඬබවකි.

"එදා ඉඳන් ඔය සිද්ධිය මගේ හිතට දුස්වප්නයක් එන්න ඇති" කෝබට් කීය. "බිලීගේ හිසට සිදුවී තිබුණු තුවාලවල හැටියට, ඔහු එදාම මියයෑමට ඉඩ තිබුණා. සමහරවිට ඔහුගේ ජීවිතය බේරා ගැනීමට, අපට මොනම ඉඩකඩක්වත් නොතිබෙන්න ඇති. මං එහෙම හිත හිතා, මගේ හිත සනසවාගන්න උත්සාහ කළා. ඒත් ගලක් පැටෙව්වා වගේ බරවෙලා තිබෙන මගේ හෘදසාක්ෂියෙන්, මට ගැලවීමක් නෑ. ඔය සිද්ධියෙන් ඇතිවුණු කාංසාවෙන් වෙන්න ඇති, මාව නිතර නිතර අසනීප වුණා. හිස ඔසවා ගෙන ඉන්න බැරිතරමට ක්ලාන්තයක් හැදෙන්න පටන්ගත්තා. පසුව නැව් සමාගමේ වෛද්‍යවරයා කීවේ – මට හෘදය වස්තුව සම්බන්ධ බරපතළ රෝගයක් තියෙනවා; ඒ නිසා නැවේ රැකියාවට මං කොහොමටවත් සුදුසු නැහැ කියලා.

ඒ නිසා ඔවුන් මාව රැකියාවෙන් ඉවත්කළා. මං මගේ මුදලුත් අරගෙන, ලිවර්පූල්හි නොරැඳී බ්‍රිස්ටල්හි පදිංචියට ආවා. මාව හඳුනාගන්න අපහසු වෙන විදියට මුහුණපුරා රැවුලකුත් වවලා, ගෙදරින් එළියට යද්දී, මුහුණ වැහෙන්න මේ හිස්වැස්මත් පැළඳුවා. ඒත් දින කිහිපයකට කලින් නොසිතූ විදියට, බ්‍රිස්ටල් දුම්රිය පොළේදී, බිලීගේ බිරිඳ මාව දැකලා. ඇය මාව හඳුනාගෙන මගේ නම කියා කෑගැහුවා. බිලීගේ මිනීමැරුමේ ලේ, මගේ දැත් වලත් ගෑවී තියෙනවා කියලයි මට හිතෙන්නේ. ඉතින් මං කොහොමද ඒ මනුස්සයාට මුහුණදෙන්නේ?"

"බිලි තරුණයා මුහුදට විසිකළාට පස්සේ මොකක්ද සිද්ධවුණේ?" හෝම්ස් ඇසීය. "මං කැමතියි ඒ හරියත් දැනගන්න. ඔබ නෞකාවෙන් කොහේටද යාත්‍රා කළේ?"

"කපිතාන් කල් ඇතුවම ඒ ගැන සැලසුම් කරලයි තිබුණේ" කෝබට් කීය. "ඩන්කර්ග් පසුකරලා අපි උතුරටයි යාත්‍රා කළේ. සෑහෙන තරම් දුර ගියාට පස්සේ, නැවෙන් ගැළවූ දැව කොටන්, ලෑලි, කඹ හා වෙනත් දේවල්, අපි මුහුදට විසිකළා. "සොෆී



www.sinhalaelibrary.com

ඇන්ඩසන්" කියල තීන්තෙන් ලියා තිබූ. ජීවිතාරක්ෂක තබා, බඳපටින් ඒ අතර තිබුණා. ඒවා හමුවුණු විටයි ඔවුන් හිතා තිබුණේ, කාර්යමණ්ඩලය සමග නැව මුහුදුබත් වුණු එක ස්ථිරයි කියලා.

අපි මුලින්ම යාත්‍රා කළේ රොටර්ඩෑම් වෙත. මැක්නීල් සහෝදරයන් මේ වෙනකොට, "හෙන්රියටා" නෞකාව, පැනමාවෙ නැව් සමාගමක ලියාපදිංචි කරලත් අවසන්. අනෙක අප ගෙනගිය පොටෑසියම් නයිට්රේට් මිලට ගන්න, රොටර්ඩෑම්හි ගනුදෙනු කරුවෙකුත් මැක්නීල්ල සූදානම් කර තිබුණා. ඒ නිසා ඒ බඩු බෑව ගමන්, ගල් අඟුරු තොගයකුත් පටවාගෙන ඈත පෙරදිග බලා යන්නයි, "හෙන්රියටාව" සූදානමින් තිබියේ. නමුත් පෙරදිග සාගරවල ඒ දිනවල ඇතිවී තිබූ ප්‍රචණ්ඩ රළ ගැන අහන්න ලැබීම නිසා ඒ ගමන වෙනස්වුණා. අපි ලුණු දැමූ මස්, කිරි ආහාර, හා ධාන්‍ය පටවාගෙන, රොටර්ඩෑම් සිට ස්කොට්ලන්තයේ ඩන්ඩි වෙත ආවා. මාව වෛද්‍ය පරීක්ෂණයකට යැව්වෙ එහේදියි.

මේ අතරෙදි අපි මුහුදට දැමූ "සොෆී ඇන්ඩසන්" හි පුන්චුන්, බ්‍රිතාන්‍ය මසී නෞකාවකට හමුවෙලා තිබුණා. අපේ නෞකාව ස්ථිර වශයෙන්ම කාර්ය මණ්ඩලය සමග මුහුදේ ගිලිලා බව, ලොයිඩ්ස් ආයතනය නිවේදනය කළේ එනකොටයි.

අපි ඩන්ඩි වෙත ළඟාවෙද්දි රක්ෂණ සමාගමෙන්, විනාශවුණු නැවේ අලාභය ගෙවලා. අපට ලබාදෙන්න ඔවුන් පොරොන්දු වුණු මුදල අඩු නැතුව ගෙව්වා. මාව රැකියාවෙන් ඉවත්කරන්න වෛද්‍යවරයා නිර්දේශ කළාම, මගේ මුදලුත් අරගෙන, මං ඔවුන්ගෙන් සමුගෙන ආවා. ඒක එක් විදියකින් මගේ හිතට සැනසීමක් වුණා.

"මේ දවස්වල හෙන්රියටා නෞකාව කෝ?" හෝම්ස් විමසුවේය.

"මධ්‍යධරණී රටවල් කිහිපයකට ගිහිං, පලතුරු හා ඔලිව් තෙල් අරගෙන, "හෙන්රියටා" ලන්ඩන් වරායට සේන්දුවුණු බව මං පුවත්පතක දැක්කා. ඒ දින තුනකට කලින්" කෝබට් කීය. "තවම ඒ බඩුබානවා ඇති"

"තම පරිස්සය දල්වා ගත් මගේ මිත්‍රයා, දුම් පිටකරමින් මිනිත්තු කිහිපයක් කල්පනා කළේය. ඔහු සිතන්නට ඇත්තේ, අප මීළඟට ගතයුතු පියවර ගැනය. අපට දැනගන්නට ලැබී ඇත්තේ වැදගත්





තොරතුරු රාශියකි. ඒවා එළිවූ විට මහා ආන්දෝලනයක් ඇතිවෙනු නිසැකය.

"දැන් මේක බැරෑරුම් ප්‍රශ්නයක් බව අපට පෙනෙනවා" අන්තිමේදී හෝම්ස් කීවේ, තීරණයකට පැමිණි ආකාරයෙන් නොවේ. "මෙහිදී අපරාධ දෙකක් සිදුවී තියෙනවා. එකක් නොගිළුණු, විනාශ නොවූ නෞකාවක් විනාශ වූ බව පෙන්වා, රක්ෂණ මුදල් වංචනිකව ලබාගැනීම. ඔබත් එම මුදලෙන් කොටසක් හෝ භාරගැනීම නිසා, ඔබත් වින්දිකරුවෙකු වේවි. අනෙක බිලී විලර් ඝාතනය. එහෙදි ප්‍රධාන වශයෙන්ම චෝදනාව එල්ල වෙන්නේ කපිතාන් හැරෝට. ඒ වුණත් තමන්ගේ නිදහස සඳහා ඔහු අනිවාර්යයෙන්ම කියාවි, ඒ වෙලාවෙ බිලී විලර් හිටියේ මරණයට පත්වෙලා කියල. තරුණයා ජීවතුන් අතර හිටි බව කියන්නේ ඔබ විතරයි. මේ කරුණ උසාවියේදි ඔප්පු කර ගැනීම අමාරුවෙනවා. හැරෝ ඔබට කළ මරණ තර්ජනය - දඹරැහිල්ල තම උගුර හරහා අදිමින් කළ සංඥාව, ඇසින් දුටු තවත් කවුරුවත් නැද්ද?"

"ඇයි මගේ මිත්‍රයා - ඇන්ඩ්‍රියස් තෙල්? නැවේ කෝකියා?"

"ඔබ සාන්ත ක්‍රිස්තෝපර් කුරුසිය විලර්ගේ පපුව උඩ තැබූ අයුරු ඔහු දුටුවාද?"

"ඔව් මහත්මයා" කෝබට් කීය. "මට කුරුසිය එක්ක අතදමන්න පුළුවන් වෙන විදියට, ලණුව ගළවලා, කැන්වසය බුරුල් කළේ ඔහු. කපිතාන් හැරෝ, ඔහුගේ දඹරැහිල්ල බෙල්ල හරහා අදිමින්, මට මරණ තර්ජන කළ ආකාරය, ඔහු දකින්න ඇති. මට ඒක හොඳටම විශ්වාසයි. නමුත් කපිතාන් එහෙම කළේ ඇයි කියලා, තෙල් එදාවත් පසුව වත් මගෙන් ඇහුවෙ නෑ"

"ඔහු තවමත් හෙන්රියටා නැවේ කෝකියා හැටියට සේවය කරනවාද?"

"ඔව්. බොහොම වෙලාවට තවමත් ඇති" කෝබට් කීය. "මට රැකියාවෙන් ඉවත්වෙන්න සිදුවුණත්, ඔහුට එහෙම ප්‍රශ්නයක් ආවෙ නෑ. නැවේ රැකියාවෙන් අස්වෙන්න ඔහුගේ බලාපොරොත්තුවක් තිබුණෙත් නෑ"

"ඔබ මා සමග දැන් කියූ කරුණු, උසාවියේදී සාක්ෂියක් හැටියට ඉදිරිපත් කරන්න සිදුවේවි" හෝම්ස් කීය. "අසරණ තරුණයෙක් අමානුෂිකව ඝාතනය කරලා තියෙනවා. ඒ අපරාධකාරයන් නීතියේ



www.sinhalaelibrary.com

රැහැණට හසුකර දියයුතුයි. ඒක නීතිගරුක රටවාසීන් හැමදෙනෙකුගේම යුතුකමක්. ඔබේ සාක්ෂිය තහවුරු කරමින්, කපිතාන්ට එරෙහිව සාක්ෂි දෙන්න නෙල් කැමැති වේවිද?"

"ඒක ගැන නම් මට කියන්න අමාරුයි මහත්මයා" කෝබට් කීය. "තමන් රැකියාව කරන නැවේ ප්‍රධානියාට විරුද්ධව සාක්ෂි දෙනවා කියන්නේ, සිය දිවි නසාගන්නවා වගේ වැඩක්. මං ඔහුගේ මිත්‍රයෙක් බව ඇත්ත. නමුත් ඔහුට දැන් ටොම් කෝබට් කියන්නේ, තවත් මිනිහෙක් විතරයි. මගේ සාක්ෂිය තහවුරු කිරීමෙන් ඔහුට සැලසෙන වාසියක් නෑ"

"කෝබට් මහත්මයා, මේ අහන්න" හෝම්ස් කීය. "මෙතැනදී වාසි අවාසි තක්සේරු කිරීමට, අවස්ථාවක් සැලසෙන එකක් නෑ. රන්පවුම් ලක්ෂ ගණනක රක්ෂණ වංචාව, අපි මොහොතකට අමතක කරමු. ඒක අමතක කළත්, මෙතැන සිදුවී ඇති මනුෂ්‍ය ඝාතනය අපට අමතක කරන්න බෑ. ඒ ගැන මීට කලින් වගකිවයුත්තන්ට දැනුම් නොදීමෙන්, ඔබ කර ඇත්තේ වරදක්. නමුත් මං හිතන හැටියට නීතිඥ මහත්වරුන්ට හැකිවේවි, ඔබට කොන්දේසි සහිත සමාවක් අරගෙන, පැමිණිල්ලේ සාක්ෂි කරුවෙකු කරගන්න. නෙල් පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දෙන්න කැමැතිවුණොත්, ඔහුටත් ඒ වාසිය ලැබේවි."

"මට තේරෙනවා මහත්මයා" කෝබට් කීය. "මට තේරෙනවා, මමත් මේ අපරාධයට පටළැවී ඇති බව. ඇත්තටම අපරාධය කළ අය පොලීසියට අල්ලා දෙන්න, මොකක්ද අපි කළයුත්තේ? ඒක මට කියන්න. ඔබ නියම කරන විදියට මං කටයුතු කරන්නම්"

මගේ මිත්‍රයා යළිත් වරක් නිහඬව කල්පනා කළේය.

"අනෙක් අයට හොර රහසේ, අපට නෙල් හමුවෙන්න පිළිවෙළක් නැද්ද?" හෝම්ස් ඇසීය.

"රාත්‍රී කාලයේ නැවට ගියොත් ඔහු හමුවෙන්න පුළුවනි" කෝබට් කීය.

"ඒ වුණත් එහෙකොට අනෙක් අය හමුවීමේ අවදානමක් තියෙනවා නේද?" ඒ ප්‍රශ්නය හෝම්ස් ගෙනි.

"මහත්මයා" කෝබට් කීය. "දිගු මුහුදු ගමනක් ගිහිං ආවට පස්සේ, නැවේ කාර්යමණ්ඩලය, නැවේ රැඳෙනවා අඩුයි. බඩුබෑම අවසන් කරන තුරු, ඔවුන් නිදහසේ එහේ මෙහේ සැරිසරනවා. යාළුමිත්‍රයන් හමුවෙන්න යනවා. ආපහු නැවට එන්නෙ රෑ දොළහට





එකට. රෑ දහයමාර වෙද්දි, නැව බොහොම පාළුයි. නෙල් නම් මගේ වයසෙ තනිකඩ කෙනෙක් නිසා, ඔය වෙලාව වෙනකොට කෑම කාලා, එයාගෙ කුටියට වෙලා නින්දට යාවි. නාවිකයන්ගේ ඇඳුම්වලින් සැරසිලා ගියොත්, නැවේ කවුරුවත් ඔබ ගැන සැක හිතන එකක් නෑ."

"හොඳයි. මං ඔබෙන් ඇසිය යුතු තවත් එක ප්‍රශ්නයක් තියෙනවා" හෝම්ස් කීය. "නෞකාව "මෙන්ටිසටා" හැටියට නම වෙනස් කළාට පස්සේ, කාර්ය මණ්ඩලයේ කවුරු හරි මියගියාද? එහෙමත් නැත්නම් ඔබ වගේ රැකියාවෙන් ඉවත් කෙරුණාද?"

"මං දන්න තරමින්, මං ඇර වෙනත් කවුරුවත් රැකියාවෙන් ඉවත් කළේ නෑ" කෝබට් කීය. "නමුත් සති කීපයකට කලින්, ඒ කියන්නේ රක්ෂණ මුදල් ගෙවා දුන්නට පස්සේ, පැට්‍රික් ඕලියන් නම් නැවියෙක් හදිසි අනතුරකින් මියගියා. ඔහු තමයි කුඹගස්වල මුදුනට ම නැගලා, රුවල් ගැටගහන කටයුතු කළේ. මේක වුණේ හොන්ඩුරාසයේදී. ධාන්‍ය හා පලතුරු, ගේන්න මධ්‍යධරණියට යන්න දිනකට කලින්, ඉරීගිය පරණ රුවලක් වෙනුවට, අලුත් රුවලක් හයිකරමින් හිටියලු. ඒ වෙලාවෙ තද සුළඟක් තිබිල තියෙනවා. ඔහු සකුල ලිස්සලා, කුඹගහේ මුදුනේ ඉඳල බිමට වැටිලා, එතැනම මියගියාලු"

"ඔහු ලියන්න, කියවන්න දැනහිටි කෙනෙක් ද?"

"ඔව්, මහත්මයා"

"හරි, එහෙනම් ඔබ මොනවා හරි කාල බීලා, මේ ගෙදරදීම ටිකක් විවේක ගන්න. ඒ ගැන මේ වොට්සන් මහත්මයා ඔබට උදව්කරාවි. මම මේ ළඟට ගිහින් ඉක්මනින් එන්නම්. වොට්සන්, අපි තුන්දෙනෙකුට රාත්‍රී කෑම ඉක්මනින් අවශ්‍ය බව, හඩ්සන් මහත්මියට දැනුම්දෙන්න"

මට උපදෙස් දුන් හෝම්ස්, ඉක්මනින් ඇඳ පැළඳගෙන, නිවසෙන් පිටවී ගියේය. රෑ කෑම සඳහා අමුත්තෙකු සිටින බවත්, රෑ අට වෙද්දී රෑ කෑම අවශ්‍ය බවත්, මම හඩ්සන් මහත්මියට දැනුම්දුන්නෙමි.

රාත්‍රී අටට මඳවේලාවකට පෙර හෝම්ස් ආපසු පැමිණියේය. ඔහු රැගෙන ආ පොදියේ, අප තිදෙනා සඳහාම ඇඳුම් කට්ටල තිබිණ. ඒ නාවිකයන් අඳින පළඳින ආකාරයේ කලිසම්, කබා සහ හිස්වැසුම්ය. ඊට අමතරව නීතිඥයන් ලියකියවිලි ගෙනයාමට



www.sinhalaelibrary.com

භාවිත කරන, සමින් තැනූ කුඩා අත්බෑගයක් ද ඒ සමග විය. අප දෙදෙනාගේ රිවෝල්වර ද අප ගෙන යායුතු බව හෝම්ස් මට රහසෙන් මතක් කළේය.

"රෑ කෑම කාල, අපි දහය වෙද්දි පිටත්වෙමු" ඔහු කීය. "උවමනා ඇඳුම් පැළඳුම් ඔක්කොම තියෙනවා. දැන් එතකොට ඉතිරි වෙන්නෙ එක ප්‍රශ්නයයි. තෝබට් මහත්මයා. මං ඔබට කලින් කිව්වා වගේ, නැව ඇතුළට පිවිසුණොත් අපේ වැඩ කටයුතු පහසුයි. නමුත් ඒකෙ අවදානම වැඩියි. ඒ නිසා ඔබ පමණක් නැව තුළට ගිහිං, ඇන්ඩ්‍රියස් නෙල් අවදිකරවාගෙන, ඔහු නැවෙන් එළියට කැඳවාගෙන ආ යුතුයි. නෙල්ගේ කුටියට යද්දි අනෙක් අයට නොපෙනී යන්න පුළුවන් තරම් උත්සාහ කරන්න.

ඔබ දුටුවාම නෙල් බොහොම සන්තෝෂ වේවි. හැබැයි බිලී වීලර් මිනීමැරුම ගැන, එක වචනයක් වත් කථාකරන්න යන්න එපා. නැව ඇතුළත නිදහසේ කතාබහ කරන්න, ඉඩක් නැති බව මතක් කරන්න. ඒ නිසා රම් වීදුරුවක් බොමින්, නිදහසේ කථාකරන්න, වරායෙන් පිටත අවන්හලකට යමු කියලා, ඔහු කැඳවාගෙන එන්න. ඔහු කැමැත්තෙන්ම එනවාට සැකයක් නෑ. මං සාන්ත කැතරින් ජැටිය වෙත ගියා. ඒ ජැටිය අසල පිහිටි වාප්පුවේ, ඉඩකඩ තියෙන කාමරයක් සූදානම් කරලයි මං ආවේ. අපි යන ගමන් මං ඔබට ඒක පෙන්වන්නම්. ඔබ නෙල් කැඳවාගෙන ආපසු ආ යුත්තේ ඒ පැත්තෙන්."

රාත්‍රී නවයයි තිහ වෙද්දී, අපි කුලීරියකින් බේකර් වීදියෙන් පිටත් වී ගියෙමු. දහයයි තිහ වෙද්දී, සාන්ත කැතරින් ජැටිය අසලටම ළඟාවීමු. අප හැඳ සිටි නාවික ඇඳුම නිසා, කාගේවත් අවධානයට ලක්නොවී, වරාය තුළ අපි ගමන් කළෙමු.

අන්ධකාර පැරණි ගොඩනැගිල්ලක, වසා තිබූ කාමර පේළියක, එළියක් දල්වා තිබූ එක් කාමරයක් වෙත, හෝම්ස් අප කැඳවාගෙන ගියේය. එය නැව්වලින් බාන බඩු, ගණන් තැබීම සඳහා, නිලධාරයන් යොදාගත් කාර්යාල කාමරයකි. එය පැය කිහිපයකට පෙර අප වෙනුවෙන් පිරිසිදු කර තිබූ අතර, මඳ එළියක් විහිද වූ භූමිතෙල් ලාම්පුවක් දල්වා තිබිණ.

"තෝබට් මහත්මයා" හෝම්ස් කීය. "ඔබට තියෙන්නෙ නැවෙන් පිටවෙලා, මේ බරාඳය දිගේ ඇවිද එන්නයි. ඔබ ළඟට එද්දි, අපි





කාමරයෙන් එළියට ඇවිත් ඔබට කතාකරන්නම්. දැන් ඔබට යන්න වෙලාව හරි"

හෝම්ස් තම සාක්කුවෙන් යතුරක් ගෙන, කාමරයේ දොර විවෘත කළේය. අපි කාමරය තුළට වී දොර වසාගත්තෙමු. දොර අසලම වූයේ යකඩදැල් ගැසූ විශාල කවුළුවකි. ජැටිය හා ඒ අසල නවත්වා තිබූ 'හෙන්රියටා' නෞකාව, ඈතින් දර්ශනය විය. පහනේ ආලෝකය අඩුකර දමා, අපි නොඉවසිල්ලෙන් බලාසිටියෙමු.

"මං විශ්වාස කරනවා......" හෝම්ස් කීවේ කෙඳිරිලි හඬෙනි. "........... තමන් මුහුණදීල තිබෙන තත්ත්වයේ අනතුරුදායක බව, තෝබට් තේරුම් අරගෙන ඇති කියල. ඔහු සහ නෙල් දෙදෙනා සහයෝගය නොදුන්නොත්, වීලර් තරුණයා ඝාතනයට ලක්වුණු බව, උසාවියේදී ඔප්පු කරගන්න අපට සාක්ෂි මදි"

"තෝබට් නම් සාපෝච්චාරණයක් කළා" මම කීවෙමි. "ඔබ හිතන්නෙ කපිතාන් ලෝර් ට විරුද්ධව යමක් කියන්න, නෙල් ඉදිරිපත්වේවි කියලද?"

"අපි ඒකට උත්සාහයක් දැරිය යුතුයි වොට්සන්" හෝම්ස් කීය. "සමහරවිට ඒ දෙන්නා දැන් නැවෙන් පිටත්වෙලත් ඇති. තෝබට් කිව්වා වගේ නාවිකයො කියන්නෙ මහ සැරෙ මිනිස්සු. ඒ නිසා අපේ රිවෝල්වර සූදානමෙන් තබාගමු. රිවෝල්වරය එක් ක්ෂණයකින් එළියට ගන්න පුළුවන් විදියට සාක්කුවට අත දමාගෙන ඉන්න"

අපට පැය භාගයකට වඩා බලාසිටීමට සිදුවිය. අන්තිමේදී දෙදෙනෙකු සෙමින් බරාඳය දිගේ ඇවිද එන හඬ අසන්නට ලැබිණි. ඒ සමගම ඇසුණු කතාබහ සහ සිනාහඬ, බොහෝ කලකට පසුව හමුවූ මිත්‍රයන්ගෙන් අසන්නට ලැබෙන තාලේ ඒවා විය. ඔවුන් අප සැඟවී සිටි කාමරය ඉදිරිපසින් ගමන් ගනිද්දී, එක්වරම දොර විවෘත කළ හෝම්ස් ඉදිරියට පැන්නේ, රිවෝල්වරය එල්ල කරමිනි.

"මේ තෝමස් තෝබට් සහ ඇන්ඩෲස් නෙල් මහත්වරු නේද?" හෝම්ස් ඇසීය. "කරුණාකරල මේ කාමරය ඇතුළට එන්න මහත්වරුනි. ඔබට කිසිම හිරිහැරයක් කරදරයක් නෑ. ප්‍රශ්න කිහිපයකට පිළිතුරු දෙන්න තියෙනවා. එපමණයි"

නෙල්ගේ මුහුණ එක්වරම වෙනස් වූ අයුරුත්, ඔහු සැකයෙන් තෝබට් දෙස බැලූ හැටිත් මම දුටුවෙමි. මැදිවියේ පුද්ගලයෙකු වූ



www.sinhalaelibrary.com

නෙල් නීතියට පත්වූ බැව්, කාමරයේ තිබූ මඳ ආලෝකයෙන් මම තේරුම් ගතිමි. මේසය ඉදිරිපිට තිබූ හිස්පුටු දෙකෙන් අසුන්ගන්නා මෙන්, හෝම්ස් ඔවුනට සංඥා කළේය. මේසය මත තිබුණේ හෝම්ස් ගෙන ආ නීතිඥ බෑගයේ තිබී එළියට ගත් ලියවිල්ලකි. අඩ අඳුරේ මට පෙනුණේ එය, නීතිඥයෙකු විසින් සකස් කළ දිවුරුම් පෙත්සමක් ලෙසය.

"මහත්වරුනි, මේක නීතිය සම්බන්ධ කටයුත්තක්" හෝම්ස් කීවේය. "වැල්පරයිසෝ සිට ලිවර්පූල් බලා එද්දී මුහුද මැද්දී අතුරුදන් වූ, "සොෆී ඇන්ඩසන්" නෞකාව ගැන ඔබට මතක ඇති. ඒ නැවේ සේවය කළ බිලී වීලර් නම් තරුණයාට, නැවේ ඇතිවුණු සණ්ඩුවකදී, මාරාන්තික ප්‍රහාරයක් එල්ල වුණා. ඊළඟට ඔහුගේ සිරුර මුහුදට ........"

"මොන පට්ටපල් බොරුවක්ද ඒ?" කියමින් ගිගිරූ නෙල් පුටුවෙන් නැගිට, හෝම්ස් දෙසට පැන්නේ, දැන් මිට මොලොවා ගෙනය. ඔහු තව මොහොතකින් හෝම්ස්ට පහර දෙනු ඇතැයි මට සිතිණ. මම එක් ක්ෂණයකින් මගේ රිවෝල්වරය අතට ගෙන එය නෙල්ට පෙනෙන ලෙස ඔහුගේ මුහුණ දෙසට ළං කළෙමි. එය දුටු ඔහු යළිත් පුටුවේ හිඳගත්තේය.

"නෙල් මහත්මයා, ඔබ කියන්නේ ඒක බොරුවක් කියලද?" හෝම්ස් ඇසුවේ මේසය මතවූ ලියවිල්ල, නෙල්ගේ අතට ළංකරමිනි.

"කුඹ ගහක රුවලක් සවිකරන්න ගිහින්, මෑතකදී ජීවිතක්ෂයට පත්වුණු පැට්‍රික් ඔබ්‍රයන් ගැන ඔබට මතක ඇති. ඒ අනතුරට දින කීපයකට පෙර ඔහු, නීතිඥයෙකු ඉදිරියේ දිවුරුම් ප්‍රකාශයක් කළා. මේ තියෙන්නේ ඒ ලියවිල්ල. උවමනා නම් අරගෙන කියවා බලන්න. මෙකෙ තියෙන්නෙත් බිලී වීලර්ට ප්‍රහාරයක් එල්ලවුණු ආකාරය, අන්තිමේදී ඔහුගේ ශරීරය මුහුදට විසිකෙරුණු හැටි. ඊළඟට "සොෆී ඇන්ඩසන්" නෞකාවට අත්වුණු ඉරණම ගැනත් මෙකෙ සඳහන්. ඊට පස්සේ ඔහු අත්සන් තබලා, සාක්ෂිකරුවනුත් අත්සන් තබලා මුද්‍රා තබලයි තියෙන්නේ. ඔබ තවමත් කියන්නේ මේ සම්පූර්ණ විස්තරයම බොරුවක් කියලද?"

ඇන්ඩ්‍රියාස් නෙල් තම පුටුව මතම අප්‍රාණික වූයේ, ක්ලාන්ත ගතියෙන් යයි මට සිතිණ. ඔහු තම මිත්‍රයාගේ අතක් තදින් අල්ලාගත්තේය.





"අපට කරන්න කිසිම දෙයක් නෑ නෙල්" කෝබට් කීය. "හැම දෙයක්ම එළිවෙලා. අපි දෙන්නා ඔය අපරාධ වලට සම්බන්ධ නැති බව, මං මේ මහත්වරුන්ට කිව්වා. අනික් අය බේරෙන්න ගිහිං, අපි මොකටද එල්ලුම්ගස් යන්නෙ? අපි ඇත්ත කියමු. මේකට තියෙන එකම විසඳුම එච්චරයි"

"මහත්වරුනි" නෙල් කීවේ මිනිත්තුවක් දෙකක් නිහඬව කල්පනා කිරීමෙන් පසුවය. "කෝබට් කිව්වා වගේ, ඇත්ත කියනවා ඇරෙන්න, අපට මේකෙන් ගැලවෙන්න වෙනත් ක්‍රමයක් නෑ. ඔය අපරාධයට, මේ කෝබට්වත්, මං වත් මොනම ආකාරයකින් වත් සම්බන්ධ නෑ. සන්ත මරියා නාමයෙන්, දෙවියන්ගේ නාමයෙන් මං දිවුරනවා; මං කියන්නේ ඇත්ත. උන් හත් අට දෙනෙක් බිලී ඉලන්දාරියාව, කෝප්පයෙන් පහරදුන්නා. ඒ වෙලාවෙ ඒක නවත්වන්න, අපි දෙන්නට පුළුවන් කමක් තිබුණේ නෑ. අන්තිමේදී කපිතාන් ඈෆරුත් මැදිහත්වෙලා, බොහොම අමාරුවෙනුයි උන් පාලනය කළේ"

"කපිතාන්වරයා බිලීගේ බෙල්ලට අත තියල නාඩි පරීක්ෂා කළා" හෝම්ස් කීය. "ඊළඟට ඔහු තරුණයා මියගිහින් බව කිව්වද?"

"ඔව් මහත්මයා"

"ඊළඟට මේ තෝමස් කෝබට් තමන්ගේ බෙල්ලේ දමල තිබුණු කුරුසියක් සහිත දම්වැල, තරුණයාගේ බෙල්ලේ ගැටගැසූ හැටි ඔබ දුටුවාද?" හෝම්ස් ඇසුවේය.

"ඔව්. මහත්මයා" නෙල් කීය. "මං තමයි ඒකට උදව් කළේ"

"ඊළඟට කෝබට් කුරුසිය තරුණයාගේ පපුව මත තබල, ඔහුගේ පපුවටත් අත තියාගෙන ඉඳල කපිතාන් ඈෆර් දිහා බැලුවා. ඔබ ඒක දුටුවද?"

"ඔව් මහත්මයා"

"එතකොට කපිතාන් මොකද කළේ?"

"කපිතාන් ඈෆර් තමන්ගේ අතේ දඹරැඟිල්ලෙන්, තමන්ගේම බෙල්ල හරහට ඉරක් ඇඳගෙන ගියා"

"ඔහු ඒකෙන් අදහස් කළේ මොකක්ද කියා ඔබ දන්නවාද?"

"ඔව්" නෙල් කීය. "තරුණයා ඒ වනවිටත් මියගිහින් නොසිටි බව, කාටවත් හෙළිකළොත්, කෝබට්ට අත්වෙන්නේ මරණ දඬුවම බව"



www.sinhalaelibrary.com

"සත්‍යය හෙළිකිරීම ගැන ඔබට ස්තුතියි තෙල් මහත්මයා" හෝම්ස් කීය. "වොට්සන් දැන් ඔය පහනේ ආලෝකය හොඳින් වැඩි කරන්න"

හෝම්ස්ගේ නියෝගය අනුව මම එසේ කළෙමි. ඒ මොහොතේම, අප සිටි කාමරය දෙසට දුව ආ කිහිපදෙනෙකුගේ, බූට් සපත්තු ශබ්දය ඇසිණ. ඔවුහු දොර තල්ලුකරගෙන ඇතුළට විවිසියහ. නිලඇඳුමෙන් සැරසුණු පොලිස්භටයන් හතර දෙනෙකු සමග එහි පැමිණියේ, ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ පරීක්ෂක ලෙස්ට්‍රේඩ්ය.

"ලෙස්ට්‍රේඩ්. ඔබ ආවේ නියම වෙලාවට" හෝම්ස් කීය. "'සොෆි ඇන්ඩසන්' නැවේ සේවය කළ බිලී වීලර් තරුණයා ඝාතනය, උසාවියට ගෙන එන්න දැන් ඔබට හැකිවේවි. උසාවියේදී ඒ ගැන දිවුරා සාක්ෂිදීමට, නැවේ සේවය කළ තෝමස් කෝබට් මහතා සූදානම්. ඒ නැවේ කෝකියා වූ ඇන්ඩ්‍රියස් තෙල් මහත්මයා, මට දැන් මොහොතකට කලින් කටඋත්තරයක් දුන්නා. ඒකෙන් කෝබට්ගේ සාක්ෂිය තවදුරටත් තහවුරු වෙනවා. තෙල් මහත්මයා ඒකට ඔබ ඉදිරියේ අත්සන් කරාවි. ඊටපස්සේ මමත් වොට්සනුත් සාක්ෂියට අත්සන් කරනවා"

එදා සැන්දෑවේ ටොම් කෝබට් මා සමග රඳවා, හෝම්ස් ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය වෙත ගොස් සියල්ල හෙළිදරව් කළ ආකාරය සිතාගැනීම, මට අපහසු නොවීය. පසුවදාට එළිවෙන පාන්දර යාමයේ 'හෙන්රියටා' නෞකාව වටකළ පොලිස් හමුදාවක් විසින්, කපිතාන් ෂැෆර් හා සිද්ධියට අදාල තවත් අය සිරභාරයට ගන්නා ලදී

* * *

බිලී වීලර් ඝාතනය පිළිබඳ නඩු විභාගය, ඊට සති කිහිපයකට පසු ඕල්ඩ් බේලි අධිකරණයේදී ඇරඹිණ. තරුණයා ජීවත්ව සිටි බැව් දැන දැනම, ඔහු මුහුදට විසිකිරීමට අණ දුන් කපිතාන් ජෝසප් ෂැෆර් එල්ලුමකට නියම විය. බිල් වීලර්ට අමානුෂික ලෙස පහරදී ඔහුට මරණීය තුවාල සිදුකිරීම, ඝාතනය සඳහා ෂැෆර්ට ආධාර හා අනුබලදීම යන චෝදනා යටතේ, හය දෙනෙකුට, අවුරුදු දහය සිට පහළොව තෙක් සිරදඬුවම් නියමවිණි. ඝාතනයට. ලක්වූ බිලී වීලර්ගේ පවුලට වන්දි වශයෙන්, රන්පවුම් තිස්දහසක් ගෙවීමට






"වුයිට් ස්ටා" නැව් සමාගමට නියෝග කෙරිණි. ඇන්ඩ්‍රියස් තෙල් හා තෝමස් කෝබට් දෙදෙනාටම එරෙහිව චෝදනා එල්ල නොවූ නිසා, ඔවුනට නිදහස ලැබිණි. නාවික රක්ෂණ සමාගමට කළ වංචාව ගැන මැක්නීල් සොහොයුරනට එරෙහිව ඉදිරිපත් වූ නඩුව, මා මෙය ලියන අවස්ථාව වනවිටත් අවසානව් නොමැත.

මෙම අපරාධය කෙදිනක හෝ ලොවට හෙළිවෙතැයි එක් පුද්ගලයෙකු ඉවෙන් මෙන් අනුමාන කරන්නට ඇත. ඒ "සොෆි ඇන්ඩසන්" නෞකාවේ බඩු ගබඩාව භාරකරුවූ, සිල්වෙස්ටර් ඩයස් නමැත්තාය. තම කොටස් මුදල ලබාගත් වහාම ඔහු අතුරුදන් වී ඇත. පසුව දැනගන්නට ලැබුණේ, ආජන්ටිනාවේ බුවනෝස් අයිරිස් වෙත ගිය මගී නෞකාවක නැගී, සිල්වෙස්ටර් ඩයස් රටින් පැන ගොස් ඇති බවයි. ඔහු අල්ලාගැනීම සඳහා අධිකරණයෙන් වරෙන්තු නිකුත්වුවද, පොලීසිය තවමත් එයට සමත්ව් නොමැත.

www.sinhalaelibrary.com

## අබිරහස් දොස්තර සමග
## ෂර්ලොක් හෝම්ස්



www.sinhalaelibrary.com

# පූර්විකාව

ෂර්ලොක් හෝම්ස් මහතා රහස් පරීක්ෂණ වෘත්තියෙන් විශ්‍රාම ගෙන සසෙක්ස් ප්‍රාන්තයේ පදිංචියට ගිය බව, ඔබ දැනටමත් දන්නා බව නිසැකය. ඔහු එසේ ගියේ තමන් ඉතා ආශා කළ, මීමැස්සන් ඇතිකිරීමේ විනෝදාංශයේ යෙදීමේ අරමුණෙනි. එය කිසිසේත් මගෙ සිත්ඇදගත් ක්ෂේත්‍රයක් නොවිය. මම කෙන්සිංටන්හි මගේ නිවසේ රැඳී සිටියෙමි. එක් උදෑසනක මගේ දුරකතනය නාදවිය. රිසීවරය අතටගත් වහාම අසන්නට ලැබුණේ, මගේ හිතවත් මිත්‍රයා ගේ කටහඬ යි.

"සුභ උදෑසනක් වොට්සන්! මං විශ්වාස කරනවා, ඔබ සුපුරුදු සුවයෙන් ඇති කියල?"

"හෝම්ස්!" මට කෑගැසිණ.

"දුරකතන පණිවුඩයක් බලාපොරොත්තුවෙන් ඔබ හිටියේ හිතේ හරිම නොඉවසිල්ලෙන්, එහෙම නේද?" හෝම්ස් ඇසිය. "ඒ කාගෙන් පණිවුඩයක් බලාපොරොත්තුවෙන්ද? ඒක මටත් නොකියන රහසක්ද?"

මම අතිශය පුදුමයට පත්වුණෙමි. හෝම්ස් එය තේරුම් ගත්තේ කෙසේදැයි වටහාගැනීමට මට නොහැකි විය. "හෝම්ස් මම දුරකතන පණිවුඩයක් බලාපොරොත්තුවෙන් හිටිබව ඇත්තයි. ඒත් ඔබ කොහොමද ඒ බව දැනගත්තේ?"

"ඒක බොහොම සරලයි වොට්සන්. දුරකතනය නාදවන්න පටන්ගත් විගසම, ඔබ ඊට පිළිතුරු දුන්නා."

"විශිෂ්ටයි" මම කීවෙමි. "ඒ වුණත් ඔබ ලන්ඩන් නගරයට ආ බවක්, මං දැනගෙන හිටියෙ නෑ. මං හිතුවා ඔබ තවම සසෙක්ස්වල කියලා. ඔබ එහේ පදිංචියට ගියේ, ආයෙත් මෙහේ නොඑන්නම නේද?"

"වෛද්‍ය විශේෂඥවරයෙක් හමුවෙන්න, මට එන්න වුණා වොට්සන්" ඔහු කීය. "හන්දිපත් රුදාව දැන් එන්න එන්නම වැඩියි. අවුරුදු දෙකක් තිස්සේ ගොන් බෝක් ලුහුබැඳගිය වැඩෙන්, මගේ සන්ධිප්‍රදාහ රෝගය හොඳටම වැඩිවුණා. ඒක නෙමෙයි මිත්‍රයා.





1884, 85 කාලෙ සොහෝවල අප යෙදුණු පරීක්ෂණය මතකයි නේද? ඒකෙ සටහන් තවමත් ඔබ ළඟ තියෙනවද?"

මම එක්වරම පුදුමයට පත්වුණෙමි.

"ඇත්තෙන්ම ඔව්. ඇයි අහන්නෙ?"

"මෙකයි" හෝම්ස් කීය. "ඔබේ කථාවක් හුඟ කාලෙකින් පාඨකයින් අතට පත්වුණේ නැහැ කියලයි මට හිතෙන්නේ. ඔය සිද්ධිය වෙලා දැන් අවුරුදු තිහකටත් වඩා වැඩියි නේද?"

"අවුරුදු 32 ක් වෙනවා."

"ඉතින් අර "අතිශය රහසිගත" ලිපිගොනුවෙන් ඒක එළියට අරගෙන, පාඨකයාට ඉදිරිපත් කරන්න. එහෙම කළාට වරදක් නැහැ කියලයි මම හිතන්නේ. ඔබට මතකද අපි ගිහිං හමුවුණු අර කාන්තාව? ඇයත් මෑතකදී මියගියා"

"නීතිමය ප්‍රශ්න ඇතිවේවිද දන්නෙ නැහැ නේද?" මම ඇසීමි.

"නැහැ වොට්සන්" ඔහු කීය. "ඒක දශක තුනකට කලින් වුණු 'හදිසි අනතුරක්'. රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයට, ඒ ගැන හොයනවාට වඩා, වැඩරාජකාරි හුඟක් තියෙනවා."

සර් ඩැන්වර්ස් කැරූ ඝාතනය සම්බන්ධයෙන් පැන නැඟුණු ආන්දෝලනය, තවමත් බොහෝ දෙනෙකුට මතක ඇතැයි සිතමි. එය අළලා, රොබට් ලුවී ස්ටීවන්සන් ලියූ "දොස්තර ජෙකිල් සහ හයිඩ් මහතාගේ අරුම පුදුම කථාව" ට විශාල ප්‍රසිද්ධියක් ලැබිණ. මෙහිදී කාරණා රැසක් හෙළි නොකොට, මහජනයාගෙන් සැඟවීමට, ස්ටීවන්සන්ට සිදුවූ බව සත්‍යයකි. එසේ නොකොට සියල්ල හෙළිකළේ නම්, රටේ මහත් ආන්දෝලනයක් ඇතිවන්නට ඉඩ තිබිණ. එදා වික්ටෝරියානු සමාජයේ කැලඹීමක් ඇතිකළ හැකිව තිබූ කථාව, කිසිවක් නොසඟවා දැන් සම්පූර්ණයෙන්ම හෙළිකිරීමට මම අදහස්කරමි.

ලක්ෂ සංඛ්‍යාත මිනිස් ජීවිත හා ශිෂ්ටාචාර, එක මොහොතෙන් සුනුවිසුනු කළහැකි සොයාගැනීම් වලින්, සිදුවන අයහපත කොතරම්ද? සොබාදහමේ සීමා, මායිම් බිඳ හෙළීමට විද්‍යාඥයා උත්සාහ නොකළ යුතු ය.

ජෝන්. එච්. වොට්සන්

1917 අගෝස්තු 13
ලන්ඩන් නුවරදීය.

1.

# පුදුමාකාර උරුමක්කාරයා

"හෝම්ස් කුලිරිය පාරෙ සූදානමින් තියෙන්නෙ" මම කීවෙමි. "මං මේ බලාගෙන ඉන්නෙ ඔබ එනතුරු."

ඒ 1884 ඔක්තෝබර් මාසයේ අවසන් භාගයයි. සීත සෘතුව ළඟ එන නිසා, ලන්ඩනය පුරා පැතිරී තිබුණේ දැඩි සීතලකි. බේකර් වීදියේ අංක 221බී, අපේ නිවහනේ දොරටුව අසලට වී, මම බලාසිටියෙමි. සීතලෙන් බේරීම සඳහා, සිරුර ආවරණය වන සේ හැඳගත් ගනකම් කබායේ, සාක්කු දෙකට දැත් රුවාගෙන, මා සිටියේ නොඉවසිල්ලෙනි. එහෙත් මගේ මිත්‍රයා රසායන විද්‍යාත්මක පරීක්ෂණයක නියැළුණේ, ඊට වඩා නොඉවසිල්ලෙනි. නිලඇඳුමෙන් සැරසුණු පණිවුඩකරුවෙක්, ඒ අසලම බලාසිටියේ ය. ඒ, හෝම්ස්ගෙන් ලැබෙන පණිවුඩය ගෙනයාමට සූදානමෙනි.

"මට තව මිනිත්තු කිහිපයක් දෙන්න වොට්සන්" ඔහු කීවේ, තමා වාඩිවී සිටි අසුනේ කැරකී, මා වෙත නෙත් හෙළමිනි. කුඩා පරීක්ෂණ නළයක දැමූ නිල්පාට ද්‍රාවණයක් බන්සන් දාහයකින් රත්වෙමින් තිබිණි. මීළඟට මේසය මත තිබූ සුදු පැහැති කුඩු සහිත කඩදාසි කැබැල්ල ඔහු අතට ගත්තේය. එම කුඩු ඉවතට නොහැළෙන සේ, හෝම්ස් ඒවා පරීක්ෂණ නළය තුළට දැමීමේ පරෙස්සමිනි.

"ඔන්න බලාගන්න දොස්තර මහත්තයා" හෝම්ස් කීය. "මේ කුඩු නිසා මේ නිල්පාට දියරය දම්පාටට හැරී, අවසානයේ කහපාටට හැරුණොත්; ඒ කියන්නේ මරණය! ගෑනියකට එල්ලුම්ගස් යන්න සිදුවේවි. වෙනත් පාටකට හැරුණොත් එතකොට වෙනස් කතාවක්. මගේ හිතේ නම් කිසිම සැකයක් නෑ, මේ දියරය දම්පාට වී කහපාටට හැරෙනවා ම යි."

එසේ කියූ ඔහු කුඩු සියල්ල නළය තුළට දමා, එය හොඳින් දිය වී යනසේ, සොලවමින්, නළය බන්සන් දැල්ලට ඉහළින් අල්ලා රත්කළේය.

අපි ඉතා ඕනෑකමින් පරීක්ෂණ නළය දෙස බලාසිටියෙමු. මිනිත්තු කිහිපයක් ගතවෙද්දී, නිල්පැහැති දියරය, ක්‍රමයෙන් තද





කොළ පැහැයට හැරිණි. ඊළඟට ක්‍රමයෙන් ලා කහ පැහැයට, තැඹිලි පැහැයට හැරී අන්තිමේදී ගඩොල් රතු පැහැයට හැරිණි.

ඔහු බලාපොරොත්තු වූ දෙය සිදු නොවුණු විට, හෝම්ස්ගේ කට බාගෙට ඇරිණි. ඔහු දෙනෙත් විශාල කොට මා දෙස බැලුවේ, එය ඔහුට විශ්වාස කිරීමටත් අපහසු බව හඟවමිනි. එහෙත් අන්තිමේදී පරීක්ෂණ නළයේ තිබූ දියරය ගඩොල් රතු පැහැයට හැරී, නළයේ පත්ලේ එම පැහැයට අවක්ෂේපයක් ද සැදිණි.

"හො හෝ! හො හෝ!" ෂර්ලොක් හෝම්ස් කොක්හඬලා සිනාසුණේය. "දෙයියෝ සාක්කි! එහෙනම් මෙතැන මොකුත් අපරාධයක් සිදුවෙලා නෑ. අන්තිමට තව ටිකෙන් මාටයි විහිළුවට ලක්වෙන්නෙ. ඒකෙනුත් මං හොඳ පාඩමක් ඉගෙන ගත්තා." කඩදාසියක් හා පෑනක් අතට ගත් ඔහු යමක් කුරුටු ගා, එය පණිවුඩකරුවා අතට දුන්නේය.

"මිත්‍රයා, මේක මෙහිනිං පොලිස් පරීක්ෂක ග්‍රෙග්සන් අතට දෙන්න." හෝම්ස් කීය. "කියන්න වින්ගේට් වෙනිස් මහත්මයා මියගිහින් තියෙන්නේ, ස්වාභාවික හේතූන් නිසා බව. පශ්චාත් මරණ පරීක්ෂණයේ දී, ඒ බව තහවුරු වේවි. මහත්මයාගෙ තේ කෝප්පයට පැකට්ටුවක තිබූ සීනි ටිකක් දානවා හැරෙන්න, වෙනිස් මහත්මිය අතින් කිසිම අපරාධයක් සිදුවෙලා නැහැ."

ලියුම් කැබැල්ල රැගත් පණිවුඩකරුවා වහා එතැනින් නික්ම ගියේය. ඊළඟට මගේ මිත්‍රයා, මා දෙස බැලුවේ විමසිල්ලෙනි.

"ඉතින් වොට්සන්. මොකක්ද දැන් මට කරන්න තියෙන්නෙ? හරි. මට මතක් වුණා. දැන් අපි දෙන්නා කිංස්ක්‍රොස් දුම්රියපොළට යන්න ඕන නේද? හොඳ විවේකයක් ලබාගැනීමට අප දෙදෙනා යා යුතුයි...... උතුරු දිග එංගලන්තය බලා!" සිනාසෙමින් කී මගේ මිත්‍රයා අසුනෙන් නැගිට්ටේ, ඔහුගේ හිස්වැස්ම හා කබාය අතට ගැනීමට ය.

මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා සමග බේකර් වීදියේ නිවහනේ අප පදිංචියට ගිය කාලය ගැන, මම මීට පෙර සඳහන් කර ඇත්තෙමි. එහි මුල් මාස කිහිපය තුළ හෝම්ස්ට රාජකාරි එතරම් බහුල නොවීය. එහෙත් ඔහුගේ අතිදක්ෂ බව, අවංකකම, හා කාරුණික භාවය ගැන කීර්තිනාමය, ඉක්මනින් පැතිරගියේය. මේ නිසා ඔහුට ලැබුණු පරීක්ෂණ සංඛ්‍යාව ඉතා ඉක්මනින් වැඩිවිණි. ඒවා විසඳීම සඳහා මගේ මිත්‍රයා රෑ දවල් නොබලා වෙහෙස මහන්සි විය.



www.sinhalaelibrary.com

1883 අගභාගය වෙද්දී ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය අයහපත් අතට හැරුණේ මා බලාසිටියදීම ය. ඔහු අනිවාර්යයෙන්ම නිවාඩුවක් ගතයුතු බැව් මම තේරුම් ගතිමි. මේ ගැන මම ඔහුට බලකර සිටියෙමි. මීට පෙර කිහිපවතාවක්ම නිවාඩු ප්‍රතික්ෂේප කළ හෝම්ස්, මෙවර එයට කැමැති විය.

නොටිංහැම්ෂයර් ප්‍රාන්තයේ ගම්මානයක, මාසයක නිවාඩුවක් ගතකිරීමට, මම කටයුතු සැලසුම් කළෙමි. අපේ ගමන්මලු සියල්ල අසුරා, ගමන පිටත්වීම සඳහා අශ්වකරත්තය ද බේකර් වීදියට කැඳවූයෙමි. අපගේ සේවක ළමයා ගමන්මලු කරත්තයට පටවා අවසන් කළේය. එහෙත් මගේ මිත්‍රයා ගමනට කැඳවාගැනීමට මට නොහැකි විය. ඒ, විසඳිය යුතු ගැටලුවක් අන්තිම මොහොතේ ඔහුට භාරවූ හෙයිනි. අන්තිමේ දී එය ද විසඳා, අප උඩුමහලේ සිට පහළට බසින්නට පටන්ගත්තේ, හඩ්සන් මහත්මියගෙන් සමුගෙන ඉක්මනින් පිටවීයාමේ අරමුණෙනි. එහෙත් අප පුදුමයට පත්කරමින්, හඩ්සන් මහත්මිය ඉදිරියට ආවාය. ආගන්තුක පත්‍රයක් සහිත බන්දේසියක් ඇගේ අතේ විය.

"හෝම්ස් මහත්මයා, ඔබ හමුවෙන්න අමුත්තෙක්" ඇය කීවාය.

"ජී. ඒ. අටර්සන්" හෝම්ස් කීවේ, කාඩ්පත කියවා බලමිනි. "හඩ්සන් මහත්මිය ඔබ ඔහුට කීවේ නැද්ද, කලින් යොදාගත්ත ගමනකට අප පිටත්වෙන්න හදන බව?"

"මං කිව්වා මහත්මයා" ඇය කීවාය. "නමුත් මේ මහත්මයා කියනවා, ඔහුගේ අවශ්‍යතාවය බොහොම හදිසි එකක් කියලා."

"හොඳයි හොඳයි. එහෙනම් ඔහුට උඩට එවන්න" හෝම්ස් කීවේ මගේ මුහුණ බලමිනි. "මගේ මිත්‍රයා වොට්සන්. මේ ඇතිවන ප්‍රමාදය ගැන මට බොහොම කණගාටුයි. ඔබට තේරෙනවා ඇති, මට මේ මනුස්සයා හමුවීම ප්‍රතික්ෂේප කරන්න බැරිබව. ඒක හරියට වෛද්‍යවරයෙකුට රෝගියෙකු ප්‍රතික්ෂේප කරන්න බැරුව වගේ. කුලිරථ රියැදුරාට දැනුම්දෙමු අපි තවත් ප්‍රමාදයි කියලා"

"හෝම්ස්" මම කීවෙමි. "වෛද්‍යවරයෙකු හැටියට මට කියන්න තියෙන්නේ මෙච්චරයි.......... ප්‍රමාද වැඩිවන්නේ ඔබට නිවාඩුවක් ගැනීමට නොලැබුණොත්. ඔබ මේ සෙල්ලම්කරන්නේ, ඔබේ ජීවිතයත් සමග. භයානක අනතුරක් පෙනෙන තෙක් මානයේ එද්දී, එය නොසලකා හැරීම හරිම අවදානම්!"





"මොනවා කරන්නද වොට්සන්?" ඔහු කීවේ පැළඳසිටි හිස්වැස්ම හා කබාය ගලවා ඉවත්කරමිනි. "මේ ලන්ඩන් නගරයටම උපදේශක රහස් පරීක්ෂකයකු ඉන්නේ මං විතරයි. ඒකට මට ලැබෙන දඬුවම තමා මේක. කොහොම වුණත්......."

හෝම්ස් තම දෙසවන් යොමු කළේය. ඒ, තරප්පුව නැගගෙන උඩුමහලට එන අපේ අමුත්තාගේ අඩි ශබ්දයට යි.

"වොට්සන්....... ඔබේ කබාය ගලවලා, පුරුදු පුටුවෙන් වාඩිවෙන්න. ඇහෙන අඩි ශබ්දයේ හැටියට මට කියන්න පුළුවනි, අමුත්තා ඉන්නේ ලොකු කරදරයක වැටිලා. ඔහුගේ දුක්ගැනවිල්ලට, මට අමතරව තවත් කෙනෙක් සවන් යොමුකරනවා දකින්න, ඔහු වඩාත් කැමැතිවේවි."

මඳවේලාවක දී, විසිත්ත කාමරයේ දොර විවෘත විය. අමුත්තා ඇතුළුවිය. ඔහු වයසින් අවුරුදු පනහට ළංවූ අයෙක් බව බැලූ බැල්මට පෙනිණ. ඔහු අඳුරු පැහැති ඇඳුම් කට්ටලයකින් සැරසී සිටියේය. කළුපැහැති උඩුරැවුලක් තිබූ ඔහුගේ මුහුණ, බොහෝ සෙයින් ඇලිවැටී තිබිණ. ඒ හැම එකකටම වඩා මුහුණෙන් පළවූයේ අධි ශෝකයකි. හිසකෙස් බොහෝ ලෙස හැළීයාම නිසා, අමුත්තාගේ තට්ටය පෑදී තිබිණ. ඔහුගේ දෙනෙත්වලින් පැවසුණේ ද ශෝකහරිත බවකි.

හඩ්සන් මහත්මිය පිටව් යනතුරු, අමුත්තා නිහඬව බලා සිටියේය. මීළඟට ඔහු අප දෙදෙනාගේ මුහුණු දෙස බලන්නට වූයේ, තම ඇමතීම යොමු කළ යුත්තේ කාටදැයි සිතාගැනීමට අපහසු වූ අයුරෙනි.

"සුභ සන්ධ්‍යාවක් අටර්සන් මහත්මයා" හෝම්ස් කීවේ සුරත දිගුකරමිනි. "මම ෂර්ලොක් හෝම්ස්. මේ මගේ හිතවත් මිත්‍රයා, දොස්තර වොට්සන්. මා සමග කිවයුතු ඕනෑම දෙයක් ඔහු ඉදිරියෙත් කියන්න පුළුවනි.

ඔබේ කබාය ගලවන්න එපා. අද හුගක් සීතලයි. ගිනිඋදුන දල්වා නැති නිසා ඒක වඩාත්ම දැනෙනවා. ඒ වුණත් ඔය පුටුවේ වාඩිවෙන්න. අද දවස පුරාම ඔබ, ලන්ඩන් නගරයේ ඇවිද ඇති බව මට පෙනෙනවා. ඒ නිසා හැමදේකටම කලින් වාඩිවෙලා මහන්සි අරින්න"

"ඔබ කියූ දේ ඇත්තයි මහත්මයා" අමුත්තා කීවේ අසුනක හිඳගනිමිනි. "ඒ වුණත්....... ඒ කාරණය ඔබ දැනගත්තේ කොහොමද කියලා, මට හිතාගන්න අමාරුයි"



www.sinhalaelibrary.com

"සාමාන්‍ය නිරීක්ෂණයක් මගින්" මගේ මිත්‍රයා කීවේ අමුත්තාට සුරුට්ටුවක් පිළිගන්වමිනි. එහෙත් අමුත්තා එය, ප්‍රතික්ෂේප කළේය.

"ඔබේ කලිසම් කකුල්වල, මඩ ඉහී තිබෙන අයුරු මට දැකිය හැකියි" හෝම්ස් කීය. "ඒ මඩ පැල්ලම් නගරයේ විවිධ ප්‍රදේශවලින් ඉහී ඇති ඒවා බවට සැකයක් නෑ. ඔබ ගමන්කර තිබෙන්නේ තුලීරියකින් නෙමෙයි, පයින්. ඒක නම් බොහොම පහසුවෙන් කියන්න පුළුවනි. එහෙම නොවෙන්න මේ තරමට ඔබේ පාවහන් කෙත්වන්නේත් නෑ. ඔබේ හිස්වැස්මේ තැවරුණු මඩ තට්ටුවක් තියෙනවා. ඒක වියැළී යන්නත් පටන්අරගෙන."

අටර්සන් මහතාගේ හිස්වැස්ම තිබුණේ ඔහුගේ උකුළ උඩය. එහි මඩ තැවරී තිබූ තැන වෙත ඔහු තම නෙත් යොමු කළේය.

"හවුන්ඩ්ස්ඩිච් වලදියි ඒක සිද්ධවුණේ" ඔහු කීය. "දුම්කවුළු පිහිදමන ජරා කොල්ලෙක්, මගේ පැත්තට මඩ අහුරක් දමා ගැහුවා. මං සැරයටිය එසෙව්වා ඌට පහරදෙන්න. ඌ පැනලා දිව්වා."

"අටර්සන් මහත්මයා" හෝම්ස් කීවේ ගින්නක් නොදැල්වුණු උදුන දෙස බලමිනි. "දැන් මං කැමතියි, ඔබේ ගැටලුවට කන්දෙන්න. මං කැමතියි ඔබ හැම තොරතුරක්ම, අනුපිළිවෙළින් මා වෙත ඉදිරිපත් කරනවා නම්........ හරියට මහේස්ත්‍රාත්වරයෙකුට නඩුවක් ඉදිරිපත් කරද්දී වගේ........"

මේ මොහොතේ අපේ අමුත්තා සිය අසුනෙන් නැඟී සිටියේ, මුදා හළ දුන්නක් විලසිනි. පුදුමය හඟවමින් ඔහුගේ දෙනෙත් විශාල වී තිබිණි.

"........... ඔබේ ඇතුළු කබායේ සාක්කුවේ තිබෙන කඩදාසි මිටිය මා දුටුවා" හෝම්ස් කීය. "ඒ නීතිමය කටයුතු සඳහා යොදාගන්නා ප්‍රමාණයේ, ලොකු, ලා අළු පැහැති, තරමක් ඝනකම් පිටුදෙකේ කඩදාසි. ලතින් භාෂාවෙන් මුද්‍රිත වගන්තියක් හෝ දෙකක්, ඒ කඩදාසියක මා යන්තමින් දුටුවා. ඔබ නීතිඥයකු බව නිගමනය කිරීමට, එය හොඳටම ඇති."

හෝම්ස් කාරණා එකින් එක තේරුම් කරද්දී, අමුත්තාගේ කැලඹිලි ගතිය අඩුවූ බැව් පෙනිණ.

"හෝම්ස් මහත්මයා. ඔබ කලින් මට දුන් සුරුට්ටුව දල්වා ගත්තොත් හොඳයි කියල, මට දැන් හිතෙනවා"





මම සුරුට්ටු අසුරා තිබූ පසුම්බිය ගෙන, අටර්සන් මහතා වෙත ළං කළෙමි. ඔහු කතාව ඇරඹුවේ ඉන්පසුව ය.

"හෝම්ස් මහත්මයා. ඔබේ විස්තර මට ලබාදුන්නේ, මගේ ඥාති සහෝදරයා-රිචඩ් එන්ෆීල්ඩ් මහත්මයා. ඔහුගේ භාරයේ තිබුණු දුර්ලභ රන්කාසියක් අතුරුදන්වීම ගැන සෙවීම, ඔබට භාරදුන් බව ඔහු කීවා. ඔබ විශ්වාස කටයුතු, අවංක කෙනෙකු බවට ඔහු රෙකමදාරු කළා"

හෝම්ස් තම දෙනෙත් මා වෙත යොමුකොට, තම මේසයේ ලාච්චුවක් දෙසට ඇඟිල්ල දිගුකළේය. මම ඒ සංඥාව තේරුම් ගතිමි. ලාච්චුවේ තිබුණේ හෝම්ස්ගේ පරීක්ෂණ පිළිබඳ තොරතුරු කෙටියෙන් සුචිගත කළ පොතකි. මම එය රැගෙන හෝම්ස් අතට දුන්නෙමි.

"ස්තුතියි වොට්සන්" කියා එය අතට ගත් ඔහු, පිටු පෙරළා බැලීමට පටන්ගත්තේය.

"කෝ බලන්න.......... ආ මේ තියෙන්නේ එන්ෆීල්ඩ්" එය ඉක්මනින් කියවා බැලූ ඔහු පොත වසා දැම්මේය. "ඒක 1813 දී තුන්වැනි ජෝජ් රජ්ජුරුවන්ගේ කාලයේ නිකුත් කළ ගිනි එකේ කාසියක්. නිෂ්පාදනයේදී සිදුවුණු අත්වැරැද්දකින්, රජුගේ හිසේ ලාංඡනය, එහි දෙවරක්ම මුද්‍රා තබලා. ඒ නිසා වටිනාකම අතින් ඉතාම වැඩියි. මං ඒක පහසුවෙන්ම හොයාදුන්නු බව ඇත්තයි. ජීවිතේ අප මුහුණ දෙන ගැටලු අනන්තයි අප්‍රමාණයි. ඒ හැම එකක් ම පහසුවෙන් විසඳාගන්න පුළුවන් කියල, ඔබ හිතනවද අටර්සන් මහත්මයා?"

"හැම එකක්ම එහෙම විසඳාගන්න පුළුවන් නම් කොච්චර වාසනාවක්ද?" අටර්සන් මහතා හිස සෙලෙව්වේ සිනාසෙමිනි. "නමුත් මේක නම් එහෙම එකක් නොවෙයි. ඒ වගේම මේක ඉතාම රහසිගතව විසඳිය යුතු ප්‍රශ්නයක්. මං ඔබට අපහාස කරනවා කියල හිතන්න එපා මහත්මයා. මේක අතිශයින්ම රහසිගත කාරණාවක්. ඒක මේ බිත්ති හතරෙන් එළියට නොයා යුතුයි."

"ඒ ගැන මං ඔබට පොරොන්දු වෙනවා" හෝම්ස් කීය.

"මාත් පොරොන්දු වෙනවා" මම කීවෙමි.

අපේ ප්‍රතිචාරයෙන් අමුත්තා සෑහීමට පත්වූ බැව් පෙනිණ. කිහිපවාරයක් සුරුට්ටුව උරා දුම් පිටකළ ඔහු, පුටුවේ හරිබරිගැසී කතාව ඇරඹුවේය.



www.sinhalaelibrary.com

"මහත්මයා, මගේ හොඳම මිත්‍රයා තමයි, මගේ පරණම ගනුදෙනුකාරයා. ඔහුගේ නම දොස්තර හෙන්රි ජෙකිල්. බාගවෙලාවට ඔබ ඔහු ගැන අහලා ඇති. ජෙකිල් නාමය වෛද්‍ය ක්ෂේත්‍රයේ වගේම, ඉහළ සමාජයේත් ඉඳහිට අහන්න ලැබෙන නමක්."

"ඔහු කීර්තිමත් වෛද්‍යවරයකු බව මට අහන්න ලැබිලා තියෙනවා." මම කීවෙමි.

"හැබැට? එහෙනම් වෛද්‍ය විද්‍යාව වෙනුවෙන් ඔහු කරන පර්යේෂණ ගැනත් ඔබට අහන්න ලැබිලා ඇති" අටර්සන් මහතා කීය. "ඔහු කර ඇති පර්යේෂණ ගැන, ඔබ වෛද්‍ය විද්‍යාත්මක සඟරාවල කියවලා ඇති. ඒවා අමතක කරමු. ඒ හැම දේකටම වඩා මට නම්, හෙන්රි ජෙකිල් කියන්නේ අවංක මිත්‍රයෙක්. එය මං හොඳින්ම දන්නා කරුණක්. මිත්‍රයෙක් ඔහු වෙත විශ්වාසය තබා තිබෙනවා නම්, තමන්ගේ ජීවිතය ගියත්, ඒ විශ්වාසය නොකඩන කෙනෙක්. නමුත්......... නමුත් ටික කාලයකට පෙර, ඔහු නිසා මගේ හිත තදින් කැලඹුණා. තමන්ගේ අන්තිම කැමති පත්‍රය ලිවීමට ඔහුට උවමනා වුණා. එකෙ වරදක් නෑ. නමුත් එහි අඩංගු කළ කරුණු මගේ ඔළුව අවුල් කළා........."

"............... අටර්සන් මහත්මයා" හෝම්ස් කථාවට බාධා කළේය. "මේ දොස්තර ජෙකිල් වයස කීයක කෙනෙක් ද?"

"ඔහුත් මං වගේම අවුරුදු පනහට ළංවුණු කෙනෙක්"

"ඒ වයසේ කෙනෙක් තමන්ගේ මරණය ගැන හිතලා, අන්තිම කැමැති පත්‍රයක් ලිවීමේ වැරැද්දක් තියෙනවද?" හෝම්ස් ඇසීය.

"නැහැ මහත්මයා" නීතිඥයා පිළිතුරු දුන්නේය. "මගේ ඔළුව අවුල් කළේ, අන්තිම කැමැති පත්‍රය ලිවීමම, ඔහුට ඇතිවුණු උවමනාව නෙමෙයි; එහි අඩංගු කළයුතු බවට ඔහු කී කාරණා. ඒ ලියවිල්ල මං ඔබට පෙන්වන්නද?"

එසේ විමසූ නීතිඥයා තම ඇතුළුකබායේ සාක්කුවෙන් ලියකියවිලි කිහිපයක් එළියට ඇද්දේය.

"අටර්සන් මහත්මයා" හෝම්ස් කීය. "ඔබ ඒ ලියවිලි මට පෙන්වීමෙන්, නීතිඥ වෘත්තියේ විශ්වාසය බිඳීමක් සිදුවෙනවා නේද?"

"එහෙමවෙලා, මට නීතිඥ රැකියාව නැතිවුණත් කමක් නෑ මහත්මයා. මගේ මිත්‍රයාගේ ජීවිතය මට ඊට වඩා ලොකුයි. මං එය කියවන්නද?"





"එහි අඩංගු කරුණුවල සාරාංශය කියන්න" හෝම්ස් කීය. "මගේ ලතින් භාෂා දැනුම දැන් දුර්වලයි"

"මෙන්න අහගන්න" අටර්සන් කීය.

"දොස්තර හෙන්රි ජෙකිල් වන මා මරණයට පත්වුවහොත් හෝ, මාස තුනකට වැඩි කාලයක් හදිසියේ අතුරුදන්ව සිටියොත් හෝ, සිතාගත නොහැකි ලෙස දකින්නට නොලැබුණොත්, මගේ දේපොළ සම්බන්ධයෙන් පහත සඳහන් ලෙස කටයුතු කළ යුතු ය. පවුම් දෙලක්ෂ පනස්දහසක් වටිනා, සියලුම නිශ්චල චංචල දේපළ, එඩ්වඩ් හයිඩ් නම් මහත්මයාට හිමිවිය යුතුය."

අටර්සන් මහතා ලියවිල්ල නැවත සාක්කුවේ දමාගත්තේ, ප්‍රශ්නයක් අසමින් "හෝම්ස් මහත්මයා, මේ විදියේ අන්තිම කැමැති පත්‍රයක් ගැන, ඔබ ජීවිතයේ කවදාහරි අහල තියෙනවද?"

"මේක නම් පුදුමාකාර අන්තිම කැමැත්තක් බව ඇත්තයි. කවුද ඔය එඩ්වඩ් හයිඩ් කියන්නේ?" හෝම්ස් ඇසීය.

"අබිරහස තියෙන්නේ අන්න එතැනයි මහත්මයා" අටර්සන් කීය. "ජෙකිල් මට කියන තුරු, එහෙම කෙනෙක් ගැන මං ජීවිතේට අහලා තිබුණෙ නෑ."

"ඔහු කවුද කියලා, ඔබ ජෙකිල්ගෙන් ඇහුවෙ නැද්ද?"

"එම පුද්ගලයා ගැන තමන්ගේ හිතේ, විශේෂ උනන්දුවක් ඇති බවයි, ජෙකිල් කිව්වේ. ඔහු ඊට වඩා එක වචනයක්වත් කියන්නෙ නෑ"

හෝම්ස් මඳ වේලාවක් කල්පනා කළේය. "වෙන මොනවද ඔබට කියන්න තියෙන්නේ?"

"ඔව්, මගේ කතාවේ තවත් කොටසක් තියෙනවා" නීතිඥයා කීය. "මගේ ඥාති සොහොයුරා රිචඩ් එන්ෆීල්ඩ් ගැන, මං ඔබට කිව්වා. ඔහු ඒ පළාතේ අය ආශ්‍රය කරන, ඕපාදූප වලට කන්දෙන කෙනෙක්. වැඩ රාජකාරි වලින් හෙම්බත් වුණාම, මං යනවා ඔහු හමුවෙන්න. හැන්දෑවෙලාවේ, බීර ටිකක් පානය කරමින් අපි කතා බහ කරමින් ඉන්නවා. මීට දවස් දහයකට, දොළහකට කලින් මං ඔහු හමුවෙන්න ගියා. එතකොටයි මේ කතාව ඔහු මට කිව්වේ.

එක දවසක් උදේ පාන්දර, ඔහුට මේ දේ දකින්න ලැබී තිබුණා. පාරේ මංසන්ධියක් වගේ තැනකයි, මේක වෙලා තිබුණේ. උස් ගොඩනැගිල්ලක් තිබී මඟ නොපෙනී යාමෙන්, දෙපැත්තෙන් ආව

www.sinhalaelibrary.com

දෙදෙනෙක් එකිනෙකාගෙ ඇඟේ හැපිලා. එයින් එක් අයෙක් — කුඩා ගැහැනු ළමයෙක්. ඇය වේගයෙන් දුවගෙන ඇවිත්, එක්වරම අනෙක් පාරට හැරුණාලු. අනෙක් පාරේ වේගයෙන් ඉදිරියට ආ පිරිමියාගේ ඇඟේ ඇය හැපුණාලු. ඔහු උසෙන් අඩු මිටි පුද්ගලයෙක්. මේවා පාරෙදි සාමාන්‍යයෙන් සිදුවෙන දේවල් නේ. වැඩිය වටපිට නොබලා කුඩා ළමයින් දුවයන නිසා මේවා වෙන්නේ.

ඔහු මහත්මයකු නම් කරන්න තිබුණේ, සමාව අයදින්න. නැත්නම් වැඩිම වුණොත්, ළමයාට යමක් සැරෙන් කියා බැණවදින්න. නමුත් අර මිනිහා මොකද කළේ? බිම ඇදවැටුණු ළමයා හඬද්දීම, ඔහු ඇගේ සිරුර උඩින් කකුල්දෙක තියලා පාගාගෙන ගියාලු. ඇය වේදනාවෙන් මරහඬ දුන්නත්, ඔහු කිසිම නැකීමක් කරල නැහැ. පාරෙ තිබුණු ලෑල්ලක් උඩට පය තබා ඇවිදයනවා වගේ, ඔහු ඉදිරියට ඇවිද ගියාලු. එන්ෆීල්ඩ් ඔය කතාව කියද්දී, මගේ හිතට ඇතිවුණේ දරාගන්න බැරි කෝපයක්."

"ඇත්ත තේන්නම්" මට කියැවිණි. "ඒ යකා මිනිහෙක් නෙමෙයි, මෘගයෙක්"

අමුත්තා තම කථාන්තරය දිගටම කීවේය.

"මේ දුෂ්ටයා ඉක්මනට එතැනින් ඉවතට ඇවිදගෙන ගියාලු. නමුත් එන්ෆීල්ඩ් ඒ මිනිහා පිටුපස දිව ගිහින්, ඔහුව කරපටියෙන් අල්ලාගෙන තියෙනවා. මේ වෙනකොට ළමයාගේ පවුලේ අයත් එතැනට දුවගෙන ආවාලු. ඒ කිට්ටුව පදිංචිව හිටි දොස්තර මහතෙකු එතැනට කැඳවාගෙන ඇවිත්. එන්ෆීල්ඩ් අර තක්කඩියාට යන්න දීල නැහැ. දොස්තර මහත්මයා අර පුංචි ගෑනුළමයාව පරීක්ෂාකරල බලල තියෙනවා. දෙවියන් බැලුවා වගේ, ඇයට මොකුත් බරපතළ තුවාලයක් සිදුවෙලා නැහැ. තව ටිකෙන් ළමයාගේ පවුලේ අය, අර තක්කඩියාගේ ඇටකටු කඩන්න, ඉඩ තිබුණාලු. එන්ෆීල්ඩ් ඒ අයට කාරණා කියල දීල තක්කඩියාව බේරාගත්තාලු. ඔහුගේ මුහුණ ගැස්ලාම්පුවේ එළියෙන් දුටු එන්ෆීල්ඩ්ගේ හිතේ, මහ පිළිකුලක් ඇතිවුණාලු. ඒ තක්කඩියාගේ මුහුණේ තිබුණේ, භයානක මිනීමරුවෙකු සතු, දරුණු පෙනුමක්ලු. ඒ වුණත් ඒ වෙලාවේ ඔහුට අනුකම්පා කරල, ඔහුව නිදහස් කර යවන්න එන්ෆීල්ඩ් යෝජනා කළාලු.





කොහොමවුණත්, ළමයාට වුණු හිරිහැරය වෙනුවෙන්, ඇයගේ පවුලේ අයට අලාභයක් ගෙවන්න කියලා, එන්ෆීල්ඩ් කිව්වලු. අන්තිමේදී ගැහැනුළමයාගේ පවුලට පවුම් සීයක් ගෙවන්න, තක්කඩියා එකඟවෙලා තියෙනවා. ඒ වෙලාවේ තමන් ළඟ මුදල් නොමැති නිසා, තමන්ගේ ගෙදර ළඟට එන මෙන් ඔහු පිරිසගෙන් ඉල්ලා හිටියලු.

ඔවුන් ඊකට කැමතිවෙලා තියෙනවා. ඔවුන් ගිහින් තියෙන්නේ, නගරයේ බොහොම කලබලකාරී වීථියක තිබුණු හරස්පාරක. ඒකෙ තිබුණු අබලන්, පරණ ගේක දොරක්, යතුරෙන් ඇරගෙන, අර මිනිහා ඇතුළට ගියාලු. මිනිත්තු කිහිපයකින් ඔහු එළියට ඇවිත් තියෙනවා. ඔහු තමන්ගේ මුදල් පසුම්බියෙන් එළියට ගත්තලු, රන් පවුම් කාසි දහයක්. ඉතිරි පවුම් අනූවට ඔහු චෙක්පතක් ඉදිරිපත් කළා ලු.

ඒ චෙක්පත අතටගත් එන්ෆීල්ඩ් ඉමහත් පුදුමයට පත්වුණාලු. ඒ මොකද, චෙක්පත අයත් තැනැත්තාගේ නම, සමාජයේ සුප්‍රසිද්ධ වැදගතෙකුගේ නමක්ලු. මේ චෙක්පත භාරගන්න, පවුලේ අයවත් එන්ෆීල්ඩ් වත් කැමැතිවෙලා නැහැ. පස්සේ ඔවුන් බැංකුව අරිනතුරුම අර තක්කඩියාව රඳවාගෙන ඉඳලා තියෙනවා. චෙක්පත බැංකුවට ඉදිරිපත් කළාම, කිසිම ප්‍රශ්නයක් නොඅසාම බැංකුවෙන් ඊට මුදල් ගෙවල තියෙනවා. ඊට පස්සෙ තමයි ඔවුන් අර දුෂ්ට මිනිහාට යන්න දීල තියෙන්නේ.

"අශෝභන සිදුවීමක්" හෝම්ස් කීය. "ඒ වුණත් පැහැදිලි කාරණයක් මතුකරගන්න තරම් දෙයක් එතැන නෑ. අපි මේ කරමින් හිටි කතාවට, මේ සිද්ධිය සම්බන්ධ වෙන්නේ කොහොමද?"

"ඒ සම්බන්ධය පුදුමාකාරයි හෝම්ස් මහත්මයා" අටර්සන් කියද්දී, පුරුද්දට වුව ගත් ඔහුගේ අත වෙවුලන අයුරු අපි දුටුවෙමු. "එන්ෆීල්ඩ් මේ කතාව මට කිව්වේ, අපි එම වීදියේ ඇවිද යද්දී. අපි ගියේ, අර තක්කඩියා මුදල් සහ චෙක්පත ගෙන එන්න ඇතුළුවුණු දොරටුව ඉදිරියෙන්. එන්ෆීල්ඩ් මට ඒ දොර පෙන්නුවා.

"හරි පුදුමයක් නේ" මං එන්ෆීල්ඩ්ට කිව්වා. "මගේ හිතමිත්‍ර දොස්තර ජෙකිල්ගේ නිවස පිහිටි ගොඩනැගිල්ලට, මේ දොරටුවෙන් ඇතුළුවෙන්න පුළුවන්. ඇත්තම කියනවා නම් මේක තමා ජෙකිල්ගේ නිවසේ පසුපස දොරටුව"



www.sinhalaelibrary.com

"හරියට හරි" එන්ෆීල්ඩ් කිව්වා. අර චෙක්පත අයිති ගිණුම, ජෙකිල්ට හිමි ගිණුමක්. එයට අත්සන් කර තිබුණේත් ජෙකිල් මහත්මයා යි. ඒකෙ ලියා තිබුණේ එඩ්වඩ් හයිඩ්ට හෝ රැගෙන එන්නාට කියලයි" එන්ෆීල්ඩ් මට කිව්වා"

"දෙයියෝ සාක්කි!" මට කෑගැසිණ.

හෝම්ස් බොහෝවිට මෙවැනි කතාවලට සවන්දෙන්නේ, දෙනෙත් පියාගෙන නිදිබර ආකාරයට ය. එහෙත් අටර්සන් අන්තිමට කී වාක්‍යය ඇසූ හෝම්ස් තිගැස්සුණේය. ඔහු ඉක්මනින් පුටුවේ කෙළින් හිඳගත්තේය. ඔහුගේ දෙනෙත් දීප්තිමත් විය. එම දෙනෙත් නීතිඥයා දෙසට යොමුකළ හෝම්ස්, මිනිත්තුවකට වඩා කාලයක් ඇසිපිය නොහෙළා බලා සිටියේය. ඊළඟට ඔහු මා දෙසට හැරුණේය.

"වොට්සන්, කුලිරිය ආපහු හරවා යවන්න!" ඔහු කීවේ තීරණාත්මක හඬකිනි.



2.

## ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණය භාරගනියි.

මගේ මිත්‍රයාගේ යහපත වෙනුවෙන් ඔහුට නිවාඩුවක් ගැනීමට, මා කටයුතු සූදානම් කළ බව සත්‍යයකි. එහෙත් මෙවැනි වෙලාවක, ඔහුට සිත් ඇදගන්නා පරීක්ෂණයක් ලැබුණු වෙලාවක, ඊට විරුද්ධත්වය පළකිරීමෙන්, ප්‍රයෝජනයක් නොලැබෙන බැව් මම දැනසිටියෙමි. කළහැකි හොඳම දෙය ගමන අවලංගු කර දැමීමය.

බඩු පිරවූ අපේ ගමන්මලු, ආපසු කාමර වෙත ගෙන එන මෙන්, මම කුලීරථ රියැදුරාගෙන් ඉල්ලා සිටියෙමි. ඉන්පසු, ඔහුගේ මහන්සිය වෙනුවෙන් පවුම් භාගයක මුදලක් ගෙවා, ඔහු පිටත්කර හැරියෙමි.

මේ වනවිට හෝම්ස්, අපේ විසිත්ත කාමරයේ ගිනිඋදුන දල්වා, කාමරය උණුසුම් කර තිබිණ. අටර්සන් මහතා කබාය ඉවත්කොට සුවපහසු අසුනක හිඳගෙන සිටියේය. අප සතුව තිබූ හොඳම වයින් වලින්, අමුත්තාට සංග්‍රහ කිරීමට අමතක නොකළ හෝම්ස්, තම පයිප්පයේ කෝච්චට දුම්කොළ පුරවමින් සිටියේය.

"වොට්සන්, අපි බලාහිටියෙ ඔබ එනතුරු" මගේ මිත්‍රයා කීවේ, මා විසිත්ත කාමරයට පැමිණ ඔවුන් සමීපයෙහි හිඳගනිද්දීය.

"ඉතින් අටර්සන් මහත්මයා" හෝම්ස් කීය. "අපට කියන්න ඔබේ කතාවේ ඉතිරි හරිය. මේ සිද්ධිය පිටුපස හැංගුණු අබිරහස මොකක්ද කියලා හොයන්න, ඔබ උත්සාහ කරන්න ඇති. ඔබේ ඒ කටයුත්ත කොයිතරම් දුරට සාර්ථක වුණාද? කියන්න. මට හංගන්න එපා. නීතිඥයන්ට තියෙන්නෙත්, රහස් පරීක්ෂකයන්ට තියෙන ආකාරයේ, කුතුහලයෙන් හාරා අවුස්සන හිතක්. එහෙම නැති නීතිඥයකු තවම මට හමුවෙලා නෑ. මේකෙ අගමුල මොකක්ද කියලා හොයාගන්න, මොනවද ඔබ කළේ?"

තම පයිප්පය වෙත යොමුකරගෙන සිටි දෙනෙත්, හෝම්ස් අමුත්තා වෙතට යොමු කළේය. එහි තිබුණේ සියල්ල විනිවිද යන ආකාරයේ බැල්මක් බව මම දුටුවෙමි.



www.sinhalaelibrary.com

හෝම්ස්ගේ වචන වලට කන්දෙමින්, අටර්සන් මහතා හිස ඉහළ පහළ සෙලෙව්වේය. අතේ තිබූ වීදුරුවෙන් වයින් ස්වල්පය බැගින් පානය කළ ඔහු, කරාව ඇරඹුවේ වීදුරුව මේසය මත තබමිනි.

"හෝම්ස් මහත්මයා. ඔබට කාරණා හැංගීමෙන් පලක් නොවන බව මං දැනගිටියා. මම සෝදිසි කිරීම් කිහිපයක්ම කළා. ඒ, මට හැකි පමණින්. ජෙකිල්ගේ නීතිඥයා හැටියට, මං එහෙම දෙයක් කිරීමේ වැරැද්දක් නෑ.

මං මුලින්ම ගියේ, අපි දෙන්නාගේම මිත්‍රයෙකු හමුවෙන්න. ඒ තමයි කැවෙන්ඩිෂ් චතුරශ්‍රයේ දොස්තර හේස්ටි ලැනියන්. මා හැරුණු විට ජෙකිල්ට ඉන්නා පැරණිම මිත්‍රයා ලැනියන්. එහිදී මට දැනගන්න ලැබුණේ, මා හරිම පුදුමයකට පත්කළ කරුණක්. පහුගිය අවුරුදු දහයක කාලයකට දොස්තර ලැනියන්, දොස්තර ජෙකිල් සමඟ එක වචනයක් කතාකරල නෑ. මොකක් හරි වෛද්‍ය විද්‍යාත්මක කරුණක් සම්බන්ධයෙන්, දෙදෙනා අතර මතභේදයක් පැන නැගිලා, පසුව ඒක උග්‍රවෙලා. ඒ නිසයි අමනාපය. දොස්තර ලැනියන් අර එඩ්වඩ් හයිඩ් ගැන කිසිම දෙයක් දැනගෙන හිටියෙ නෑ."

"මොහොතක් ඉන්න" හෝම්ස් කීය. "දෙදෙනා අතර මතභේදය ඇතිවුණේ, කුමන විද්‍යාත්මක කරුණ ගැනද කියලා ලැනියන් ඔබට කිව්වද?"

එසේ නොකිවූ බව හඟවමින් හිස සෙලවූ අටර්සන්, ඉක්මනින් පිළිතුරු දුන්නේය.

"නෑ, හරියටම ඒ මොකක්ද කියලා ලැනියන් මට කිව්වෙ නෑ. ඔහු කිව්වේ මෙහෙමයි — ජෙකිල්ගේ කරුණෙ වැඩකරන්නෙ, කිසිම විද්‍යාත්මක පදනමක් නැති, පිස්සු බහුබූත — ජෙකිල්ගෙ නම සඳහන් කරද්දීම ලැනියන් කෝපයට පත්වුණා"

"හරිම සිත් ඇදගන්නාසුලුයි. ඔබේ කරාව දිගටම කියන්න." හෝම්ස් ඉල්ලා සිටියේය.

"දොස්තර ලැනියන් ගෙන් තවත් මොනවත්ම දැනගන්න බැහැ කියලා, මට අන්තිමේදී තේරුණා" අටර්සන් කීය. "ඉතින් මං කල්පනා කරලා එක දෙයක් තේරුම්ගත්තා. ඒ මොකක්ද; මේ ප්‍රශ්නයේ පතුලටම යන්න නම්, මං මේ එඩ්වඩ් හයිඩ් හමුවිය යුතුමයි කියන කරුණ. ඒක කිරීමට තියෙන්නේ එකම විදියයි. ඒ





තමා, එන්ෆීල්ඩ් එදා මට පෙන්වූ දොරටුව අසලට වෙලා, සෝදිසියෙන් රැඳී සිටීම. මෙම දොරටුවෙන් ඇතුළුවුණාම මුලින්ම, හමුවෙන්නේ තරමක් ලොකු ශාලාවක්. කාලයකට පෙර මළසිරුරු කපා පරීක්ෂාවට ජෙකිල් යොදාගත්තෙ ඒ ශාලාව."

"ඒක මට තව පැහැදිලි කරන්න"

"හෝම්ස් මහත්මයා. ජෙකිල් වෛද්‍ය විද්‍යාවේ පර්යේෂණ කළ කෙනෙක් බව මං ඔබට කිව්වා. ඒ නිසා ඔහු මැතක් වෙනතුරු මළසිරුරු විච්ඡේදනය කරමින් පර්යේෂණ කළා. පසුකලක ඒ කටයුතු නැවැත්වූ බව ඔහු සඳහන් කළා මට මතකයි. මළසිරුරු විච්ඡේදනය නැවැත්වීමෙන් පසු, ජෙකිල් ඒ ශාලාව වෙනත් කටයුතු සඳහා යොදාගත්තා.

ඔහු ඒක තමන්ගේ රසායන විද්‍යා පර්යේෂණාගාරය බවට පත්කරගත්තා. රසායන වර්ග දහදහස් ගණනක්, ලෝහමය යන්ත්‍රෝපකරණ, අම්ල සහිත විශාල බෝතල් එහි තිබෙනවා. බන්සන් දාහක සඳහා ගෑස් නිෂ්පාදනය කරන යන්ත්‍රයක්, එම ශාලාවේ එක් පැත්තක තියෙනවා. වීදුරු වලින් තැනූ නොයෙකුත් හැඩයේ, අමුතු නම් වලින් හැඳින්වෙන භාජනත් එහි තියෙනවා. ජෙකිල් ඒවා යොදාගෙන පර්යේෂණ කරනවා. මේ රසායනාගාරයේ එක් පැත්තක, එච්චර පාවිච්චියට නොගන්න ගබඩා කාමර තියෙනවා. එඩ්වඩ් හයිඩ්, ජෙකිල් හමුවෙන්න යනවා ඇත්තේ, මේ පැත්තෙන් වෙන්න පුළුවනි. මට හිතුණේ එහෙමයි. ඒ නිසා හයිඩ් අල්ලාගන්න උවමනා නම්, මා කළ යුත්තේ රෑ දවල් නොබලා මෙතැන රැකසිටීමයි.

හෝම්ස් මහත්මයා. දවස් ගණනාවක් ඔය විදියට මං එතැන සෝදිසියෙන් හිටියා. රහස් පරීක්ෂකයෙක් වීමට, මගේ හිතේ ආශාවක් තිබුණා නම්, ඒකත් එපාවුණා. කොහොම වුණත් අන්තිමේදී එක්තරා රාත්‍රියක, මගේ බලාපොරොත්තු ඉටුවුණා. ඒ ඊයේ රාත්‍රී. එය අන්ධකාර සීතල රාත්‍රියක්. වෙලාව රෑ දහය පහුවුණා විතරයි.

මුලින්ම මට ඇහුණේ කෙනෙකුගේ අඩි ශබ්දය. පෙවණැලි තිබූ අන්ධකාර තැනකට වෙලා මං බලාගෙන හිටියා. ආවා කෙනෙක්. උසින් අඩු මේ පුද්ගලයා ඇඳ සිටියේ, සාමාන්‍ය ඇඳුමක්. ඔහුගේ එක් අතක තිබුණා බර සැරයටියක්. අනෙක් අත තබා සාක්කුවට

දමලා. ඔහු යතුරක් එළියට ගත්තා. ඊළඟට ඔහු එය යතුරු කටට දමන්න සූදානම් වෙන කොටම, මං එතැනට ළංවුණා.

ඔහුගේ උරහිස උඩින් මං අත තැබුවාම, ඔහු හිගැස්සී වහාම ආපසු හැරුණා. ක්ෂණිකව මට පහරදීමට සූදානමෙන්, ඔහුගේ සැරයටිය දකුණු අතින් අමෝරා ගත්තා. නමුත් මගේ අතෙත් සැරයටියක් තිබුණු නිසා, මං භයවුණේ නෑ.

"මහත්මයා මොහොතකට නවතින්න" මං කිව්වා. "මම දොස්තර හෙන්රි ජෙකිල්ගේ මිත්‍රයෙක්. මං හිතන්නේ ඔබත් ඔහුගේ මිත්‍රයෙක්. එහෙම නේද?"

"ඔව්" ඔහු පිළිතුරු දුන්නේ අකමැත්තෙන්.

"ඔබ වෙන්නැති එඩ්වඩ් හයිඩ් මහතා?" මං ඇහුවා.

"ඔව් මං තමයි" ඔහු කීවේ ගොරෝසු කටහඬකින්. කිසිම ආචාරශීලී බවක් නැති විදියට. "දැන් ඔහේට මොනවද මගෙන් ඕන වෙලා තියෙන්නේ?"

"හයිඩ් මහත්මයා" මං කිව්වා. "මං කැමතියි ඔබ සමග කතාබස් කරන්න. ඔබව දැන හඳුනාගන්න. දොස්තර ජෙකිලුත් මට හමුවිය හැකියි නේ. අපි යමුද ගේ ඇතුළට?"

"බැහැ!" ඔහු ගිගිරුවේ හරිම අශෝභන විලාසයෙන්. "ඔහේ මේ ගේ ඇතුළට ඒමෙන් කිසිම ප්‍රයෝජනයක් නැහැ. කොහොමවත් දොස්තර ජෙකිල් මේ වෙලාවෙ ගෙදර නෑ. ඒක නෙමෙයි. තමුසේ කොහොමද මාව අඳුනාගත්තෙ?" හයිඩ් මගෙන් ඇසුවා.

මේ වෙලාවෙ එතැන තිබුණේ සැහෙන අන්ධකාරයක්. ඒ නිසා ඔහුගේ මුහුණ මට කොහොමවත් පෙනුණේ නෑ. අනෙක ඔහු හිස්වැස්ම පැළඳගෙන හිටියේ, මුහුණ වැහෙන විදියට. හයිඩ් ඇසූ ප්‍රශ්නය මගහරිමින් මං මෙහෙම කිව්වා.

"මහත්මයා. ඔබ මගදි දැක්කොත් හඳුනාගැනීමට, මං කැමතියි ඔබේ මුහුණ ටිකක් බලාගන්න"

"හැබෑට? මගේ මුහුණ බලාගන්න ඔහේට ඕනමද?" ඔහු ඇසුවේ කර්කශ හඬෙන්. ඒක උපහාසයක් ගැබ්වෙලා තිබුණා කියල, මට දැන් හිතෙනවා. එහෙම කියූ ඔහු ගෑස් පහනේ එළිය වැටෙන හරියට ගිහිං, හිස්වැස්ම ඉවත්කරලා, මුහුණ මා දිහාට දිගු කළා. දෙවියනේ!"

අටර්සන් මහතාගේ ඇඟ කිලිපොලා ගිය බැව් මම දුටුවෙමි. කථාව නැවැත්වූ ඔහු, වයින් වීදුරුව මුව තබා උගුරු කිහිපයක් පානය කළේය.





"හෝම්ස් මහත්මයා. මං ඔබට දිවුරා කියන්නම්. මගේ ජීවිත කාලය තුළදී ඒ මුහුණ තවත් නම් දැකගන්න මට උවමනා නැහැ. හයිඩ්ගේ මුහුණ දැකීමෙන්, මගේ හිතේ ඔහු කෙරෙහි ඇතිවුණේ ද්වේෂයක්, පිළිකුලක්, වෛරයක්. එය ඔබට කොහොම විස්තර කරන්නද කියලා මට නම් තේරෙන්නෙ නැහැ. ඔහුට තිබුණේ ඉතාම බියකරු විකෘති මුහුණක්. මට ඒක වචනයෙන් විස්තර කරන්න බැහැ. ඒ වුණත් යළිත් දුටුවොත්, දුටු වහාම මට හඳුනාගන්න පුළුවනි. ඔහු කෙරෙහි මගේ හිතේ ඇතිවුණු පිළිකුල මේ මොහොතෙත් මට දැනෙනවා"

"හරිම පුදුමයි" හෝම්ස් කීය. "ඉතින් ඔබේ කථාව කියන්න"

"ඔහුගේ මුහුණේ පෙනුමෙන්, මං ලොකු තැතිගැන්මකට පත්වුණු බව ඇත්තයි" අටර්සන් කීය. "ඒ වුණත් මගේ කටෙනුත් වචන කිහිපයක් පිටවුණා. ඔහු මුහුණ පෙන්වූ එක ගැන ස්තුති කිරීමක් මං කළේ"

"ඔහේ දන්නවද, මං පදිංචි කොහේද කියලා?" එඩ්වඩ් හයිඩ් එක්වරම මගෙන් ඇහුවා. මං පුදුමයට පත්වුණා. මට හිතෙන්නේ ඔහුට උවමනා වුණා, ඔහු පදිංචි ස්ථානය ගැන මට දැනුම් දීල තියන්න. ඒ මොකද ජෙකිල්ගෙ අන්තිම කැමැත්ත හදිසියේ ක්‍රියාත්මක කරන්න උවමනා වුණොත්? එතකොට හයිඩ් පදිංචි තැන මං දැනගෙන ඉන්න එපායැ. ඔහුගේ කටහඬෙන්, ඔහු එය කියූ තාලෙන් මට තේරුණේ මොකක්ද දන්නවද? අද හෙටම නැත්නම් ළඟදීම, ජෙකිල්ගේ දේපළ, තමන්ට උරුම වේවි කියල හයිඩ්ගේ හිතේ බලාපොරොත්තු ඇතිබව.

"ඔහේ මට කිව්වෙ නැහැනේ, මාව අඳුනාගත්තෙ කොහොමද කියලා?" හයිඩ් ආයෙත් මතක් කළා?

එතකොට මං කිව්වා — "මං හිතන්නේ හයිඩ් මහත්තයාගෙ පෙනුම ගැන, දොස්තර ජෙකිල් මට විස්තර කියල තිබුණා"

මගේ ඒ කතාව ගැන මිනිහට හොඳටම කේන්ති ගියා. කේන්තියෙන් පුපුරමින් ඔහු මට බැණ වැදුණා.

"තමුසෙ මහා බොරුකාරයෙක්! ඔව්. මහා බොරුකාරයෙක්. ඔහ පට්ටපල් බොරුවක්නෙ ඔය කිව්වේ!" මෙහෙම කියා ගිගිරූ ඔහු, යතුරෙන් දොර ඇරගෙන, කාමරයට ඇතුළට වැදිලා, "දඩාස්" ගාල දොර වසා ගත්තා.



www.sinhalaelibrary.com

මං මිනිත්තු කිහිපයක් පදික වේදිකාව උඩට වෙලා බලාගෙන හිටියා. ඊ ළඟට කළ යුත්තේ මොකක්ද කියලා තීරණය කරගන්න බැරුව. අන්තිමට මං තීරණයකට ආවා. මේකෙ හැංගිච්ච රහස මොකක්ද කියලා, මං හොයාගත යුතුයි. මං ඒක හාරා අවුස්සා බැලිය යුතුම යි.

ඒ පටුමාවතෙන් මං ආපහු ප්‍රධාන පාරට ආවා. ඒකෙ ගිහින් ජෙකිල්ගේ ඉස්සරහ දොර තියෙන මාවතේ ගමන් කළා. මේක බොහොම වැදගත් පැත්තක්. දොර විවෘත කළේ ජෙකිල්ගෙ ගෘහ සේවකයා — පූල්.

"දොස්තර මහත්මයා ගෙදර නෑ; බැහැරක ගිහින්" පූල් කිව්වා.

"ආ....... ඒකට කමක් නෑ පූල්" මං කිව්වා. "මොහොතකට කලින් මං දැක්කා, දොස්තර මහත්තයාගෙ මිත්‍රයා — හයිඩ් මහත්තයා. මං අනික් පටුමගේ එද්දි මට ඔහු හමුවුණා. ඔහු දොස්තර මහත්තයාගෙ අර පරණ විච්ඡේදන කාමරය — දැන් රසායනාගාරය; ඒකෙ දොර ඇරගෙන ගෙට ඇතුළුවුණා. හයිඩ් මහත්තයා නිතරම ඒ පැත්තෙන් ගෙට ඇතුළුවෙනවද?"

"ඔව් අටර්සන් මහත්මයා" පූල් පිළිතුරු දුන්නා. "ඒ දවල් කියල නෑ, වෙලාවක් කියල නෑ. හයිඩ් මහත්තයා ගෙට ඇතුළුවෙන්නෙ පිටවෙන්නෙ ඒ පැත්තෙන්. උන්හිටි ගමන් දොර ඇරගෙන එනවා, යනවා. ජෙකිල් දොස්තර මහත්තයා අපට නියෝග කරලා තියෙන්නේ, හයිඩ් මහත්තයාගෙ වැඩකටයුතු වලට බාධා කරන්න එපා කියලයි. ඔහු මෙහේ කෑමට නම් නවතින්නෙ නෑ. ආවට දීර්ඝ කාලයක් ඉන්නෙත් නෑ. අපට ඒ හැටිම මුණගැහෙන්නෙත් නෑ" පූල් පිළිතුරු දුන්නා. ඉතින් ෂර්ලොක් හෝම්ස් මහත්මයා එච්චර හයිඩ් ගැන මට හොයාගැනීමට හැකිවුණේ ඔය තොරතුරු පමණයි."

"විශිෂ්ටයි" හෝම්ස් පැවසුවේ, දුම් වලාවක් පයිප්පයෙන් පිට කරමිනි. "අටර්සන් මහත්මයා, ඔබ නීතිඥ වෘත්තිය තෝරා ගැනීම ඇත්තෙන්ම කණගාටුවට කරුණක්. ඔබට සුදුසු වෘත්තිය — රහස් පරීක්ෂණ වෘත්තිය. ස්කොට්ලන්ඩියාඩ් පොලීසියට උවමනා කරන්නේ ඔබ වගේ අය. මේ ආකාරයට තොරතුරු සපයාදීමෙන්, ඔබ මගේ කටයුත්ත පහසු කරනවා"

"මේ අභිරහස විසඳීම ඔබ භාරගන්නවාද එහෙනම්?" අටර්සන් විමසුවේ අසුනෙන් නැගී සිටිමිනි.





"මේකෙ තියෙනවා, පැටළුණු, අවුල් සහගත තැන් රාශියක්" හෝම්ස් කීය. "ඒ සමගම තිබෙනවා සිත් ඇදගන්නා කරුණු. මට තියෙනවා ඔබෙන් අහන්න අවසන් ප්‍රශ්නයක්. ඔබ දොස්තර ජෙකිල්ව අඳුනන්නේ සෑහෙන කාලයක ඉඳලා. ඔහු කවදා හරි, මොනවා හරි අපරාධයකට හෝ කදබල වැඩකට පැටළුණු බවක් දැනගන්න තියෙනවද?"

"කොහොමටවත් නෑ මහත්මයා" නීතිඥයා කීය. "කවදාවත් නෑ. මං දන්නවා ඔබ අදහස් කරන්නේ මොනවද කියලා. නමුත් මං ඔබට සහතික කරලා කියන්නම්. හෙන්රි ජෙකිල් කියන්නේ, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම, වැදගත් මහත්මයෙක්. ඔහුගේ චරිතය ගැන කිසිම වරදක්, කවදාවත් මට අහන්න ලැබිලා නැහැ. හැබැයි මං මේ දෙයත් කිවයුතුයි. මං ජෙකිල්ව හඳුනාගත්තේ, ඔහු වෛද්‍යවරයකු ලෙස ලන්ඩනයේ පදිංචියට ආවට පස්සේ. ඔහු වෛද්‍යවරයකු වීමට අධ්‍යාපනය ලබල තියෙන්නේ එඩිංබ්‍රෝ සරසවියේ. ඔහු එහේ ජීවත්වුණු කාලයේ, ඔහුගේ තොරතුරු කිසිම දෙයක්, මං දන්නේ නැහැ. ඒ වුණත්, ඒ කාලෙවත්, ඔහු තමන්ගේ චරිතයට කැළලක් ඇතිකරගත් කෙනෙක් කියලා, මං හිතන්නේ නෑ. හෙන්රි ජෙකිල් කියන්නේ, වෛද්‍ය වෘත්තියටම ගෞරවය ලබා දෙන කෙනෙක්"

"ජෙකිල් විවාහකද? කාන්තාවන් සමග ඔහුගේ සම්බන්ධය කොහොමද?" හෝම්ස් විමසුවේය.

නීතිඥයාගේ මුහුණට සිනාරැල්ලක් නැගිණ.

"හෝම්ස් මහත්මයා. ඔහු කවදාවත් විවාහ වෙලත් නෑ; විවාහ වෙන්නෙත් නෑ, හරියට මං වගේමයි. මං ඒ ගැන සහතික වෙන්නම්. ජෙකිල් ඉතා හොඳ චරිතයක් ඇති කෙනෙක්"

"අපට මොකුත්ම තේරුම් ගන්න අමාරු තත්ත්වයක් තමා තියෙන්නේ" හෝම්ස් කීය.

"හෝම්ස් මහත්මයා, මට ඇත්තම කියන්න." අටර්සන් කීය. "මේ හයිඩ් කියන මිනිහා ජෙකිල් ප්‍රාණ ඇපකාරයෙක් කරගෙනද? ජෙකිල්ගේ යම් රහසක් එළිකරන බවට තර්ජනය කරමින්, ඔහු භය කරගෙනද? ඔබට හිතෙන්නේ එහෙමද?"

"එහෙම දෙයක් වෙන්නත් පුළුවනි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "නමුත් ප්‍රමාණවත් තරම් දත්ත නොමැතිව, කුමන හෝ පැත්තකට හිතාබලන්න අමාරුයි."

"හොඳයි කමක් නෑ" අටර්සන් කීය. "ජෙකිල්ගේ සැඟවුණු රහසක් තිබුණා හරි නැතුව හරි; ඔහු මගේ මිත්‍රයා එච්චරයි" අටර්සන් මහතා කීවේ පිටවී යාමට සූදානම් වෙමිනි. "එච්චර හයිඩ් කියන්නේ බිහිසුණු මංගයෙක් බව පැහැදිලියි. ඒ මංගයා ඉදිරියේ, මගේ මිත්‍රයාට දුක් කරදර විඳින්න සිදුවෙනවා නම්, ඒකට ඉඩදෙන්න මට නම් බෑ. මං ඔහු නිදහස් කරගත යුතුයි. අන්න ඒ නිසයි මං ඔබ හමුවෙන්න ආවෙ. ඔබ මේ ගැටලුව විසඳීම භාරගන්නවද නැද්ද?"

"මං බොහොම කැමැත්තෙන් භාරගන්නවා" හෝම්ස් පිළිතුරු දුන්නේය.

"හරි. බොහොම ස්තුතියි. "අටර්සන් කීය. "ඒත් එක කරුණක් ගැන, ඔබ බොහොම පරෙස්සම් වියයුතුයි. ඔබ මේ ගැන හොයා බලන බව, ජෙකිල්ට දැනගන්න ඉඩතියන්න එපා"

"මං ඒ ගැන පොරොන්දු වෙන්නම්, අටර්සන් මහත්මයා. අපට හැකිතරම් කල්, ඔහුට කිසිම දෙයක් නොදන්වා අපේ කටයුතු කරගෙන යන්නම්"

අටර්සන් නීතිඥවරයා හෝම්ස්ගේ සුරත ගෙන ස්තුති කළේ සමුගැනීමට සූදානමෙනි. මේ අතර හෝම්ස්, ජෙකිල්ගේ, අටර්සන්ගේ හා හයිඩ්ගේ ලිපින සටහන් කරගත්තේය. තමාට දැනගන්නට ලැබෙන කරුණු ගැන නීතිඥයා දැනුවත් කිරීමට ද හෝම්ස් පොරොන්දු විය.

නීතිඥයා අපෙන් සමුගෙන පිටවී ගිය පසු, මගේ මිත්‍රයා මා ඇමතුවේය.

"වොට්සන්. ඔබ ළඟ තියෙනවා නේද, වෛද්‍යවරුන් පිළිබඳ තොරතුරු ඇතුළත් කෝෂග්‍රන්ථයක්? ඒකෙ මොනවද හෙන්රි ජෙකිල් ගැන සඳහන් වෙලා තියෙන්නෙ?"

හෝම්ස් සඳහන් කළ ග්‍රන්ථය රාක්කයෙන් එළියට ගෙන පෙරළා බැලීමි.

"මෙන්න තියෙනවා තරමක විස්තරයක්" මම කීවෙමි.

"ජෙකිල්, හෙන්රි විලියම්.

MD FRS DCH LLD

උපත 1835 දී. අධ්‍යාපනය — ඊටන් විද්‍යාලය (1851 දක්වා) 1851 සිට 1855 දක්වා වෛද්‍ය පීඨය, එඩින්බ්‍රෝ විශ්වවිද්‍යාලය.





වෘත්තීය තොරතුරු: 1855/56 නේවාසික ශල්‍ය වෛද්‍ය, ක්‍රිමියන් යුද පෙරමුණේ වෛද්‍ය බලකාය 1861-64 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - - ලන්ඩන් විශ්වවිද්‍යාලය. 1864 - සිට පෞද්ගලික වෛද්‍ය වෘත්තිකයෙකි.

භීෂණ උන්මාදයෙන් පෙළෙන රෝගීන් සන්සුන් කිරීමට යොදන, ජෙකිල් නිද්‍රාකාරක ඖෂධය, ඔහුගේ සොයාගැනීමකි. මස්තිෂ්ක ව්‍යාධි පිළිබඳ පර්යේෂකයෙකු වූ මහාචාර්ය රොඩ්නි බැනිස්ටර් සමග කලක් පර්යේෂණවල යෙදුණේය.

උන්මත්තක රෝග පිළිබඳ ශ්‍රේෂ්ඨ විද්‍යාඥයකු වූ මහාචාර්ය ජෝජ් ගාෆීල්ඩ් MD MRCS යටතේ ද පර්යේෂණ වල නිරත විය. එයින් සමහරක් යොමුකෙරුණේ, මානසික විකෘති නිසා භයානක අපරාධවල යෙදෙන්නන්, රසායනික ඖෂධ මගින් සුවපත් කිරීමේ අරමුණෙනි. මනෝ විකෘති හා උන්මත්තක රෝග පිළිබඳ පර්යේෂණ පවත්වන්නන් අතර ප්‍රමුඛස්ථානයක් ගනී. ඔහු වෛද්‍ය සඟරාවලට සැපයූ ලිපි සමහරක සිරස්තල:

* පෞරුෂයේ දෙබිඩි ස්වභාවය සහ නීතිය
  (1876 ජුලි - ලැන්සට් සඟරාව)
* උන්මත්තක බව නෛතික ඇසකින්
  (1880 අගෝස්තු — මානසික වෛද්‍ය සඟරාව)
* චිත්ත සංග්‍රාමය
  (1882 පෙබරවාරි — බ්‍රිතාන්‍ය වෛද්‍ය සඟරාව)

මහරැජින විසින් 1881, 1882 වර්ෂ වලදී දෙවරක්ම නයිට් පදවි පිරිනමන ලදී. අවස්ථා දෙකේදීම ඔහු ඒවා ප්‍රතික්ෂේප කළේය."

"චිත්ත සංග්‍රාමය කියල ඔහු ලියල තියෙන්නේ මොකක් ගැනද වොට්සන්?" හෝම්ස් විමසුවේය. "ඔබට ඒ සඟරාව හොයාගන්න පුළුවන් නම්, මං කැමතියි ඒ ලිපිය කියවලා බලන්න"

"ගිය සතියේ මං වෛද්‍ය සඟරාවේ පහුගිය කලාප පෙරළා බැලුවා. එතකොට ඔය ලිපිය මට අහම්බෙන් දකින්න ලැබුණා." මම කීවෙමි. "ඔහොම ඉන්න. මං ඒක හොයාගෙන, ඔබට ටිකක් කියවන්නම්.........."

කෝෂග්‍රන්ථය ඉවතින් තබා, මම වෛද්‍ය සඟරා එකතුව අවුස්සා බැලීමට පටන්ගත්තෙමි. මිනිත්තු කිහිපයක දී එම ලිපිය අඩංගු සඟරාව සොයාගැනීමට, මට හැකි විය.



www.sinhalaelibrary.com

"මෙන්න තියෙනවා. කියවන්නද?"

"අනේ ඔව්"

"........... ශ්‍රේෂ්ඨ පුද්ගලයකු මියගිය විට අපට අහන්නට ලැබෙන්නේ මොනවාද? ජීවිත කාලයක් තුළ ඔහු පෙන්වූ දක්ෂතා, කළ නිර්මාණ, ලැබූ ජයග්‍රහණ, අත්කරගත් කීර්තිනාමය, සතුටු හොඳ ගතිගුණ, හිමිවූ ගෞරව සහ අනුන් වෙත දැක්වූ සුහද ත්‍යාගශීලී භාවයයි.

නමුත් එම පුද්ගලයා පිළිබඳව අප නොසලකා හරින කොටසකුත් තිබේ. ඒ එම පුද්ගලයාගේ සිතේ අධම හෝ පහත් ස්වභාවයයි. සෑම පුද්ගලයෙකුම එක් අයෙකු නොව දෙදෙනෙකි. මේ දෙදෙනා නිරන්තරයෙන්ම සංග්‍රාමයක යෙදී සිටිති. උත්තම ගුණාංග වලින් හෙබි සිත ජයගතහොත්, පුද්ගලයා උත්තමයකු වේ. අධම ගුණාංග පිරි සිත ජයගතහොත්, ඔහු අධමයකු බවට පත්වේ. ජයගන්නේ කුමන සිතද යන්න තීරණය කෙරෙන්නේ.........."

"මේ ලිපිය පිටු හයක් දිගට තියෙනවා හෝම්ස්" මා කීවේ සඟරාව වසා දමමිනි.

"කෙනෙකුගේ සිත තදින්ම ආකර්ෂණය කරගත හැකි මාතෘකාවක්" හෝම්ස් කීය.

"ඒ වුණාට එයා අලුත් දෙයක් කියල නෑ." මම කීවෙමි. "මේ කියල තියෙන්නේ අපි මීට කලිනුත් දැන හිටි දෙයක්"

"අන්න ඒ නිසාම තමයි, ඒක වැදගත්කම වැඩිවෙන්නේ" හෝම්ස් කීය. "මේක වෛද්‍ය සඟරාවක පළවුණු එකයි පුදුමේ. මෙවැනි දෙයක් වඩාත් සුදුසු දර්ශනවාදය පිළිබඳ සඟරාවකට"

"ඔහු ලිපියේ අන්තිමට මෙහෙම කියනවා" මා පැවසුවේ වසා දැමූ සඟරාව යළි විවෘතකරමිනි. "මනුෂ්‍යයාගේ චින්තාභ්‍යන්තරයේ තිබෙන, මෙම දෙබිඩි ස්වභාවය වෙන්කිරීම, අතිශයින්ම දුෂ්කර කටයුත්තකි. එහෙත් එය කළ හැකි අයුරු හරිහැටි හඳුනාගත්තොත්, එය මනෝවිද්‍යාවේ ජයග්‍රහණයක් වනු නොඅනුමානය. මානසික රෝග සුවකිරීමේ යතුර ද එය වියහැක."

මා සඟරාව කියවාගෙන ගියත්, මගේ මිත්‍රයා සිටියේ මා කියූ දෙයට සවන් යොමුකරමින් නොවේ. පයිප්පයෙන් දුම්රැළි නිකුත්කරමින්, දෙනෙත් සිලිම දෙසට යොමුකරගෙන, ඔහු ගැඹුරු කල්පනාවකට වැටී සිටියේය. "සිත් දෙකක්.......... එකක් උත්තම......... එකක් අධම......... කවුද දන්නේ? ජෙකිල්ගෙ උත්තම





ස්වභාවය නිසා, ඔහු අධමයාගෙ ගොදුරක් වුණාද දන්නෙ නෑ. දෙබිඩි පෞරුෂත්වය......... විසඳීමට ඉතාම අපහසු ගැටලුවක්" හෝම්ස් තමාටම කියාගත්තේ සිහිනෙන් දොඩවන පුද්ගලයකු විලසිනි.

"හෝම්ස්. මේක විසඳීමට යාම ඔබේ සෞඛ්‍යයට අහිතකර වෙන්න පුළුවනි" මම කීවෙමි. "ඔබ නිවාඩුවක් ගතකරන්න යෑම, අත්හැරදැමූ එක වැරදියි"

"මොනවද වොට්සන් මේ කතා? නිවාඩු? නිවාඩු කියන ඒවා කවදා ගන්න බැරිද?" මගේ මිත්‍රයා පැවසුවේ මා නොසිතූ අයුරිනි. "මගේ හිතවත් වොට්සන්, මේක නිවාඩුවකට වඩා වැදගත් ප්‍රශ්නයක්. අසරණ මිනිසුන්ට ප්‍රාණ ඇපයට අරගෙන, කප්පම් ඉල්ලන අය තමයි අන්තිම නරක අපරාධකාරයෝ. උන් අසරණ මිනිසුන්ගේ ලේ උරාබොනවා. නැමිස්සෙට් වල ඉන්නවා මිනිහෙක්. රටේ වැදගත් ගැහැනු මිනිස්සු, දහදොළොස් දෙනෙකුගේ ජීවිත රැඳී තියෙන්නේ මිනිහා අතේ. ඔහු ඔවුන්ගෙන් කප්පම් මුදල් ගරාගන්නේ, රහස් හෙළිකරන බවට තර්ජනය කරමින්. එවැනි අධම අපරාධකාරයෙක්, අද ඔහුගේ අල්ලේ නටවන්නේ කවුද? මේ සමාජයට විශාල මෙහෙවරක් කරන උත්තම ගතිගුණ ඇති වෛද්‍යවරයෙක්. එහෙම එකක් සිදුවෙද්දී, අපි කොහොමද නිවාඩුවක් ගතකරන්න යන්නෙ? දොස්තර ජෙකිල් සහ හයිඩ් මහතා ගැන අබිරහස විසඳන තුරු, නිවාඩුවක් ගැන මට මතක් කරන්නවත් එපා." එසේ කී මගේ මිත්‍රයා එල්ලා තිබූ ඔහුගේ කබාය සහ හිස්වැස්ම අතට ගත්තේය.

"කොහේ යන්නද?" මම ඇසීමි,

"සන්ධ්‍යාව බොහොම සුන්දරයි වොට්සන්" ඔහු කීවේ මගේ කබාය හා හිස්වැස්ම මා අතට දෙමිනි. "සොහෝ පැත්තේ සක්මනක යෙදිලා එන්න, ඔබේ අකමැත්තක් නැහැ නේද?"

www.sinhalaelibrary.com

3

# සොහෝ හි දී හමුවීමක්

මිනිත්තු කිහිපයක් කුලීරියක ගමන් කිරීමෙන් පසු, අපි සොහෝ පෙදෙසට ළඟාවීමු. සෑම අතකටම විහිදුණු පටුමාවත් හා, අබලන් පැරණි ගොඩනැගිලි වලින් සැදුණු සොහෝ චතුරශ්‍රය, ජනාකීර්ණ පෙදෙසකි. විවිධ ජාතීන්ට අයත් පුද්ගලයෝ මෙහි වාසය කළහ.

එය වලාකුළෙන් තොර රාත්‍රියක් වුවත්, දක්නට ලැබුණේ අඳුරු බවකි. දැලි හා දූවිල්ලෙන් වැසීගිය ගෑස්ලාම්පු වලින් නිකුත්වුණේ දුබල එළියකි. කුලීරථයේ රියැදුරා රියෙන් බැස, අප සෙවූ අංකය ගැන විමසිලිමත් විය.

"මහත්වරුනි, මෙතැන තමයි ඔබ සෙවූ තැන" රියැදුරා කීවේ අංකය බැලීමට ඔහු දැල්වූ ගිනිකූර නිවාදමමිනි. "මහත්තයල මොන එහෙකට මේ කසලගොඩට ආවාද මං දන්නෙ නෑ"

රියෙන් බිමට බට හෝම්ස්, තම කබාසාක්කුවෙන් ක්‍රවුන් භාගයේ කාසියක් ගෙන රියැදුරා අත තැබීය. ඔහු එයින් සතුටට පත් වූ බැව් පෙනිණ. "වැඩි ඈතක නොගිහින්, මේ හරියේ පෙනෙන තෙක් මානයක රැඳී ඉන්න" හෝම්ස් කීය.

අපි පියවර දෙකක් ඉදිරියට තැබුවෙමු. "මේ කසල ගොඩේ ජීවත්වෙන මිනිහෙක්, මහා විශාල ධනස්කන්ධයකට එකම උරුමකාරයා කියල දැනගත්තොත්, රියැදුරා මොනවා නොකියයි ද? ඒක නෙමෙයි වොට්සන්, ඔබ අද ඔබේ රිවෝල්වරය අරගෙන ආවද?"

"නෑ. මං හිතුවා ඒක උවමනා වෙන එකක් නැහැ කියලා?"

"ෂා!" හෝම්ස්ට නියැවිණ. "කමක් නෑ. අපි දෙන්නගේම අත්වල සැරයටි තියෙනවා නේ. ඔය තරම් භයවෙලා මා දිහා බලන්න එපා මනුස්සයෝ. කලබලයක් ඇතිවේවි කියල, මං හිතන්නේ නෑ. ඒ වුණත් මේ හයිඩ් කියන මිනිහා ගැන, අපට අහන්න ලැබුණු දේවල් හැටියට........ ටිකක් පරෙස්සම් වෙන්නත් ඕන"

එසේ කී මගේ මිත්‍රයා, අප ළඟාවූ නිවසේ දොරට තට්ටු කළේය. දොර විවෘත කරන ලද්දේ වයස්ගත කාන්තාවක විසිනි.





"මහේලට උවමනා කරන්නේ කාමර කුලියට ගන්නද?" ඇය ඇසුවාය. "උඩ තට්ටුවේ පිටිපස්සේ කාමර තියෙනවා. කුලිය සතියකට සිලිං පහයි. හැබැයි බල්ලො අරං එන්නත් බෑ. සිගරට් සුරුට්ටු බොන්නත් බෑ"

"නෝන මහත්මයා" හෝම්ස් කීය. "අපි ආවෙ කාමර කුලියට ගන්න නෙමෙයි. අපි අඳුනන මනුස්සයෙක් හම්බවෙන්න. එයාගෙ නම එඩ්වඩ් හයිඩ්"

ඒ නම සඳහන් කළ විගස ඇය තිගැස්සීමට පත්වූයේ, හෝම්ස් සර්පයකු ඇය දෙසට දිගුකළා නම් භයවෙන විලසිනි.

"මහේලා එයාගෙ යාළුවොද?" ඇය ඇසුවාය. "අද එයා ගෙදර නැහැ. සමහර වෙලාවට සති ගණන්, මෙහේ එන්නෙ නෑ. දැන් හුඟක් දවසකින් මට එයාව දකින්න ලැබුණේ නෑ. මේ සුමානෙ අන්තිමට විතර එන්න." කී ඇය සූදානම් වූයේ, දොර වසා දැමීමට ය. හෝම්ස් තම පාදය ඉදිරියට දිගුකළේ දොර වැසීමට නොහැකි වන පරිද්දෙනි.

"අපට පුළුවන්ද එයාගෙ කාමරය ටිකක් බලන්න?" හෝම්ස් විමසුවේ, පවුමේ රන්කාසියක් තම අත්ල මත තබා ඇය දෙසට දිගුකරමිනි. මුලින් එය ගැනීමට උත්සාහ කළත්, පසුව ඇය ඒ අදහස වෙනස් කළාය.

"මහේලට ඒක කරන්න ඉඩදෙන්න මට බෑ" ඇය කීවාය. "ඒ මහත්තයාට හුඟක් කේන්තියාවි"

ඇය එසේ කීවේ තැන්පත් ස්වරයෙන් වුවත්, ඇගේ සිතේ තිබූ භීතිය මුහුණෙන් පළවිය. ඇගේ නිවසේ කුලියට සිටින නේවාසිකයා ගැන, මෙතරම් භීතියක් පළවන්නේ ඇයි? එයින් අපට සිතාගත හැකිවූයේ, එඩ්වඩ් හයිඩ් බිහිසුණු පුද්ගලයෙකු බවයි.

"හොඳයි හොඳයි. ඔහේ අපට සලකන්නෙ ඒ තාලෙටද?" හෝම්ස් කථාකළේ තරමක් රළු ස්වරයකිනි. "එහෙම නම් මේ ගේ සෝදිසි කරන්න, අපට විශේෂ බලපත්‍රයක් අරගෙන එන්න පුළුවනි. අපි යමු සාජන්ට්"

"ඇය වහා දුවැවිත්, හෝම්ස්ගේ කබා අතෙන් අල්ලාගත්තාය. "මහේල පොලීසියෙන් කියල මං කොහොමද දන්නෙ? ඒක කල් ඇතුව කියන්න එපායැ?" කී ඇය දොර සම්පූර්ණයෙන්ම විවෘත කළාය. අප ගෙට ඇතුළු වූ පසු ඇය දොර වසාදැමුවාය.



www.sinhalaelibrary.com

හෝම්ස් තම කබා සාක්කුවෙන් ගත් රන්කාසිය ඇය භාරගත්තේ "මං දුප්පත් අසරණ ගෑනියක් මහත්මයා" කියමිනි.

"හරි. අපි මෙහේ ආව බව්ත් හයිඩ් මහත්තයාට කියන්න එපා. මේ ගාස්තුව ඒකටත් එක්ක" හෝම්ස් කීය.

"ඒකට නම් මුදල් ගෙවන්න ඕන නැහැ මහත්මයා" ඇය කීවේ රන්කාසිය ඒප්‍රනයේ වූ සාක්කුවට දමාගනිමිනි. "එයාගෙ කාමරය බලන්න මං වෙන කෙනෙකුට ඉඩදුන්නා කියල දැනගත්තොත්, ඒ යකා මාව මරාවි. මොකද එයා කරදරේක පැටලිලා ද?" යතුරු කැරැල්ලක් හා පහනක් අතට ගත් ඇය, අප කැඳවාගෙන ගියේ පටු තරප්පු පෙළක ඉහළටය. පැරණි නිවසක් නිසා ලෑලි තරප්පුවෙන් සැහෙන ශබ්දයක් නිකුත්විණි.

"හයිඩ් මොන විදියේ නේවාසිකයෙක්ද?" හෝම්ස් විමසුවේ අප ඉහළට නගින අතරදීය.

"එයා මාත් එක්ක කතාබහට එන්නෙ නෑ" ඇය කීවාය. "එයා මෙහේ ආවට පස්සේ, මෙහේ ඉඳපු නේවාසිකයෝ ඔක්කොම අස්වෙලා, මෙහෙන් යන්න ගියා."

"හැබෑට? ඇයි ඒ?"

"ඔහේලට එයාව කවදාහරි හම්බවෙලා තියෙනවා නම්, ඔහොම ඔය ප්‍රශ්නය අහන එකක් නෑ" ගෙහිමි කත පිළිතුරු දුන්නාය. "මෙන්න මහත්තයා ඔහුට දීල තියෙන්නෙ මේ කාමර දෙක" ඇය කීවේ යතුරකින් දොරවල් විවෘත කරමිනි. "ඔහේලා බලන දෙයක් ඉක්මනට බලලා, වහාම මෙහෙන් පිටවෙලා යන්න. කාමරේ අවුස්සන්න එපා. තියෙන දේවල් ඒ හැටියටම තියන්න. මෙක අවුස්සලා කියල ඔහුට තේරුණොත්, මාව මරලා ඉතුරු කරන එකක් නෑ" කී ඇය, පහන මා අතට දී තරප්පුව බැස ගියාය.

කාමර දෙකේ ස්වභාවය දුටු අපි පුදුමයට පත්වීමු. ඉඩකඩ සහිත කාමර දෙකක් වූ එහි, වටිනා බුමුතුරුණු එළා, ජනෙල්වලට ගනකම් විල්ලුද රෙද්දෙන් තිරදමා තිබිණි. එක් බිත්තියක එල්ලා තිබුණේ වටිනා තෙල්සායම් චිත්‍රයකි. කාමරයේ තිබූ එක් අල්මාරියක් පිරෙන්නටම, මිල අධික වයින් වර්ගවල බෝතල් රැසක්ම විය. තවත් උස අල්මාරියක් පුරා, මිල අධික රෙදි වර්ග වලින් මැසූ ඇඳුම් කට්ටල කිහිපයක්, ශීත කාලයට අඳින ලෝම් කබා සහ නිව්බොන්ඩ් වීථියෙන් මිලට ගත්, නවීන මාදිලියේ ඇඳුම් ද විය. ලාච්චු සහිත මේසයක් හා පුටු දෙකක් ඇඳ අසලම විය.





"මේ කාලෙ මිනිස්සු ඇඳුම් අඳිනවා නෙ උවමනාවටත් වැඩිය" හෝම්ස් කීය. "ඒකට ගැළපෙන විදියට මහත්මයෙක් වෙන්න, නොයෙක් විදියේ ඇඳුම් උවමනායි. ඒ හැම එකක්ම මෙතැන තියෙනවා."

"ඒ වුණත් හෝම්ස්" මම විරුද්ධත්වය ප්‍රකාශ කළෙමි. "අපට ඔහු ගැන අහන්න ලැබුණු දේවල්වල හැටියට නම්, ඔහුව මහත්මයෙක් කියන්න බෑ"

"ඒක ඇත්ත වොට්සන්" හෝම්ස් එකඟ විය. "මේ කාලෙ මිනිහෙකුගෙ වැදගත්කම තීරණය වෙන්නෙ, ඔහු ඇඳල ඉන්න ඇඳුම් කට්ටලයෙන් මිස, ඔහු කරන ක්‍රියාවෙන් නෙමෙයි නේ. මොන තරම් කණගාටුවට කරුණක්ද? චාරිත්‍රවල නියමිත විධියට තේ කෝප්පය අල්ලාගෙන, පළුදු නැති ඇඳුම් කට්ටලයක් හැඳ සිටියොත්, මේ කාලෙ ගෝරිල්ලෙකුට වුණත් පුළුවනි මහත්මයෙකු හැටියට පෙනී ඉන්න"

"මිනිහට හොඳට මිලමුදල් තියෙන පාටයි" මම කීවෙමි.

"ඒකෙ පුදුමයක් නෑ" හෝම්ස් කීය. "එයාට දේපොළ උරුමකර දෙන පුද්ගලයා, ලන්ඩන් නගරයේ ඉන්න ඉහළම ධනවතෙක්"

මගේ මිත්‍රයා මීළඟට තම අවධානය යොමු කළේ, ඇඳුම් අල්මාරියේ පහළම තට්ටුව වෙතය. එය පිරී තිබුණේ ඉතා හොඳ වර්ගයේ පාවහන් ජෝඩු රැසකිනි. මීළඟට හෝම්ස් මේසයේ ලාච්චු, එකින් එක පරීක්ෂා කිරීමට පටන්ගත්තේය. ඔහු සෙවූයේ කුමක්ද යන්න, මා දැනසිටියේ නැත. අන්තිමේදී හෝම්ස් තමා අතට පත්වූ අළුපැහැති පොතක පිටුපෙරළමින්, එය කියවා බැලීමට පටන්ගත්තේය.

එය අපේ පැරණිම මෙන්ම, කීර්තිමත් බැංකුවකින් නිකුත්කළ පාස්පොතක් බැව් මම දුටුවෙමි. එහි තිබූ ගනුදෙනු සටහන් ඉතා විමසිල්ලෙන් කියවා බැලීමට, හෝම්ස් වැඩිපුර කාලයක් ගතකළේය. අනතුරුව එය ලාච්චුවට දමා, කාමරයේ සෑම තැනක්ම පරීක්ෂාවට ලක්කළේය. බොහෝ තැන් පරීක්ෂා කිරීමේදී, තම උත්තල කාචය ද යොදා ගෙන සෝදිසි කිරීමට, හෝම්ස් අමතක නොකළේය. බිම එළා තිබූ බුමුතුරුණු, කඩදාසි ඉවත දමන කුණුකූඩය, මේසය යට හා නාන කාමරය ද රහස් පරීක්ෂකයාගේ සෝදිසියට බඳුන් විය.

"මොකක්ද............" මම ප්‍රශ්නයක් ඇසීමට සූදානම් වූයෙමි.



www.sinhalaelibrary.com

වහාම තම දෙතොල් හරහට දබරැඟිල්ල තබා, ඔහු මට නිශ්ශබ්ද වන ලෙස සංඥා කළේය. අනතුරුව ශබ්දයක් නොනැගෙන සේ කාමරයේ දොරටුවට ළංවූ ඔහු, දොර බෝල්ලය කරකවා එක් ක්ෂණයකින් දොර විවෘත කළේය.

වයස්ගත ගෙහිමි කාන්තාව කාමරය තුළට ඇදවැටුණාය.

"මීට පස්සෙවත්......." හෝම්ස් කීවේ ඇයට නැගිටීමට උදව්කරමිනි. "යතුරු කටට ළංවෙලා, අනුන්ගේ කතාබහට කන්දෙන්න බලාපොරොත්තු වෙනවා නම්; මං දෙන්නම් හොඳ උපදෙස් කීපයක්ම. පළමුවැනි එක යතුරු සිදුරට ළංවෙලා හිටියට දොරට හේත්තුවෙන්න එපා. අනෙක තරප්පු පෙළ නගිද්දී, තරප්පුවේ අයින් වලින් නගින්න. ලෑලි මැදට අඩිය තැබුවාම ශබ්දය වැඩියි. තව එකක් තරප්පු පෙළ නගිද්දී, ඇඳගෙන ඉන්න සිල්ක් සාය මදක් ඉහළට ඔසවා ගන්න ඕන. නැත්නම් සිල්ක් ඇඳුම් විකුණන කඩයක වහන වේලාව ළංවුණා වගේ, "සර-සර" ගාල ශබ්දය ඇහෙනවා"

ගෙහිමි කාන්තාව කෝපයටත් ලැජ්ජාවටත් පත්වී සිටිබැව් අපි දුටුවෙමු.

"ඒකට කමක් නෑ නෝනා" හෝම්ස් කීය. "මේ හයිඩ් මහත්තයා දවල් කාලයේදී කරන වැඩ කටයුතු, ගමන්බිමන් මොනවාද?"

ඇය පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළාය. ඇගේ කට ඇරුණේ හෝම්ස්ගෙන් තවත් රන්පවුමක් තෑගි ලැබුණු පසුව ය.

"දවල් කාලෙට එයා මොකුත් ගමනක් කරන්නෙ නෑ" ඇය කීවාය. "කලාතුරකින් දවල් කාලෙදිත් මෙහෙ ඇවිත් තියෙනවා. ඒ දවස්වල කළුවර වැටෙනතුරු, ගෙයින් එළියට බැස්සෙ නෑ. බොහොම වේලාවට ගෙදරින් පිටවෙලා යන්නෙ කළුවර වැටුණාම. ගෙදර එන්නෙ උදේ ඉර පායන්න කලින්"

"ඒ වැඩ මුරයකට ඔහු කොහේ හරි රැකියාවකට යනවද?"

"ඒක මං දන්නෙ නෑ" ඇය කීවාය. "එයාගෙ රස්සාව තැබෑරුමකට වෙලා මත්පැන් බොන එක නම්, ඕගේ කියන දේ ඇත්ත වෙන්න ඇති. මගේ උගුරෙ සෙම් අමාරුවක් තියෙනවා" කතාව නවත්වා ඇය මදක් කැස්සාය. "සෙම බුරුල් වෙන්න මං හැන්දෑවට රම් ඩිංගක් බොනවා. ඒකට මං යන්නෙත් හන්දියේ තියෙන ජිමීට් තැබෑරුමට. හයිඩ් මහත්තයා ඒකට වෙලා බොන හැටි මං කොච්චරවත් දැකලා තියෙනවා"





"බොහොම ස්තූතියි. අපට දැනගන්න උවමනා එපමණයි"

ලාම්පුව අතින් ගෙන කාමරයෙන් එළියට ආ හෝම්ස්, තරප්පු පෙළ බැසීමට පටන්ගත්තේය. මම ද ඔහු පසුපස ආවෙමි. ලාම්පුව ඇය අතට දී ඇයට සුභ රාත්‍රියක් පතා අපි එළියට බැස්සෙමු.

"අරක වෙන්න ඇති ජිමීට්ගේ තැබෑරුම" හෝම්ස් කීවේ අප මදක් ඉදිරියට යද්දී දකින්නට ලැබුණු, අපිරිසිදු ගොඩනැගිල්ල පෙන්වමිනි. "වොට්සන් අපි එතැනට ගොඩ වැදිලා මොනවා හරි ඇණවුම් කරමු."

"හයිඩ්ගේ කාමරය පරීක්ෂාවෙන්, මොනවද ඔබට දැකගන්න ලැබුණෙ?" මම විමසීමි.

"දැනගන්න ලැබුණෙ කාරණා බොහොම ස්වල්පයයි" හෝම්ස් කීය. "වැදගත් කරුණු මොනවා හරි හොයාගත යුතුයි කියන ආශාව, මගේ සිතේ ඇතිවුණා. හයිඩ්ගේ සුප්‍රසිද්ධ මිත්‍රයාගෙන්, නිතිපතාම විශාල මුදලක් හයිඩ්ට තෑගි ලැබෙනවා. ඒ හැරෙන්න ඔහුට කිසිම ආදායම් මාර්ගයක් නෑ. නමුත් ඔහු මුදල් අරපරෙස්සමෙන් වියදම් කරන ආකාරයක්, මට දකින්න ලැබුණෙ නෑ. මත්පැන් පානය සහ රේස් ඔට්ටු සඳහා හයිඩ් විශාල වශයෙන් මුදල් වියදම් කර තිබෙනවා. ඔහුගේ ශරීරයේ ස්වභාවය කිව්වොත්, උස අඩි පහයි. කකුල්වල තියෙනවා විකෘති ස්වභාවයක්. ඇවිදිනකොට දණහිස් එකට ගැටෙනවා. දණහිසෙන් පහළ කොටස් දෙපැත්තට විහිදිලා. ඔහු පාවිච්චි කරන්නෙ කැවෙන්ඩිෂ් දුම්කොළ. ඒ ටික හැරුණාම, ඔහුගේ අනෙක් තොරතුරු හැමදෙයක්ම අබිරහස්."

හයිඩ් සතු බඩුබාහිරාදිය ඉක්මන් පරීක්ෂාවට ලක්කොට, මෙතරම් තොරතුරු සොයාගැනීමට හෝම්ස් සමත්වීම ගැන මම පුදුමයට පත්වූයෙමි. එවැනි නිගමනවලට පැමිණියේ කෙසේදැයි ඔහුගෙන් අසන්නට මම සූදානම්වීමි. එහෙත් ඒ වනවිට අප ජිමීට්ගේ තැබෑරුම දෙසට පාතබා අවසානය. ඒ දිගු කතාබහකට වේලාව නොවන බව මම තේරුම් ගතිමි.

එය අනුග්‍රාහකයනට මත්පැන් වලින් සංග්‍රහ කළ අවන්හලකි. සාමාන්‍යයෙන් වෙනත් අවන්හල් නම්, ගෑස්ලාම්පු දල්වා හොඳින් ආලෝකමත් කිරීම, නිතර දකින්නට ලැබෙන දෙයකි. එහෙත් මෙතැන පැවතියේ අඩ අඳුරේය. තැනින් තැන තබා තිබූ මේසපුටු අතරින් හෝම්ස් මං ඉදිරියට ඇදගෙන ගියේය. ඉතා විශාල තැනක්



www.sinhalaelibrary.com

වූ එහි, ගනුදෙනුකරුවෝ සෑහෙන ගණනක් රැස්ව සිටියෝය. ඉංග්‍රීසි පමණක් නොව, වෙනත් භාෂාවලින් කෙරෙන කතාබහ ද අපට අසන්නට ලැබිණ. කෙනෙකු උස්හඬින් සිනාසුණු අතර, තවත් කෙනෙක් තරහෙන් කෑගැසූහ. මත්පැන් වලට මුදල් ගත් කවුන්ටරය අසල සිටියේ, රළු පෙනුමක් තිබූ හැඩිදැඩි පුද්ගලයෙකි. ඔහු අප දෙදෙනා වෙත අවධානය යොමු කළේය. මේ පුද්ගලයා තැබෑරුම් අයිති ජිමී විය යුතු යයි, මම අනුමාන කළෙමි.

"මොනවද මහත්ලට ඕන?" ඔහු විමසුවේ ජර්මන් උච්චාරණය සහිත රළු හඬකිනි.

"අපි දෙන්නට විස්කි" හෝම්ස් පිළිතුරු දුන්නේය.

අයිතිකරු වීදුරු දෙකකට විස්කි වත්කරන අතරේ, හෝම්ස් යළි කථා කළේය.

"මට අහන්න ලැබුණා අපේ මිත්‍රයා එඩ්වඩ් හයිඩ්, මත්පැන් බොන්න නිතර මෙහේ එනව කියල. අද නම් මිනිහව පෙනෙන්න නෑ. මිනිහ ආවෙ නැද්ද ළඟකදි මේ පැත්තෙ?"

ජර්මන් ජාතිකයාගේ මුහුණ තරහෙන් විරූපී වූ බව මම දුටුවෙමි. විස්කි වීදුරු කවුන්ටරය උඩ තැබූ ඔහුගේ, කථාවෙන් ද කෝපය පළවිණි.

"හයිඩ්? ආවෙ නෑ ළඟකදි" ඔහු කීය. "මහත්ල දෙන්නා ඒ මිනිහගෙ යාළුවොද? එහෙනම් මේක බිල ඉක්මනට එළියට බහිනවා. මගේ අවන්හලේ සණ්ඩුසරුවල් දකින්න මං කැමති නෑ" ඔහු කීවේ ගොරවමිනි.

"ඇයි ඒ මිනිහ මෙහේ කලබල කළාද?" හෝම්ස් විමසුවේය.

"බලනවා අර කණ්ණාඩිය දිහා" ජිමී පැවසුවේ බිත්තියේ සවිකර තිබූ ලොකු කැටපතක් දෙසට අතදිගු කරමිනි.

"අද මුදලට හෙට ණයට"

යනුවෙන් ලියා තිබූ කැටපත, කැබලි කැබලි වලට බිඳී, විනාශවී තිබිණි.

"ගිය සැරේ හයිඩ් මෙහේ ආ වෙලාවෙ, මිනිස්සු කීපදෙනෙක් එක්ක සණ්ඩුවක් පටන්ගත්තා. එකෙක් බීර ජෝග්‍රුවකින් හයිඩ්ට දමල ගැහුවා. උන් ඔළුව පහත් කරල බේරුණා. නමුත් මගේ කණ්ණාඩිය කුඩුවුණා. මං උන් ඔක්කෝම මෙතැනින් එළෙව්වා. මං කිව්වා, උන් එකෙක් හරි ආයෙ මෙහෙ ආවොත්, උන්ගෙ ඔළු පලනවා කියල"





"කවුද සණ්ඩුව පටන්ගත්තෙ? හයිඩ්ද?"

"හයිඩ්ගෙ මුහුණ දිහා බලල, කවුද එකෙක් මහ නරක වචන කීපයක් කිව්වා. හයිඩ් ඒ මිනිහට මරන තර්ජන කළා. සණ්ඩුව පටන්ගත්තෙ එහෙම. හයිඩ් මෙහේ ආවොත් එදාට මොනවා හරි ගුටිබැට හුවමාරුවක් වෙනවා. ඒ යකා මෙහේ නොඑන එක ගැන මට හරි සතුටුයි."

විස්කි වලට මුදල් ගෙවූ හෝම්ස්, වීදුරු දෙක අතට ගත්තේය. අපි අවන්හලේ ඈත කෙළවරක වූ මේසයක් වෙත ගියෙමු.

"හයිඩ් බොහොම ජන-අප්‍රිය පුද්ගලයෙක් පාටයි." හෝම්ස් කීය. "මේ වගේ තැන්වල ගැවසෙන එකා ලොකු මෝඩකමක් කියල මිනිහට තේරේවි."

"හෝම්ස්" මම කීවෙමි. "දැන් විනකට කලින් හයිඩ්ගෙ කාමරයෙදී අපි දෙන්නාම දුටුවෙ එකම දේවල්. ඔබ කොහොමද ඔය තරම් නිගමන රාශියකට ආවෙ? මට නම් මොකුත් හිතාගන්න බෑ."

"මගේ හිතවත් වොට්සන්. ඔබ නොයෙක් ක්ෂේත්‍ර වලින් බොහොම දක්ෂතා ඇති අයෙක්. ඒ වුණත් නිරීක්ෂණය සහ නිගමනය කිරීම කියන දෙකට නම්, ඔබේ දක්ෂතාවය මදි. එතැන හෝඩුවාවන් රැසක් තිබුණා. ඒවා හඳුනාගන්න දක්ෂතාවයක් තිබුණා නම්, මං කියූ කාරණා තේරුම් ගන්න තිබුණා."

"හොඳයි. කියන්න බලන්න" මම කීවෙමි. "ජේකිල් දෙන මුදල් ඇරෙන්න, හයිඩ්ට වෙන ආදායම් මාර්ගයක් නැහැ කියල, ඔබ කොහොමද කිව්වෙ? අනෙක හයිඩ් අරපරෙස්සමෙන් වියදම් කර නැති බව?"

"ඒ ගැන නම් ගෞරවයක් ලබාගන්න මං උත්සාහ කරන්නෙ නෑ" හෝම්ස් කීය. "ඇයි වොට්සන් දැක්කෙ නැද්ද? මට හමුවුණා නේ එයාගෙ ගනුදෙනු සටහන් පොත"

"ඒක කියවද්දී නේද ඔබට සිවුරුහත් කෙරුණෙ?"

"ඔව් වොට්සන්. තමන්ට ලැබුණු මුදල් ප්‍රමාණ, දින වකවානු සහිතව හයිඩ් සටහන් කරල තිබුණා. ඒවා ඉතා විශාල මුදල් ප්‍රමාණ. හයිඩ්ගේ ගමන්බිමන් ගැන, අර ගෙවල් අයිතිකාරියගෙන් අපට දැනගන්න ලැබුණා නෙ. ඒ විස්තර වල හැටියට හයිඩ් කොහේ හරි රස්සාවක් කරන කෙනෙක් කියල හිතන්න අමාරුයි. අනික ඒ මුදල් ගෙවීම් කරල තිබුණේ සති හෝ මාස පිළිවෙළකට නෙමෙයි. ඒ



www.sinhalaelibrary.com

ඊනියාවකින් ලැබෙන වැටුපක් නෙමෙයි කියල. ඒ නිසා අපට හිතාගන්න පුළුවනි. මුදල් ප්‍රමාණ තිබුණේ සම්පූර්ණ ගණන් වලින්. ඒ කියන්නේ පවුම් විතරයි; සිලිං පැන්ස නැහැ. ඒ හින්දා ඒවා ව්‍යාපාරයක මුදල් ආයෝජනය කිරීමෙන් ලැබුණු ලාභාංශ වෙන්න බෑ. ඒ නිසා නිසැකවම කාගෙන් හරි ලැබුණු මුදල්. හැමවිටකම ඒවා එකම ආකාරයක ගණන්. ඒ නිසා ඒවා දුන්නේ එකම පුද්ගලයෙක් කියල අපට හිතන්න පුළුවනි. ඒ පුද්ගලයා ජෙකිල් වියයුතුයි."

"වියදම් කිරීමේදී හයිඩ්ගේ අරපරෙස්සමක් නැති බව?"

"අඳින්නට ඔහු මිලට ගෙන තිබුණේ, මිල අධික වර්ගයේ ඇඳුම් පැළඳුම්" හෝම්ස් කීය. "ඒකෙ වැරැද්දක් මා දකින්නේ නෑ. නමුත් ඔහුගේ කුණුකූඩයේ කිලිටි කමිස දෙකක් තිබෙනවා මා දුටුවා. වටිනා අලුත් ඇඳුම් කිලිටි වුණාම සෝදවා ගන්නෙ නැතුව, කුණු කූඩයට දමන්නේ කවුද?"

"ඔහු නිදහසේ මුදල් වියදම් කරමින් විනෝද වී ඇති බව?"

"ඔහුගේ කුණුකූඩයේ තිබී මට හමුවුණු අනෙක් ප්‍රධානම දේ තමයි, හයිඩ් මිලදී ගෙන තිබූ ප්‍රවේශපත් වල ඉතිරි කොටස්. මොන ප්‍රවේශ පත්‍ර වලද? රාත්‍රී සමාජ ශාලා, විනෝද නිකේතන, සංගීතය, නැටුම් හා මත්පැන් අලෙවිකරන රංගශාලා ආදී තැන්. ඔහු බැංකු ගිණුම් වලින් දිගින් දිගටම, මුදල් ආපසු අරගෙන ඇති හැටිත්, මට දකින්න ලැබුණා."

"එතකොට ඔහුගේ උස, කකුල්වල ඔකල ගතිය, පාවිච්චි කරන දුම්කොළ ගැන ඔබ කිව්වේ කොහොමද?"

හෝම්ස්ට සිනා පහළවිය.

"ඒවා බොහොම සරල දේවල් නේ වොට්සන්. ඒ දිග කලිසම, අඩි පහක් පමණ උස කෙනෙකු මිස, වෙනත් කෙනෙකු අඳින්නේ කොහොමද? ඔහුගේ පාවහන්වල අඩිය මා පරීක්ෂා කළා. දෙපයේ ඔකල ගතිය නිසා, ඇතුළත දාර දෙසින් හුගක් ගෙවී ගිහින් තිබුණා. දුම්කොළ ගැන කියන්න තියෙන්නේ එක දෙයයි. කොළපාට මිශ්‍ර අළුපාට කුරුට්ටු අළු. ඔහුගේ බුමුතුරුණු මත මා දුටුවා. ඒ පැහැදිලිවම කැවෙන්ඩිෂ් දුම්කොළ වල අළු..........."

හෝම්ස්ගේ කථාව එක්වරම නැවතුණේ, අවන්හල තුළට කඩාවැදුණු එක් පුද්ගලයෙකුගේ දසුනෙනි. අතේ සැරයටියක්ද රැගෙන, හොඳ ඇඳුම් පැළඳුම්වලින් සැරසී සිටි ඔහුගේ, උස





අඩිපහකට වැඩි නොවීය. හිස ප්‍රමාණයෙන් විශාල වූ අතර, මුහුණේ තිබුණේ වානරයෙකුගේ වැනි, රෞද්‍ර පෙනුමකි. ගොරෝසුව මැවුණු කළු ඇහිබැම අපට සිහිපත් කළේ, කිරිවවුලෙකුගේ පියාපත් යුගලයයි. ඒවා නාසයට ඉහළින්, නළල මැද දී, එකට සම්බන්ධ වී තිබිණ. කෝපයෙන් දැවෙන බැල්මක්, ඔහු අවන්හලේ සැම අස්සක් මුල්ලක් නැරම යොමු කළේ, ගින්දර මෙන් රත්පැහැ දෙනෙත් වලිනි. එම මුහුණේ පෙනුම, මගේ සිතේ ඇතිකළේ දැඩි පිළිකුලකි.

"කෝ අර තක්කඩි?" තම සැරයටිය ඉහළට ඔසවා අමුත්තා ගිගිරුවේ තර්ජනාත්මක හඬකිනි.

කාගේත් නෙත් ඔහු වෙත යොමුවිය. ඔහු අවන්හලේ අය වෙත යොමු කළ මිනීමරු බැල්ම, වඩාත් දරුණු වූයේ අප දෙදෙනා දුටුවිට යි.

"හා, ඔය ඉන්නේ කාලකණ්ණි තක්කඩි!" යයි කෑගැසූ ඔහු අප සිටි දෙසට වේගයෙන් දිව ආවේය. මීළඟට ඔහු මාරුවෙන් මාරුවට අප දෙදෙනා දෙස බැලුවේ, කෝපාවිෂ්ඨ සතෙකු මෙන් නාස්පුඩු වලින් පිඹිමිනි.

"උඹලගෙ නායකයා කොයි එකාද?"

ඔහු කෑගැසුවේ ගොරෝසු හඬකිනි.

"ඔහේ වෙන්න ඇති එඩ්වඩ් හයිඩ් කියන්නෙ?" හෝම්ස් කීවේ තම අසුනෙන් නැගී සිටිමිනි. අමුත්තාට වඩා හෝම්ස් අඩියක් පමණ උස බැව් එවේලේ මට පෙනිණ.

"හො හෝ! මගේ නේවාසිකාගාරයට කඩා වැදුණු චණ්ඩි දෙන්නගේ නායකයා උඹද?" ඔහු විමසුවේ අවඥා සහගත සිනාවක් සමඟය. අඩියක් පිටුපසට ගත් ඔහු, සැරයටිය ඉහළට එසෙව්වේ අපට පහරදීමට සූදානමෙනි. එවිට ඔහුගේ අත්වල ඉදිරිකොටස් නිරාවරණය විය. ඒවා ඝනව වැඩුණු කළුපැහැති රෝමයෙන් වැසී තිබුණේ, ගෝරිල්ලෙකුගේ අත් සිහිගන්වමිනි.

"උඹල දෙන්නා, මං නැතිවෙලාවෙ මගේ කාමරේට කඩා වැදුණේ කාගෙන් අවසර අරගෙනද? මොකද ඒක බොරුයි කියලද උඹල කියන්නෙ? උඹල කාමරේට අරගෙන ගිය ලාම්පුවේ, භූමිතෙල් දුම් ගඳ මට හොඳට තේරුණා. ගේ අයිති ගෑනිගේ අත්දෙක අඹරවල කඩන්නයි මම හැදුවෙ. එතකොට ඒ බැල්ලි උඹලගෙ හැඩහුරු කම් විතරක් නෙමෙයි; එන්න ඇත්තෙ මේ තැබෑරුමට කියල කිව්වෙ මරළතෝනි දෙමින්."



www.sinhalaelibrary.com

“මගේ නම ෂර්ලොක් හෝම්ස්. මේ මගේ මිත්‍රයා දොස්තර ජෝන් වොට්සන්. හයිඩ් මහත්මයා අපි ඔබ හමුවෙන්න බලාගෙන හිටියෙ හුගක් දවසක ඉඳල. මහත්වරු වගේ විස්කි එකක් බොමින්, අපි මේ ප්‍රශ්නය ගැන කතාබස් කරමු ද?”

“මහත්වරු වගේ?” අමුත්තා ගිගිරුවේය. “තොපි ගෙවල් බිඳින හොරු! හොඳයි නැද්ද?” ඔහු තම සැරයටිය මුගුරක් මෙන් ඉහළට එසෙව්වේ අපට පහරදීමටයි.

මගේ මිත්‍රයාගේ පිහිටට ඒමට, මම වහාම අසුනෙන් නැගිට්ටෙමි. එතැනින් ඉවත්වෙන ලෙස හෝම්ස් මට සංඥා කළේය.

“ස්තූතියි වොට්සන්. මට පුළුවනි මේ ප්‍රශ්නය තනියම විසඳාගන්න” කී ඔහු, කබාය ගලවාදමා සටනට සූදානම් විය. අවන්හලේ සිටි අය ද සටන නැරඹීමට සූදානමෙන්, තමන්ගේ අසුන්වලින් නැගිට අප අසලට පැමිණියහ. තව මොහොතකින් සටන ඇරඹෙන්නට ඉඩ තිබිණි. අවන්හල අයිතිකරු ජිම්ට් පොල්ලක් අතින් ගෙන එතැනට ළංවුණේ එවිටය. ඔහු පොලු පහර එල්ල කළේ වීදුරු කිසිවක් නොතිබුණු මේසයකටය.

“දෙයියන්ගෙ නාමෙන්!” ඔහු කීය. “මෙහෙ ඇතුළෙ පන්දු පටන්ගන්න එපා. ඒවා ඕන නම් බහිනවා එළියට. මං මේ හයිඩ්ව අල්ලගන්නම්. ඒ අතරෙ ඔහේගෙ යාළුවත් ඇදගෙන යනවා!” ජිම්ට්ගෙන් එම අණ ලැබුණේ මා වෙතය. “ඊට පස්සේ ඔහේලා මිනීමරාගත්තත් මට කමක් නෑ”

වඩාත්ම නුවණට හුරු ක්‍රියාව, කෝලාහලයා මගහැර ඉවත්ව යාම බැව් අපි තේරුම් ගත්තෙමු. අපේ හිස්වැසුම් හා සැරයටි අතින් ගෙන, අපි එතැනින් එළියට බැස්සෙමු. ජිම්ට්ගේ දෑතට හිරවී සිටි හයිඩ්, අප දෙස බලාසිටියේ කෝපයෙන් වෙවුළමිනි.

මෙවැනි අවස්ථාවල වීදියට පිවිසි විගස සැහැල්ලුවෙන් සිනාසීම, මගේ මිත්‍රයාගේ සිරිතයි. එය මට නොයෙක් වර දකින්නට ලැබී ඇත. එහෙත් කුලීරියකට නැගී, අප එන අතරේ ද, මගේ මිත්‍රයාගේ තිබුණේ දැඩි නිහඬතාවයකි. ඔහු නළල රැලිකරගෙන කල්පනාවකට වැටී සිටියේය.



4

## ප්‍රාකාරයක් අබියස

“කොහොම වුණත් අපට බඩගින්නේ ඉන්න සිදුවෙන්නෙ නෑ වොට්සන්” මගේ මිත්‍රයා කීවේ, නිවහනට ආපසු පැමිණ ගැස්පහන දල්වන අතරේය. “නේවාසිකාගාරේ පවත්වාගෙන යන නෝනලා ගැන හිතනකොට, හඩ්සන් මහත්මිය මැණිකක්”

හෝම්ස් මේ වර්ණනාව කළේ, අප නිවසේ නොසිටියත්, අපේ රාත්‍රී අහර උඩුමහලේ මේසය මත සූදානම්ව තිබීම නිසා ය. රෝස්ට් කළ කුකුළමස් වලින්, එම ආහාර වේල සමන්විත විය. එයට සූදානමෙන් හෝම්ස් වයින් බෝතලයක් විවෘත කළේය.

අප ආහාර ගත්තේ කතාබහකින් තොරවය. ඊට හේතුව වූයේ මගේ මිත්‍රයාගේ තිබූ දැඩි නිහඬතාවයයි. මා ඇසූ ප්‍රශ්නවලට “හ්ම්” කියා මිස, ඔහුගෙන් නිසි පිළිතුරු නොලැබිණි. මා කියූ දේට සවන්දීමට ද ඔහුගේ උනන්දුවක් නොවීය. “ඊළඟට අපි මොකක්ද කළ යුත්තේ?” අන්තිමේදී මම විමසුවෙමි.

“නිදා ගැනීම” හෝම්ස් පිළිතුරු දුන්නේ සිනාසෙමිනි. “මගේ හිතවත් වොට්සන්. අපි හොඳ නින්දක් නිදාගත යුතුයි. ඒ මොකද අප විසින් කළ යුතු වැඩ රාශියක් හෙට දවසෙ තියෙනවා. ඔබට කරන්න තියෙන්නෙ මොනවද දන්නව ද? යන්න ඔබේ පරණ ක්‍රීඩා සමාජ ශාලාවට. ගිහින් පරණ මිතුරන් සමග මිත්‍රකම් අලුත් කරගන්න. ඔබ බොහොම කාලයකින් ඒ පැත්තෙ ගියේ නැහැනෙ?”

“ඔබ මොනවද කරන්න බලාපොරොත්තු වෙන්නෙ?” මම විමසීමි.

“මට තියෙනවා ගමන් බිමන් හුගක්” ඔහු කීය. “බැංකුවෙන් බැංකුවට යාමට මට සිදුවේවි. ඊළඟට ස්කොට්ලන්ඩ්යාඩ් එකට. ඊටපස්සෙ රාජ්‍ය ලේඛනාගාරයට. එඩ්වඩ් හයිඩ්ගේ උපතේ සිට අද දක්වා විස්තර හොයාගන්න ඕන. ඒක එච්චර පහසු කටයුත්තක් වේවි කියල මං හිතන්නෙ නෑ. නමුත් මගේ සම්පූර්ණ උත්සාහය යෙදිය යුතුයි. ඔහු අපේ අංක එකේ හතුරා වෙන්නයි යන්නේ. හතුරාට මුහුණදීමට ගතයුතු මුල්පියවර නම්, හතුරා හොඳින් හඳුනාගැනීම.”



www.sinhalaelibrary.com

"ඒ වුණාට හෝම්ස් ඔබේ සෞඛ්‍ය තත්ත්වය........?" මම ඇසීමි.

"ලන්ඩන් නගරයේ ටිකක් ඇවිද්දට මගේ සෞඛ්‍ය තත්ත්වයට අයහපතක් වෙන්නෙ නෑ" හෝම්ස් කීය. "වෛද්‍යවරු කොහොමටත් කියන්නෙ, නිතර ව්‍යායාම ගන්න කියල නේද?"

"ව්‍යායාම කියන්නෙ එකක්; මහන්සිවීම තවත් එකක්" මම කීවෙමි. "ඔබ ප්‍රමාණයට වඩා මහන්සි නොවුණොත් හොඳයි."

"වොට්සන්. මං අසනීප වෙන්නෙ මොන තත්ත්වයකදීද දන්නවද? කිසිම වැඩක් නොකර, එකම තැනකට වෙලා, කම්මැලි කමින් ඔහේ බලාගෙන ඉන්න සිද්ධවුණොත්. දැන් ඉතින් නින්දට යන්න වෙලාව හරි"

හෝම්ස් තම නිදන කාමරයට ගියත්, මට නම් නින්ද අහලකවත් නොවීය. මට දිගින් දිගටම සිහිවූයේ, දොස්තර හෙන්රි ජෙකිල් සහ එඩ්වඩ් හයිඩ් අතරේ සබඳතාවයයි. නිදාගැනීමට කාමරයට ගියත් හෝම්ස්ට ද ඉක්මනින් නින්ද නොයන්නට ඇත. ඔහු නොකඩවා කාමරයේ ඉහළ පහළ ඇවිදින අඩි ශබ්දය මට ඇසිණ. ඔහුගේ පයිප්පයේ ඇවුණු දුම්කොළ වල සැර දුගඳ, මගේ නාස්පටල විනිවිද ගියේය.

පසුදින උදයේ අවදිවී මම විසිත්ත කාමරයට පිවිසියෙමි. සයිඩ්බෝඩ්ය මත මා නමට ලියූ ලියුම් තැබැල්ලක් විය. ඉක්මනින් උදේ ආහාරය ගෙන, තමා පිටත්වී යන බව මගේ මිත්‍රයා ලියා තිබිණ. ඊට අමතරව කලින්දා රාත්‍රියේ මට මතක් කළ කටයුත්ත ගැන ද ඔහු සඳහන් කර තිබිණ. මේ වෙලාව වනවිට ධාරානිපාත වර්ෂාවක් ඇදහැලෙන්නට පටන්ගත්තේය. උදේ ආහාරය නිමකොට, හැඳපැළඳගෙන බලාසිටියත්, වැස්ස නොනැවතිණ. පැය ගණනාවක් නොකඩවා වැස්ස ඇදහැළුණු නිසා, අන්තිමේදී, ක්‍රීඩා සමාජයට යාමේ අදහස අත්හැර දමා, මම ඇඳුම් මාරු කරගත්තෙමි.

හෝම්ස් ආපසු එනවිට සවස පහ පමණ වී තිබිණ. ඔහුගේ තිබුණේ බලාපොරොත්තු කඩවූ විලාසයකි.

"හෝම්ස් ඔබ මේ ඇවිත් තියෙන්නේ එංගලන්ත මහ බැංකුවට ගිහින්, එහෙම නේද?" මා ඇසුවේ කියවමින් සිටි පොත ඉවතින් තබමිනි.

මගේ මිත්‍රයා මා වෙත හෙළුවේ, විමතියට පත් බැල්මකි. "ඔබට ඒ ආරංචිය ලැබුණේ කොහෙන්ද වොට්සන්?"





"බොහොම සරලයි" මා කීවේ අතිශය සතුටට පත්වය, නිරීක්ෂණ හා නිගමන මගින් ඔහු පුදුමයට පත්කිරීමට අවස්ථාවක් මට ලැබුණේ කලාතුරකිනි.

"ඊයේ රාත්‍රී මා එක්ක කතා කරද්දි ඔබ කිව්වා, යන්න බලාපොරොත්තු වෙන එක තැනක් බැංකුව බව" මම කීවෙමි. "දින කිහිපයකට පෙර ත්‍රෙඩ්නීඩල් වීදියේ ඇවිද යද්දී, මා දුටුවා අපූරු දර්ශනයක්. එංගලන්ත මහ බැංකුව ඉදිරිපිට පදික වේදිකාවේ, සිමෙන්ති ලෑලි ගළවා ඉවත්කර තිබූ හැටි. සේවකයන්, එම ලෑලි යට තිබූ රතුපාට පස් ඉවත්කොට, ඒවා පාරට දමා තිබුණා. ඔබේ වම් සපත්තුවේ අඩියේ දාරයේ, එම රතුපාට පස් ස්වල්පයක් ඇලී ඇති බව මට පෙනෙනවා. සැකයක් නෑ; ඔබ අද යන්න ඇත්තෙ ඒ පැත්තේ."

එහාට තම වම් සපත්තුව ගැළවූ මගේ මිත්‍රයා, එහි අඩිය පරීක්ෂා කර බලා ඉවතින් තැබුවේය.

"විශිෂ්ටයි මගේ හිතවත් වොට්සන්" ඔහු කීය. "නිරීක්ෂණයට ඔබේ ඇති දක්ෂකම දිනෙන් දිනම ඉහළ යනවා. ඒ ගැන මගේ ප්‍රශංසාව පිළිගන්න"

"එහෙනම් මං නිවැරදියි, එහෙම නේද? ඔබ එංගලන්ත මහ බැංකුවට ගියා?"

"නෑ මිත්‍රයා. මං ඒ පැත්ත පළාතක ගියේ නෑ" ඔහු කීය.

"එහෙනම් කොහොමද ඔය රතුපාට........?"

"පයිප්ප දුම්කොළ ටිකක් මිලට ගන්න, මං බ්‍රැඩ්ලි ගේ සාප්පුවට ගොඩවැදුණා. ඔවුන් සාප්පුවේ නාමපුවරුවේ රතුපාට තීන්ත ආලේපකරමින් හිටියේ. එළියේ තැන් තැන්වල, ඒ රතුපාට තීන්ත වැටී තිබුණා. එයින් ස්වල්පයක් තමා මගේ සපත්තු අඩියේ තැවරෙන්න ඇත්තේ"

"එහෙනම් මට වැරදිලා?"

"ඒ වුණත් අධෛර්යය වෙන්න එපා, මගේ හිතවත් වොට්සන්" ඔහු කීය. "දිගටම උත්සාහ කරල බලන්න. අද දවසේ මගේ කටයුතුත්, හැම එකක්ම වගේ අසාර්ථක වුණා. එහෙම දවසක ඔබේ නිගමන විශ්ලේෂණයකට හවුල්වෙන්න ලැබීමත් සතුටක්." ඔහු පයිප්පයේ තිබූ දුම්කොළ රොඩු ඉවත්කොට, එහි කෝවට අලුත් දුම්කොළ පිරවීමට පටන්ගත්තේය.



www.sinhalaelibrary.com

"මං අද ගියේ හයිඩ්ගේ ගිණුම පවත්වාගෙන යන ග්‍රින්ඩ්ලේස් බැංකුවට" හෝම්ස් කීය. "එතැන හිටි අයකැමිවරයා හයිඩ්ගේ ගිණුම ගැන තොරතුරු, මට හෙළිකරන්න කැමැතිවුණේ නැහැ. ඔබ දන්නවා බැංකුකරුවන්, ඔවුන්ගේ ගනුදෙනුකරුවන් ගැන තොරතුරු පිටට හෙළිකරන්නේ නැහැ. මං ඔහුට කිව්වා, මං හයිඩ් සමග ව්‍යාපාර ගිවිසුමකට එළඹිලා ඇති බව. ඒ නිසා මට දැනගැනීමට අවශ්‍ය මූලික කාරණා කිහිපයක් පමණක් බව. ඉතින් තොරතුරු ස්වල්පයක් මට ලැබුණා. හයිඩ් ගිණුම ඇරලා තියෙන්නේ අවුරුද්දකට කලින්. ඊට පෙර කවදාවත් ඔහුට මේ බැංකුවේ මොනම ගිණුමක්වත් තිබිල නැහැ.

එතැනින් මං ගියේ රාජ්‍ය ලේඛනාගාරයේ උපත් ලියාපදිංචි කිරීමේ අංශයට. එතැන සිට අනෙක් අංශවලටත් මගේ විමසීම යොමුවුණා. නමුත් මේ කියන වයසේ එඩ්වඩ් හයිඩ් කෙනෙකු ගැන, කිසිම ලියවිල්ලක සටහන් වෙලා නැහැ........."

"මොනවා? ඒක හරි පුදුමයක් නේ"?

"ඔව් වොට්සන්. ඔහු කවුරු වුණත්, ඉපදිලා තියෙන්නේ එංගලන්තයේ නම් නොවෙයි. ඔහු සතුව කිසිම දේපළක් නැහැ. මං ස්කොට්ලන්ඩ්යාඩ් එකටත් ගියා. එඩ්වඩ් හයිඩ් ගැන කිසිවක් ඔවුනට වාර්තාවෙලත් නැහැ. අන්තිමේදී මං තීරණය කළා ආයෙමත් ඔහුගේ නවාතැනටම යන්න. ගෙහිමි කාන්තාව හිටියේ ප්‍රාණභයෙන්. එක වචනයක් හෝ පිටකරන්න, ඇගේ සූදානමක් තිබුණේ නැහැ. ඒත් රන්පවුමේ කාසිය දුටුවාම ඇගේ කට අමාරුවෙන් ඇරුණා.

හයිඩ් ඒ ගෙදර පදිංචියට ඇවිත් තියෙන්නේ අවුරුද්දකට පෙර. ඒ කියන්නේ අර බැංකු ගිණුම පටන්ගත් කාලයේ. ඔහු මාස එකහමාරක කාමර කුලී, අත්තිකාරම් හැටියට ගෙවල තියෙනවා.

කලින් ඔහුගේ ජීවිතය ගැන — ආවෙ කොහෙන්ද ආදී කිසිවක්, ඔහු ඇයට කියා නැහැ. ඉතින් කොයි පැත්තෙන් ගියත් අපි යන්නේ එකම කාල වකවානුවකට. ඒ කියන්නේ 1882 ඔක්තෝබර් වලට. ඊට කලින් එංගලන්තයේ එඩ්වඩ් හයිඩ් කියල නම තියෙන කෙනෙක් හිටි බවට සාක්ෂි නෑ"

"ඒක ඔහු ආරූඪ කරගත් බොරු නමක් වෙන්නත් පුළුවන් නේද හෝම්ස්?" මම ඇසීමි.





"බොහොම වෙලාවට, ඔව්" හෝම්ස් එකඟවිය. "ඒ වුණත් ඔහුගේ ශරීරයේ ඇති අස්වාභාවික විකෘති පෙනුම නිසා, නම වෙනස් කර ගැනීම විතරක් ප්‍රමාණවත් නැහැ. මං ඔහුගේ ස්වරූපය ස්කොට්ලන්ඩ්යාඩ් පොලිස් නිලධාරයන් කිහිපදෙනෙකුටම විස්තර කළා. ඒත් අපරාධවලට සම්බන්ධ එහෙම කෙනෙකු ගැන, ඔවුන්ට මතක් වුණෙත් නෑ. කිසිම වාර්තා පොතක සටහන් වෙලත් නෑ."

"ඔහු විදේශයක ඉඳලා, අවුරුද්දකට කලින් එංගලන්තයට ආවද දන්නෙ නෑ?" මම කීවෙමි.

"එහෙම කියල හිතන්නත් අමාරුයි වොට්සන්" මගේ මිතුරා කීය. "ඔහු පැහැදිලිවම විදේශිකයෙක් නම් නොවෙයි. නමුත් ඔස්ට්‍රේලියාවේ, කැනඩාවේ හෝ දකුණු අප්‍රිකාවේ කාලයක් විසූ, ඉංග්‍රීසි ජාතිකයෙක් කියලා හිතමු. ඒ වුණත් ඔවුන්ගේ ඉංග්‍රීසි උච්චාරණයේ සියුම් වෙනස්කම් ඇතිවෙනවා. මට නම් එහෙම වෙනසක් පෙනුණේ නැහැ. මං ඔහු සමග බහින් බස් වුණා නේ. දීර්ඝ කාලයක් ලන්ඩන් නුවර හිටි කෙනෙකු පිළිවෙළට, නිවැරදි ඉංග්‍රීසි කතා කළේ.........."

"හයිඩ්ගේ පෙනුම දුටු කෙනෙකුට ලේසියෙන් අමතක වෙන එකකුත් නෑ" මම කීවෙමි.

"ඒක හරි වොට්සන්. ලන්ඩන් පාතාල ලෝකයේ අපරාධකරුවන් ඉතා විශාල ගණනක් මං දැකල තියෙනවා. ඒ වුණත්, දුෂ්ටකම, කුරිරුකම, පිළිකුළුකම, මේ තරමට මුහුණේ ලියැවුණු කෙනෙකු නම් කවදාවත් දැකල නෑ. ප්‍රශ්නය තියෙන්නේ මෙකයි මිත්‍රයා. අපට ඉදිරියට යා හැකි හෝඩුවාවක් මොකුත්ම නෑ. ඒකෙනුයි මගේ මොළේ අවුල්වෙන්නෙ"

කී ඔහු තම නිදනකාමරය තුළට වැදුණේය. හෝම්ස් ඊළඟට ගන්නේ කුමන පියවරක්ද යන්න, මට සිතාගත නොහැකි විය. එය ඔහුවත් තීරණය කර නොමැති විය හැක. මේ ආකාරයට කැලඹීමට පත්වීම, ඔහුගේ සෞඛ්‍යයට අහිතකරය. එහෙත් ඒ ගැන මට කළ හැකි දෙයක් නොමැති බැව් මට වැටහිණ. මා කල්පනා කරමින් සිටියදී එක්වරම මගේ කාමරයේ දොර විවෘත විය.

කාමරය තුළට පිවිසියේ ලැස්කාර් නමින් අප හඳුන්වන පුද්ගලයෙකි. දුඹුරු පැහැති සමක් ඇති ඉන්දියන් ජාතිකයන් වන ඔවුහු, ලන්ඩනය හා පෙරදිග අතර යාත්‍රා කෙරෙන නැව්වල සේවය කරන්නෝ වෙති. ඇතුළට පැමිණි ලැස්කාරියා අඩි හයක් පමණ උස ශක්තිමත් නාවිකයෙකු බැව් පෙනිණ.



www.sinhalaelibrary.com

මගේ යාබද කාමරයේ සිටියේ හෝම්ස් පමණක් බවත්, ඔහු වෙස් මාරු කරගැනීමට හපනෙකු බවත් දැන නොසිටින්නට, මා තිගැස්සෙනු නොඅනුමානය. ඔහු හැඳසිටියේ තාරපැල්ලම් වැටුණු රළු ඇඳුමකි. හිසේ ගැටගසා තිබුණේ රතු ලේන්සුවකි. දුගඳ හමන ඉන්දියානු කළුසුරුට්ටුවක් ඔහු කටේ ගසාගෙන සිටියේය. පැළඳ සිටි අපිරිසිදු කැන්වස් සපත්තු ඉරී ගොසිනි. තද දුඹුරු පැහැති මුහුණේ එක් පැත්තක, විශාල තුවාල කැළලකි. එක් ඇසක් වටා කළුපැහැති පැල්ලමක් ද විය. මෙවැනි පුද්ගලයන් නිතර දකින්නට ලැබුණේ, වරාය කිට්ටුව පිහිටි පටුමාවත්වලය. අඳුරු සැඳෑවක මෙවැන්නකු තමා පිටුපස එනු දැකීම, කෙනෙකුගේ සිත මහත් අසහනයකට පත් කළ හැකි තත්ත්වයකි.

"හෝම්ස්" මම කීවෙමි. "ඔබේ වෙස් වළා ගැනීම නම් විශිෂ්ටයි. ඔබ පාරට බැස්ස වහාම, පොලිසියෙන් හිරභාරයට ගත්තොත් මං පුදුමවෙන්නෙ නෑ"

"ස්තුතියි වොට්සන්. ඔබට පෙනෙන්නේ එහෙම නම්, මට සෑහීමකට පත්වෙන්න පුළුවනි. මං මේ යන්න හදන්නේ රංග ශාලාවකට"

"හෝම්ස්!" මට කෑගැසිණ.

"කලබල වෙන්න එපා මිත්‍රයා." ඔහු කීය. "එවැනි තැන්වලට විවිධ ජාතීන්ට අයත් විවිධ සමාජ මට්ටම්වල අය එනවා. ඒ අතරේ මාව කැපී පෙනෙන එකක් නැහැ. මං ඔබට කිව්වා නේද හයිඩ්ගේ කුණු කූඩයේ තිබී මට හමුවුණු ප්‍රවේශපත්‍ර වල ඉතිරිකොටස් ගැන? මං මේ යන්න හදන්නේ අන්න එවැනි තැනකටයි"

"ඒ මොකටද? හයිඩ් හමුවෙන්නද?"

"ඔව්"

"අදත් ඔහු එතැනට එයි කියල ඔබ කොහොමද දන්නෙ?" මම ඇසීමි.

"මට ඒ හෝඩුවාව දුන්නෙ, ඔහුගේ නේවාසිකාගාරය අයිනි ගැනි. ඔහුගේ කාමරය ඇය යැව්වාලු, රෙදි පිරිසිදු කරන තැනකට. ඊට පෙර කබා සාක්කුව බලද්දී, ඇයට හමුවුණාලු රංගශාලා ප්‍රවේශපත්‍රයක්. එතැනට තමයි මං අද යන්න හදන්නෙ"

"එතෙන් මොනවද ඔබ හොයාගන්න බලාපොරොත්තු වෙන්නෙ?"





"ස්ථිර විශ්වාසයක් නෑ" හෝම්ස් කීය. "සමහරවිට මොනම කාරණයක් වත් දැනගන්න බැරිවේවි. සමහරවිට කාරණා රාශියක් දැනගන්න අවස්ථාවක් ලැබෙන්නත් ඉඩ තියෙනවා. කොහොම වුණත් හයිඩ්ව ඉතාම ළඟින් නිරීක්ෂණය කරන්න අවස්ථාවක් මට ලැබුණොත්? ඒක මට ඉදිරියේදී ප්‍රයෝජනවත් වෙන බවට සැක නෑ.......... නෑ නෑ වොට්සන්. ඔබ කලබල වෙන්න එපා. අද මට ඔබ උවමනා වෙන එකක් නැහැ."

"ඔබට මාව උවමනා නොවෙන්න පුළුවනි" මා කීවේ තරහෙන් ය. "නමුත් ඔබ උවමනාවට වඩා මහන්සිවෙන එක නම් කොහොමටවත් හොඳ නැහැ. ඒක වළක්වන්න මං අද ඔබ සමඟ යා යුතුමයි. අපරාධ පරීක්ෂණ විද්‍යාවේ ඔබ විශේෂඥයකු වෙන්න පුළුවනි. ඒත් ලෙඩරෝග ගැන වැඩි දැනුමක් තියෙන්නේ මට"

"හොඳයි හොඳයි මිත්‍රයා. එහෙනම් ඔබත් එන්න මා සමඟ"

හෝම්ස් ඔහුගේ නිදනකාමරය වෙත මා කැඳවාගෙන ගියේය. මට හඳුනාගත නොහැකි උපකරණ, පාටකූරු, පින්සල් හා සායම් බඳුන් රැසක් ඔහුගේ කණ්ණාඩි මේසය මතවිය. මේසය මත තිබුණේ කළු මිශ්‍ර දුඹුරු පැහැති දියරයකි.

මගේ කමිස කොලරය ඉවත් කළ ඔහු, දුඹුරු පැහැති දියරය මගේ මුහුණේ හා දෑත්වල ආලේප කර ගන්නා මෙන් උපදෙස් දුන්නේය. මීළඟට ඔහු මගේ කන්වල හා බෙල්ලේ පිටි පස ද එය තැවරුවේය. අනතුරුව මා පුටුවක හිඳුවා මගේ මුහුණට නොයෙක් පියරවර්ග හා සායම් ආලේප කළේ දැඩි අවධානයකිනි. මේ කටයුතු සඳහා පැය භාගයකට වඩා ගත කළ ඔහු, අන්තිමේදී උපකරණ ඉවතට දමා දෑත් පිසදමා ගත්තේ "ඔන්න වැඩේ ඉවරයි" කියමිනි. "දොස්තර වොට්සන්, ලැස්කාරියකු කිරීමේ කටයුතු සාර්ථකද කියලා, අන්න අර කැටපතෙන් බලාගන්න."

කැටපතේ මගේ ඡායාව දුටු මම ඉමහත් පුදුමයට පත්වීමි. මට දකින්නට ලැබුණේ ලන්ඩනයේ වෛද්‍යවරයකු නොව, නාවුක සේවයේ යෙදුනු ඉන්දියානු කම්කරුවෙකි. සණ්ඩු සරුවල් වලට මැදිවීම නිසා බිඳී විකෘති වූ නාසයක්, අබිං පානය නිසා කළු පැහැති අවලක්ෂණ වූ දත් දෙපෙළක් ද මට ලැබී තිබිණ. අනෙක් බොහෝ දේවල්වලදී මෙන්, වෙස් මාරුකිරීමේ කලාවේද, හෝම්ස්ට තිබුණේ ඉන්ද්‍රජාලිකයෙකු සතු දක්ෂතාවයකි. මම ඒ බැව් ඔහුට පැවසීමි.



www.sinhalaelibrary.com

"වොට්සන් ඔබ මගේ දක්ෂතා අගය කරනවා. ඒ වුණත් මුහුණේ ආලේප කළ වොල්නට් කහට යවන්න ගියාම, ඔබට තරහත් යාවි. දැන් මේ ඇඳුම හැඳගන්න"

අපවිත්‍ර, ඉරීබිය, නාවික ඇඳුම් කිහිපයක් ඔහු මා අතට දුන්නේය. ඒවා හැඳ ඔහු දුන් හිස්වැස්ම පැළඳ ගතිමි. යළිත් වරක් කැටපතෙන් බැලූ මා දුටුවේ, ඇදහිය නොහැකි වෙනසකි. මගේ මව ජීවත්ව සිට මේ පෙනුම දුටුවා නම්, ඇයට ද මා හඳුනාගැනීමට නොහැකිවනු නියතය.

"වොට්සන්. දැන් ඔය කබා සාක්කුවට ඔබේ රිවෝල්වරය දමා ගන්න. ඒක අපේ වැඩි පරෙස්සම සඳහා. දැන් මේ කාසි ඔබේ කලිසම් සාක්කුවලට දමාගන්න."

ඔහු මා අතට දුන්නේ, පැන්සයේ හා පැන්ස බාගයේ කාසි රැසකි.

"මේ මොකටද?"

"රංගනය අවසානයේ නාට්‍යාංගනාවන් වෙත විසිකිරීමට!"



5

# හයිඩ් රැඳුණු තැන්

අපේ පෙනුම දුටු හඩ්සන් මහත්මිය තිගැස්සුණාය. බොහෝ කාලයක සිට ඇය, හෝම්ස්ගේ 'විකාර' හැසිරීම් වලින් සිත අවුල්කරගෙන සිටියාය. මෙලෙස වෙස්වළා ගැනීමට ඇති අවශ්‍යතාවය, හෝම්ස් ඇයට පහදා දුන්නේය. ඇය නිහඬව ඒ සියල්ල අසා සිටියාය. අන්තිමේදී අපි ප්‍රධාන දොරටුවෙන් පාරට නොබැස, පැති දොරටුවෙන් පිටවීමට තීරණය කළෙමු. ඇය එයට ද එකඟවූවාය. පැති දොරටුවෙන් අඟුවකට පිවිසි අපි, බේකර් වීදියේ වෙනත් තැනකින් මතුවූයෙමු.

ඊළඟට අපට තිබූ අභියෝගය වූයේ කුලීරියක් අල්ලා ගැනීමයි. හිස් කුලීරථ තුනකම රියැදුරෝ, රිය නැවැත්වීමට අප කළ සංඥාව නොතකා, නොනවත්වාම ගියහ. අන්තිමේදී එක් රියැදුරෙක් අප කුලීරියෙන් ගෙන යාමට එකඟවිය. ඒ, ගමන පිටත්වීමට පෙර, තමා ළඟ තිබූ රන්කාසියක් හෝම්ස් රියැදුරාට පෙන්වූ පසුවය.

සොහෝ ප්‍රදේශයේ අප පැමිණි මන්දිරය, අවුරුදු පනහක් පමණ පැරැණි අබලන් වූ තැනක් විය. එහි දැලිකුණු බැඳී තිබූ බිත්ති හා බිඳුණු වීදුරු ජනේල වෙත මගේ අවධානය යොමුවිය. ඇතුළුවන දොරටුව අසලම යකඩ කණුවක, නාම පුවරුවක් එල්ලා තිබිණ. එහි "රතුපාත්තයා රඟහල" යනුවෙන් සඳහන් විය. ඇතුළතින් වාදනය වූ පියානෝවක සංගීතය සමඟ, අතරින් පතර නැගුණේ පුද්ගලයන් මහහඬින් නැංවූ සිනාහඬය. එය වඩාත් ළංවූයේ, මත්පැනින් වෙරිවූවන්, වෙරිමතෙන් නගන සිනාහඬට යයි මට සිතිණ.

"අපි ප්‍රමාද වගෙයි වොට්සන්. දර්ශනය ඇරඹිලා"

හෝම්ස් පැවසූ ලෙසින්ම, දර්ශනය පටන්ගෙන තිබිණ. අපට දකින්නට ලැබුණේ වේදිකාවේ රඟදැක්වුණු, තරුණ නාට්‍යාංගනාවන්ගේ නැටුම් සංදර්ශනයකි. ප්‍රේක්ෂකයන් වූයේ, වරායේ සුළු සේවකයන්, කම්කරුවන් වැනි දුප්පතුන් පිරිසක් බැව් බැලූ බැල්මට පෙනිණ. ටොප්හැට් වර්ගයේ හිස්වැසුම් පැළඳගෙන



www.sinhalaelibrary.com

සිටි කෙනෙකු සිටියේ ඉඳහිටය. පියානෝවේ සංගීතය වේගවත් වෙද්දී, තරුණියන්ගේ නැටුම ද වේගවත් විය. ඒ සමගම ඔවුන් දිරිගන්වමින් කෑගසන හඬ ද, කටට ඇඟිලි දෙකක් දමා නැගූ විසිල් හඬ ද අසන්නට ලැබිණි. හොඳින් ආලෝකය තිබූ නිසා, මගේ දෙනෙත් ප්‍රේක්ෂකාගාරය වෙත යොමු කළෙමි. මගේ වෘත්තීය සගයන් වන වෛද්‍යවරුන් කිහිපදෙනෙකු ද එහි සිටිනු දැක, මම ලැජ්ජාවට පත්වුණෙමි. හෝම්ස්ගේ මුවෙන් නැගුණේ බලාපොරොත්තු කඩවූ හඬකි.

"ෂෑ අපි ආව එකෙන් වැඩක් නෑ වගෙයි වොට්සන්. කෝ හයිඩ් ඇවිත් නැහැනෙ. අපට ලැබිල තියෙන්නෙ වැරදි ආරංචියක්ද?.......... හො හෝ මේ කියන කොටම ඔහු එන්නෙ"

ඇඳුම් ආවරණයවන පරිදි, විශාල කබායක් හැඳසිටි ඔහුගේ, අතේ සැරයටියක් ද විය. ප්‍රේක්ෂකාගාරය ඉදිරියටම පැමිණි ඔහු, සෙනග දෙසට උඩගු බැල්මක් හෙළුවේය. ඒ, තමාට අභියෝග කළ හැකි කිසිවෙකු, එහි සිටින්නේ දැ යි විමසන්නාක් මෙනි. අප වෙත යොමුවුණු ඔහුගේ දෙනෙත් තත්පර කිහිපයක් නොසෙල් වී තිබිණ. ඉවත බැලීමට නැගුණු සිතිවිල්ල, මම අමාරුවෙන් මැඩගත්තෙමි. ඔහුගේ කුරිරු දෙනෙත් අප වෙතින් ඉවත්වෙද්දී මගේ සිතට සැනසුමක් දැනිණ. එහෙත් යළිත් වරක් මේ පුද්ගලයා ගැන, මගේ සිතේ ඇති වූයේ පිළිකුලක් මෙන්ම වෛරයකි. එයට හේතුව කුමක්ද යන්න, මටවත් තේරුම් කළ නොහැක. හෝම්ස්ගේ මුහුණ දෙස මම හොරෙන් බැලීමි. ඔහුගේ සිතේ ඇතිවූයේ ද මගේ සිතේ ඇතිවූ හැඟීම් බව මම තේරුම් ගතිමි.

තම හිසේ වූ "ටොප්හැට්" හිස්වැස්ම හා ලෝගුව ඉවත් කළ හයිඩ්, ඒවා අතට ගෙන තුන්වැනි පේළියේ අසුනක් වෙත ගමන් කළේය. නළලක් නොපෙනුණු ඔහුගේ, හිස්මුදුනේ වූයේ, අවුල් ජාලයක් වූ ඝන කෙස්වැටියකි. එයින් අපට සිහිපත්වූයේ, ගෝරිල්ලාට නෑකම් කියන, අමුමස් කමින් ගල්ගුහාවල ජීවත්වූ, ආදිකල්පික මිනිසෙකුගේ චිත්‍රයකි. දෙපාවල තිබූ විකෘතිය නිසා, ඇවිදීමේදී ඔහු වෙතින් වානර ගමන් විලාසයක් දිස්විය. ඔහු මිටි පුද්ගලයෙකු වීම නිසා, තුන්වැනි පේළියේ අසුන්ගත් විගස අපට නොපෙනී ගියේය.

අප කල්පනා කරමින් සිටියේ ප්‍රේක්ෂකාගාරයේ පිටිපස අසුන්වල හිඳගැනීමටය. එහෙත් හයිඩ් ඉදිරියට ගිය බව දුටු වහාම, හෝම්ස් තම අදහස වෙනස් කළේය.





"වොට්සන්. අපි ඉස්සරහට යන්න ඕන" ඔහු කෙඳිරුවේය.

ශාලාවේ මැදින් ඉදිරියට ගිය අපට, හතරවැනි පේළියේ එක ළඟ අසුන් දෙකක් ලැබිණි. ඒ, හරියටම හයිඩ්ට පිටුපසිනි. අපේ වම්පසින් සිටි තැනැත්තා, පදික වේදිකාවේ බඩු අලෙවිකරන්නකු ගේ පෙනුම තිබූ අයෙකි. අනෙක් පසින් සිටි හැඩිදැඩි සිරුරක් තිබූ තැනැත්තා, මාළු වෙළෙන්දෙකු බව නිගමනය කළ හැකිවිය. ඔහුගේ සිරුරෙන් නිකුත් වූ දුගඳ අවට පැතිරගිය නිසා, ඔහුගේ වෘත්තිය හඳුනාගැනීමට හැකිවිය.

අපට දකින්නට ලැබුණු රංගනය ගැන විස්තර, පාඨකයා වෙත ඉදිරිපත්කිරීමට මම බලාපොරොත්තු නොවෙමි. එහෙත් නැටුම් වලින් ප්‍රමෝදයට පත්ව සිටි ප්‍රේක්ෂකයන්, නාට්‍යාංගනාවන් සිටි දෙසට කාසි විසිකිරීම, මේ වනවිටත් ඇරඹී තිබිණ. ඒ පැන්සයේ හා පැන්ස භාගයේ තඹ හා ලෝකඩ කාසි පමණි. එයින් සතුටට පත්වූවන්, කාසි අහුලාගැනීමට උනන්දු නොවූ නාට්‍යාංගනාවෝ, දිගටම තම රංගන ඉදිරිපත් කළහ.

මඳ වේලාවක් ගතවෙද්දී තම සාක්කුවට අත දැමූ හයිඩ්, කාසි අහුරක් ගෙන නාට්‍යාංගනාවන් වෙත විසිකළේය. පෙනී නොපෙනී ගිය රිදී දිස්නය නිසා, ඒ සිලිමේ රිදීකාසි බැව් මම තේරුම් ගත්තෙමි. ඒවා වේදිකාව මතට වැටෙද්දී නැගුණේ තඹ කාසිවලින් නැගුණු බොල්හඬ නොවේ. අනපේක්ෂිතව ලැබුණු වාසනාව ගැන පුදුමයටත් සතුටටත් පත් නාට්‍යාංගනාවෝ, නැටුම නැවැත්වූහ. මීළඟට ඔවුන් කළේ, රිදීකාසි වැඩි ප්‍රමාණයක් එකතුකරගැනීම සඳහා බිම පෙරළෙමින්, එකිනෙකා සමග පොරකෑමය. මෙය හයිඩ්ගේ සිතේ ඇතිකළේ සතුටක් බැව්, මම අනුමාන කළෙමි. කොක්හඬලා සිනාසුණු ඔහු, සාක්කුවෙන් තවත් රිදී කාසි අහුරක් ගෙන වේදිකාව මතට විසිකළේය.

නැටුම් දැකීමට රිසිව, එතැනට පැමිණ සිටි බොහෝ දෙනෙක් මෙයින් කෝපයට පත්වූහ. සෑහෙන මුදලක් ගෙවා මෙහි පැමිණ සිටි වැඩිදෙනෙක්, දුප්පත් පංතියේ අය බැව්, මම මුලින් සඳහන් කළෙමි. තමන් විසිකළ තඹකාසි මායිම් නොකළ තරුණියන්, රිදීකාසි අහුලා ගැනීමට යෙදුණු පොරය, කම්කරුවන්ගේ සිත්වල ඊර්ෂ්‍යාවක් ඇතිකරන්නට ඇත. අනෙක් අතට මුදල් ගෙවා බලන්නට ආ දර්ශනය නැරඹීමට, නොහැකි වීමේ පාඩුව නිසා, ඔවුන්ගේ සිත්වල තරහක් ඇතිවීම පුදුමයක් නොවේ.

www.sinhalaelibrary.com

"කලබලයක් ඇතිවෙන්නයි යන්නෙ" හෝම්ස් මගේ කනට කොඳුරා කීය. "වොට්සන් ඔබේ රිවෝල්වරය සූදානමින් තියාගන්න"

එය තේරුම් ගත් බව හැඟවීමට හිස සොලවා, කබාසාක්කුවට අත දමා, රිවෝල්වරය අල්ලාගෙන සූදානමෙන් සිටියෙමි. බිහිසුණු අත්දැකීම් වලට මුහුණදීමට සිදුවූ අවස්ථා බොහොමයකදී, අපව බේරාගත්තේ මෙම ආයුධයයි.

"නැට්ටුම් නැවතුණේ අන්න අර මෝඩයා නිසා" නාවික ඇඳුමෙන් සැරසී සිටි අයෙකු කීවේ, හයිඩ් දෙසට අත දිගුකරමිනි.

හයිඩ් එයට පිළිතුරු දුන්නේ උපහාසාත්මක වියරු සිනාවකිනි.

"අල්ලපියව් ඔකාව" බීමත්ව සිටියෙකු කෑගසනු ඇසිණ.

හයිඩ් අසල සිටි හැඩිදැඩි පුද්ගලයෙක් නැගිට, අත මිට මොලොවා හයිඩ්ගේ යටි හක්කට පහරක් එල්ල කළේය. සිටි තැනින් ඉවතට පනිමින් හයිඩ් එම පහරෙන් වැළකුණේය. සිරුරේ සමබරතාවය රඳවාගත නොහැකිවූ ප්‍රහාරකයා මුහුණින් අතට ඇදවැටුණේය. ඔහුගේ හිසට හයිඩ්ගේ සැරයටියෙන් පහරක් එල්ල විය. හිස්කබලේ අස්ථියක් බිඳෙන ශබ්දයක් නිකුත්වෙද්දී ඇදවැටුණු තරුණයා හිස එසවීමටවත් උත්සාහ නොකළේය. රංග ශාලාව තුළ කෝලාහලයක් පටන්ගැනුනේ ඒ සමගය. පුටු ඔසවා පොළොවේ ගැසූ සමහරුන් උත්සාහ කළේ, ලී කැබලි අතට ගෙන හයිඩ් වෙත ළඟාවීමටයි. සැරයටි හා වේවැල් අත තිබූ පුද්ගලයෝ ඈත සිටම, හයිඩ් දෙසට ප්‍රහාර එල්ලකිරීමට උත්සාහ කළහ. එයින් සමහරක් ඒ ළඟ සිටි අපට වැදෙද්දී අපි ප්‍රතිප්‍රහාර එල්ල කළෙමු.

"හෝම්ස්. කෝ හයිඩ්?" මා ඇසුවේ ඔහු දැකගන්නට නො ලැබුණු විටය.

"ඔහු පැන ගියා" හෝම්ස් කීය. "අපට කරන්න තියෙන්නෙත් ඒක"

සෙනග අතරින් අපහසුවෙන් බේරී අපි මහමගට පිවිසියෙමු.

"අන්න යනවා!" මගේ මිත්‍රයා කීවේ, මේ මොහොතේ අපේ දසුනෙන් ඉවත්වූ අශ්වකරත්තයක් පෙන්වමිනි. රෝද හතරේ කුලීරියක් මේ වෙලාවේ අපි සිටි තැන පසුකර යමින් තිබිණ. සාක්කුවෙන් පවුමේ රන් කාසියක් අතට ගත් හෝම්ස්, එය පෙන්වා කරත්තය නවත්වා ගැනීමට සමත්විය.





"අර ඉස්සරහින් වේගයෙන් යන අශ්වකරත්තය අල්ලගන්න අපි යන්න ඕන" හෝම්ස් කීවේ ඒ තුළට නගිමිනි. මම ද ඉක්මන් කළෙමි. "ඒක පෙනෙන තෙක් මානයෙන් ගියොත් ඔහේට පවුම් භාගයක් දෙනවා"

රිය වහා පිටත්විය. සණ්ඩුව සංසිඳවීමට, රඟහලට පැමිණි පොලීසියේ තළාහඬ, අපට අසන්නට ලැබුණේ එවිටයි.

"එඩ්වඩ් හයිඩ් හරි දක්ෂයෙක් කියලයි මට හිතෙන්නෙ" හෝම්ස් කීය.

"එහෙම කියන්නෙ කොහොමද?" මම ඇසීමි. "තව ටිකෙන් ඒ යකාගෙ කැලිවත් ඉතිරිවෙන්නෙ නෑ"

"සණ්ඩුව පටන්ගත්තේ මිනිහට පැනගන්න පහසුවෙන්න." හෝම්ස් කීය. "මං නම් විශ්වාසයි, මිනිහ අපව අඳුනාගත්ත කියල. අපි ඔහු ගැන සෝදිසියෙන් ඉන්න බව හයිඩ් දැනහිටියා."

"අඳුනාගත්තා? අපි වෙස්මාරු කරගෙන ඉඳිද්දී, එයා කොහොමද අඳුනාගත්තෙ?"

"වැරදුණේ මටයි වොට්සන්" හෝම්ස් කීය. "මිනිහගේ දක්ෂකම, මං තක්සේරු කරල තියෙන්නේ අඩුවෙන්. වෙස්වළාගත්තා වුණාට, අපේ කන්පෙතිවල මොනවා හරි වෙනසක් කරන්න මට බැරිවුණා."

"කන්පෙති වල?"

"ඔව්" හෝම්ස් කීය. "මිනිස් සිරුරේ අංගෝපාංග වලින්, කන්පෙතිවලට ඉතාම වැදගත් තැනක් හිමිවෙනවා. හැම අතකින්ම එක සමාන කන්පෙති දෙදෙනෙකුට පිහිටන්නෙ නෑ. මං හිතන්නේ අප කලින් දුටු වෙලාවේ, ඒ ගැන ඔහුගේ මතකයේ තැන්පත් වුණා."

අප ඔහු පසුපස ලුහුබැඳ එන බවක් හයිඩ් සැකකළාද යන්න, අපි දැන නොසිටියෙමු. ඔහුගේ රිය ගමන්ගත්තේ එතරම් වේගයකින් නොවේ. හරියට පසුපස ඒම අපට පහසුවන අයුරෙන් ගමන්කළාක් මෙනි. අප මගහැර පැනයාමට ඔහුගත් තීරණය, වෙනස්කළා විය යුතුය. රාත්‍රිය පුරා පැය ගණනාවක්ම ඒ කුලීරිය ගමන් කළේය. සොහෝ ප්‍රදේශයේ මුඩුක්කු, පටුමාවත්, මංසන්ධි, වටරවුම් වලින් එය ගමන් කළේ නොඉක්මන් ගමනෙනි.

එහෙත් එක් අඳුරු මංසන්ධියකදී, ඒ කුලීරිය අපට නොපෙනී ගියේ, අප මවිතයට පත්කරමිනි. ඒ රිය යන්නට ඇතැයි සිතූ පැම



www.sinhalaelibrary.com

දිශාවකටම නෙත් යොමුකලත්, එහි සේයාවක් වත් නොවිය. හෝම්ස්ගේ නියමය අනුව, කුලීරථ රියැදුරා ද විමසිල්ලෙන් සොයා බැලුවේය. එහෙත් ඒ රියේ කිසිදු ශබ්දයක් හෝ සලකුණක් නොතිබිණ. එය ආකාශයට වාෂ්ප වී ගියාක් මෙන් අතුරුදන්ව ගොසිනි! අන්තිමේදී සුසුමක් හෙළූ මගේ මිත්‍රයා, අප බේකර් වීදියට ගෙනයන මෙන් රියැදුරාට නියම කළේය.

අප ආපසු කුලීරියෙන් එන අතරේ හෝම්ස්ගේ තිබුණේ දැඩි නිහඬ බවකි. නළල රැළි කරගෙන, දෙතොල් එකට තදකරගෙන ඔහු කල්පනා කළේය. නින්දකින් අවදිවූවාක් මෙන් ඉරියව්ව එක්වරම වෙනස්කළ ඔහුට කෑගැසිණ.

"රිය නවත්වන්න!" කී හෝම්ස්, ජනේලයෙන් එළියට හිස දමා, රියැදුරාට යම් උපදෙසක් දුන්නේය. අශ්වකරත්තය හරවාගත් රියැදුරා විරුද්ධ දිශාවට ගමන් ඇරඹුවේ, වේගය වැඩිකරමිනි. ඉන්පසු අප ගමන්කළේ පවනට බඳු වේගයෙනි. කිසිත් තේරුම් ගත නොහැකිව මම පුදුමයෙන් බලාසිටියෙමි.

"ෂා මේ පැහැදිලි කාරණය, මට මේ තරම් වෙලා නොපෙනුණු හැටි" හෝම්ස් කීය. "අපි ඔහු පසුපස එන බව හයිඩ් දැනගිට්යා, ඔහු මොකටද අපව මඟහරින්න නොයෙක් පාරවල රවුම් ගහන්නෙ? එයා පදිංචි තැන අපි දන්නවා. ඒක හයිඩුත් දන්නවා. එහෙනම් ඇයි ඔහු, අප මඟහරින්න උත්සාහ කළේ?"

"ඒක මට හිතාගන්න අමාරුයි" මම කීවෙමි.

"ඒක බොහොම සරලයි වොට්සන්. ඔහුගේ සම්බන්ධයක් තියෙන එක තැනක් තියෙනවා. ඔහුට යන්න උවමනා එතැනටයි. නමුත් අප ඒක දැනගන්නවාට ඔහු කැමති නෑ. ඔහුගේ ඒ සම්බන්ධය කවුරුන් සමගද කියල ඔබට හිතන්න පුළුවන් ද?"

"දොස්තර ජෙකිල්?"

"හරියටම හරි වොට්සන්. දැන් අපි යන්නෙ එතැනට. ආ..... කියන කොටත් එතැනට ළඟාවෙලා...... අර බලන්න හයිඩ් බස්සවා, ඒ කුලීරිය පිටත්වී ගියහැටි. රියැදුරු උන්නැහේ ඔහොම නවත්වන්න. දුටුවා නේද ලෝගුවක් හැඳගෙන "වොප්හැට්" හිස්වැස්මක් දැමූ කෙනෙක්, මේ දොරටුවෙන් ඇතුළුවුණා? ........ මේක තමයි දොස්තර ජෙකිල්ගෙ ගෙදර පිටිපස්සා පැත්ත — ඔහුගේ පර්යේෂණාගාරයට ඇතුළුවෙන දොරටුව"





"හයිඩ් මොකටද මේ අවේලාවෙ දොස්තර ජෙකිල් හමුවෙන්න ආවෙ?" මම ඇසීමි.

"අන්න ඒක තමා අප විසඳාගත යුතු මුල්ම අබිරහස. මුදල් ඉල්ලාගන්න වෙන්නත් පුළුවනි. එහෙමත් නැත්නම් රාත්‍රිකාලයේ තමා දැක්වූ හපන්කම් ගැන විස්තරයක්, මුදල් සපයන්නාට දැනුම් දීමට වෙන්නත් පුළුවනි.......... මෙතැන මොකක් හරි දුෂ්ට වංචනික කටයුත්තක් සිදුවෙනවා. ඔය ඇතින් මේ පැත්තට ගලා එන මීදුම වගේ, ඒකත් නොපැහැදිලියි. කොහොම වුණත් මෙතැන තවත් රැඳී සිටීමෙන් අපට දැනගත හැකි වෙන යමක් නෑ. අපි ආපහු යමු බේකර් වීදියට. අර මුරපොළේ ඉන්න පොලිස්භටයා, දෙවරක්ම සැකයෙන් මේ පැත්ත බැලුවා. තවත් වෙලා අපි මෙතැන රැඳීසිටියොත්, සැකසහිත පුද්ගලයන් කියලා, අපව භාරයට ගන්නවාට සැක නෑ."

අපි ඉක්මනින් එතැනින් පිටත්වී ගියෙමු.

"මට තේරුම් ගන්න බැරි කාරණය මේකයි." පසුවදා උදේ, අපේ නිවසේදී උදෑසන ආහාරය ගන්නා අතරේ මගේ මිත්‍රයාට කීවෙමි. "හයිඩ් තමන්ගේ දුශ්චරිත කටයුතු, හැංගිහොරා කරන කෙනෙක් නොවෙයි. ඒවා අනෙක් අය දැනගනීවිද නැද්ද කියලා, ඔහු සැලකිලිමත් වෙන්නෙ නැහැ. එහෙම නම්, හයිඩ් ජෙකිල් සමග තියෙන මිත්‍රකම, රහසිගතව තියාගන්න උත්සාහ කරන්නේ ඇයි?"

කෝපි කෝප්ප දෙකක් පානය කොට අවසන් කළ මගේ මිත්‍රයා, කථා කළේ, තම පයිප්පයේ කෝවට දුම්කොළ පුරවමිනි.

"ඒක තමයි නොකඩවාම අප වෙත එල්ලවෙන ප්‍රශ්නය. ඔය ප්‍රශ්නයට නිවැරදි පිළිතුර හොයාගත්තොත්, මේ ගැටලුවෙන් තුන්කාලක්ම විසඳිලා අවසන්. හෝම්ස් සහ වොට්සන් දෙන්නා තමන්ගේ සතුරෝ කියල හයිඩ් දැනටම නම් කරල අවසානයි. ඒ නිසා එයා අපිත් එක්ක, කිසිම කතාබහක යෙදෙන එකක් නෑ. අපට උවමනා කරන තොරතුරු සපයන්න පුළුවන් එකම මිනිහයි ලන්ඩනයේ ඉන්නෙ"

"ඔබ අදහස් කරන්නේ ජෙකිල් බව මට තේරෙනවා හෝම්ස්" මම කීවෙමි. "ඒ වුණත් එහෙම කළොත් අපි දෙන්නා අටර්සන්ට වුණු පොරොන්දුව කඩනවා නේද?"

"කොහොමටවත් නෑ වොට්සන්. ඒක ජෙකිල්ට හෙළිනොකර, ඔහුට රහසක් හැටියට තබාගන්න බැරි කාලයක් තමයි දැන් උදාවෙලා තියෙන්නේ"



www.sinhalaelibrary.com

## 6

# අටර්සන් අදහස වෙනස් කරගනියි

දොස්තර හෙන්රි ජෙකිල් මහතාගේ නිවසට පිවිසෙන ගේට්ටුවෙන් අපි ඇතුළුවූයෙමු. මුලින්ම අපට දකින්නට ලැබුණේ කොළ පැහැති තණකොළ වලින් වැසුණු මිදුලයකි. දක්ෂ උයන්පල්ලකු විසින්, ඇඩි උත්සාහයක් දරා, එය අලංකාර ලෙස සකස්කොට තිබිණ. එයට දිගු කලක් ගතවන්නට ඇත.

කලබලයෙන්, රථවාහන වලින් හා දූවිල්ලෙන් පිරුණු ලන්ඩන් නගරයේ, මෙවැනි සුන්දර තැනක් තිබේදැයි සිතන්නටත් අපහසුය. බිත්තිවල රතුපැහැති ගඩොල්වලට අලංකාරයක් ලබාදෙන අයුරෙන්, මල්වැල් වගා කොට තිබිණ. දොර ජනෙල් සියල්ල පිරිසිදු දිප්තිමත් ඒවා විය. එකම ගොඩනැගිල්ලක ඉදිරිපස මෙතරම් පිරිසිදු අලංකාර තැනක් වෙද්දී, එහිම පිටුපස දොරටුව, එයට ප්‍රතිවිරුද්ධ ආකාරයේ එකක් වීම කොතරම් පුදුම සහගත ද? මෙම දෙබිඩි තත්ත්වය දැනගැනීම සඳහා අපට ඇවිදයාමට තිබුණේ, පියවර කිහිපයක් පමණි.

හෝම්ස් නිවසේ සීනුව නාද කළ විට, ගෘහසේවකයා අප ඉදිරියට පැමිණියේය. උස වයස්ගත පුද්ගලයෙකු වූ ඔහුගේ, හිස කෙස් තරමක් පැසී, සුදුපැහැගැන්වී තිබිණ. ඔහුගේ කොට්ටු මුහුණේ සුදුමැලි බවක් ද මම දුටුවෙමි. ජීවිතයේ දිගුකලක් තම ස්වාමියාට සේවය කිරීමට කැපකළ සේවකයකුගේ හැසිරීම, අපට ඔහු තුළින් දක්නට ලැබිණ.

හෝම්ස් දුන් ආගන්තුක පත්‍රය සිය දෙනෙතට ළංකළ සේවකයා, එය අමාරුවෙන් කියවා බැලුවේය. ඉන්පසු ඔහු අප අමුත්තන්ගේ කාමරය වෙත කැඳවාගෙන ගියේය. එය ඉතා අලංකාර ලෙස සකසා තිබිණි. ජනේල හා දොරවල් සඳහා වටිනා, දර්ශනීය තිර රෙදි යොදා තිබූ බැව් අපි දුටුවෙමු. බිත්ති වල අලංකාර තෙල්සායම් සිතුවම් කිහිපයක් එල්ලා තිබිණ. වාඩිවීමට තිබූ පුටු පවා, අලංකාර කැටයම් සහිත පෞරාණික ඒවා බැව් අපට පෙනී ගියේය. මෙවැනි තෙල් සායම් සිතුවම් මෑතකදී, කොහේදී හෝ දුටු බැව් මට සිහිවිණි.





ඒ හයිඩ්ගේ කාමරයේ බැව්, ඉතා ඉක්මනින් මගේ මතකයට නැඟිණ. හයිඩ්ට ඒවා තෑගි ලැබුණේ දොස්තර ජෙකිල්ගෙන්ද?

"මෙතැන ලස්සනට තියාගෙන ඉන්න හැටි වචනවලින් විස්තර කරන්න අමාරුයි" හෝම්ස් කීවේ වටපිට බලමිනි. "ඔය තෙල්සායම් චිත්‍ර දේගස්ගේ හොඳම සිතුවම් කිහිපයක්. පුටු - දඟහතර වැනි ලුවී සමයේ කළ නිර්මාණ. මේවායින් කියවෙන්නේ වැදගත් බව, ධනවත් බව, අවදානමට, ගවේෂණයට සහ අභියෝග භාරගන්න ඇති සූදානම. කල්පනා කරලන තක්කඩියෙකුට, මීට වඩා හොඳ තැනක් හොයන්න බෑ."

ඔහු තවත් යමක් කීමට සූදානම් වූවත්, එවිටම දොර විවෘතවිය. එයින් ඇතුළුවූයේ ප්‍රධාන ගෘහසේවකයා ය. "ජෙකිල් දොස්තර මහත්තයා කැමතියි ඔබව හමුවෙන්න"

දොරවල් කිහිපයක් විවෘත කරමින්, අප පිවිසි පසු යළි ඒවා වසමින්, ඔහු අප කැඳවාගෙන ගියේය. බරාඳ කිහිපයක ගමන් කොට, අවසානයේ අපි එක් දොරටුවක් වෙත ළංවීමු. එය වසා තිබිණ. ඔහු දොරට තට්ටු කළේය.

"ඇතුළට එන්න" කෙඳිරිලි හඬක් ඇසිණ.

අප එළියේ රඳවා සේවකයා ඇතුළුවිය. අප පැමිණි බව ඔහු දැනුම්දෙන අයුරු අපට ඇසිණ. මිළඟට එළියට ආ සේවකයා, අපට දොස්තර මහතාගේ කාමරයට යාමට ඉඩ සලස්වා දොර වසා දැම්මේය.

අප ඇතුළුවූ කාමරයේ සෑම දෙසකටම මගේ නෙත් යොමුවිය. එක් බිත්තියක හැර, අනික් බිත්ති තුනකම බිම සිට සිවිලිම දක්වා තිබුණේ, පොත් රාක්ක බැව් මම දුටුවෙමි. එම රාක්ක පුරවා තිබුණේ, නොයෙක් ප්‍රමාණවල පොත්පත් රාශියකිනි. ඒවා තිබුණේ ප්‍රදර්ශනයට නොව, කියවා තේරුම්ගැනීමට බැව්, මම වහාම තේරුම් ගතිමි. එයින් අඩක් පමණ වෛද්‍යවිද්‍යාත්මක පොත් වූ අතර, තවත් සමහරක් නවීන විද්‍යාවට අදාළ ඒවා විය. මීට අමතරව 'ගොතේ' නම් ජර්මන් ජාතික කවියාගේ, කාව්‍යග්‍රන්ථ කිහිපයක්ද දුටුවෙමි.

පොත්වලින් වැසී නොතිබුණු එකම බිත්තිය, ලොකු දොරකින් හා විශාල ජනේල දෙකකින් සමන්විත විය. ඒවා විවෘත වූයේ රෝසමල් පඳුරු පිරුණු මැද මිදුලකටයි. එහෙත් එයට යාර දහයක්



www.sinhalaelibrary.com

දොළහක් ඇතිත්, ගල්වලින් ඉදිකළ නිවසක් මම දුටුවෙමි. මීදුමෙන් වැසුණු එය දිස්වූයේ හොල්මන් ගෙයක් ලෙසිනි. අප මේ සිටින්නේ ලන්ඩනයෙන් සැතපුම් ගණනාවක් ඈත, පෞරාණික නටබුන් නගරයකදෝ යයි සිතෙන තරමට, ඒ දසුන අප්‍රසන්න විය.

විශාල මේසයක් පිටුපස වාඩිවී සිටි පුද්ගලයෙක්, අසුනෙන් නැගිට අප ඉදිරියට ආවේය.

"ෂර්ලොක් හෝම්ස්?" ඔහු ඇසුවේ ආචාර කිරීමට සුරත දිගුකරමිනි. "මං හිතන්නේ නෑ මීට කලින් මට ඔබ මුණගැහිල තියෙනවා කියල........... කලින් හඳුනාගෙන නැහැ නේද?"

"ඒ වුණත්............" හෝම්ස් කීවේ සමාචාර කරමිනි. "ජෙකීල් දොස්තර මහත්මයා. මං නම් ඔබ ගැන අහල තියෙනවා. මේ මගේ හිතවත් මිත්‍රයා ජෝන් වොට්සන්. ඔහුත් ඔබ වගේම වෛද්‍යවරයෙක්."

ජෙකීල් මට ද අතට අත දුන්නේය. ඔහු හෝම්ස් තරමටම උස, ඊට සරිලන හැඩිදැඩි සිරුරක් තිබූ, වයස පනහක පමණ අයෙක් බැව් මම දුටුවෙමි. නිල්පැහැති තියුණු දෙනෙත් ද කඩවසම් මුහුණක් ද ඔහු සතුවිය. ඔහුගේ දුඹුරු පැහැති කෙස්වැටිය, නළල දෙපසින් සුදුපැහැයට හැරෙන්නට පටන්ගෙන තිබිණ. ගිරාහොටක් වැනි නාසය ද, පුළුල් නළල් තලය ද, ජෙකීල්ට ගෙන ආවේ බුද්ධිමත් පෙනුමකි.

සවස දෙකට ළංවී තිබුණත්, වෛද්‍යවරයා තවමත් හැඳසිටියේ ගෙදරට අඳින පිටකබායම ය. එය මා පුදුමයට පත්කළ කරුණක් විය. එහෙත් එක් අතකින් එය පුදුමයට කරුණක් නොවේ. ජෙකීල් ද මගේ හිතමිත්‍ර හෝම්ස් මෙන්, රාත්‍රිකාලයට වෛද්‍ය හෝ රසායනික විද්‍යාත්මක පර්යේෂණ වල යෙදෙන්නෙකු විය යුතුය. පාන්දර දෙක තුන වනතුරු පර්යේෂණවල නියැලෙනවා නම්, ජෙකීල් අවදිවන්නේ බොහෝ ප්‍රමාද වී විය යුතුය. ඔහුගේ දෙනෙත් වලට පහලින් මුහුණ, මඳක් දම්පැහැයට හැරී තිබූ අතර, විඩාපත්බවක් ද මුහුණෙන් දිස්විය. හොඳහැටි නින්දක් නොලැබීම ගැන, මා කළ අනුමානය නිවැරදි බව එයින් පෙනිණ.

"ඔබේ පැමිණීම මට සතුටක් හෝම්ස් මහත්මයා" ජෙකීල් කීය. "ඒත් ඔබ මෙහෙ ආවෙ ඇයි කියලා මං ඇහුවොත්?"

"දොස්තර මහත්මයා. ඔබ එඩ්වඩ් හයිඩ් නම් පුද්ගලයා හොඳින් හඳුනන බව මට දැනගන්න ලැබුණා....."





ජෙකීල්ගේ මුහුණ එක්වරම වෙනස් විය. මෙතෙක් වේලා එහි තිබූ සුහද බව වෙනුවට, එහි මතුවූයේ නුරුස්සන බවකි. කතාබහේ තිබූ ආචාරශීලීත්වය ද අතුරුදන්විය. ජෙකීල් කථාකළේ පොලිස්භටයකු මෙන් රළු ආකාරයට යි.

"ඒක දැනගන්න ඔබට උවමනා වුණේ මොන හේතුවක් නිසාද?"

"ලන්ඩන් නගරයෙන් පිටත විකිණීමට ඇති, කුඩා ඉඩම කැබැල්ලක් නිසයි, මේ ප්‍රශ්නය මතුවුණේ" හෝම්ස් කීය. "එඩ්වඩ් හයිඩ් ඒක මිලට ගන්න හොයල තියෙනවා. එතැන වෙළඳුන්ට හයිඩ් දීල තියෙනවා ඔබේ නම සහ ලිපිනය. ඔහුගේ වත්කම් ගැන දොස්තර ජෙකීල්ට සහතික වෙන්න පුළුවන්ලු. ඉතින් ඉඩම විකුණන තැනැත්තා මට කිව්වා, හයිඩ්ට ඉඩමට මුදල් යොදවන්න හැකියාවක් තියෙනවාද කියල හොයල බලන්න"

"ඒකටයි ඔබ මේ ආවෙ?" කී වෛද්‍යවරයා අපට පසුපස හරවා ජනේලයෙන් ඉවත බැලීය. "එහෙම දෙයක් හොයල බලන එක, ඉඩම විකුණන තැනැත්තාටම කරන්න පුළුවන් නේ. ඒක වෙනත් කෙනෙකුට පැවරීම හරි පුදුමයි"

"මෙක මහ විශාල මුදලක්, අතින් අත මාරුවෙන කටයුත්තක්" හෝම්ස් කීය. "අපේ අනුග්‍රාහකයා කැමති නෑ, අවදානම් විදියට වැඩ කරන්න. වහලෙ උළුකැට බිඳිලා වහල තෙමෙනවා නම්, ඒකට බාස්කෙනෙකුම යවනවා මිස, ඔබම වහලෙට නගින්නෙ නැහැ නේද මහත්මයා? දොස්තර මහත්මයා. මේ කියන එඩ්වඩ් හයිඩ් ඔබ හඳුනනවාද?"

"ඔව්"

"ඒක මොන විදියේ හැඳුනුම්කමක් ද?"

"අපි දෙන්නා මිත්‍රයෝ"

"කොයි තරම් කාලයක් ඉඳන්ද ඔබ ඔහු අඳුනන්නේ?"

"අවුරුද්දක් විතර........... බාගවෙලාවට ඊටත් වැඩි ඇති"

"කොහොමද ඔබ ඔහුව හඳුනාගත්තේ?"

"අපි දෙදෙනාගේම මිත්‍රයෙක් හඳුන්වාදුන්නා"

"ඒ මිත්‍රයා කවුද කියලා මට කියන්න පුළුවන් ද?"

"බැහැ!"

"හොඳයි කමක් නෑ" හෝම්ස් කීය. "ඔබට හයිඩ්ව අන්තිමට හමුවුණේ කවදද?"



www.sinhalaelibrary.com

"ඔය ප්‍රශ්නවලට මං උත්තර දුන්නු හරිය හොඳටම ඇති" මෙවර දොස්තර ජෙකිල්ගේ කටහඬේ තිබුණේ රෞද්‍ර බවකි. "මහත්තයෝ! ඔහේ නම් පට්ටපල් බොරුකාරයෙක්!" ජෙකිල් කෝපයෙන් ගිගිරුවේය. "මේ ලන්ඩනයෙන් පිටත ඉඩමක් ගන්න, හයිඩ්ට කිසිම උවමනාවක් නෑ. ඔහේලත් එක්ක පිස්සු දොඩවන්න මට කාලයක් නෑ. පූල්.......!" සේවකයා කැඳවමින් ජෙකිල් සීනුව නාද කළේය.

සේවකයා වහා දුවැවිත් දොර විවෘත කළේය.

"මේ මහත්තුරු එළියට එක්ක යන්න. අපට තවත් කතාකරන්න මොකක්වත් නෑ"

"ජෙකිල් දොස්තර මහත්මයා. මට ඔබ ගැන කණගාටුයි" හෝම්ස් කීවේ ආචාරශීලී බවකින් තොරවය. "මිනුයෙකු දුටුවාම ඔහුව හඳුනාගන්න බැරි තැනැත්තා අවාසනාවන්තයෙක්. අපි යමු වොට්සන්"

අපි සේවකයා සමග එතැනින් පිටවී ආවෙමු.

"ඉතින් වොට්සන්" මගේ මිත්‍රයා පැවසුවේ, අශ්වකරත්තයට නැගී අප ආපසු එන අතරේදීය. "තත්ත්වය මේ විදියට වෙනස්වුණු එක ගැන මොනවද හිතෙන්නෙ?"

"තත්ත්වය වෙනස්වුණු බවක් මට නම් වැටහුණේ නෑ" මම කීවෙමි.

"වෙනස්වුණා තේන්නම්. අප කළ ප්‍රයෝගය ජෙකිල්ට අහුවුණා!"

"මට හිතෙන්නේ මෙහෙමයි" මම කීවෙමි. "මීට කලින්නුත් ඔහුට අපි දෙන්නා හමුවුණු වින්තිය, හයිඩ් කියන්න ඇති දොස්තර ජෙකිල්ට"

"ඔව් එහෙම වෙන්නත් පුළුවනි." හෝම්ස් කීය. "ඒ වුණත් තමන්ගේ මිත්‍රයාට, ලන්ඩනයෙන් පිටත ඉඩකඩම් ගන්න උවමනා නැහැ කියලා ජෙකිල් කොහොමද දන්නෙ?"

"ඒකත් හයිඩ් කියල තියෙන්න ඇති."

"හොඳයි අපි එහෙමයි කියල හිතමු." හෝම්ස් කීය. "ඒ කියන්නේ මේ දෙන්නා, අයියලා මල්ලිලා දෙන්නෙකුටත් වඩා හිතවත්. හයිඩ්ගේ ජීවිතයේ හැම විස්තරයක්ම, දොස්තර මහත්මයා දන්නවා. එතකොට අප කරපු එක උපකල්පනයක් බිඳ වැටෙනවා."





"ඒ මොකක්ද?"

"ජෙකිල්ව බයකරලා, හයිඩ් කප්පම් ගන්නවා කියන උපකල්පනය, එතකොට බොරු වෙනවා. ඒ වගේ මිනිහෙක් තමන්ගේ හුගක්ම පෞද්ගලික තොරතුරු ජෙකිල්ට හෙළිකරාවිද?"

"ඒකත් ඇත්ත" මම එකඟවූයෙමි.

"මං කිවූ බොරුවට ජෙකිල් රැවටුණේ නෑ. ඒත් එක්වරම ඒක හෙළිනොකර ඔහු ඒකට විකවෙලාවක් ගත්තෙ ඇයි?"

"මට හිතාගන්න අමාරුයි"

"අපි කොයිතරමක් කාරණා දන්නවද කියලා, ජෙකිල් දැනගිටියෙ නෑ. ඔහුට උවමනාවුණා ඒක හරිහැටි දැනගන්න. ඒ හින්දයි ඔහු මාව කෙළින්ම එළවා නොදමා, ටිකක් වෙලා ගතකළේ. අද උදේ පාන්දර හයිඩ් මෙහි පැමිණියේ ඇයි කියන එකත්, මෙයින් පැහැදිලි වෙනවා. අපි ජෙකිල් ළඟට එන බව හයිඩ් අනුමාන කළා. වොට්සන් මේ පරීක්ෂණය, බොහොම අපූරු හැඩහුරුවක් ගන්නා බවයි මට පෙනෙන්නේ. මගේ හිතේ ලොකු උද්‍යෝගයකුත් ඇතිවෙනවා........ ඔහෝ අප හමුවෙන්න අමුත්තෙකුත් ඇවිත්"

අපි බේකර් වීදියේ නිවහන ඉදිරියේ නැවතුණෙමු. හෝම්ස්ගේ අවධානය යොමු වූයේ, අපේ උඩුමහලේ ජනේලය වෙතය. එහි එළියක් දල්වා තිබිණි. තිරරෙදි වලින් ආවරණය වී තිබුණත්, අපට සෙවණැල්ලක් දකින්නට ලැබිණ. ඒ එකතැනකට වී සිටියෙකුගේ නොව, නොඉවසිල්ලෙන් ඉහළ පහළ ඇවිදින අයෙකුගේ සෙවණැල්ලය.

තරප්පු පෙළ නැග, අපි උඩුමහලට පිවිසියෙමු. "ආයුබෝවන් අටර්සන් මහත්මයා" හෝම්ස් ආයිංසනය කළේ අප විසිත්ත කාමරයට පිවිසීමටත් පෙර ය. "මේ වෙලාවේ ඔබ වෙනුවෙන් අපට කළ හැකි දේ මොකක්ද?"

අප කතා ඉවත්කිරීමට සූදානම් වෙද්දී, එතැනට පැමිණියේ නිතිඥ අටර්සන් ය. ඔහු කෝපාවිෂ්ට වී සිටි බව ඔහු දුටු වහාම, මම තේරුම් ගතිමි. සාමාන්‍යයෙන් සුදුමැලි ඔහුගේ මුහුණ, මෙවේලේ රතුවී තිබිණ. දෙනෙත්, ගින්නෙන් දිළිසුණු ගිනිඅඟුරු මෙන් විය.

"මගේ ඥාති සහෝදරයාට වෙලා තියෙන්නේ ලොකු වැරැද්දක්" අටර්සන් කීය.



www.sinhalaelibrary.com

හෝම්ස් තම දෙබැම ඉහළ එසවූයේ මවිතය පළකරමිනි.

"ඔහු කිව්වා හෝම්ස් මහත්මයා කියන්නේ, රහස් ආරක්ෂා කරමින් කටයුතු කරන, විශ්වාසවන්ත කෙනෙක් කියලා" අටර්සන් කීය. "මේ කාමරයෙදිම ඔබත් ඒ කාරණය මට සනාථ කළා. ඒ වුණාට, මං මෙතැනින් පිටවුණු වහාම, ඔබ ගියේ ජෙකිල් ළඟට. ගිහිං ඔහුට ඔක්කෝම කිව්වා. නමුසෙට ලැජ්ජාව කියල දෙයක් නැද්ද හැබෑට?"

"අටර්සන් මහත්මයා. ඔබ මට අපහාස කරනවා" හෝම්ස් කීය.

"මොකද නෑ කියනවද?" නීතිඥයා ඇසුවේ අභියෝගාත්මක හඬිනි. "මං මේ ජෙකිල්ගේ ගෙදර ඉඳලා එන ගමන්. මෙතට ඔබ පැටලී ඇතිබව ඔහු හොඳින් තේරුම් අරගෙන ඉවරයි. ඔහු මට අවසාන නිවේදනයක් දුන්නා. එක්කො මං ඔබට භාරදුන්නු රාජකාරිය වහාම අවලංගු කරනවා. එහෙමත් නැත්නම්..........? හෝම්ස් මහත්මයා. ඔබෙන් නොවෙයි නම්, දොස්තර ජෙකිල් කොහොමද මේ හැමදෙයක්ම දැනගත්තේ?"

"මාත් කැමතියි අන්න ඒක දැනගන්න" හෝම්ස් කීය.

"ජෙකිල් කොහොමද මේ දේවල් දැනගත්තේ?" අටර්සන් යළිත් විමසුවේය.

"මට ඒක කියන්න අමාරුයි අටර්සන් මහත්මයා" හෝම්ස් කීය. "ඒ මොකද මං පේන කියන්නෙකු නොවන නිසා. ඒ වුණත් මට ඒක අනුමාන කරන්න පුළුවනි. ඒ මොකද මට එළවට හයිඩ් හමුවුණා. මං කවුද කියල මං ඔහුට හඳුන්වා දුන්නා. එහෙම හමුවෙලා තවම පැය 4 ක් ගතවුණේ නෑ"

"මේ කටයුත්ත ඔබට භාරදුන්නේ අටර්සන් කියල, ඔබ ඔහුට කිව්වාද?"

"ඒක කියන්න මට වෙලාවක් තිබුණේ නෑ" හෝම්ස් කීය. "තිබුණත් මං ඒක කියන්නෙත් නෑ. මට මේ කටයුත්ත භාරදුන්නෙ කවුද කියල හයිඩ් නිශ්චය කරන්න ඇති. අප්‍රසන්න කෙනෙකු වුණත්, ඔහු බුද්ධිමත් තරුණයෙක් බවයි මට පෙනුණේ. මේ අහන්න අටර්සන් මහත්මයා, ඔබ මා ළඟට එද්දිම, ඒක ජෙකිල්ට හෙළිවීමේ අවදානම තිබුණා"

මගේ මිත්‍රයා සිද්ධිය තර්කානුකූලය විග්‍රහ කළ පසු, නීතිඥයාගේ කෝපය නිවීගියේය. ඇවිළෙන ගින්නක් ජලය දමා නිවා දමන ලද කලක මෙන්, මොහොතක නිහඬබවක් පැවතිණ.





"මට සමාවෙන්න හෝම්ස් මහත්මයා. මං ඔබට චෝදනා කිරීම අසාධාරණ බව දැන් මට පෙනෙනවා"

කෝපි පෝච්චියක් රැගත් හඩ්සන් මහත්මිය, උමුමහලට පැමිණියාය. කෝපි කෝප්ප හිස්වෙද්දී එතැන තිබුණේ නිසල බවකි.

"අටර්සන් මහත්මයා. ඔබ ජෙකිල්ගේ නිවසෙන් පිටත්වී ආවෙ කීයටද?" හෝම්ස් විමසුවේය.

"දවල් එකහමාරට"

"අපි එතැනට ළඟාවුණේ දවල් දෙකට." හෝම්ස් කීය. "අප මගහැරෙන්න ඇත්තේ අතරමගදී. ඔබ එතැනින් එද්දී ජෙකිල්ගේ ස්වභාවය කොහොමද?"

"ඔහු සිටියේ මාත් එක්ක හරි තරහෙන්" අටර්සන් කීය. "කැලඹිලයක් ඇතිකළේ නෑ. නමුත් මට කිව්වා, මේ මට දෙන අවසාන දැනුම්දීම කියලා"

"එපමණයිද?"

"මං ජෙකිල්ට හැමදෙයක්ම තේරුම් කරල කිව්වා. මං ඔහුට කිව්වා, මං හෝම්ස් මහත්මයා ළඟට ගියේ, ඔබව - ජෙකිල්ව හයිඩ්ගේ ග්‍රහණයෙන් බේරාගැනීමේ අරමුණෙන් කියල"

"ඉතින්"

"ඔහු මට මෙහෙම කිව්වා: "අටර්සන්. දෙවියන්ගේ නාමයෙන්, මගේ අවුල ලිහාගැනීම මට කරගන්න දෙන්න. හයිඩ් එක්ක මගේ ගනුදෙනුවක් තිබෙන බව ඇත්තයි. ඒත් ඒක පෞද්ගලික එකක්. ඔබ හෝ වෙනත් කෙනෙකු ඒකට ඇඟිලිගහන්න එනවාට මං කැමති නෑ. ඒක මොකක්ද කියල මගෙන් අහන්න එපා. මං ඒක කියන්නෙත් නෑ. මං කියන දේ තේරුම් ගන්න අටර්සන්. මං මොනම ආකාරයකින්වත් ඒ මිනිහට ණය නෑ. මට ඕනෑවුණු වෙලාවක ඒ යකා එළවා දමන්න පුළුවනි"

"ඉතින් ඒකට අටර්සන් මහත්මයා මොකද කිව්වෙ?"

"මිත්‍රයෙකු හැටියට මට ඒකට එකඟවෙන්න සිද්ධවුණා." අටර්සන් කීය. "හෙන්රි ජෙකිල් වටා මොකක්දෝ අබිරහසක් තියෙනවා. ඒක ඇත්තයි. නමුත් ඔහු බොරුකාරයෙක් නෙමෙයි. ඔහු කියනවා හෝ පහසුවෙන්ම හයිඩ්ගෙන් ගැළවෙන්න පුළුවන් කියලා. එහෙනම් අපි, ඒක කරගන්න එයාට ඉඩහරිමු. කවුද දන්නෙ? සමහරවිට මං මේ අනවශ්‍යව කලබල වෙලා වෙන්නත්



www.sinhalaelibrary.com

පුළුවනි. හෝම්ස් මහත්මයා. ඔබ වුණු මහන්සියටත්, ඔබේ වටිනා කාලයටත් මං ගෙවීමක් කළ යුතුයි."

"අටර්සන් මහත්මයා. ඔබේ මුදල් ඔහොම ම තිබුණා වේ. මේ වියදම, මේ මහන්සිය මගේ ගණනේ; මගේ සන්තෝසයෙන්. ඒ වුණත් ඔබ මෙතැනින් පිටවී යන්න කලින් මං කැමතියි ඔබට එක් අවවාදයක් දෙන්න."

පිටත්වී යාමට සූදානමෙන් අසුනෙන් නැඟී සිටි නීතිඥයා, මගේ මිත්‍රයා දෙස බලාසිටියේ පුදුමයට පත් අයුරෙනි.

"ඔබ කියන්නේ ඔබේ මිත්‍රයා සත්‍යවාදියෙක් කියලා. එහෙම නේද?" හෝම්ස් ඇසීය. "මං ඒ කතාව විශ්වාස කරනවා. නමුත් ඔහු කොයිතරම් දුරට මේකෙ පටලැවිලාද කියන එක, දොස්තර ජෙකිල්වත් දන්නෙ නෑ. ඔහු සම්බන්ධකම් ඇතිකරගෙන තියෙන්නේ, මහා නින්දිත අපරාධකාරයෙකු සමඟ. ඕක අවසන් වෙන්න කලින්, විනාශ වෙන ජීවිත ගණන, එකකට වැඩිවෙන්නට පුළුවනි.

මං මහජනයා වෙනුවෙන් සේවයට කැපවී ඉන්නා කෙනෙක්. ඔබට උවමනා වෙලාවට රාජකාරී කටයුත්තක්, මට භාරදෙන්නත් පුළුවනි. නැත්නම් ඉවත්කර ගන්නත් පුළුවනි. එඩ්වඩ් හයිඩ් ගැන කරුණු මට හොයාගන්න පුළුවන් වුණේ ස්වල්පයයි. නමුත් ඇතිවී තිබෙන තත්ත්වය තේරුම්ගන්න, ඒ ටික හොඳටම පුළුවනි. මං ඔබට සහතික කරලා කියන්නම්, දොස්තර ජෙකිල්ගේ ඉල්ලීමට අවනත වෙලා, ඔබ කරන්නේ ලොකු මෝඩකමක්. ඔබ ඒ ගැන පසුතැවෙනවා සහතිකයි. එහෙම දවසක් උදාවුණොත්, ඇවිත් මාව හමුවෙන්න අමතක කරන්න එපා."

"ඒ දවස ආවොත්........." අටර්සන් කීවේ හිස නමා ආචාරකරමිනි. "ඇවිත් මහ හමුවෙන්න මං අමතක කරන්නේ නෑ" කියූ අටර්සන් අපේ නිවසෙන් පිටවී ගියේය.

"මං හිතුවේ මං කියූ දේ අහල, අටර්සන් වෙනස් වේවි කියල" හෝම්ස් කීවේ සුසුමක් හෙළමිනි. "නමුත් වැඩක් වුණේ නෑ"

"හෝම්ස් ඔබට හිතෙන්නේ, ජෙකිල් මහා විනාශයක් කරා යනවා කියලද?" මම ඇසීමි.

"මං කලින්ත් කිව්වා නේ වොට්සන්, මං ජේන කියන්නෙක් නොවෙමි කියල. ඒ වුණත් ජෙකිල් බොරුකාරයෙක් බව මට ඔප්පුකරන්න පුළුවනි"





"ඒ කොහොමද?"

"අපි හමුවුණු වහාම - දවල් 2ට ඔහු කිව්වා, ෂර්ලොක් හෝම්ස් කියන නම, එච්චර අහල පුරුදු එකක් නෙමෙයි කියල. නමුත් ඊට පැය භාගයකට කලින් - දවල් එකහමාරට ඔහු අටර්සන්ට තර්ජනය කළාලු, ෂර්ලොක් හෝම්ස් මේකට ගාව ගත්තෙ මොකටද කියලා. නමුත් අපි ඉස්සරහ ජෙකිල් රඟපෑවෙ කොහොමද?"

මකුළුවා මේ ආකාරයේ ඉතාම සංකීර්ණ දැලක් වියන්නේ, ගොදුරක් අල්ලාගන්නයි. ගොදුර එහි පැටළෙන බවට කිසිම සැකයක් නෑ. ඔව් වොට්සන්, ජෙකිල් මන්දිරයේ නිවැසියන් වෙත ළඟාවෙන්නේ විනාශය බව, මට සක්සුදක් සේ පැහැදිලියි. ඒක ළඟාවෙන්නේ අදද, හෙටද නැත්නම් ලබන මාසෙද කියන එක, ඒ තරම් වැදගත් නෑ. ඒ මොකද ඒකෙන් ඔහු ගළවාගැනීමට, අපට පිළිවෙලක් නැති නිසා."

මගේ මිත්‍රයා සයිප්පය දල්වාගෙන මිනිත්තු කිහිපයක්ම නිහඬව සිටියේය. ඔහුගේ දෙනෙත් ගිනිඋදුනේ ඇවිළෙන අඟුරු වෙත යොමුවී තිබිණි. අන්තිමේදී සුසුමක් හෙළා, තම දෙබැම ඉහළ නැංවූ ඔහු, මා වෙත අවධානය යොමු කළේය.

"ඉතින් මගේ හිතවත් මිත්‍රයා" හෝම්ස් කීය. "නිවාඩුවක් ගතකරන්න ඔබ සමග එන බවට, මං ඔබට පොරොන්දුවුණා නේද? කරුණාකරල බ්‍රැඩ්ෂෝගේ දුම්රිය කාලසටහන පරීක්ෂාකරල බලන්න. නොටිංහැම් බලා අප යායුතු දුම්රිය පිටත්වෙන්නෙ කීයටද?............ කරුණාකරල මගේ වයලීනයත් මා අතට දෙන්න වොට්සන්. අර චයිකොව්ස්කිගේ සංගීත ප්‍රසංගයේ තුන්වැනි කොටසේ, එක් වාදන ඛණ්ඩයක් මට කොහොමටත් තේරුම් ගන්න අමාරුයි. ඒක වාදනය කරන්න අද හැන්දෑවේ මට හැකිවුණොත්, මේක වැඩ කටයුතු සාර්ථක වුණු හැන්දෑවක් ලෙස මට සලකන්න පුළුවනි."



www.sinhalaelibrary.com

7

# කැරූ මිනීමැරුම

මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස්ගේ සහකරු ලෙස මා ගෙවූ කාලය, අවුරුදු තිහකට ආසන්න යයි මම සිතමි. එයින් 1884 වර්ෂය මගේ මතකයේ විශේෂයෙන්ම සටහන් වී ඇති වසරක් බව කිව යුතුය. ලෝහිත පරීක්ෂණය නමින් මා ප්‍රසිද්ධියට පත් කළ රහස් පරීක්ෂණය නිසා, ඔහුට සුවිශේෂ කීර්තිනාමයක් ලැබිණ. එය වචනයෙන් විස්තර කිරීමට අපහසුය. එහෙත් ඔහු වඩාත් කැමැතිවූයේ අප්‍රසිද්ධියේ දිවි ගෙවීමට ය. තමා සතු සහජ කුසලතා මහිමයෙන් හෝම්ස්, අභිරහස් රැසක් සාර්ථක ලෙස විසඳා දුන්නේය. ඔහු තම අවධානය යොමු කළේ, අනුග්‍රාහකයන්ගේ තෘප්තිය ගැනයි. ඒ සමගම සමාජයෙන් ඈත්වී නිහඬ ජීවිතයක් ගෙවීමට හෝම්ස් ප්‍රිය කළේය.

කෙසේ වෙතත් හෝම්ස් ලබා තිබූ ප්‍රසිද්ධිය ගැන අප ලැබූ අත්දැකීමක් මෙහි සඳහන් කිරීම සුදුසු යයි, මම විශ්වාස කරමි.

මැංචෙස්ටර් චතුරශ්‍රයේදී පුද්ගලයෙකු පැහැරගෙන යාමක් ගැන, හෝම්ස් වෙත පැමිණිල්ලක් ලැබිණ. මේ ගැන නිවාස පිරිසිදු කරන්නියකගෙන් ප්‍රශ්න කිරීමට ගොස්, අපි ආපසු බේකර් වීදියේ නිවහන වෙත පැමිණෙමින් සිටියෙමු. අධික ලෙස විඩාපත් වී සිටි බැවින් අවන්හලකට ගොඩවැදී, වයින් වීදුරුවක් පානය කොට යාම යෝග්‍ය යයි මගේ මිත්‍රයා යෝජනා කළේය.

1883 අගභාගයේදී හොරකල්ලියක්, කැපෙල් ඇන්ඩ් කවුන්ට්ස් බැංකුවේ නගරශාඛාව කොල්ලකෑමට දැරූ උත්සාහය, ඔබට මතක ඇතැයි සිතමි. මේ, එම හොරකල්ලිය පොලිසියට අල්ලා දීමට හෝම්ස් සමත්වූයෙයි. එම හොරකල්ලියේ ප්‍රධානියා වූයේ කලක් ඉන්දියාවේ සේවය කළ, බ්‍රිතාන්‍ය යුද්ධ හමුදාවේ හිටපු කර්නල් වරයෙකු වූ මයිකල් එඩිංටන් ය. මෙම අභිරහස හෙළිකිරීම ගැන සියලුම පුවත්පත්වල මුල්පිටුවේ වාර්තා පළවිය.

අඳුරු මුල්ලක මේසයකට වාඩිවී, වයින් වීදුරුවක් තොලගාමින් අප ගතකරන්නට ඇත්තේ, මිනිත්තු පහකට නොවැඩි කාලයකි.





මත්පැන් පානය කරමින් සිටි පිරිසක්, වෙනත් මේසයක ගීත ගායනයක යෙදී සිටියහ. පුවත්පතක පළවූ කවිපංතියක්, කොටස් යයි සිතිය හැකි පදමාලා, ඔවුනු ගායනා කළහ. ඔවුනට නුදුරින් අසුනක වාඩිවී සිටියේ කවුරුන් දැයි, මේ පිරිසට කිසිදු අවබෝධයක් නොතිබූ බැව් මම තේරුම් ගතිමි. පුරාමිනින් හොඳින් පදම් වී සිටි ඔවුහු, මේසවලට තඩිබාමින්, දිගින් දිගටම ගීත ගායනා කළහ. එයින් මගේ සිහියේ රැඳුණු ගීයක කොටසක්, මෙහි සඳහන් කිරීමට මම කැමැත්තෙමි.

"හොර තක්කඩි මිනීමරුවෝ
වැජඹුණු ලන්ඩන් නගරේ
බැංකු හොරුන් අල්ලන්නට
පොලිසියෙන් මොකද කරේ?
ස්කොට්ලන්ඩ්යාඩ් එකේ
ග්‍රෙග්සන්ලගෙ හඬ පැතිරේ
ඒත් අනේ හොරමැරකම්
චෝරයන්ගෙ මල්ල කරේ

අපරාධයෙ බැඳුණු මෙරට
ගොඩගන්නද අද කිසිදා
නීතිය වල්වැදී තිබෙ
හොරු අල්ලන්නද කවදා
ලෙස්ට්‍රේඩ්ල, හොප්කින්ස්ල
නිව්කමෙන්ල මග පරදා
ජය ලබාවී ලොව පරසිඳු
ෂර්ලොක් හෝ — ම්ස් මැතිඳා"

තමාගේ නම ඇතුළත් ගීත ගායනාවේදී, මගේ මිත්‍රයාගේ මුහුණ ලැජ්ජාවෙන් රතු විය. වයින් වීදුරුව එක හුස්මට ගිල දැමූ හෝම්ස්, අවන්හලේ දොර වෙත ගියේ අඩියට දෙකටය. ඔහු අල්ලාගැනීම සඳහා මම වේගයෙන් දිවගියෙමි.

මුලදී සිනාව අමාරුවෙන් නවතාගෙන සිටියත්, පාරේ පියවර කිහිපයක් යද්දී, මට එය තවත් යටපත් කර ගැනීමට නොහැකි විය. තවමත් ලැජ්ජාවෙන් රතුවී සිටි මගේ මිත්‍රයාගේ මුහුණ දුටු මම, මහ හඬින් සිනාසුණෙමි.



www.sinhalaelibrary.com

"කොහේ හරි පුවත්පතක තිබිලා. ඔය මිනිස්සු ඔය ගීතය අහුලාගන්න ඇති." හෝම්ස් කීය. "ජනප්‍රිය වීමත් එක්තරා විදියක හිරිහැරයක් වොට්සන්. ඕක ස්කොට්ලන්ඩ්යාඩ් එකේ අයගේ කනට වැටුණොත් මට බේරුමක් නැතිවේවි"

"මේ වගේ දේට කලබල නොවී ඉවසීමට, ඔබට පුරුදුවෙන්න සිදුවෙනවා" මම කීවෙමි. "හැමදාමත් අනික් අයට නොපෙනී හැංගිලා ඉන්නෙ කොහොම ද?"

මා මෙසේ කියද්දී අප ඉදිරියට ආවේ, පුවත්පත් වෙළඳාමේ යෙදුණු කොලුවෙකි.

"වෙස්ට්මින්ස්ටර්හි මිනීමැරුමක්! ඩැන්වර්ස් කැරූ ඝාතනය! ඇසින් දුටුවෙකුගේ සාක්ෂි! මිනීමරුවා හඳුනාගැනේ!"

කෑගසමින් ගිය කොලුවා, හෝම්ස් දුන් කාසිය සාක්කුවට දමාගෙන, පුවත්පත මගේ මිත්‍රයා අතට පත් කළේය.

"දෙයියෝ සාක්කි! මේ අහන්න වොට්සන්!" කී මගේ මිත්‍රයා පුවත්පත කියවීමට පටන්ගත්තේය.

"පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කෲර ලෙස ඝාතනය වේ.

සුපුකට ධනපතියෙකු මෙන්ම රජපවුලේ මිතුරෙකු ලෙස ප්‍රසිද්ධ, සර් ඩැන්වර්ස් කැරූ කෲර ලෙස ඝාතනය වූ පුවත අසා, මුළු ලන්ඩන් නගරයේම ජනතාව මහත්සේ කම්පාවට පත්ව සිටිති. මෙම ඛේදජනක සිදුවීම වූයේ, ඊයේ රාත්‍රියේ වෙස්ට්මින්ස්ටර් ප්‍රදේශයේ, තේම්ස් ගඟේ වම් ඉවුරේ බව වාර්තා වේ.

මිල් බැන්ක්හි ජෙෆ්රි මැක් ෆැඩින් මහතාගේ ගෘහසේවිකාවක වූ, එව්ලින් විල්බ්‍රෝ මෙනෙවිය විසින්, මේ සිදුවීම පොලීසියට දැනුම් දී ඇත. ඇය මේ සිද්ධිය සියැසින් දැක ඇත්තේ, තම නිදන කාමරයේ ජනේලය තුළින් ගඟ දෙස බලාසිටියදීය. එම ස්ථානය වෙත ගිය පොලිස් නිලධරයනට දැකගන්නට ලැබුණේ, සර් ඩැන්වර්ස් කැරූගේ මළසිරුරයි. මෙම මිනීමැරුම සිදුකිරීමට අපරාධකරුවා යොදාගත්තේ සැරයටියක් බැව්, විල්බ්‍රෝ මෙනෙවිය පවසා ඇත. තම සැරයටියේ බිඳී ගිය කොටසක්, එම ස්ථානයේම තිබී සොයාගැනීමට පොලිසිය සමත් විය.

තමන් දුටු සිදුවීම විස්තර කරන ලෙස, පොලිස් නිලධරයන් විසින්, සාක්ෂිකාරියගෙන් ඉල්ලා සිටින ලදි. හොඳින් සඳ එළිය වැටී තිබුණු මෙම රාත්‍රියේ, තම කාමරයේ ජනේලය තුළින්, තේම්ස්





ගංගාව හා ඉවුර දෙස බලාසිටි බැව් ඕ පැවැසුවාය. තමා නින්දට යාමට පෙර, එනම් රාත්‍රි එකොළහට පමණ සර් ඩැන්වර්ස් පාරේ ඇවිද එන අයුරු ඇය දැක ඇත. ඔහුගේ ඉදිරියට පැමිණ ඇත්තේ මිටි සිරුරක් තිබූ මිනිසෙකි. ඔහු තම ස්වාමියා හා යම් ගනුදෙනුවකට පැමිණි හයිඩ් නම් මහතෙකු බව ඇය හඳුනාගත්තාය. සර් ඩැන්වර්ස් තමා ඉදිරියට පැමිණි එම පුද්ගලයාගෙන්, යායුතු මාර්ගය වැනි යමක් විමසා ඇත. එයින් කෝපයට පත් අපරාධකරුවා කර ඇත්තේ, සර් ඩැන්වර්ස්ට, සැරයටියේ නැමුණු කෙළවරෙන් පහරපිට පහර එල්ල කිරීමයි. වයස්ගත මහතා එවිට බිම ඇදවැටී ඇත. ඔහුට නැගිටීමට නොහැකිවනසේ ඒ මහතාගේ සිරුර පාගාගත් මැරවරයා, තම සැරයටියෙන් නොනවත්වාම පහර එල්ලකර ඇත. මෙම දර්ශනයෙන් තමා ක්ලාන්ත වූ බව සේවිකාව පැවසුවාය. රාත්‍රි දෙකට පමණ යළි සිහි ලැබූ ඇයට දකින්නට ලැබුණේ, වයසක මිනිසා තවමත් බිම වැටුණු අයුරෙන්ම නොසෙල් වී සිටි ආකාරයයි. අපරාධකරුවා පැනගොස් සිටි බව ද ඇය දුටුවාය. මේ අනුව වහාම පොලිසිය කැඳවීමට විල්බ්‍රෝ මෙනෙවිය පියවර ගත්තාය. අපරාධකරුවා ලෙස සැලකෙන හයිඩ්, ප්‍රමාණයෙන් විශාල හිසක් හා කෙටවූ සිරුරක් ඇති, කුරුමිට්ටෙකු බව පැවසේ."

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ!" මට කෑගැසිණ. "හෝම්ස් මේ අපට හම්බවුණු හයිඩ්මද?"

"හරියට හරි. ඔහුමයි" හෝම්ස් කීය. "මිනීමරුවාගේ පෙනුම ගැන දී තිබෙන විස්තරය, අප දන්නා එඩ්වඩ් හයිඩ්ට අකුරටම ගැළපෙනවා. ළඟදි මෙහෙම දෙයක් සිදුවෙන බව මම දැනගිටියා වොට්සන්. ඔබට මතකද මං එදා අටර්සන්ට කියූ කාරණාව. මේ පරීක්ෂණයේ යෙදෙන එකෙන් මාව ඉවත් කළොත්, මිනිස් ජීවිත එකකට වඩා විනාශවේවි කියල මං කිව්වා නේද? මට පුදුම මේකට මෙතරම් කාලයක් ගතවුණු එක ගැන. මොහොතකට මෙහෙම ඉන්න වොට්සන්. මං ඉක්මනට එන්නම්"

මේ වනවිට අපි බේකර් වීදියේ අපේ නිවහන වෙත පැමිණ සිටියෙමු. පුවත්පත මා අතටදුන් හෝම්ස් නිවස වෙත ගොස් වහා ආපසු පැමිණියේය.



www.sinhalaelibrary.com

"මෙක ඔබෙ සාක්කුවට දමාගන්න" කියා හෝම්ස් මා අතට දුන්නේ මගේ රිවෝල්වරයයි. "මගේ ආයුධයත් මං අරගෙන ආවා"

"කොහේටද අපි මේ යන්නේ?" මම විමසුවෙමි.

"අපරාධකරුවෙකු ඔහුගේ ගුහාවෙදිම කොටුකරගන්න" කී හෝම්ස් කුලීරියක් නවත්වාගත්තේය. "ඉක්මන් කරන්න. සොහෝ චතුරශ්‍රයට" ඔහු රියැදුරාට උපදෙස් දුන්නේය. මා රියට නැගුණ පමණි. එය වේගයෙන් ගමන් ඇරඹුවේය.

"පොලීසිය මේ විස්තරය දීල තියෙන්නේ වරෙන් ගොඩින්" හෝම්ස් කීය. "මෙකෙ සඳහන් ඒවට වඩා කාරණා ඔවුන් දන්නවා"

"ඔබ කොහොමද එහෙම කියන්නේ?"

"මේ පරීක්ෂණය භාරදීල තියෙන්නෙ ස්කොට්ලන්ඩ්යාඩ් එකේ නිව්කමෙන් නම් පරීක්ෂකවරයාට. ඔවුන්ගේ සිරිතක් තියෙනවා; අපරාධය ගැන කාරණා හුගක් හොයාගෙන නම්, ඔවුන් වැඩිපුර දොඩවන්න යන්නෙ නෑ. වැඩි තොරතුරු නොදන්න වෙලාවට තමයි බොරුවට කයිවාරු ගහන්නේ. අපට කලිනුත් කවුරු හරි ගිහින් හයිඩ් හමුවෙලා තිබුණොත්, මං ඒ ගැන පුදුමවෙන්නෙ නෑ"

හෝම්ස් කියූ දෙය ඇත්තක් බව මට ඉක්මනින්ම දැනගන්නට ලැබිණ. හයිඩ් පදිංචිය සඳහා කුලියට ගෙන තිබූ නිවසේ දොරටුව අසල, පොලිස්භටයකු සීරුවෙන් සිටි අයුරු අපි දුටුවෙමු.

"අපට ටිකකට ඇතුළට යන්න උවමනායි" මගේ මිතුරා කීය.

"යන්න දෙන්න බෑ"

"ඇයි?"

"පෙනෙන්නෙ නැද්ද? මම පොලීසියෙන්. මෙතැනින් එහාට අඩියක්වත් තියන්න එපා!"

හෝම්ස් හා පොලිස්භටයා අතර වාග් සංග්‍රාමය මිනිත්තු කිහිපයක්ම තිබිණ. එය නැවතුණේ ලොකු කබායක් හැඳසිටි හැඩිදැඩි ස්කොට්ලන්ත ජාතිකයෙකු, නිවසෙන් එළියට ඒමත් සමගය. හමුදා භටයෙකුගේ කෙටි උඩුරැවුලක් තිබූ ඔහු, අප දෙදෙනා වෙත හෙළුවේ තියුණු බැල්මකි.

"ට්‍රම්බල්, මොකක්ද ප්‍රශ්නේ? කවුද මේ මිනිස්සු?" ඔහු විමසුවේ පොලිස්භටයාගෙනි.

"මම ෂර්ලොක් හෝම්ස්. මේ මගේ සහකාරයා දොස්තර වොට්සන්. අපි ආවේ..........." මගේ මිතුරා කීමට පටන් ගන්නා පමණි. ඔහුගේ කථාවට බාධා කෙරිණ.





"ෂර්ලොක් හෝම්ස්?" හැඩි දැඩි පොලිස් නිලධරයා එය ප්‍රතිරාවය කළේ උපහාසාත්මක අන්දමිනි. "මං දන්නවා ඔහේල ආවෙ මොකටද කියල. ඔබට ලැබී තිබෙන කීර්තිනාමය ගැනත් මං අහල තියෙනවා. පත්තර කාරයො තමයි ඔහේව පුම්බන්නෙ. උන් ඔහේව පුම්බමින්, ස්කොට්ලන්ඩ්යාඩ් එකට පහරගහනවා. දැන් දැන් නැබැරුම් වලත් ඔහේගේ ගුණ ගායනා කරමින්, සාප්ප් දාන්න පටන් අරගෙන කියල මට ආරංචියි."

"ඒවා මං ලියල දුන්නු ඒවා නොමෙයි" හෝම්ස් කීය. "කොහොම වුණත් මං විශ්වාස කරනවා, මං මේ කථාකරන්නේ අපරාධ පරීක්ෂක නිව්කමෙන් සමග කියා..........."

"ඔව්. මම නිව්කමෙන් තමයි. ඒත් ඔහේ කොහොමද ඒක දැනගත්තේ? ඊළඟට මං මෙහේ ඉන්න බව ඔහේට දැනගන්න ලැබුණේ කොහොමද? මං මෙතැනට එන බව ස්කොට්ලන්ඩ්යාඩ් එකටවත් දැන්නුවේ නෑ"

ඔහු එසේ කථාකරමින් සිටින අතර, නිවසේ දොර යළිත් විවෘත විය. මෙවර එළියට පාතැගුවේ, ජී. ජේ. අටර්සන් නම් නීතිඥයා ය. අප දුටු විගස ඔහුගේ දෙනෙත් විශාල විය.

"ආයුබෝවන් අටර්සන් මහත්මයා" හෝම්ස් ආශිංසනය කළේය. "ඔබ මෙහි පැමිණීම ගැන, මම නම් පුදුමවෙන්නෙ නෑ. අප මෙතැන දකින්න ලැබීම ගැන නම්, ඔබ පුදුමයට පත්වෙන්න ඇති. නිව්කමෙන් මහත්මයා ඔබ ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දැන් ඔබට ලැබෙන්න ඇති. මේ අටර්සන් මහත්මයා යම්කිසි කාරණයක් ගැන, කලින් දවසක මගෙන් උපදෙස් ලබාගත්තා. මේ මහත්මයාට එඩ්වඩ් හයිඩ් මීට කලින් හමුවී ඇති බව මට දැනගන්න ලැබුණා. ඊයෙ රෑ වෙස්ට්මින්ස්ටර්හි ඛේදජනක සිදුවීම ගැන, අටර්සන් මහත්මයා ඔබ හමුවෙන්න එන්න ඇති?"

"මම පොලිස් පරීක්ෂකවරයා හමුවෙන්න ආවෙ නැහැ" අටර්සන් පැවසුවේ හෝම්ස් කියූ දෙය නිවැරදි කරමිනි. "සර් ඩැන්වර්ස් කැරූ මගේ අනුග්‍රාහකයෙක්. ඔහු මා නමට ලියූ ලිපියක්, ඔහුගේ කබා සාක්කුවේ තිබී හමුවෙලා. අද මුළු දවසම මං ගෙදර හිටියෙ නෑ. මං ගෙදර ආවෙ මීට පැය බාගෙකට කලින්. එතකොට මේ නිව්කමෙන් මහත්මයා, මාව හමුවෙන්න මගේ ගෙදරට ඇවිත්.

ඒ ඇති භයානක සිදුවීම ඔහු මට විස්තර කළා. එතකොට මං ඔහුට කිව්වා, මට වරක් හෝ දෙකක් අහම්බෙන් එඩ්වඩ් හයිඩ් හමුවී



www.sinhalaelibrary.com

ඇති බව. ඉතින් මට ලැබී තිබුණු හයිඩ්ගේ ලිපිනයට, මං නිව්කමෙන් මහත්මයාව කැඳවාගෙන ආවා." අටර්සන් මහතාගේ දෙනෙතේ තිබුණේ, ආයාචනාත්මක බැල්මක් යයි මට සිතිණ. හෙන්රි ජෙකිල් සහ එඩ්වඩ් හයිඩ් අතර ඇති සබඳතාවය ගැන පොලිසියට හෙළි නොකරන මෙන්, අටර්සන් අයැද සිටිනවා විය යුතුය.

"එතකොට ඔබට දකින්නට ලැබුණේ කුරුල්ලා කූඩුවෙන් පලාගිහින් ඇති බව. එහෙම නේද?" හෝම්ස් විමසුවේය.

"ඒකෙන් ඔහේට ප්‍රශ්නයක් නැහැනේ?" පොලිස් නිලධරයා හෝම්ස් වෙත කඩාපැන්නේය.

"මොකද නැත්තෙ?" හෝම්ස් කීය. "සාධාරණත්වය, යුක්තිය ඉටුවෙනවා දැකීම, කාගේත් වගකීමක්. මේ හයිඩ් කියන පුද්ගලයා මටත් හමුවෙලා තියෙනවා. ඔහු අංක එකේ කෛරාටිකයෙක්. ඒ වගේම අනුකම්පා විරහිත කෲර පුද්ගලයෙක්. ඒ ගතිගුණ දෙක එකට එක්වුණාම, ඒක බොහොම භයානක සංයෝගයක් වෙනවා. ඔහු හඳුනාගත් බව දැනගත් වහාම, ඔහු තමන්ගේ ලියකියවිලි පුළුස්සා දමල, බඩුබාහිරාදියත් අරගෙන, පැන ගිහින් ඇති"

"හෝම්ස් කියූ දේ ඇසූ නිව්කමෙන් තිගැස්සුණේය. හෝම්ස් නිවැරදිව උපකල්පනය කළ දේ සැඟවීමට, තමා පමාවුණා වැඩි බැව් නිව්කමෙන්ට වැටහෙන්නට ඇත.

"ඒව ඔක්කොම පොලිසියට අයිති වැඩ කටයුතු." නිව්කමෙන් කීය. "කරුණාකරල මෙතැනින් පිටවෙලා යන්න. එහෙම නොගියොත් මේ ට්‍රම්බල් ඔහේලගේ බෙල්ලෙන් අල්ලා එළියට දමාවි. තෝරගන්නෙ එයින් කොයි මාර්ගයද?"

"ඔබ කියන්නෙ මේ පරීක්ෂණයට මගේ උදව් අවශ්‍ය නෑ කියලද?"

"හෝම්ස් මහත්තයා, ඔහේගේ උදව් බලාපොරොත්තුවෙන, පොලිස් පරීක්ෂකවරුන්ට ඇති. ඒත් මම එයින් කෙනෙක් නොවෙයි. මේ මිනීමැරුම ගැන හැම දෙයක්ම මට පැහැදිලියි. මගේ ඇඟට ඇඟිලිගහලා පැනලා යන්න, කාටවත් බෑ. සතිදෙකක් යන්න කලින්, මං හයිඩ්ව අත්අඩංගුවට ගන්නවා. ඒ මගේ දක්ෂතා මගින්. කාගෙවත් උදව් මට අවශ්‍ය නෑ. සුභ දවසක් මහත්වරුනි. ට්‍රම්බල්. දැන් ඉතින් එනවා, මේ ගේ ඇතුළට. අපි මේ ගේ සෝදිසිකිරීම අවසන් කළේ නැහැනෙ"





"පොලිස් පරීක්ෂක මහත්මයා" අටර්සන් කීය. "මගෙන් තවත් මොනවා හරි දැනගන්න තියෙනවාද? නැත්නම් මං ගියාට කමක් නැද්ද? හෝම්ස් මහත්මයා එක්ක මට පුළුවනි ඔහුගේ කුලිරියේ යන්න."

"ගියාට කමක් නෑ"

"අටර්සන් මහත්මයා" හෝම්ස් කීවේ අප ලොකු කුලිරියක නැගී, නීතිඥයාගේ නිවස දෙසට යන අතරේය. "ඔබ පොලිසියට හයිඩ් ගැන දන්නා හැම දෙයක්ම කීවේ නැහැනෙ. මටත් ඒකට හවුල් වෙන්න සිද්ධුණා. දැන් ඉතින් කියන්න, ඔබට අලුතෙන් දැනගන්න ලැබුණු තොරතුරු. මං විශ්වාස කරනවා ඔබට වැදගත් යමක් දැනගන්න ලැබිලා ඇති කියල"

"මං ඒ විදියට කටයුතු කළේ ඇයි කියල ඔබට වැටහේවි හෝම්ස් මහත්මයා" අටර්සන් කීය.

අවිවාහකයකු වූ ඔහු, නීතිඥ රාජකාරියේ යෙදීම සඳහා, තම කාර්යාලය පවත්වාගෙන ගියේ තම නිවසේ ම ය. ඔහු අප දෙදෙනා නිවසේ උඩුමහලට කැඳවාගෙන ගියේය.

නීතිපොත් රාක්කවලින් වටවූ ඔහුගේ කාමරයේ, ඔපදැමූ විශාල මේසයක් සහ සුවපහසු අසුන් කිහිපයක් විය. ඊට අමතරව අඳුරු මුල්ලක තිබූ යකඩ සේප්පුවක් ද මම දුටුවෙමි. මේසය මත තිබූ පහන දැල්වූ ඔහු, ඔරලෝසු දම්වැලේ වූ යතුරගෙන, යකඩ සේප්පුව විවෘත කළේය. ඒ තුළින් ඔහු එළියට ගත්තේ, නැමූ කඩදාසි කිහිපයකි.

"අපරාධය ගැන මං දැනගත්තේ නිව්කමෙන් ගෙන් ම යි කියල මං ඔහුට කිව්වා." අටර්සන් කීය. "නමුත් ඒක බොරුවක්. අද උදේ සමාජ ශාලාව වෙත යද්දී මේ අපරාධය ගැන මිනිස්සු කතාබහවෙනවා, මට අහන්න ලැබුණා.

සර් ඩැන්වර්ස් මරාදැමූ තැනට, පොලිසිය ඇවිත් පරීක්ෂණ පවත්වලා තියෙනවා. ඒ වෙලාවෙ එතැනට ගිය මිනිහෙක් තමා, අනෙක් මිනිස්සුන්ට කරුණු කිව්වෙ. පොලිසිය ඒ මිනිහා ගෙනුත් ප්‍රශ්න කරලා තිබුණා. මං වහාම ගියා ජෙකිල් හමුවෙන්න. මේ බිහිසුණු මිනීමැරුම ගැන මට දැනගන්න ලැබුණු විස්තර මං ජෙකිල්ට කිව්වා. එතකොට ඔහු මට මෙන්න මේ ලියුම දුන්නා."

හෝම්ස් එය දිගහරිද්දී, ඔහුගේ උරහිසට ඉහළින් මම ලිපිය වෙත නෙත් යොමුකළෙමි. එය ඉතා නොසැලකිල්ලෙන්, හදිසියේ ලියූ



www.sinhalaelibrary.com

ලිපියක් බැව් මම දුටුවෙමි. කඩදාසියේ තැන් තැන් වල, තීන්ත බිඳු ඉහිරී විසිරී තිබූ සැටියෙන්, ඒ බව තේරුම් ගැනීමට මට අපහසු නොවීය.

"මගේ හිතවත් දොස්තර ජේකිල් වෙතටයි,

දිගු කලක් තිස්සේ ඔබ මා වෙත දැක්වූ ත්‍යාගශීලී ක්‍රියා දහසකුත් එකකි. එහෙත් ඒ වෙනුවෙන් සතුටුදායක ලෙස ප්‍රතිඋපකාර කිරීමක් මා අතින් ඉටුනොවිණි. මගේ ආරක්ෂාව වෙනුවෙන් ඔබ තවදුරටත් වෙහෙස විය යුතු නැත. විශ්වාසදායක ලෙස පැන යා හැකි මගක් මට තිබේ.

මෙයට ඔබේ යටහත්
එඩ්වඩ් හයිඩ්."

"කවදා කොයිවෙලාවෙද ජේකිල්ට මේක ලැබිල තියෙන්නෙ?" හෝම්ස් විමසීය.

"පණිවුඩකරුවෙකු අතේ. අද උදේ එවලා තිබුණලු"

"ලියුම් කවරයක දමලද?"

"මං ඒ ගැන ජේකිල්ගෙන් ඇහුවා. ඒ ගැන වැඩිදුර කල්පනා නොකර ඔහු ලියුම් කවරය ගිනිඋදුනට විසිකර පුළුස්සා දැම්මලු"

ලිපිය ආලෝකය වෙත ඇල්ලූ හෝම්ස් නිහඬව, එය පරීක්ෂාවට ලක් කළේය.

"ෆුල්ස්කැප් කඩදාසියක් තමා" ඔහු කීය. "නමුත් ඉතාම බාලවර්ගයේ නෙමෙයි. මේකෙ ඉහළ කොටස, මුවහත නොවුණු කතුරකින් කපාදමා තියෙනවා. ඒ නිසයි කැපූ දාරයේ තැනින් තැන රැළි වැටිලා තියෙන්නේ. සමහරවිට ඒ කොටසේ මුද්‍රිත ලිපිශීර්ෂයක් තිබුණාද දන්නෙත් නෑ. මේ අත්අකුරු වලින් යම් යම් දේවල් තේරුම් ගන්න පුළුවනි. මෙය ලියූ පුද්ගලයා, අධිෂ්ඨානාත්මකව කටයුතු කරන කෙනෙක් බව කිවහැකියි. ඒ වගේම, ක්‍රමානුකූල අධ්‍යාපනයක් මෙන්ම, සමාජචාරිත්‍ර උගත් අයෙක්. කොහොම වුණත් ලිපිය ලියද්දී, එම ලක්ෂණ සඟවන්න උත්සාහ කරල තියෙනවා."

"එහෙම උත්සාහ කරල තියෙන්නෙ ඇයි?" අටර්සන් විමසුවේය.

"අටර්සන් මහත්මයා" හෝම්ස් කීය. "මේ පරීක්ෂණයේදී, තවමත් නොපැහැදිලි, තේරුම් කරන්න අපහසු ගැටලු ගණනාවක් මගේ හිතේ මතුවෙලා තියෙනවා. දැන් ඔබ ඇසූ ප්‍රශ්නය තමා, එතැනට එකතුවෙන අලුත්ම ප්‍රශ්නය. මේක මං ගත්තට කමක් නැද්ද?"





හෝම්ස් සූදානම් වූයේ, එය තම සටහන්පොත ඇතුළත තැන්පත් කරගැනීමටයි. එහෙත් අටර්සන් එයට අකමැති වූ බවක් පෙනිණ. ඔහු හෝම්ස් දෙසට අත දිගුකළේ, ලිපිය තමා වෙත ලබා ගැනීමේ අරමුණෙනි.

"මං ගැන වරදවා හිතන්න එපා හෝම්ස් මහත්මයා" නීතිඥයා කීය. "ජේකිල් මේ ලියුම මට.........."

"හා හා කමක් නෑ" හෝම්ස් පැවසුවේ ලිපිය ආපසු දෙමිනි. "ඔබේ විශ්වාසය දිනාගැනීමට, මට තවමත් හැකිවෙලා නැත්නම්.......... ඒකට කමක් නෑ"

"නෑ නෑ හෝම්ස් මහත්මයා. එහෙම දෙයක් නොවෙයි." අටර්සන් යළිත් කීය. "මේක මට දෙද්දී ජේකිල් ලියුම ගැන, මට නිසි පැහැනෙව්වෙ නෑ. මං ඒකට කැමැති දෙයක් කළාට ඔහුගෙන් ප්‍රශ්නයක් නෑ. ඒ වුණත් කැරූ මිනීමැරුම කළ අපරාධකාරයා, හයිඩ් බව ප්‍රසිද්ධ වෙනකොට තමයි, ප්‍රශ්නයක් මතුවෙන්නේ. වැදගත් මහත්මයෙකු වන ජේකිල්ගේ නමට, හයිඩ්ගේ නම ඈඳෙන බවට සුදුසු නෑ. එතකොට අපේ දොස්තර මහත්මයා නිකරුණේ අපකීර්තියට ලක්වෙනවා. මේ ලියුම මගේ අල්මාරියේම තිබීම මගේ හිතට ලොකු සහනයක්" එසේ කියූ නීතිඥයා ලිපිය යකඩ සේප්පුව තුළට දමා යතුරු දැම්මේය.

"ඔබ ජේකිල් දකිද්දී, මේ බිහිසුණු මිනීමැරුම ගැන ඔහුගේ තිබුණෙ මොන වගේ ආකල්පයක්ද?" හෝම්ස් විමසුවේය.

"ජේකිල් හරිම කම්පාවකට පත්වී හිටියා" අටර්සන් කීය. "ඔහුට මුලින්ම මේ ගැන අහන්න ලැබිල තියෙන්නේ, පුවත්පත් විකුණන ළමයි කළ කෑගැහිල්ලෙන්. ලියුම ලැබිලා තියෙන්නේ ඊටත් බොහොම කලින්. ඒක කියෙව්වාම, ඒ වෙලාවෙ ඔහුට එය තේරුම්ගන්න බැරි ගැටලුවක් වෙන්න ඇති. තවත් පුදුමාකාර දෙයක් තියෙනවා හෝම්ස් මහත්මයා"

"ඒ මොකක්ද?"

"ජේකිල් කිව්වෙ, මේ ලියුම ඔහුට පණිවුඩකරුවෙකු අතේ එවා තිබුණා කියල"

"ඉතින්?"

"මං ගෘහසේවක පූල්ගෙන් ඒ ගැන ඇහුවා. මං ඇහුවේ පණිවුඩකරුවා ආවේ කීයටද, ඔහු මොන වගේ පෙනුමක් තිබුණු කෙනෙක්ද කියලා"



www.sinhalaelibrary.com

"ඉතින්?"

"පූල් කියනවා ලියුමක් අරගෙන හෝ නැතුව, කිසිම කෙනෙක් ගෙදරට ආවෙ නැතිලු. ඔබ ඒක තේරුම් කරන්නෙ කොහොමද හෝම්ස් මහත්මයා?"

මගේ මිත්‍රයා නළල රැලිකරගෙන, මඳවේලාවක් කල්පනා කළේය. "........ ඒකත් සුවිශේෂ කාරණයක් නම් තමා"

"පූල් එහෙම කිව්වත්, ලියුමක් ගෙනාපු බවට සාක්ෂිත් තියෙනවා"

හෝම්ස්ගෙන් එයට ප්‍රතිචාරයක් නොලැබිණි. "අපි මොහොතකට දොස්තර ජෙකිල්ව අමතක කරමු." හෝම්ස් කීය. "අර පොලිස් පරීක්ෂක නිව්කමෙන්ට හයිඩ්ගේ කාමරේ තිබිල මොනවද හම්බවුණේ?"

"අපරාධකාරයා හයිඩ් බව තහවුරු කරන වැදගත්ම සාක්ෂිය හම්බවුණා." නීතිඥයා කීය. "මිනීමැරීමට යොදාගත් සැරයටියේ අනික් භාගය හම්බවුණා. ඒක දුටුවාම මගේ හිතේ දැඩි වේදනාවක් ඇතිවුණා හෝම්ස් මහත්මයා. දොස්තර හෙන්රි ජෙකිල්ගේ 42 වැනි උපන්දිනය වෙනුවෙන්, ඔහුට ඒ සැරයටිය තෑගිදුන්නේ මම. මේ භයානක මිනීමැරුමට හයිඩ් යොදාගෙන තියෙන්නේ ඒ සැරයටියම යි.

ඒ ඇරෙන්න පොලිස් නිලධරයාට වැදගත් යමක් හමුවුණා කියල, මං හිතන්නෙ නෑ. මම අනුමාන කළා හරි. හයිඩ් ඔහුගේ බඩුබාහිරාදිය අහුරාගෙන, කඩිමුඩියේ පිටවෙලා ගිහින්. නිව්කමෙන් පුදුමයට පත්වුණු තවත් දෙයක් හමුවුණා."

"ඒ මොකක්ද?"

"හයිඩ් ඔහුගේ චෙක්පොත පුළුස්සා දමලා තිබුණා"

"ඔහුගේ චෙක්පොත?"

"ඔව්. ගිනිලැවුනේ අඩකොටේ, දැවී අළු වූ චෙක්පොත, අපි පැහැදිලිවම දුටුවා. රැජිනියගේ වැඩිකොටසක් ඔහු ගනකරන්න ඇත්තේ ඔහුගේ අනික් ක්‍රියකියවිලි පුලුස්සා දමමින්. මට නම් හිතෙන්නේ ඔහුට හොඳට ම පිස්සු කියලයි. පැනයන්න උවමනා වෙලාවේ, තමන්ට බැංකුවෙන් මුදල් ගන්න තියෙන චෙක්පොත පුලුස්සාදමන මිනිහා පිස්සෙක් නොවෙයිද?"

"ඔව්. ඒක හැබෑව." හෝම්ස් එකඟවිය. "මේ අබිරහසේ පරීක්ෂණයට දවසින් දවස කරුණු එකතුවෙනවා. මෙතක විසඳීම





ඔබ මට භාරදෙනවා නම්.......... එහෙම නම් මට මේ නො විසිඳුණු තැනකින් පොටක් අල්ලාගන්න බැරිවෙන්නේ නෑ. මං ඒ ගැන නො ඉවසිල්ලෙන් ඉන්නේ"

නීතිඥ අටර්සන් හිස දෙපසට සෙලවූයේ තීරණාත්මක විලසිනි. "ඒක මට කරන්න බැරි දෙයක් හෝම්ස් මහත්මයා. හෙන්රි ජෙකිල් මේ මිනීමැරුමට කොයි ආකාරයකින් හරි සම්බන්ධ කෙනෙක් නෙමෙයි නේ. ඉතින් එයින් ලැබෙන ප්‍රතිඵල වලින් ඔබටවත් මටවත් වැඩක් නෑ. හයිඩ් අල්ලාගන්න කියල. මියගිය සර් ඩැන්වර්ස්ට ආපහු පණ ලැබෙන්නෙත් නැහැනෙ......."

"ඒ කතාව සම්පූර්ණයෙන් ම වැරදියි අටර්සන් මහත්මයා." හෝම්ස් කීය. "අපරාධකාරයෙකුට නිදහසේ යන්න අරිනවා කියන්නේ, මහ භයානක දෙයක්. ඔහු තව අහිංසක මිනිසුන් කීදෙනෙක් මරාදමාවිද කියල කවුද දන්නෙ? අපරාධකාරයා අල්ලාගෙන ඔහුට නිසි දඬුවම දීම, මුළු සමාජයේම වගකීම. අපි හැමෝම ඒකට බැඳී සිටිනවා. ඔබ නීතිඥයෙක් හැටියට ඒක.........."

"හෝම්ස් මහත්මයා" අටර්සන් කීවේ මගේ මිත්‍රයාගේ කථාවට බාධා කරමිනි. "ඔබට කැමැති හැටියකට කටයුතු කරන්න. ඒත් මගෙන් උදව් බලාපොරොත්තු වෙන්න එපා. ශුභ දවසක් මහත්වරුනි." අටර්සන් උස්හඬින් පැවසුවේ, කෝපයෙන් කළුපැහැ ගැන්වුණු මුහුණෙනි.

"හෝම්ස්. ඔබ මේ ගැන සෙවීම අත්හැර දමන්නද බලාපොරොත්තු වෙන්නෙ?" මා ඇසුවේ අප නිවස බලා එන අතරතුරදීය.

"මොනවා කරන්නද? අපට වෙන විකල්පයක් ඉතිරිවෙලා නෑ වොට්සන්. කොහොම වුණත් ජෙකිල් කියන්නෙ මහා බොරුකාරයෙක්. ඔහු මේ අපරාධයට හොඳටම පැටලිලා. අටර්සන් රැවටිලා"

"ඔබ කොහොමද ඒක දන්නෙ?"

"මේ අහන්න වොට්සන්. ජෙකිල් නීතිඥයා එක්ක කිව්වලු, මිනීමැරුම ගැන දැනගත්තෙ, උදෑසන පත්තර විකුණපු ළමයි කළ කෑගැහීමෙන් කියල. ඒක කොහොමටවත් වෙන්න බෑ. ඒ මොකද මේ මිනීමැරුම ගැන උදේ පුවත්පත් මොකකවත් වාර්තා වෙලා තිබුණෙ නෑ. මං ඒක දන්නවා. උදේ කෑමට පෙර හැම පුවත්පතක්ම කියවූ නිසා, මං ඒක දන්නවා. මිනීමැරුම ගැන මහජනයා කිසිම



www.sinhalaelibrary.com

දෙයක් දැන ගන්න කලින්, ජේකිල් ඒ ගැන දැන හිටියා. ඒක මට සහතිකයි. මේ පැටළුණු අවුල්ජාලය ගැන හොඳ අවධානයක් යොමු කරන්න වොට්සන්.

මේක අස්සේ කොහේ හරි දරුණු මිනීමරුවෙක් හැංගිලා ඉන්නවා. පොලිසියෙන් හා අදාල වගකිවයුත්තන් ගෙන් අපට සහයෝගයක් නොලැබුණොත් මොකක්ද වෙන්නෙ? ඒ අපරාධකාරයා මේ නගරයේ නිදහසේ සැරිසරාවි. ඔහු නොම්මර එකේ කෛරාටිකයෙක්. ඔහුව අල්ලාගන්න ස්කොට්ලන්ඩ්යාඩ් එකට නම් හැකියාවක් නෑ. ඒ තරම් කපටියෙක්. ඒ වගේමයි. ඔහු වැඩි දවසක් නිකං ඉන්නෙ නැහැ. එකවරක් ලේ රහ බැලූ එකා තව වරක් එය කරනවා! ඒක මට හොඳටම විශ්වාසයි.

දෙවියන්ගේ නාමයෙන් වත්, අපි මේ අපරාධ පරීක්ෂණය කළ යුතු වෙනවා වොට්සන්. මේ කටයුත්ත අත්හැර දමන්න අපට පුළුවන්කමක් නෑ. මේ මොහොතේ ඉඳල අපි දැඩි අවධානයකින් ඉන්න ඕන. කන්වලට මොන තරම් වේදනාවක් දැනුණත් අනික් අයගේ කතාබහට හොඳින් කන්දෙන්න ඕන. මොන තරම් වෙහෙසක් දැනුණත් පුළුවන් හැම එකක්ම නොකඩවා පරීක්ෂා කළ යුතුයි. අපි කොහොමටවත් මේ සටන පාවා දෙන්නෙ නෑ කියන අධිෂ්ඨානයෙන් කටයුතු කරමු."

"මොනව ගැනද අපි හොයා බලන්නෙ?" මම ඇසීමි.

"ඒක අපි හරිහැටි දන්නෙ නෑ මිත්‍රයා. ඒක හොයාගන්න තුරු අපි දන්නෙ නෑ. ඒ වුණත් හයිඩ් ඉහිරි කරලා යන ඔහුගේ සලකුණ වෙනස් වෙන්නේ නෑ........ ඔහුගේ අත්සන......... ඔහුගේ ලාංඡනය! නීතියේ රැහැන් ටිකක් ලිහිල් වෙනතුරු හයිඩ් බලා ඉන්නවා ඇති. නමුත් මේ හැංගිමුත්තන් සෙල්ලම, ඔහු හිතාගෙන ඉන්න ආකාරයේ එකක් නෙමෙයි. මෙතැන ඔහු සමග සෙල්ලමට එක්කෙනෙකුට වඩා ඉන්නවා. ඔහු ඒ බවත් තවම දන්නෙ නෑ.........!"

තනියම දෙඩවූ හෝම්ස්ගේ මුවෙන් පිටවූයේ වියරු සිනාවකි. ඒ ඇසූ මගේ ඇඟ කිලිපොළා ගියේය.



8

## ආකර්ෂණීය අනුග්‍රාහකයෙක්

"තුන්වැනි පංතියේ සංගීත ප්‍රසංගවලදීත් මං මේකට වඩා හොඳ වයලින් වාදන අහල තියෙනවා" හෝම්ස් තරහෙන් මා සමග කීය. ඒ 1885 වසරේ එක් රාත්‍රියක. අප බේකර් වීදියේ නිවහන වෙත ආපසු පැමිණ, තරප්පු පෙළ නගින අතරතුරදී ය.

මගේ මිත්‍රයාගෙන් මේ ආකාරයේ ප්‍රබල විවේචනයක් අසන්නට ලැබෙන බැව් මම දැනසිටියෙමි. වයලීනයක තත්වලින් නැගෙන මියුරු නාද වලට සවන්දීම තරම් තවත් සතුටක්, ෂර්ලොක් හෝම්ස්ට නොතිබිණ. එදා සවස අප සහභාගි වූ සංගීත ප්‍රසංගයේ දී නම්, ඔහුගේ මුහුණේ තිබුණේ කලකිරුණු පෙනුමකි. කුලිරියේ නැගී ආපසු එද්දී, ඔහු වචනයක් හෝ නොදොඩා මුමුණාගෙන සිටියේය. දක්ෂ වයලීන වාදකයෙකු වූ හෝම්ස්, විශිෂ්ට තත්ත්වයේ ප්‍රසංග වලදී විඳගත්තේ අපරිමිත සතුටකි. එහෙත් ප්‍රසංගය බලාපොරොත්තු නොවූ ආකාරයේ දුර්වල එකක් වූ කල, ඔහු කෝපයට පත්විය. මෙයින් මම අතිශය කණගාටුවට පත්වීමි. ඒ කුමක් නිසාද යත්, ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය තිබුණේ ද සතුටුදායක ස්වභාවයක නොවූ නිසාය. පසුගිය මාස තුනක කාලයක් තිස්සේ, එඩ්වඩ් හයිඩ් නම් මිනීමරුවා සොයමින් අධික වෙහෙසට පත්වූ හෝම්ස්, කායිකව මෙන්ම මානසිකව ද දුර්වල විය. සංගීත සන්ධ්‍යාවකට කැඳවාගෙන යාම මගින්, ඔහුට මානසික සුවතාවයක් ලබාදීමට හැකිවෙතැයි මම විශ්වාස කළෙමි. එහෙත් මගේ බලාපොරොත්තු කඩවිය.

එඩ්වඩ් හයිඩ් පිළිබඳව ද කිසිදු ආරංචියක් නොලැබිණ. ඔහු පොළොවතලයෙන් වාෂ්ප වී ගියාක් මෙන් අතුරුදන්වීම නිසා, මගේ මිත්‍රයා කිසිවක් නුරුස්සන තත්ත්වයට පත්ව සිටියේය. මොහු යථා තත්ත්වයට ගැනීමට, කුමක් කළයුතුදැයි සිතා ගැනීමට නොහැකිව මම ළතැවීමි. අපි උඩුමහලේ විසිත්ත කාමරය වෙත පැමිණ ගැස්පහන දැල්වීමු. එක්වරම අපට දකින්නට ලැබුණේ අමුත්තෙකුගේ පැමිණීම පිළිබඳ සලකුණකි. ඒ ගිනිඋදුන අසල බිත්තියකට හේත්තු කර තිබූ සැරයටියකි.



www.sinhalaelibrary.com

"හො හෝ!" එය දුටු මගේ මිත්‍රයාට කෑගැසිණ. "අමුත්තෙක් ඇවිත් අපව හමුවෙන්න. හඩ්සන් මහත්මිය කල්ඇතුවම නිදාගන්න ගිහින් වගෙයි. නැත්නම් ආවෙ කවුද කියන එක, ඇය අපට දැනුම් නොදී ඉන්නෙ නෑ"

"ඒ කොයි වගේ කෙනෙක් කියලද ඔබ හිතන්නේ?" මා විමසුවේ මගේ කබාය ගලවා ඇඳුම් රාක්කයේ එල්ලමිනි. හිත ඇතුළතින් මම අප්‍රමාණ සතුටකට පත්වීමි. ඒ, මගේ මිත්‍රයාගේ අවධානය යොමු කිරීමට, පුළුවෙන් හෝ ගැටලුවක් ලැබීම නිසාය.

"උස මිනිහෙක්. ඒකෙ සැකයක් නෑ" හෝම්ස් කීවේ සැරයටිය තම ඇගේ පැත්තකට හේත්තු කරගෙන, සෘජුව නැගිට සිටිමිනි. "ඔබට පෙනෙනවා නේද වොට්සන්, සිරුර ඒ පැත්තට නොනමා, මට ඒකෙන් පහසුවෙන් සහයක් ලබාගන්න පුළුවනි. මේක බොහොම ශක්තිමත්. ඒ වගේම ගනකමෙන් වැඩියි. ඒ වුණත් සමබරයි" ඔහු කීවේ සැරයටිය ඔසවා මැදින් සමතුලිත ලෙස තබාගනිමිනි. "ඒකෙන් තේරෙන්නේ මේකෙ උඩ කෙළවර හාරලා, ඇතුළට ඊයම් පුරවලා තැනූ. එයින් අපට ගතහැකි නිගමනයක් තියෙනවා. මේක හිමිකරුවා උස වගේම තරබාරු කෙනෙක්"

මීළඟට තම සාක්කුවෙන් උත්තල කාචය ඉවතට ගත් හෝම්ස්, එය ආධාරයෙන් සැරයටියේ දෙකෙළවර පරීක්ෂා කළේය. "යට කෙළවරේ පිත්තල විල්ල ගෙවිල නෑ, අලුත් එකක් වගේ තියෙනවා. නමුත් සැරයටියේ මුදුන — අතින් අල්ලාගෙන ඉන්න හරිය හුඟක් ගෙවිලා."

"එහෙම නම් සමහරවිට පිත්තල විල්ලක් අලුතෙන් දමලද දන්නෙ නෑ?" මම කීවෙමි.

"මට නම් හිතෙන්නෙ නෑ එහෙම දෙයක්" හෝම්ස් කීය. "එහෙම අලුත්වැඩියාවක් කරන්න උවමනා වුණා කියල හිතමු. එහෙම නම් මේකෙ කරන්න තවත් වැඩක් තියෙනවා. මේකෙ පහනහරියේ මොකක් හරි පළුදු වීම නිසා, ලීයෙ පතුරක් ගිහින්. සැරයටියට ආදරය කරන කෙනෙක් නම්, ඒකත් අලුත්වැඩියා කරවා ගන්නවා. වොට්සන් මට නම් හිතෙන්නේ මෙහෙම දෙයක්. මේක අයිතිකාරයා නිතරම ගමන්කරන්නේ, සැරයටියේ මැදින් අල්ලාගෙන. එළියේ ඇවිදීමේදී, ඔහු තමන්ගේ සිරුරේ බර ඒකට දෙන්නෙ නෑ. දවසේ වැඩිවේලාවක් දීර්ඝ ලෙස කල්පනාවට වැටී ඉන්න කෙනෙක්. ශාරීරිකව මහන්සි නොවෙන තරමක් අලස පුද්ගලයෙක්."





"ඔබ කොහොමද ඒක දැනගත්තෙ?"

"ඒක පැහැදිලිවම කියන්න පුළුවනි. එකම තැනකට වෙලා කල්පනා කරන කෙනෙක් මොකද කරන්නේ? සැරයටියේ අතින් අල්ලන කෙළවර දෑතට හිරකරගෙන, සැරයටිය එහා මෙහා අඹරවමින් කල්පනා කරනවා. මං මෙහෙම නිගමනවලට එන හැටි, ඔබට තේරුම් ගන්න අමාරු ද?"

මගේ මුහුණට සිනාවක් නැගිණ. එය ඔහුගේ සතුටට හේතු නොවූ බව මම තේරුම් ගතිමි.

"මං මෙහෙම කිව්වට තරහ ගන්න එපා හෝම්ස්. එම පුද්ගලයාගේ අලස බවක් මතක් අපි මොහොතකට අමතක කරමු. එතකොට ඔබේ විස්තරය නිවැරදිව ගැළපෙන්නේ ඔබටම යි."

මා කියූ දෙයට හෝම්ස් ප්‍රතිචාරයක් දැක්වූයේ නැත. ඒ වෙනුවට ඔහු සැරයටිය මදක් ඇසිපිය නොහෙළා බලාසිටියේය. මීළඟට ඔහු එය බිමට විසිකළේය. එයින් නැඟුණු හඬ කොතරම් තියුණු වී ද යත්, පහළ තට්ටුවේ නිදා සිටි හඩ්සන් මහත්මිය නිසැකව ම ඇගේ නින්දෙන් අවදිවන්නට ඇත.

"ඔය හැංගිලා ඉන්න තැනින් එළියට එන්න මයික්‍රොෆ්ට්" හෝම්ස් තම නිදනකාමරයේ දොර දෙසට හැරී කෑගැසුවේ ජයග්‍රාහී හඬෙනි. "ඔබ ඔතන ඇතුළෙ ඉන්න බව, මම දැන් දන්නවා."

මගේ මිත්‍රයා මේ දොඩවන්නේ කුමක් ගැනදැයි විමසීමට, මට කාලයක් නොවීය. හෝම්ස්ගේ නිදනකාමරයේ දොර විවෘතකරගෙන, විසිත්ත කාමරය තුළට ආවේ අමුත්තෙකි. ඒ ෂර්ලොක් හෝම්ස්ගේ වැඩිමහල් සොහොයුරු මයික්‍රොෆ්ට් හෝම්ස් ය.

ග්‍රීක් භාෂා පරිවර්තකයා සහ උමං දුම්රියේ අබිරහස් මරණය නමින් මා ඉදිරිපත් කළ කථාන්තර, ඔබට තවමත් මතක ඇතැයි සිතමි. එම පරීක්ෂණ දෙකේදීම වැදගත් තැනක් ගෙන කටයුතු කළ මයික්‍රොෆ්ට් ගැන, අලුතෙන් කීම අනවශ්‍යය. මුහුණේ පෙනුමෙනුත්, උසෙනුත් ඔහු මගේ මිත්‍රයාට බොහෝදුරට සමාන විය. එහෙත් මයික්‍රොෆ්ට් තරබාරු පුද්ගලයෙකි. ඔහු තම සුරත දිගුකර, පළමුවෙන්ම මලණුවන්ට අතට අත දුන්නේය. මීළඟට මට ද සුරත දිගු කළේ අප අමතමිනි.

"ෂර්ලොක් ඔබේ නිදනකාමරය යයි කියන එක හිරකූඩුවක් කියලයි මට නම් හිතෙන්නෙ" මයික්‍රොෆ්ට් කීය" ගිනිඋදුනක් වත්



www.sinhalaelibrary.com

නැති ඒකෙ, මං කොච්චර වෙලා හිටියද? තව ටිකෙන් ඒකෙ තිබුණු සීතලට, මං අයිස් වගේ මිදිලා මරණයට පත්වෙනවා. ඒක නෙමෙයි. මං හිතුවා මගේ හැරයටිය දුටු වහාම, ඔබ ඒක හඳුනාගනීවි කියලා. දොස්තර වොට්සන් ඉවෙන් වගේ තී දේවල් ප්‍රයෝජනයට ගන්න, ඔබට උවමනා වේවි කියල මං හිතුවෙ නෑ"

සිය සොහොයුරාගේ විහිළුව ගැනත්, ප්‍රකාශ ගැනත්, මගේ මිත්‍රයා නොනවත්වාම සිනාසෙමින් සිටියේය.

"මට හිතුණා ඔබ දෙදෙනාට විහිළුවක් කරල බලන්න." මයික්‍රොෆ්ට් කීවේ උස් හඬින් සිනාසෙමිනි. "ඔබ දෙදෙනා එළියට ගිහින් බව හඩ්සන් මහත්මිය මට කිව්වා. ඉතින් මං ඇයට කිව්වා, ඔබ එනතුරු මං ඔබේ නිදන කාමරයට වෙලා හැංගිලා ඉන්න බව. ඒ ගැන එක වචනයක් වත් ඔබට නොකියන්න, මං ඇයව පොරොන්දු කරවගත්තා. ඇය විහිළු තහළු තේරෙන කරුණාවන්ත කාන්තාවක්. ෂර්ලොක් මෙකෙ ජීවත්වෙන පිළිවෙළ, ඇයට මොනතරම් හිරිහැරයක්ද කියලා, මට හිතාගන්න පුළුවනි. ඔබ ඉලක්කයට වෙඩි තැබීම, කාමරයේ බිත්තිවලට වෙඩිතබලා පුහුණුවීම බොහොම වැරදියි. ලියුම් ටික ගිනිඋදුන් සඩියේ අමුනන්නේ උල්පිහියකින්. මේ විදියට ගේ පාවිච්චි කරනවා, ඒ ගැනිට ගෙවන ගෙවල්කුලිය හොඳටම මදි. කොහොම වුණත්, අද හැන්දෑවේ ඔබ නරඹන්න ගිය සංගීත ප්‍රසංගය ගැන නම්, ඔබ හොඳටම කලකිරීමටයි පත්වුණේ. එහෙම නේද ෂර්ලොක්?"

"අන්තිම කලකිරීමට පත්වුණා" ෂර්ලොක් කීය. "ඒක නෙමෙයි මයික්‍රොෆ්ට්. ඔබ අගමැතිතුමා එක්ක සහභාගිවුණු රාත්‍රී භෝජන සංග්‍රහය නම්, ඉතාම ප්‍රීතිමත් එකක් වී ඇතිබව, මට පැහැදිලිවම පෙනෙනවා."

"ඒක තනිකරම රාජකාරි කටයුත්තක්" මයික්‍රොෆ්ට් කීය. "ඒ වුණත් ප්‍රසංග ශාලාවෙන් එළියට බැහැපු ගමන්ම කුලීරියක් අල්ලාගන්න, ඔබ වාසනාවන්ත වුණා නේද?"

"ඔබට නම් ඒ තරම් ලේසියට කුලීරියක් ලැබිලා නැතිබවයි පෙනෙන්නේ" ෂර්ලොක් පිළිතුරු දුන්නේය.

"මේ! මේ! මේ!" දැත් ඔසවමින් මා පැවසුවේ දෙදෙනාගේම කථාවලට බාධාකරමිනි. "මට හිතන්නවත් බැරි දේවල් එක්කෙනෙක් දොඩවන්නේ, ඉන්ද්‍රජාලිකයෙකු වගේ. ඒක මට





අමාරුවෙන් ඉවසා දරාගන්න පුළුවනි. ඒත් ඒ වැඩේ දෙන්නෙක් දෙපැත්තෙන් කරන්න ගත්තාම? එතකොට මට හිතෙන්නේ, මං මොළේ කලදක් නැති මෝඩයෙක් කියලයි"

"අපට සමාවෙන්න දොස්තර මහත්මයා" මයික්‍රොෆ්ට් පැවසුවේ ඉතාම සුහද අයුරෙනි. "මට ඔබව සම්පූර්ණයෙන්ම අමතක වුණා. ඔබව අමතක කිරීම ගැන මගේ මුල්ලින් වැරදිකාරයෙක්. ඔබ දෙදෙනා සංගීත ප්‍රසංගයක් සඳහා ගිය බව, හඩ්සන් මහත්මියගෙන් මට දැනගන්න ලැබුණා.

විශිෂ්ට ගනයේ සංගීතයකට සවන්දෙමින්, සැන්දෑකාලය ගතකළාම මොකක්ද සිදුවෙන්නේ? ඔබේ ඇතුළුසිත නැත්පත් වෙලා සන්සුන් වෙනවා. ඊළඟට ඒක මුහුණෙන් පිළිබිඹු වෙනවා. මේ කරුණ මං තේරුම් අරගෙන බොහොම කල්. කොහොම වුණත් ඒ සලකුණ, ඔබ දෙදෙනාගේ මුහුණුවල මට අද දකින්න ලැබුණේ නැහැ. ඉතින් ප්‍රසංගයේ තත්ත්වය බොහොම බාල බව මං එසැණින්ම තේරුම් ගත්තා."

"මයික්‍රොෆ්ට් අද රෑ කෑම ගත්තෙ අගමැතිතුමා සමග බව, මං තේරුම් ගත්තෙ බොහොම පහසුවෙන්." ෂර්ලොක් කීය. "ඒ ඔබ අද ඇඳගෙන ඉන්න ඇඳුම නිසා. මයික්‍රොෆ්ට් කවදාවත් කෑමකට යද්දී අඳින ඇඳුම්, අලංකාර වෙන්න ඕන කියල හිතන කෙනෙක් නෙමෙයි. නමුත් ඒ කෑම එකත්ම බොරු කරමින්, ඔහු අද අලංකාර ලෙස සැරසිලා. එතකොට කාගෙන්ද ඔහුට රෑ කෑමට ආරාධනය? රජයේ ඉහළම අය සමග මයික්‍රොෆ්ට්ගේ තිබෙන සම්බන්ධය මා දන්නවා. ඒ නිසා ඔහුව රෑ කෑමට ඇරයුම් කළේ අග්‍රාමාත්‍යතුමා බව හිතාගන්න, මට අමාරුවුණේ නැහැ."

"අපට ඉක්මනින් කුලීරියක් ලැබුණු බව ඔබ තේරුම් ගත්තෙ කොහොමද?" මම මයික්‍රොෆ්ට්ගෙන් විමසුවෙමි.

"අද තදින් හිම වැටෙන රාත්‍රියක්. දෙදෙනෙක් ගමනක් ගිහින මෙන්න මහ රෑ ගෙදර එනවා. ඔවුන්ගේ හිස්වැසුම් හා කබාවල හිම තියෙන්නේ ඉතාම ස්වල්ප වශයෙන්; පාවහන්වල තෙත් බවක් දකින්නත් නැහැ."

"කුලීරියක් ඉක්මනින් ලැබීමට තරම් වාසනාවන්ත නොවුණු නැනැත්තා........" ෂර්ලොක් කීය. "හිම වැටීමට අහුවෙලා, කලිසම් කකුල්වල පහත දෙකෙළවර තෙමුණා. ඒ වුණත් දැන් ඒවා හොඳින් වියළිලා. ඒ නින්දා උඩට නැඹුරු කලිසම් කකුල් දිගහැරියට කමක් නෑ මයික්‍රොෆ්ට්"



www.sinhalaelibrary.com

"මට නම් මේ කිසිදෙයක් තේරෙන්නෙ නෑ" මා කීවේ පුටුවක හිඳගනිමිනි.

තෙමී ගිය කබා හා හිස්වැසුම් ඉවත්කර දමා, අපි විසිත්තකාමරයේ ගිනි උදුන අසලට ළංවීමු. දීප්තිමත්ව දැල්වෙන ගින්නෙන් සීතල මැකීයද්දී, අපි සුවපහසු අසුන්වල හිඳ ගත්තෙමු. මගේ මිත්‍රයා ක්‍රීම් ෂෙරි බෝතලය මයික්‍රොෆ්ට් වෙත ළංකළේය.

"පීලි මත ගමන් කරන දුම්රියක්, ඒවායින් ඉවතට ගමන් කරන්නෙ නෑ කියල, මං ඔබට කියල තියෙනවා නේද වොට්සන්?" මගේ මිත්‍රයා ඇසුවේ සිනහමුසු මුහුණෙනි. "අද මොකද මයික්‍රොෆ්ට් දුම්රිය පීලි පැන්නේ? ඔබේ ගෙදරයි, ඩයොජිනිස් සමාජශාලාවයි දෙකම එකවර ගිනිගත්තාද? එහෙමත් නැත්නම් රුසියන් නාවික හමුදාව කෝන්වෝල් පැත්ත ආක්‍රමණය කරලද?"

"ඒ එකක්වත් නෙමෙයි මගේ ඝනවත් ෂර්ලොක්" මයික්‍රොෆ්ට් කීය. "ඒ වුණත් මට කියන්න තියෙන දේ අතිශයින් ම රහසිගතයි. ඒක ඔබේ කන්දෙකට පමණක් හෙළිකරන්නයි, මට අවසර ලැබී තියෙන්නේ"

"මට තේරෙනවා" කියූ මා එතැනින් නැගිට්ටේ කාමරයෙන් පිටවීමට සූදානමෙනි.

"වොට්සන්! නැගිටින්න එපා ඔබේ අසුනෙන්!" මගේ මිත්‍රයා ආඥාවක් නිකුත් කළේ උස් හඬිනි. මෙතෙක් වේලා ඔහුගේ මුහුණේ තිබූ සිනාව මැකීගියේය.

"දොස්තර වොට්සන් කියන්නේ, රහස් හැමවිටම රැකගන්නා, මගේ විශ්වාසවන්තම මිත්‍රයා. ඔහු ඉදිරියේ ඕනෑම දෙයක් කියන්න පුළුවනි. රහසක් රැකගන්නවා කියල ඔහු දිවුරා සිටියොත්, ඒක ගලේ කෙටූ අකුරකට සමානයි. අපායට යවනවා කිව්වත් වොට්සන් නම් ඒ රහස හෙළිකරන්නේ නෑ. මයික්‍රොෆ්ට් ඔබ කියන්න හදන්නේ, මොකක් ගැනද, කා ගැනද කියල, මං අහන්නේ නෑ. නමුත් ඒක වොට්සන්ගේ කන්වලට වැටෙන්න නුසුදුසු දෙයක් ද? එහෙනම් ඒකට කන්දෙන්න මමත් කැමති නෑ"

"හරි හරි. ඒකට ඔය තරම් කලබල වෙන්න උවමනා නෑ" ෂර්ලොක් වැඩිමහල් සොහොයුරා පැවසුවේ, මලණුවන් සන්සුන් කරන අයුරිනි. "තුන් මාසයකට කලින් සිදුවුණු සර් ඩැන්වර්ස් කැරූ ඝාතනය ගැන මුළු බ්‍රිතාන්‍යය පුරාම ප්‍රසිද්ධයි. ඒක ගැන ඔබත් උනන්දුවක් දක්වන බව මට ආරංචි වුණා"





"ඇයි? මං ඒක ගැන සොයා බැලීමේ ඇති වැරැද්ද මොකක්ද?" ෂර්ලොක් ඇසීය.

"කිසිම වැරැද්දක් නෑ" මයික්‍රොෆ්ට් පිළිතුරු දුන්නේය. "ප්‍රශ්නය වෙලා තියෙන්නේ මෙයයි. තුන්මාසයක් ගතවුණා. ඒත් මිනීමැරුම ගැන අලුතෙන් කිසිම දෙයක් හොයාගන්න ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට බැරිවුණා. අපරාධකාරයා කවුද කියල ප්‍රසිද්ධ වුණා. ඒත් ඔහු හැංගිලා ඉන්න තැන ගැන, පොලීසියට කිසිම නිනව්වක් නෑ. ඔබ දන්නවා නේද? සර් ඩැන්වර්ස් කැරූ කියන්නේ අපේ රජපවුලේ සමීප මිත්‍රයෙක්"

"ඔය කාරණය මට කලකට පෙර අහන්න ලැබිල තිබුණා"

"මට සමාවෙන්න දොස්තර මහත්මයා" මයික්‍රොෆ්ට් කීවේ මගේ මුහුණ බලමිනි. "මං මේක ඔබ ඉදිරියේ කියන්න අදිමදි කළේ ඇයි කියල ඔබට තේරේවි," "ඔහු පැවසුවේ තම කටහඬේ ශබ්දය අඩුකොට රහසක් කියන ස්වරයකිනි. ෂෙරි උගුරක් පානය කළ ඔහු, වාඩිවී සිටි පුටුව තවත් ටිකක් අප දෙසට ළං කරගත්තේය.

"මේක රහසක් හැටියට තියාගන්න" මයික්‍රොෆ්ට් කීය. "අද උදේම මහ රැජින, අගමැතිතුමාව බකිංහැම් මාලිගයට කැඳෙව්වාලු. සර් ඩැන්වර්ස් කියන්නේ විදේශ ප්‍රතිපත්ති සම්බන්ධයෙන්, රජපවුලට උපදෙස් දුන් විශ්වාසවන්ත කෙනෙක්. ඔහුගේ අකල් මරණය නිසා රජපවුලට වුණේ, වචනයෙන් විස්තර කළ නොහැකි පාඩුවක්.

අපරාධකාරයා ගැන අල්පමාත්‍රයක දෙයක් පොලීසිය දන්නෙ නැහැ. මේ මිනීමැරුමට විදේශ රටක් සම්බන්ධද කියලා, වේල්ස්කුමාරයාගෙ හිතේ සැකයක් පහළවෙලා තියෙනවා. ඔබ දන්නවානේ ෂර්ලොක්, ලෝකයේ මෙහෙම දේවල් වෙන බව. සර් ඩැන්වර්ස්ගේ උපදෙස් අනුව බ්‍රිතාන්‍යය ක්‍රියාත්මක කළ යම් ක්‍රියාමාර්ගයකට, විදේශ රටක් කිපුණාද? ඔවුන් ඔහුව ඝාතනය කළේ ඒකට පළිගැනීමක් ලෙසද? ඔහු තමන්ගේ පාඩුවේ පාරේ ගිය අසරණ මහලු මිනිහෙක්. ඔහු ඝාතනය කළේ ඇයි? ඔහු සතු මුදල් හෝ අබරණ කිසිවක් මංකොල්ලකාලත් නෑ.

මං ඔබට කලිනුත් කිව්වා වගේ, මේ ගැන ස්කොට්ලන්ඩ්යාඩ් එකෙන් අල්පමාත්‍රයක දෙයක් කෙරිල නෑ. අද හෙටම මොකක් හරි සොයා නොගත්තොත්, අපි කවුරුත් නොහිතන ප්‍රතිඵල දකින්න ලැබේවි."



www.sinhalaelibrary.com

"ඒ කියන්නේ?"

"රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ, ඉහළම පුටුවල ඉන්නා නිහිපදෙනෙක්, ඉවතට විසිවෙන්න ඉඩතියෙනවා!" මයික්‍රොෆ්ට් කීය.

"මොනවා" අප දෙදෙනාටම කියැවිණ.

"රජපවුලේ විශ්වාසවන්තම සගයෙක් නාඳුනන මිනීමරුවෙකු අතින් මරණයට පත්වුණා. සණ්ඩුවකට ගිහිං නෙමෙයි; තමන්ගෙ පාඩුවේ පාරේ යද්දී "මයික්‍රොෆ්ට් කීය. "එතකොට සාමාන්‍ය මහජනතාවට තියෙන ආරක්ෂාව මොකක්ද? රටේ ආරක්ෂාව සලසන්න කියලා, ලොකු ලොකු තනතුරුවල ඉන්න අයගෙන් ඇති වැඩේ මොකක්ද? වේල්ස් කුමාරයා, අගමැතිතුමාගෙන් අහල තිබුණේ ඒ වචනමයි"

"මයික්‍රොෆ්ට්, ඔබත් එළියට විසිවෙයිද?" ෂර්ලොක් විමසුවේ කැලඹීමට පත් අයුරෙනි.

"අගමැතිතුමා ඒ දේ මාව ඉලක්ක කරලා කිව්වාම නෙමෙයි." මයික්‍රොෆ්ට් කීය. "දන්නවානේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙ හැටි? ඔවුන් නොකඩවාම දෝෂාරෝපණය කරනවා. රජයටත් සිදුවෙනවා මොකක් හරි පියවරක් ගන්න. මෙහෙම ගියොත් මං වුණත්, නැතිවම බැරි කෙනෙක් වෙන එකක් නෑ.

කොහොම හරි, අන්තිමේදී මේ අවුල විසඳීමත්, මගේ කරපිටටමයි පැටවුණේ. ගිය අවුරුද්දේ අග්‍රාමාත්‍ය කාර්යාලය මුහුණදුන් ජර්මන් රහස් ඔත්තුකාරයා පිළිබඳ අවුලෑ ඔබ ඒක විසඳා දුන් හැටි, කාටත් මතකයි. එච්චර් හයිඩ් පුහුබැඳ ගිහිං, ඔහුව අල්ලා ගැනීම, ඔබට භාරදෙන්න රජපවුල තීරණය කරලා. මේක නවදුරටත් පමාකොනකොට ඔබට භාරදෙන්න කියලා. නියෝගය ලැබිල තියෙන්නේ රජමාලිගයෙන්මයි."

තම කබා සාක්කුවට අත දැමූ මයික්‍රොෆ්ට් හෝම්ස්, සුදු පැහැති ලොකු ලියුම්කවරයක් එළියට ගත්තේය. එය ලාකඩ යොදා මුද්‍රා තැබූ එකක් බැව් දුටුවෙමි. ඔහු එය මගේ මිත්‍රයා අතට භාරදුන්නේය.

මුද්‍රාව කැඩූ ෂර්ලොක් ඇතුළත තිබූ ලිපිය ඉවතට ගෙන කියවා බැලුවේය. අනතුරුව ඔහු තම දෙනෙත් යොමු කළේ මයික්‍රොෆ්ට් වෙතය.





"ෂර්ලොක්, ඔක තමා ඔබට සියලුම බලතල ලබාදෙන ලිපිය. කවුරු හරි නිලධරයෙක් ඔබට අභියෝග කරන්න හැදුවොත් මය ලියුම පෙන්වන්න"

ලිපිය දෙකට නමා, තම ඇතුළුකබායේ සාක්කුවට දමාගත් ෂර්ලොක්, සොහොයුරාට ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය. "මේ අලුත් නියෝග ගැන, පොලිස් පරීක්ෂක නිව්කමෙන්ට දැනුම්දීලද තියෙන්නේ?"

"මං හිතන්නේ දැනුම්දීල නැතුව ඇති" මයික්‍රොෆ්ට් කීය. "ඒ මොකද මේ නියෝගය ඇවිත් තියෙන්නේ අද හවස. මොකද කියන්නේ ෂර්ලොක්? මේ අබිරහස විසඳීම ඔබ භාරගන්නවද?"

"මගේ අනුග්‍රාහකයා ඉතාම සොඳුරු පුද්ගලයෙක්." ෂර්ලොක් කීය. "මහත්මයෙක් හැටියට මං කොහොමද ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නෙ?"

මයික්‍රොෆ්ට් සිය අසුනෙන් නැගී සිටියේය. හිතේ තිබූ බරක් නිදහස් වීම නිසා, සැනසීමට පත්වූ සැටියක්, ඔහුගේ මුහුණෙන් පෙනිණ.

"එහෙම නම් ෂර්ලොක්" මයික්‍රොෆ්ට් කීය. "විශේෂඥයා ගැටලුව විසඳීම භාරගත්තා කියල, මං අග්‍රාමාත්‍යතුමාට කියන්නම්. එය රජමාලිගයට දැනුම්දීම ඔහු කරාවි"

"මට එක උදව්වක් කරන්න" ෂර්ලොක් සිය සොහොයුරාගෙන් ඉල්ලා සිටියේය. "නිව්කමෙන්ට මේ ගැන දැනුම්දෙන්න එපා. ඒක මං කරන්නම්"

මයික්‍රොෆ්ට් නිවසෙන් පිටත්ව ගිය පසු අපි ගිනි උදුන සමීපයට පැමිණ යළිත් වාඩිවුණෙමු.

"හෝම්ස් මේ ගැටලුව විසඳා දෙන්න කියලා ඔබට ආයාචනා කරන අනුග්‍රාහකයා කවුද?"

"බොහොම සුන්දර කෙනෙක්" මගේ මිත්‍රයා පැවසුවේ, ඔහුගේ මුවේ රඳවාගත් වෙරිවුඩ් පයිප්පය දල්වාගනිමිනි. "අපට බයවෙන්න දෙයක් නෑ.......... ගැටලුව විසඳලා දුන්නොත් මුදල් ගෙවීම ගැන. ඇය ඒක ලෝභ නැතුව කරාවි" එසේ කියා සිනාසුණු මගේ මිත්‍රයා තම දෙනෙත් යොමු කළේ, වෙඩි උණ්ඩ මගින්, ගිනි උදුනට ඉහළින් ඔහු බිත්තියේ කර තිබූ සලකුණු වෙතය. අප මහ රැජින සංකේතවත් කළ, විශාල VR අකුරු දෙකක් බිත්තියේ දක්නට ලැබිණ.



www.sinhalaelibrary.com

9

# අටර්සන්ට සිහිනැතිවෙයි!

"..............ආ............ මේ මගේ පරණ මිත්‍රයන්; හෝම්ස් මහත්මයා සහ දොස්තර වොට්සන් නේ" පොලිස් පරීක්ෂක ලෙස්ට්‍රේඩ් අප පිළිගනිමින් පැවසුවේ, අප ස්කොට්ලන්ඩ්යාඩ් පොලිස් මූලස්ථාන ගොඩනැගිල්ලට පිවිසි මොහොතේ දී ය.

"මහත්වරුනි, ඔබ එන්න ඇත්තේ අර, ෆ්ලීට් වීදියේ ගොඩනැගිල්ලක් ඩයිනමයිට් වලින් පුපුරවා හැරීමට සම්බන්ධ අපරාධකාරයා ගැන, සාකච්ඡා කරන්න බවට මට නම් සැකයක් නෑ. මෙදා සැරේ නම් ඔබ ප්‍රමාද වැඩියි, මං ඒ ගැටලුව පැය 24 න් විසඳුවා. හාන්සිපුටුවකට වෙලා උපකල්පන ගොඩනංවමින් ඉන්නවාට වඩා, කාර්යක්ෂම විධින් තියෙනවා. ඒ බව දැන් ඔබට පෙනේවි. මං ඒක විසඳුවේ සිදුවුණු තැනටම ගිහිං, නියම රහස් පරීක්ෂකයෙක් ලෙස කටයුතු කරලා"

"මගේ උණුසුම් සුබපැතුම් පිළිගන්න ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය. "මෙතරම් ඉක්මනින් ඒක විසඳූ ඔබ, ඇත්තෙන්ම දක්ෂයෙක්"

"මේ මොහොත වෙනකොට, අපරාධකාරයා පොලිස් සිරකුටුවේ" ලෙස්ට්‍රේඩ් කීය. "හෝම්ස් මහත්මයා. ඔබ යොදාගන්නේ අඩි සලකුණු පරීක්ෂාව, පුළුට්ටු අළු විශ්ලේෂණය වගේ දේවල් නේ. ඒවායින් විසඳන්න පුළුවන් ගැටලුත් ඉඳහිට තියෙනවා. ඒත් සංකීර්ණ ගැටලු ලිහන්න ඒවායින් ඇති වැඩක් නෑ"

"අපරාධකාරයා ඕබ්‍රයන්, එහෙම නේද ලෙස්ට්‍රේඩ්?" හෝම්ස් විමසුවේය.

ගෑස් පුරවා තිබූ බැලුනක, ගෑස් බැසගිය කලක මෙන් ලෙස්ට්‍රේඩ්ගේ මුහුණ හැකිළිණි.

"කවුද ඔබට ඒක කිව්වේ?" ඔහුට කෑගැසිණ. "කවුද ග්‍රෙග්සන්ද? ඒ යකා පුළුවන් හැම විදියකටම උත්සාහ කරන්නෙ.........."

ඊට බාධාකරමින් හෝම්ස් හඬනගා සිනාසුණේය. "අර ලොරිස්ටන් උද්‍යානයේ සිද්ධියෙන් පස්සේ, ඔබ දෙදෙනා අතර ලොකු ආරවුලක් ඇතිවුණා නේ" හෝම්ස් කීය. "තවමත් ඒක





විසඳගෙන නැහැ වගෙයි. එහෙම නේද ලෙස්ට්‍රේඩ්. ඇත්තම කියන්නම්. ග්‍රෙග්සන්ට මට, සති ගණනාවකින් හමුවුණේ නෑ. "ටයිම්ස්" පත්තරේ ඔය සිද්ධිය ගැන තිබුණු වාර්තාව කියවව ගමන්, ඒකට වගකිවයුත්තේ ඕබ්‍රයන් බව, මං නිගමනය කළා. ඒ මොකද, ඔය ගොඩනැගිල්ල ඇතුළට යන්න අවස්ථාව, අපරාධය කිරීමේ අරමුණ, ඒකට අවශ්‍ය විද්‍යාත්මක දැනුම සහ කෙරාටික කම; මේ කාරණා සියල්ල සම්පූර්ණ කළ එකම පුද්ගලයයි හිටියේ. ඒ ඕබ්‍රයන්. අයර්ලන්ත නූතනවාදීන් සමග ඔහුගේ ඇති සම්බන්ධකම් ගැන, මං හොඳට දන්නවා. ඒ කොහොම වුණත් අද මං මෙහෙ ආවේ නම්, ඔය කටයුත්තට නෙමෙයි"

"එහෙනම්?"

"මං ආවේ පොලිස් පරීක්ෂක නිව්කමෙන් හමුවෙන්න. ඔහුගේ කාර්යාලයට යන පාර මට කිව්වොත්.........."

"මං හිතන්නේ ඔය, තවමත් විසඳාගන්න බැරිවුණු වෙස්ට්මින්ස්ටර් මිනීමැරුම ගැන. එහෙම නේද?" ලෙස්ට්‍රේඩ් ඇසීය. "ඔය අපරාධය විසඳීම මට භාර නොවුණු එක නම්, මට ලොකු සන්තෝෂයක්. මෙහෙමම ඉස්සරහට ගියාම දකුණු පැත්තේ දෙවැනි දොරටුව තමයි, නිව්කමෙන්ගේ කාමරය"

අපි ලෙස්ට්‍රේඩ්ගෙන් සමුගත්තෙමු. නිව්කමෙන්ගේ කාර්යාලයේ දොර විවෘතව තිබිණි. අපි දොරට තට්ටු නොකොට, කෙළින්ම ඇතුළුවුයෙමු. ඒ මොහොතේම කාර්යාලය තුළ සිට වේගයෙන් එළියට එමින් සිටියේ පොලිස්භටයෙකි. ඔහුගේ ඇගේ නොගැටී අප බේරුණේ යාන්තමිනි. ඔහු තම ප්‍රධානියාගේ වාග් ප්‍රහාරයකට ලක්වී, පැනදුවන බැව් අපි වටහාගත්තෙමු.

පොලිස් පරීක්ෂක නිව්කමෙන්ට තිබුණේ උස, මහත සිරුරකි. සීටරූට් අලයක් මෙන් රතුව තිබූ මුහුණේ, දුඹුරු පැහැති කෙටි උඩුරැවුලක් විය. ඔහුගේ රතුපැහැති හිසකෙස්, ඉත්තකුරු මෙන් ඉහළට විහිදී තිබිණ. ඔහු කෝපයෙන් පිපිරෙමින් සිටියේය. අනපේක්ෂිත ලෙස අප එහි පිවිසීමෙන්, ඔහුගේ තත්ත්වය වඩාත් නරක අතට හැරුණායයි මට සිතිණ.

"කවුද මහේලට ඇතුළට එන්න ඉඩදුන්නෙ?" ඔහු කඩා පැන්නේය. "දෙයියම්පා! තමන්ගේ රාජකාරි හරියට කරන්න, තව එක් පොලිස් භටයෙකුට බැරිවුණොත්, මං උගේ පටි ගළවලා, ඌව අල්ලල පොලොවේ ගහනවා!" ඔහු ගිගිරුවේය.

"සන්සුන් වෙන්න නිච්කමෙන් මහත්මයා" හෝම්ස් කීවේ, මේ ප්‍රතිචාරය, ගණනකට නොගනිමිනි. "මේ ස්කොට්ලන්ඩ්යාඩ් එකේ මට හරියට යාළුවෝ ඉන්නවා. අදත් මං මේ ආවෙ කැරූ මිනීමැරුම ගැන ඔබට මොකක් හරි උපකාරයක් කරල යන්න"

"බහිනවා එළියට!" නිච්කමෙන් කඩාපැන්නේ යක්ෂාවේශ වූවෙකු ලෙසිනි. "පොලීසියේ රාජකාරිවලට, එක එකා ඇඟිලි ගහන්න එනවාට මං කැමති නෑ. මං ඒ බව තමුසෙට සැරයක් කිව්වා! මගේගේ උදව් නැතිව මොකුත් කරගන්න බැරි. පොලිස් නිලධරයනුත් මෙහේ ඇති. ඒ වුණාට මම එයින් කෙනෙක් නෙමෙයි. මට පුළුවනි ඒ ගැටලුව තනියම විසඳාගන්න"

"ඒ වුණාට හැමෝම ඒ මතයට එකඟවෙන්නෙ නෑ" හෝම්ස් කීය.

"මොනවා? කවුද කියන්නෙ මට මේක විසඳන්න බෑ කියල? ට්‍රම්බල්!"

සොහෝම් අපට හමුවූ පොලිස්භටයා වහා දුව ආවේය.

"එක්ක යනවා මේ මහත්වරු, ගොඩනැගිල්ලෙන් එළියට! හොඳින් නැත්නම් නරකින්!"

හිස නමා ආචාරකළ ට්‍රම්බල් සූදානම් වූයේ, හෝම්ස්ගේ අතකින් අල්ලාගෙන, එළියට ඇදගෙන යාමටයි. තම කබාසාක්කුවේ තිබූ කවරය ඉවතට ගත් හෝම්ස්, එහි තිබූ ලියුම දිග හැර, නිච්කමෙන්ගේ මුහුණේ ගැටෙන තරමට ළං කළේය.

ලියුම වෙත නෙත් යොමු කළ නිච්කමෙන්ගේ, දෙනෙත් විශාල වෙන අයුරු මම දුටුවෙමි. පහතින් වූ අත්සන හා රාජකීය ලාංඡනය දෙස බැලූ ඔහුගේ මුහුණ සුදුමැලිවූයේ, අවතාරයක් දුටු කලක මෙනි. තව මොහොතකින් ඔහු ක්ලාන්ත වී බිම ඇදවැටේදෝ යයි මට සැකයක් ඇතිවිය.

ඔහු ඇදවැටුණේ පුටුව මතට ය. ඊළඟට ගොතගසමින් පොලිස්භටයා ඇමතුවේය.

"............ ඕන නෑ ට්‍රම්බල්.......... තමුසෙ යන ගමන්.......... දොර වහගෙන.......... යනවා"

යළිත් ප්‍රකෘති තත්ත්වයට පත්වීමට, ඔහුට මිනිත්තුවක් හෝ දෙකක් ගතවිය. මිත්‍රශීලී සිනාවක් දෙතොලට නංවා ගැනීමට උත්සාහ දැරූ ඔහු, ඉදිරිපස පුටුවල වාඩිවෙන මෙන් අපට සංඥා කළේය.





"මට සමාවෙන්න ෂර්ලොක් හෝම්ස් මහත්මයා" නිච්කමෙන් කීය. "........... මං දන්නෙ නැහැනේ ඔබ.......... මං හිතුවෙ නෑ ඔය තරම්........."

"ගොඩක් අය හිතන්නෙ නෑ" හෝම්ස් කීය. "ඒක නෙමෙයි. අපේ මිත්‍රයා හයිඩ් හැංගිලා ඉන්න තැන් ගැන, ඔබට මොනවද හොයාගන්න හැකිවුණේ?"

"ඇත්තම කියනවා නම්........ කිසිම දෙයක් හොයාගන්න බැරිවුණා, මහත්මයා" නිච්කමෙන් කීය. "ඌ යක්ෂයෙක් වගේ සිහිසුණු එකෙක්. මේ අපරාධය ගැන අමතක කළත්, ඔහුගේ ස්වභාවය කොහොමටත් ඒ විදියයි. ඔහු හමුවී තිබෙන හැම දෙනෙකුගේම මතය එකයි. මහා පිළිකුල් සහගත පුද්ගලයෙක්. කෲරත්වයේ අන්තයටම ගිය මිනිහෙක්ලු. ඔහුගේ වැඩ ගැන, මට අහන්න ලැබුණු කතා කිව්වොත්, ඔබේ ඇඟ කිළිපොලා යාවි. ඒ වුණත්, මේ මොහොතේ ඔහු ඉන්නේ කොහේද කියන එක නම්, මට හොයාගන්න බැරිවුණා"

"සමහරවිට එයාගෙ යාළුවො, එයාව හංගාගෙන ඉන්නවාද දන්නෙ නෑ" මම කීවෙමි.

"එයාට යහළුවන් කිසිකෙනෙක් නෑ" නිච්කමෙන් කීවේ හිස වනමිනි. "මං කතාකළ මිනිස්සුන්, හයිඩ් එක්ක වෛරයෙන් ඉන්න අය. ඔහු පුදුමාකාර විධියට සිහිසුණු කුරිරු කෙනෙක්ලු. ඔහු හැංගිලා ඉන්න තැනක් ගැන දැන හිටියා නම්, ඔවුන් බොහොම කැමැත්තෙන් ඒක හෙළිකරාවි."

"හයිඩ් මිනීමැරීම සඳහා යොදාගත් ආයුධය ඔබට හමුවුණාද?"

"ඔව් මහත්මයා" කී නිච්කමෙන් මේසය මත අවුල්වී තිබූ කඩදාසි කිහිපයක් ඉවත්කොට, යමක් අතට ගත්තේය. ඒ පොලිස් බැටන් පොල්ලක් වැනි ලී කැබැල්ලකි. එහි එක් කෙළවරක කැඩී ගිය ලකුණු දක්නට ලැබිණි. අනෙක් කෙළවරේ පිත්තල විල්ලක් විය. ලී කැබැල්ල අතට ගත් හෝම්ස් එය පරීක්ෂා කර බැලුවේය.

"වොට්සන්ට පුළුවන්ද මේක හඳුනාගන්න?" හෝම්ස් ඇසීය.

"එදා ජිමීගේ අවන්හලේදී, අපට තර්ජනය කිරීමට පෙර ඉහළට එසෙව් මුගුරත් මේ වගේමයි." මම කීවෙමි.

"හරියට හරි" හෝම්ස් එකඟවිය. "මේක කැඩීයාමට හේතුව, සැරයටිය යොදාගෙන, තදින් එල්ල කළ ප්‍රහාරයක්. සර් ඩැන්වර්ස් කැරූ අකාලයේ මියගියේ, මේ සැරයටියෙන් එල්ල වූ පහරෙන්



www.sinhalaelibrary.com

කියල, අපට බය නැතුව කියන්න පුළුවනි." කී හෝම්ස් ලී කැබැල්ල ආපසු පොලිස් නිලධරයා අතට දුන්නේය.

"ඇයි ඒ ගැන ඔබේ හිතේ සැකයක් තිබුණේද?" නිව්කමෙන් විමසුවේය.

"සතුටුදායක සාක්ෂි ලැබෙන තුරු, මට හැමදෙයක් ගැනම සැකයි" හෝම්ස් කීය. "මිනීමැරුමක් සිදුවුණු ගමන්, මිනීමරුවා ගැන හෝ යොදාගත් ක්‍රම ගැන පූර්ව නිගමනවලට එළැඹීම, සම්පූර්ණයෙන්ම වැරදියි. පුවත්පත්වල බය පළවන වාර්තා, ඒ විදියටම විශ්වාසයට ගැනීම ලොකු මෝඩකමක්."

නිහඬව හෝම්ස්ට සවන් දුන් පොලිස් නිලධරයා අන්තිමේදී යමක් කීමට සැරසුණේය. "එහෙම නම් මහත්මයා, ඔබට දෙන්න තියෙන තොරතුරු හැමදෙයක්ම අපි දුන්නා. එක් දෙයක් හැර. ඒ අර ගින්නෙන් පුළුස්සා දමන්න හැදූ චෙක්පොත ගැන. ඒ ගැන ඔබ දැනටමත් දන්නවා. ඔබටත් මොනවා හරි හොයාගන්න හැකිවුණොත්, ඒ ගැන අපව දැනුවත් කරන්න. අමතක කරන්න එපා."

"මමත් එක් සොයාගැනීමක් කළා" හෝම්ස් කීය.

"ඒ මොකක්ද?"

"අපරාධය සිදුවුණු රටාව" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඇයි ඔබට ඒක පෙනුණේ නැද්ද? කුඩා ගැහැනු ළමයෙක් [illegible], මරණයට පත්කිරීමට තැත්කිරීම, සර් එඩ්වර්ඩ් මිනීමැරුම, අබ්බගාත සිඟන්නෙකුට දරුණු ලෙස පහර දී [illegible] තුවාල සිදුකිරීම. ඒක ගැන ඔබට කියන්න මට අමතකවුණේ දැනුයි. මේ හැම අපරාධයකම, අපට පැහැදිලිව දැකිය හැකි, එක් විශේෂ ලක්ෂණයක් තිබෙනවා. ඒක මොකක්ද කියලා ඔබට පෙනෙනවාද?"

"නැහැ හෝම්ස් මහත්මයා."

"මේ හැම එකකම ඔහු යෙදිලා තියෙන්නේ, යම් අරමුණක් ඉටුකර ගැනීමට නොවෙයි" හෝම්ස් කීය. "මේ ක්‍රියාවලින් පිළිබිඹු වෙන්නේ, හයිඩ්ගේ ඇති දුෂ්ට තිරිසන් ස්වභාවය පමණයි. තමන්ට මොනවා හරිදෙයක් මංකොල්ලකා ගැනීමේ අරමුණක් නෑ. පළිගැනීමේ චේතනාවක් පෙනෙන්න නෑ. කල් ඇතුව සැලසුම් කරගෙන ඉඳලා, කළ අපරාධ නොවෙයි.





දීර්ඝ කාලයක් මේ රටේ සිටි අපරාධකරුවන්ගේ ස්වභාවය ගැන, මං ගැඹුරු අධ්‍යයනයක යෙදිල තියෙනවා. ඒ වුණත් මේ වගේ කෙනෙක්, ඒ අතර හමුවෙලා තියෙනවද කියන එක, මට අවිශ්වාසයි. හෙයා සහ බර්ක් දෙන්නා ගත්තු. ඔවුන් අසරණ මිනිසුන් ඝාතනය කළේ ඇයි? විච්ඡේදනය සඳහා මළසිරුරු අවශ්‍ය වෛද්‍ය ශිෂ්‍යයන්ට විකුණන්න. දොස්තර පාමර් විෂ යොදාගෙන ඝාතන කළේ ඇයි? පෞද්ගලික ධනය වැඩිකර ගැනීමට. ප්‍රශ්නය තියෙන්නේ මෙතැනයි නිව්කමෙන්. මේ විදියට හිතක් පපුවක් නැතිව, අරමුණක් නැතිව, අපරාධ කරන අය, පහසුවට හඳුන්වන්නේ උමතු පුද්ගලයන් ලෙස. නමුත් මේ එඩ්වඩ් හයිඩ් අපට පෞද්ගලිකව හමුවෙලා තියෙනවා. ඔහු පිස්සෙක් නොවෙයි. පිස්සු විකාර අදහස් කිසිවක් ඔහුට නෑ. ඔහු කටයුතු කරන්නේ බොහොම කෛරාටිකව, සූක්ෂමව හිතා බලලා"

"හෝම්ස් මහත්මයා. එහෙනම් ඔබ හිතන්නේ හයිඩ් හැඳින්විය යුත්තේ, මොන වගේ කෙනෙක් කියලද?"

"ඔහු අතිශයින්ම බිහිසුණු, කෲර මනසක් ඇති, තුච්ඡ මිනීමරුවෙක්; නමුත් පිස්සෙක් නොවෙයි" හෝම්ස් කීයේ අසුනෙන් නැගිට, තම හිස්වැස්ම අතට ගනිමිනි.

"කොහොම වුණත්" නිව්කමෙන් කීය. "ඔබට අහම්බෙන් හෝ මොනවා හරි දෙයක් දැනගන්න ලැබුණොත් මට දැනුම් දෙන්න"

"හරි. මුලින්ම දැනුම් දෙන්නෙ ඔබටයි"

අපි එතැනින් පිටත්වී ආවෙමු.

"නිව්කමෙන් එක්ක කතාබහ කිරීමෙන්, ඔබට ලැබුණු ප්‍රයෝජනය මොකක්ද හෝම්ස්?" මා විමසුවේ අප බේකර් වීදිය බලා ආපසු එන අතරේය.

"වෙන මොකුත් නැත්නම් ආත්ම තෘප්තිය වත් ලැබුණා" ඔහු කීවේ තම පයිප්පය දල්වා ගැනීමට මොහොතකට නවතිමිනි. "මේ ගැටලුව විසඳීමේ සම්පූර්ණ බලතල, මා වෙත ලබාදී ඇති බව සඳහන් ලියුම, ඔහු අතට ගත්තේ සැකයෙන්. ඒකෙ පහළ මහේජිනගේ අත්සන සහ මුද්‍රාව දුටුවාම, ඔහු ක්ලාන්ත නොවුණා විතරයි"

"මං හිතුවා ඔහුට හෘදයාබාධයක් හැදීගෙන එනවද කියලා" මම කීවෙමි.



www.sinhalaelibrary.com

"............... ඔව් වොට්සන්" හෝම්ස් කීවේ සතුටෙන් සිනාසෙමිනි. "මිනිහට ජීවිතේටම ඇතිවෙලා නැතුව ඇති, එහෙම කම්පනයක්. ප්‍රායෝගික පැත්තෙන් බැලුවාම, මේකෙ වාසියක් තියෙනවා. මගේ පරීක්ෂණයට බාධාකරන්න ඉදිරිපත්වෙන කවුරුහරි ඉන්නවා නම්, ඔවුනුත් නිශ්ශබ්ද වෙනවා"

අප බේකර් වීදිය දිගේ ඇවිද ආවේ, අපේ නිවහන දෙසට ය. පාරේ අනෙක් පැත්තේ කුලීරියක් නැවැත්වූයේ මහහඬක් නංවමිනි. එයින් බිමට බට මිනියා, හරිහැටි පාර දෙපසවත් නොබලා, පාර හරහා පැන්නේය. අනතුරකට ළං නොවී ඔහු බේරුණේ අනූනවයෙනි. විස්කි බෝතල් අඩංගු ලී පෙට්ටි පටවාගත් කරත්තයක් පාරේ ගමන් කළේ ඉතා වේගයෙනි. අමුත්තා, එම රියේ අශ්වයින්ගේ ගැටීමට ඔන්න මෙන්න කියා තිබියදී, ඔහු අපේ පැත්තට ඇදගැනීමට හෝම්ස් සමත්විය. අමුත්තා අන් කවරෙකුවත් නොව නීතිඥ අටර්සන් මහතා බව දැක, අපි පුදුමයට පත්වීමු. ඔහුගේ මුහුණ තද රත්පැහැයට හැරී තිබිණ. හුස්ම ගැනීමට අපහසු රෝගියෙකු ලෙසින්, ඔහු ආශ්වාස ප්‍රශ්වාස කළේ ය. ඒ අතරේ ඔහුගේ මුහුණෙන් ඩහදිය වැගිරිණි.

"අටර්සන් මහත්මයා? මේ මොකද? ඔබට අසනීපයක්වත් ද?" හෝම්ස් විමසුවේය.

නීතිඥයා එය ස්ථිරකරන අයුරෙන් හිස සොලෙව්වේ හතිදමමිනි. "මං හිතන්නේ හිතේ කලබලයක් නිසා ඇතිවුණු ක්ලාන්ත ගතියක් වෙන්න ඇති" මම කීවෙමි. "කොහේට හරි එක්ක ගිහින් හාන්සිවෙන්න සැලැස්සුවොත් හරි.........."

"කොහේටද මේ හදිසියට යන්නෙ?" හෝම්ස් ඇසුවේ වටපිට බලමිනි. "ආ අර තියෙන්නේ සිම්සන්ගේ අවන්හල" හෝම්ස් කීය. "අපි එතැනට යමු. හාන්සිපුටුවකට වෙලා ටික වෙලාවක් ඉඳිද්දී ඕක හරියාවි. ඕනෙ නම් ෂෙරි වීදුරුවක් දෙකක් බොන්නත් බැරියැ. එතකොට හිතේ කලබල ගතියත් අඩුවෙලා යාවි."

අපි අවන්හලේ කොනේ පිහිටි කාමරයක් ඉල්ලා ගතිමු. ඔහු වතුර වීදුරු දෙකක් ඉල්ලා සිටියේය. එය පානය කළ පසු ඔහුගේ ක්ලාන්ත ගතිය අඩුවූ අයුරු මම දුටුවෙමි. සේවකයෙකු ගෙන ආ බ්‍රැන්ඩි වලින් ස්වල්පයක්, අපි අටර්සන් මහතාට බීමට දුන්නෙමු. මඳවේලාවක් ගතවෙද්දී ඔහුගේ කැලඹුණු ස්වභාවය පහවී ගිය බැව් අපට දකින්නට ලැබිණ.





"අටර්සන් මහත්මයා. දැන් අපට කියන්න" හෝම්ස් කීය. "මොකක්ද ඇතිවෙලා තියෙන ප්‍රශ්නෙ? ජෙකිල් ගැන ප්‍රශ්නයක්ද?"

"ඔව්" අටර්සන් කීය. "මං ඔබ හමුවෙන්න බේකර් වීදියට ගියා. ඔබ බැහැර ගිය බව, නිවස හිමිකාරිය මට කිව්වා. හෝම්ස් මහත්මයාට මතක නේද මේ ලියුම?"

සාක්කුවෙන් අතට ගත් ලිපියක්, ඔහු අපට පෙන්වීය.

"ඔව්" හෝම්ස් කීවේ එය පරීක්ෂා කිරීමෙන් පසුවය. "මාස තුනකට විතර කලින් මේක ඔබ මට පෙන්නුවා නේද? මේ හයිඩ් විසින් ජෙකිල් වෙත එවා තිබූ ලියුමක් නේද?"

"හරි" අටර්සන් කීය. "එදා හැන්දෑවේ මං මගේ ලිපිකරු ගෙස්ට් මහත්මයා එක්ක කතාබහ කරමින් සිටියා. ඒ වෙලාවෙ තමයි මට ජෙකිල්ගෙන් ලියුමක් ලැබුණේ. ඒ ඔහු සමග රෑ කෑමට ආරාධනාවක් කරලා. ගෙස්ට් මහත්මයා, අත්අකුරු විශ්ලේෂණය කරමින්, ඒ ගැන අධ්‍යයනය කරන කෙනෙක්. මං ඔහුට දුන්නා ජෙකිල් මට එවූ ඇරයුමත්, හයිඩ් ලියා තිබූ මේ ලියුමත්"

"ඉතින්?"

"ඔහු මඳ වේලාවක් ලියුම් දෙක සංසන්දනය කළා. ඉන්පසු ඔහු කී දේ ඔබට හිතාගන්න පුළුවන්ද හෝම්ස් මහත්මයා?" අටර්සන් මහතා විමසුවේ දෙනෙත් විවර කරගෙන අප්‍රමාණ භයකට පත් විලසිනි.

"ඔව් පුළුවන්" හෝම්ස් පිළිතුරු දුන්නේ සැහැල්ලුවෙනි. "ලියුම් දෙකම ලියා තිබෙන්නේ එකම පුද්ගලයකු විසින් බව. එහෙම නේද?"

"ඔව්" නීතිඥයා කීය.

"ගෙස්ට් මහත්මයා කියා ඇති දේ හරියටම හරි" හෝම්ස් කීය. "මං ඒ වෙලාවෙත් ඔබට ඒක කිව්වා නේද. මට හොඳටම සහතිකයි ලියුම් දෙකේම අත්අකුරු එකම පුද්ගලයකුගේ. නමුත් එක ලියුමක් ලියද්දී, අත් අකුරු වෙනස් කරන්න උත්සාහයක් දරල තියෙනවා. නමුත් ඒක සාර්ථක වෙලා නැහැ. ගෙදර සේවකයා ඔබට කිව්වේ මොකක්ද? එදා කිසිකෙනෙක් ගෙදරට ලියුමක් අරගෙන ආවෙ නැහැ කියලා. එතකොට හැමදෙයක්ම පැහැදිලියි. හයිඩ් ලියුවා කියන ඔය ලියුමත්, ජෙකිල් විසින් වංචනිකව සකස් කළ ලියුමක්........"

"........... නමුත් ඒ වෙලාවෙ ඔබ එහෙම දෙයක් මට ඇඟෙව්වෙවත් නැහැ නේ හෝම්ස් මහත්මයා?"



www.sinhalaelibrary.com

"ඔව්, ඒකට හේතුව මේකයි" හෝම්ස් කීය. "මගේ ඒ උපකල්පනය පිළිගන්න, ඒ වෙලාවෙ ඔබෙ කැමැත්තක් තිබුණෙ නෑ. එහෙම දෙයක් විශ්වාසකරන්න, ඔබේ හිතේ සූදානමක් තිබුණෙ නෑ. ඉතින් මං නිශ්ශබ්දව හිටියා. දැන් බලන කොට මගේ අතිනුත් වැරැද්දක් වෙලා තියෙනවා. දන්නා සත්‍ය තොරතුරු මං පොලීසියට වසන් කරලා! ඒ ඔබ සහ ඔබේ අනුග්‍රාහකයා වෙනුවෙන්, අටර්සන් මහත්මයා. මේ තොරතුරුත් අරගෙන ඔබ මාස තුනකට කලින් මා ළඟට ආවෙ නැත්තෙ ඇයි? ඒකට මොකක්ද ඔබ දෙන පිළිතුර?"

අටර්සන්ගේ මුහුණ ලැජ්ජාවෙන් රතුවිය.

"හොඳයි. මට ඒකට උත්තරයක් අවශ්‍ය නෑ" හෝම්ස් කීය. "මොකද අද, මේ හදිසියේ ඔබට මාව හමුවෙන්න උවමනා වුණේ?"

"හෝම්ස් මහත්මයා" අටර්සන් කීය. "මං හිතාගෙන හිටියේ ජෙකිල් ගැන, මං තරම්ට හොඳින් දන්න වෙනිං කෙනෙක් නැහැ කියලයි. මං වගේ හිතවත් මිතුරෙක් ඔහුට නැහැ කියලයි. නමුත් ඔහු තමන්ගේ උතුම් වෘත්තියත්, කීර්ති නාමයත් පරදුවට තියල කරන්නේ මොකක්ද? නුවණ, අධම මිනීමරුවෙක්ව ආරක්ෂා කරනවා. දැන් මගේ හිතේ සාධාරණ සැකයක් පහළවෙලයි තියෙන්නේ. මගේ මිත්‍ර ජෙකිල්, දැන් සිහිවිකල් වුණු උන්මත්තකයෙක්ද? අපේ පිස්සන් කොටුවල තත්ත්වය ඔබ දන්නවා නේ. දෙවියනේ! ජෙකිල්ට එහෙම තැනකට යන්න වුණොත්, මොන අපරාධයක්ද? ඒක ජීවත්ව ඉඳිද්දීම ඔහුට, මරණයේ දුක විඳින්නට සැලැස්වීමක්."

මඳවේලාවක් නිහඬව කල්පනා කළ අටර්සන් යළිත් කථා කළේය.

"ජෙකිල් ගේ ජීවිතයට, හයිඩ්ගෙන් ලොකු බලපෑමක් එදා තිබුණු බව ඇත්තයි. කණගාටුවෙන් වුණත් ඒක මට පිළිගන්න වෙනවා. කොහොම වුණත් ඒක කාලයක් ගතවෙද්දි ඒ තත්ත්වය වෙනස්වුණා. එවිට හයිඩ්ගේ හොල්මන් ආත්මය, අපි දෙන්නාගේම ජීවිතවලින් ඉවත්වුණා. මට තේරුණෙ එහෙමයි.

මගේ හිතවත් මිත්‍ර ජෙකිල්ගෙ ජීවිතය, යහපත් අතට හැරෙන ආකාරයක් තමා, එදා මට පෙනුණෙ. මං ඒක බලාගෙන හිටියෙ හරිම සන්තෝෂයෙන්. හරියට, ඔහුගේ තරුණ කාලයේ අදහස් සමග නැවත ඉපදීමක් වගෙයි. පිස්සෙකු වගේ හැසිරෙන්නේ





නැතුව, ජෙකිල්, පරණ මිත්‍ර සම්බන්ධතා අලුත් කරගත්තා. කලින් විදියට රෝගීන්ට ප්‍රතිකාර කරන්න පටන්ගත්තා. කලින් වගේම පුණ්‍යායතන, වැඩිහිටි නිවාස වලට ආධාර කරන්න පටන්ගත්තා. වෙනෙකක් තියා ඉරිදාට දෙව්මැදුරට ගිහිං, දේව මෙහෙයටත් සහභාගීවෙන්න පටන්ගත්තා. දෙව්මැදුරට යන එක නම්, ඔහු මෑත කාලයක කළ දෙයක්වත් නෙමෙයි. මට මේ වෙනස අදහාගන්න බැරිවුණා. ඔහුව අපායට ඇදගෙන යන්න ආ, අර හයිඩ් නමැති යක්ෂයාගේ ආත්මයෙන් ගැළවුණේ කොහොම ද? ඒක කරගත්තේ මොන විදියේ හූනියම් කැපීමකින්ද කියලා, මං පුදුමයට පත්වුණා. ඉතින් දැන් ඔබට තේරෙනවා ඇති, පහුගිය මාස තුනක කාලයක්, මං නිශ්ශබ්දව හිටියේ ඇයි කියලා. සර් ඩැන්වර්ස් ඝාතනයෙන් පස්සේ, හයිඩ් ආගිය අතක් නැතිවුණා. ජෙකිල් හොඳ පැත්තට හැරිලා, ඉතින් හියාඳේ ගියාවෙ; පරණ දේවල් හාරා අවුස්සන්නේ මොකටද කියලා මට හිතුණා.

ඒ අපරාධයෙන් පස්සේ පළමුවැනි සැරේට, ඔන්න ආයෙමත් ජෙකිල්ගේ වෙනසක් වෙලා. මට එන්න බැරි විදියට ඔහුගේ ගෙදර දොර මට වැහුවේ, ජනවාරි 12 වැනිදා. ඔහුගේ ගෘහසේවකයා — පූල් මට කිව්වා, දොස්තර මහත්තයා අසනීපයෙන්; ඒ නිසා කිසිකෙනෙකු හමුවෙන්න කැමැති නෑ කියල. ඒ වෙලාවෙ මං ඒක ඒ තරම් ගණන් ගත්තෙ නෑ. ඒකෙ බැරෑරුම් බවක් මගේ හිතට ආවෙත් නෑ. ඒ මොකද අපි ඔය ගෙදර රාත්‍රී භෝජන සංග්‍රහයකට සහභාගි වුණේ, ඊට දවස් හතරකට කලින් නේ. ඇයි දොස්තර හේස්ටි ලැනියන් පවා, මා එක්ක ඒ භෝජන සංග්‍රහයට සහභාගිවුණා නේ. අපි එදා හරියට විනෝදවුණා. එදා අපට දකින්න ලැබුණේ, ඉතාම සන්තෝෂදායක, අනාගතයක පෙරනිමිති. අවුරුදු දහයක් තිස්සේ අමනාපවෙලා හිටි දොස්තර මහත්තුරු දෙන්නා, ඔවුන්ගේ හිත් නොහොඳකම් සදහටම විසඳාගත්තා, වගෙයි. මට එදා පෙනුණේ එහෙමයි.

ඊළඟට දවස් දෙකකට පස්සේ මම එහේ ගියා. ඒ කියන්නේ 14 වැනිදා. කෝ, වැඩක් වුණේ නෑ. ඊළඟට මං 15 වැනිදාත් ගියා. ඒත් වැඩක් වුණේ නෑ. දොස්තර ජෙකිල්ගේ ඔළුවට ආයෙමත් පරණ පිස්සුව වැලඳීගෙන එනවද? මගේ හිතේ ඒ වගේ සැකයක් ඇතිවුණා. මේක මගේ මොළයට මහා වධයක් වුණා, හෝම්ස්



www.sinhalaelibrary.com

මහත්මයා. දින දෙකක්ම මේ ගැන හිත හිතා ඉඳල, අන්තිමේදී ඊයෙ රෑ මං ගියා දොස්තර ලැනියන් හම්බවෙන්න. ඒ කියන්නේ 17 වැනිදා"

මේ අවස්ථාවේ නීතිඥයාගේ හිතේ තිබූ කැලඹීම, යළිත් මතුවී ආ බැව් පෙනිණ. මේසය මතවූ බෝතලයෙන් වීදුරුවට බයිත්වී වත්කරගත් ඔහු, එක හුස්මට එය ගිලදැම්මේය. මිනිත්තු දෙකක් ගතවෙද්දී, සුදුමැලිව තිබූ මුහුණ රෝස පැහැයට හැරිණ. සිතේ දිරිය උපදවාගත් අටර්සන් කථාව යළිත් පටන්ගත්තේය.

"හෝම්ස් මහත්මයා. මිනිසුන්ගේ ස්වභාව වෙනස් වෙන හැටි, මම ජීවිත කාලයක් තිස්සේ දැකල තියෙනවා. ඒ වුණත්, දොස්තර ලැනියන් මේ දවස් නවයකට වෙනස් වෙලා තියෙන හැටි දුටුවාම, මං භීතියෙන් ගල්ගැහුණා. අන්තිමට ඔහු දුටුව වෙලාවේ, ඔහු තමන්ගේ වයසෙ හැටියට, නිරෝගී ශක්තිමත්, මනුස්සයෙක්ව හිටියා. නමුත් ඊයේ? ඊයේ රාත්‍රියේ මං දුටුවේ මරණාසන්න පණ අදින රෝගියෙක්!

ඔහුට තිබුණු නිරෝගී රෝස පැහැති පෙනුම, සම්පූර්ණයෙන්ම ඉවත්වෙලා ගිහින්. අවතාරයක් වගේ සුදුමැලිවෙලා. මුහුණ ඇදී ගිහින්, හම එල්ලා වැටී තිබුණා. ඔහු කතා කළේ බොහොම අමාරුවෙන්, වෙවුලන හඬකින්. මට ඇතුළුවෙන්න, ඔහු දොර විවෘත කළා. මට ලැනියන්ව දකින්න ලැබුණේ මරණාසන්න රෝගියෙකු විදියට. වසන්ත සෘතුව උදාවෙනවා දකින්න, ඔහු ජීවත්වෙයිද කියන එක මට සැකයි. ලැනියන් මා එක්ක කතාකළේ හරි අමාරුවෙන්. ඔහු මා සමග කී දේ මං අහගෙන හිටියේ, දැඩි ශෝකයකින්.

"මං ඉතාම බරපතල කම්පනයකට ගොදුරුවුණා අටර්සන්" ඔහු කිව්වා. "ඒක නිසා මම කායිකවත් මානසිකවත් මහා විනාශයකට ඇදවැටුණා. මං දුටුවෙ මොකක්ද කියලා මගෙන් අහන්න එපා. මට තවත් ඉතිරිවෙලා තියෙන්නේ මාරයා ළඟට යෑම පමණයි"

"ඔබගේ මේ අසනීප තත්ත්වය වෙනුවෙන් වෛද්‍යවරයෙකුට කළ හැකි දෙයක් නැද්ද?" මං ඇහුවේ දැඩි ශෝකයකින්. "අපි දොස්තර ජෙකිල්ගෙන් අහල බලමුද?"

"ජෙකිල්? ජෙකිල්?" ලැනියන්ට කෑගැහුණා. "අටර්සන් දෙවියන්ගේ නාමයෙන් ඒ නම මතක් කරන්නවත් එපා. මට සැනසිල්ලේ මැරෙන්න ඉඩදෙන්න අටර්සන්. මට ඔහු ගැන මතක්





"ඒක හරි බැරෑරුම් වැඩක්" මම කීවෙමි. "අටර්සන් කිව්වේ ඇත්ත නම්, ඔය ප්‍රශ්නය ගැන ලැනියන්ගෙන් අහන්න සෑමත් අවදානම්. මගේ මැදිහත්වීම නිසා මරණාසන්නව හිටි මිනිහෙක්, මිනිවළට යන ගමන ඉක්මන් වුණා කියල, දොස්තරට චෝදනාත් ඉඩ තියෙනවා. ඒවා අහන්න මං කැමති නෑ."

"ඔබේ කතාව ඇත්ත" මගේ මිත්‍රයා කීවේ සිගරැට්ටුව දල්වා ගනිමිනි. "එහි ඇති අවදානම දුක්කර බව නිසාමයි, මං මේ කටයුත්ත ඔබට භාරදෙන්නේ. මරණාසන්න කෙනෙකුගෙන් ප්‍රශ්න කළ යුත්තේ කොහොමද කියන කරුණ, හොඳින් දන්නේ වෛද්‍යවරයෙක්. අනෙක ලැනියනුත් වෛද්‍යවරයෙක්. ඒ නිසා මේ කටයුත්තට ඔබට වඩා හොඳ කෙනෙකු ගැන, මට හිතන්නවත් බෑ. මට හිතෙනවා ඔහු ඔබගේ වෘත්තිය සගයකු නිසා, ලැනියන් ඔබට විශේෂයෙන් සලකාවි කියල. ඒ කියන්නේ වෙනත් කෙනෙකුට හෙළි නොකරන කරුණු, ඔබට හෙළි කරන්න ඉඩ තියෙනවා. මේ අපට ලැබෙන අන්තිම අවස්ථාව වෙන්න පුළුවනි. වොට්සන්, ජෙකිල්ගේ සැඟවුණු රහස මොකක්ද කියලා, ලැනියන්ගෙන් අහන්න, මතක තියාගන්න, දොස්තර ජෙකිල්ගෙ වහල යටට යළිත් යෑම අපට අපහසුයි. ඒ මොකද අපි දෙන්නා නැවතුරටත් එහේදී, සාදරයෙන් පිළිගන්න අමුත්තන් නෙමෙයි. ඒ වුණත් මේ ගැටලුවේ විසඳීම තියෙන්නේ, ඒ කෙළවරේ කියලයි මට හිතෙන්නේ"

"ඒ අතරේ ඔබ මොනවද කරන්නේ?" මම ඇසීමි.

"මං කළ යුතු රාජකාරි, රාශියක් තිබෙනවා වොට්සන්. මුලින්ම බයිබලයේ හොඳම දුම්කොළවලින්, අවුන්ස දෙකක් මිලට ගත යුතුයි. ඒක මගේ වෙරිවුඩ පයිප්පයට පුරවමින්, සෑහෙන වෙලාවක් කල්පනා කරල බලන්න සිදුවෙනවා. ඊළඟට අවශ්‍යවුණොත්, මගේ වයලීනයේ තත් පිරිමැදීමක යෙදෙන්නත් සිදුවෙන්න පුළුවනි.........

ඒක නෙමෙයි. ඔන්න ඇත එනවා කුලීරියක්. ඔබට මතකද ලැනියන්ගේ ගෙදර ලිපිනය? විශිෂ්ටයි. සියුම් දේවල් හොඳින් මතක තියාගන්න, ඔබට තියෙනවා අපූරු දක්ෂතාවයක්. ඔබේ දක්ෂතා අතුරින්, ඒක මං විශේෂයෙන් අගය කරන ගුණාංගයක්......... එහෙනම් මං ඔබව බලාපොරොත්තුවෙනවා රෑ කෑම වෙලාවට බේකර් වීදියට"



www.sinhalaelibrary.com

10

# කුලිරියේ හුන් මිනිසා

දොස්තර හේස්ටි ලැනියන් වාසය කළේ කැවෙන්ඩිෂ් චතුරශ්‍රයේ, පැරණි සුඛෝපභෝගී නිවසකය. තට්ටු හතරේ ගොඩනැගිල්ලක් වූ එය පිහිටා තිබුණේ, හාර්ලි වීදිය හා විග්මෝර් වීදිය එකිනෙක හමුවන මංසන්ධියේ ම ය. හාර්ලි වීදිය වෛද්‍ය විශේෂඥයන් සඳහා සුප්‍රකට පෙදෙසකි.

දසදහස් ගණන් රෝගීන්ගේ පාවහන්වල ගැටීමෙන් ගෙවුණු, තරප්පු පෙළ නැග ගිය මට දකින්නට ලැබුණේ, ඕක් ලීයෙන් තැනූ විශාල දොරකි. මා සීනුව නාදකළ සැණෙකින් දොර විවෘත විය. මා අසලටම මුහුණ දිගු කළේ ගෘහසේවකයාය. සෘජු හැඩිදැඩි සිරුරක් හා රළු මුහුණක් තිබූ ඔහුට, පෞද්ගලික ආරක්ෂක තනතුරක් ද ඇතැයි මට සිතිණ.

"මොකද?" ඔහු විමසුවේ කර්කශ අයුරෙනි.

"මගේ නම දොස්තර වොට්සන්" මා පැවසුවේ මගේ ආගන්තුක පත්‍රය ඔහු අත තබමිනි. "මට දොස්තර ලැනියන් හමුවෙන්න උවමනායි"

මා දුන් ආගන්තුක පත අතට ගැනීමට වත් උනන්දු නොවී, සේවකයා කථාකළේය.

"ලැනියන් දොස්තර මහත්මයා ඉන්නේ තදබල ලෙස අසනීප වෙලා. කාටවත් හමුවෙන්න තරම් සනීපයක් ඔහුට නෑ." කී සේවකයා දොර වසා දැමීමට සූදානම් විය. මෙවැනි අවස්ථාවලදී හෝම්ස් ගන්නා පියවර කුමක්දැයි මම දැනසිටියෙමි. මම ද එවැන්නක් කිරීමට තීරණය කළෙමි. සේවකයාට දොරවැසීමට නොහැකි වන සේ මගේ සපත්තුව උළුවස්සෙන් ඇතුළට තැබීමි.

වේගයෙන් වසා දැමූ දොර මගේ සපත්තුවේ වැදිණ. මට දැනුණේ දැඩි වේදනාවකි. දත්මිටිකමින් මා එය ඉවසාගත්තේ මෙය කළ යුතුම කටයුත්තක් බැවිනි.

"ඔහු අසනීපයෙන් බව මං දන්නවා" මම කීවෙමි. "ඒ වුණත් ලැනියන් මහත්මයා මට කතාකරන්න කැමැතිවේවි. මං ආවෙ





ඔහුගේ මිත්‍රයා දොස්තර ජෙකිල් ගැන කතාබහකට. හරියටම කියනවා නම් දොස්තර ජෙකිල් සහ හයිඩ් මහතා ගැන.........."

යළිත් වරක් මගේ මුහුණ බැලූ සේවකයා, මෙවර මොහොතක් කල්පනා කළේය.

"හොඳයි. එහෙනම් ඔහොම ඉන්න ටිකක්. මං අහල එන්නම්" කී ඔහු, යළිත් දොර වැසීමට සූදානම් විය. මම මගේ කකුල ඉවතට ගත්තෙමි.

එහි තිබූ වේදනාව ඉක්මනින් අඩුවූයේ නැත. කකුලේ කුඩා අස්ථියක් බිඳී ගියා වත් දැයි මගේ හිතේ සැකයක් ඇතිවිය. දොරළඟ පඩිය මත හිඳිමින්, මම මගේ කකුල පරීක්ෂා කර බැලුවෙමි. ඒ අතරේ සේවකයා යළිත් පැමිණ දොර විවෘත කළේය.

"දොස්තර මහත්තයා කැමැතියි ඔබට හමුවෙන්න" කී ඔහු, මා නිවසට ඇතුළුවනතුරු පසෙකට වී සිටියේය.

සේවකයා මා කැඳවාගෙන ගියේ, රෝගීනට රැඳී සිටීමට තිබූ විවේකාගාරය හා වෛද්‍යවරයාගේ කාර්යාලය හරහාය.

ඒ කාමරයේ කෙළවර හාන්සිපුටුවකට වී සිටි අයෙක්, අපහසුවෙන් නැගිටීමට උත්සාහ කළේය.

"දොස්තර වොට්සන්........" ඔහු දුර්වල හඬකින් කියනු ඇසිණ. "මං ඔබව හඳුනාගෙන ඉන්න මොකුත් හේතුවක් තියෙනවද?"

"එහෙම විශේෂ හේතුවක් නම් නැහැ කියලයි මට හිතෙන්නේ" මම කීවෙමි. "වෛද්‍යවරුන් වුණත් අපි යුග දෙකක අය නේ"

"ඒ වුණත් හෙන්රි ජෙකිල් කියල, අපි දෙන්නම හඳුනන කෙනෙක් ඉන්නවා. එහෙම නේද?" ලැනියන් පැවසුවේ ඉමහත් පිළිකුලෙනි. මීළඟට ඔහු කාමරයේ මැද, හොඳින් ආලෝකමත් වූ තැනට ඇවිද යාමට උත්සාහ දැරුවේය. වෛද්‍යවරයාගේ පෙනුම මට හරිහැටි දැකගන්නට ලැබුණේ එවිටයි.

මම මරණය හා මරණාසන්න මිනිසුන් ඕනෑතරම් දැක ඇත්තෙමි. එහෙත් මරණයේ භයංකරත්වය, මේ තරමට, මුහුණෙන් මෙන්ම සිරුරෙන් ද පිළිබිඹු වූ අයෙකු, මම දැක නැත්තෙමි. ඔහුගේ දෙනෙත් ඇතුළට ගිලී තිබිණි. මුහුණ සුදුමැලි වී සම එල්ලා වැටුණේ, දීර්ඝ කාලයක් තිස්සේ බරපතල ලෙස රෝගීව සිටි අයෙකුගේ විලසිනි. කුසට හරිහැටි අහරක් නොලැබුණු නිසා, කම්මුල් ඇතුළට ගිලාබැස තිබූ අයුරු හොඳින් පෙනිණ. ඇස් වටා



www.sinhalaelibrary.com

පිහිටි දම්පැහැති අඳුරු සෙවණැලි වලින් කියැවුණේ, රාත්‍රියට හරිහැටි නින්දක් නොලැබීම බවට සැක නැත. තම වයස්ගත මිත්‍රයා, වසන්ත සමය ළඟාවනතුරු ජීවත්වේද යන්න සැකසහිත බැව් අටර්සන් කීය. නමුත් මට සිතුණේ ලැනියන් එතරම් කාලයක් වත් ජීවත්වේද යන්න අවිනිශ්චිත බවය.

"මං දන්නවා, මා දුටුවාම ඔබට හිතෙන දේවල්" ලැනියන් කීවේ, මා ඔහු දෙස බැලූ අනුකම්පා සහගත ආකාරය තේරුම් ගනිමිනි.

"මේ ලෝකයේ, තවත් සති දෙකකට වැඩි කාලයක් මට ඉතිරිවෙලා නෑ" ඔහු කීය. "මං ඒක හොඳාකාරවම දන්නවා. මං මේ අමාරුවෙන් උත්සාහ කරන්නේ, රෝගීන් ගැන විස්තර අඩංගු ලිපිගොනු ටික පිළිවෙළක් කරන්න. මගේ අනුප්‍රාප්තිකයාට ඒ පහසුව සලසන්න ඕන. ඒක මගේ රෝගීන් වෙනුවෙන් මං කරන යුතුකමක් වේවි. මං මලත් රෝගීන්ගේ යහපත වෙනුවෙන්, මට කළ හැකි හැමදෙයක්ම කරල තමයි මං මැරෙන්නෙ"

"අපි ටිකක් වාඩිවෙලා කතාකරමුද?" මා කීවේ, ඔහු අපහසුවෙන් නැඟිට සිටි අයුරු, මට බලාසිටීමට නොහැකි වූ තැනය. ඔහුගේ අසුන අසල වූ තවත් සැපපහසු පුටුවක් දෙසට ලැනියන් අත දිගු කළේය.

"මං ආවේ විශේෂඥ රහස් පරීක්ෂක ෂර්ලොක් හෝම්ස් මහත්මයාගේ නියෝජිතයෙකු ලෙස" මම කතාව ඇරඹීමි. "මාස තුනකට ඉහතදී සිදුවුණු සර් ඩැන්වර්ස් කෑරූ මිනීමැරුම ගැන ඔබ දන්නවා ඇති. ඒ ගැන වැඩිදුර පරීක්ෂණ තවමත් පැවැත්වෙනවා. ඒ ගැටලුව විසඳාදීම, රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශය මඟින්, හෝම්ස් මහත්මයාට භාරදීලයි තියෙන්නේ. මෙයට සම්බන්ධ අපරාධකාරයා ගැන, හෝඩුවාවක් යොමුවෙලා තියෙන්නේ දොස්තර ජේකිල් දිහාවට. ඔබ සහ ජේකිල් පැරණි මිත්‍රයන් බව මට අහන්න ලැබුණා?"

"හෙන්රි ජේකිල් සහ මා අතරේ බොහොම කලකට පෙර මිත්‍රත්වයක් කියා දෙයක් තිබුණා. නමුත් දැන් ඒවා ඔක්කොම ඉවරයි. මං දැන් සලකන්නේ ඔහු මියගිහින් කියලයි"

"ඒකට හේතුව මොකක්ද කියල මං ඇහුවොත්"

"ඇහුවට කමක් නෑ. ඒත් මගෙන් උත්තරයක් නම් ලැබෙන්නෙ නෑ"





ප්‍රශ්නය වෙනත් කෝණයකින් ඉදිරිපත් කිරීමට මම කල්පනා කළෙමි.

"එහෙම නම් ඔබ දෙදෙනාගේ මිත්‍රත්වය ඇරඹුණු කාලය ගැන මට කියන්න. කොයි කාලෙද්දි ඔබ දෙදෙනා හමුවුණේ?"

"අවුරුදු ගණනාවකට කලින්" ලැනියන් කීය. "ඒක මතක්කරගන්න, මට ශක්තියකුත් නෑ, උවමනාවකුත් නෑ. අපි දෙන්නා වෛද්‍යවරුන් හැටියට, එඩින්බර්ග් සරසවියෙන් සමත්වුණේ එකම අවුරුද්දේ, ඒ' 55 අවුරුද්දෙ. හෙන්රි ජේකිල් මේ ලෝකයට නිදහස් කළ ඒ අවුරුද්ද, ඉතාම අවාසනාවන්ත එකක්."

ඔහුගේ කටහඬෙන් ප්‍රකාශ වූයේ වෛරයයි. එයින් ලේ ගමන වැඩිවී, ඔහුගේ සිදුරු ලේ නහරයක් පුපුරා යා දැයි මම බියට පත්වීමි.

"එසේ හිත සන්සුන් කරගන්න මහත්මයා" මම කීවෙමි. "මට දැනගන්න ලැබුණු හැටියට, ඔබ දෙදෙනා අතර විරසකයක් ඇතිවුණේ, අවුරුදු දහයකට පමණ කලින්. මොකක්ද ඒකට හේතුව?"

ඔහු කෙළින් පිළිතුරක් දීමට පැකිළුණේය. "දන්නෙ නැද්ද මේ වගේ දේවල්? යම් විද්‍යාත්මක කරුණක් ගැන, අප දෙදෙනා අතර මත ගැටුමක් ඇතිවුණා. ඒ මොකක් ගැනද කියලා, මට දැන් හරියටම මතක නෑ. ඔබත් වෛද්‍යවරයෙක් නේද? සමහර වෙලාවට ප්‍රතිකාර ක්‍රම ගැන, රෝග විනිශ්චයන් ගැන, ගැටලු තියෙනවා. අපේ මතය හැර අනෙක් අයගේ මත පිළිගන්න අපි කැමති නෑ"

"නමුත් අවුරුදු දහයක් තිස්සේ අමනාප කමක් රඳවාගන්න තරම් ඒක බලවත් වුණා?" මම ඇසීමි. "ඒ වුණත් පහුගිය දිනෙක, ජේකිල්ගේ නිවසේ තිබූ රාත්‍රී භෝජන සංග්‍රහයට, ඔබ සහභාගී වුණා. එහෙම නේද? තිබුණු අමනාපකම් ඔක්කොම අමතක කර දැමුවා. එහෙම නේද?"

"මං වරක් ඔබට කිව්වා" ලැනියන් කීවේ ශබ්දය වැඩිකරමිනි. "මං සලකන්නේ ජේකිල් මියගිහින් කියල. ඔහු ගැන කතාකරන්නවත් මං කැමති නෑ!"

"එහෙනම් ඇයි ඔබ මා හමුවෙන්න එකඟවුණේ?"

"මං හිතුවා" ලැනියන් කීය. "ජේකිල් සහ හයිඩ් අතර තිබෙන සම්බන්ධතාවය ඔබ හොඳින් තේරුම් අරගෙන ඇති කියලා. ඒ



www.sinhalaelibrary.com

හැටලුව මොකක්ද කියන එක ඔබ විසඳාගෙන ඇති කියල. ඒ නින්ද මං බලාපොරොත්තු වුණේ ඔබට උදව් කරන්න. ඒ කොහොමද? ඔබ තවමත් නොදන්නා තොරතුරු තියෙනවා නම්, ඒවා සපයාදීල, ඔබ දැනුවත්කරන්න. නමුත් මට දැන් නම් නිතාගන්න වෙලා තියෙන්නේ වෙනත් දෙයක්. ඔබ මං තරම් වත් දේවල් නොදන්නා හැඩයි"

"ලැනියන් මහත්මයා" මම ඔහු ඇමතුවෙමි. "ඒ කතාවෙන් මට තේරෙන්නේ, අප නොදන්නා කාරණා තුනක් ඔබ දන්නා බව. මං ඔබට ආයාචනා කර සිටිනවා, ඒ තොරතුරු හෙළිකරන ලෙසට"

තමාට කියැවුණු එම වාක්‍යය ගැන දොස්තර ලැනියන් පසුතැවිලි වූ බැව් මම දුටුවෙමි.

"මං දන්න දේවල් වලින්, ඔබට ප්‍රයෝජනයක් වෙන්නෙ නෑ" අන්තිමේදී ඔහු කීය.

"මං කියන දේ අහන්න ලැනියන් මහත්මයා" මම කීවෙමි. "ජේකිල් සහ හයිඩ් ගැන අනෙක් හැමදෙනෙකුටම වඩා කාරණා රාශියක්, ඔබ දන්නා පාටයි. ඔබ ඒවා පොලීසියට දැනුම් නොදුන් බව, පසුව හෙළිවෙන්න පුළුවනි. එතකොට මිනිස්සු කියාවි, ඔබත් මේකට ආධාරකාරයෙක් හවුල්කාරයෙක් කියලා"

"ඉතින් මට මොකද?" දොස්තර ලැනියන් ගත් කටටම කීවේය. "පෙබරවාරි මාසෙ මැද වෙනකොට මං මළමිනියක් උසාවිය මගේ මිනීවළ හාරලා, මාව එළියට අරගෙන විත්ති කූඩුවට දාවිද?" අපහසුවෙන් දෙතුන් වරක් හුස්ම ඉහළ පහළ ගත් ඔහු යළිත් කථාව ඇරඹුවේය. "දොස්තර වොට්සන්, මං දන්නවා ඔබ අවංක කෙනෙක්. ඔබ සත්‍යය සොයමින් යන කෙනෙක්. ඒ ගැන ඔබට මගේ අනුකම්පාව හිමිවෙනවා. මං ඔබට එකක් කියන්නම්. මනුෂ්‍යයකු මෙලොව ජීවත්විය යුතු නීතිරීති තියෙනවා. ඒවා පනවා ඇත්තේ සමහරක් රජය මගින්. නමුත් වැදගත්ම සමහරක් සොබාදහම මගින්. අන්න ඒවා කඩා බිඳ දැම්මොත්, ඔබ වැටෙන්නේ අපායක් වැනි නරක ලෝකයකට. ජේකිල් මේ නීතිරීති කඩලා. තමන් මිනිහෙකු හැටියට හඳුන්වා ගන්න, එහෙම කෙනෙකුට අයිතියක් නැහැ. ජේකිල්ව අනුගමනය කරන්න නම් හිතන්නවත් එපා. එහෙම කළොත්, අන්තිමට ඔබත් ඒ අපායටම වැටිලා විනාශවෙනවා"





මඳ වේලාවකට අපි දෙදෙනාම නිශ්ශබ්දව සිටියෙමු. නිහඬතාවය බිඳවැටුණේ, බිත්ති ඔරලෝසුවේ රිද්මයානුකූල ශබ්දයෙන් සහ, ගිනි උදුනේ දරකැබලි ඇවිළෙන ශබ්දයෙන් පමණි.

"ලැනියන් දොස්තර මහත්මයා. එහෙනම් ඊට වඩා දෙයක් ඔබ මට කියන්නේ නැද්ද?" මා විමසුවේ අසුනෙන් නැගිටිමිනි. එය එසේම බව කීමට ඔහු හිස ඉදිරියට නැමුවේ, දුක්මුසු මුහුණක් ප්‍රදර්ශනය කරමිනි.

"සීනුව නාදකරලා මගේ සේවකයා කැඳවන්න. ඔහු මට සේවකයෙක් පමණක් නොවෙයි. මගේ ජීවිතාරක්ෂකයෙක්"

"මට එහෙම හිතුණා" මම කීවෙමි. "ඔබ දීර්ඝ කාලයක්, කාරුණික වෛද්‍යවරයෙක් හැටියට, මහජනතාවට සේවය කළා. දැන් විශ්‍රාමගොස් සිලන්ව ඉන්නේ. ඔබ කළ ඒ සේවය ගැන හැමදෙනෙක්ම දන්නවා. ඉතින් ඔබට හිරිහැර කරන්න මේ ලෝකෙ කිසිම මනුෂ්‍යයෙක්, මේ වහල යටට එවි කියල, මං හිතන්නේ නෑ"

"මනුස්සයෙක් නම් එන්නෙ නැති බව ඇත්තයි" ලැනියන් කීය. "මගේ බය තියෙන්නේ එක්තරා අමනුස්සයෙක් ගැන. දෙවියනේ! ඔහු මගේ වහල යටට ආවොත්.........!"

ලැනියන් මඳ වේලාවක් නිහඬව සිටියේ අවතාරයක් දුටු පුද්ගලයකු විලසිනි. අන්තිමේදී මට පිටව ඒමට ඔහු සමුදුන්නේය. "ඔබට සුභ දවසක්!"

ඔහුට හිස නමා ආචාර කොට මම එතැනින් පිටත්වීමි. යළිත් වරක් හිමවැටෙන්නට පටන්ගෙන තිබිණි. ඒ සමගම වේගවත්ව හැමූ සුළඟේ හිමපතුරු තිබූ නිසා, එහි හිමකුණාටුවක ලකුණු තිබිණ.

ලැනියන්ගෙන් මට සතුටුදායක තොරතුරක් දැනගන්නට නො ලැබිණ. ඔහු අවසානයේ කියුවේ කුමක්ද? "සොබා දහමේ නීතිරීති කඩල, ජේකිල් අපායට වැටුණා. තමන් මිනිහෙකු ලෙස හඳුන්වා ගන්න එහෙම කෙනෙකුට බෑ" ලැනියන් එයින් අදහස් කළේ කුමක් ද? ජේකිල් දැන් උමතුභාවයට පත්වෙලාවත් ද? එහෙම නම් ලැනියන් ඒ බව මට නොකිව්වේ ඇයි? ජේකිල්ට තමන්ගේ මිත්‍රයා අවශ්‍යම මොහොතක, ලැනියන් ජේකිල්ට පිටුපෑවේ ඇයි? ලැනියන් අටර්සන්ට කියා තිබුණේ, තමා බලවත් කම්පනයකට



www.sinhalaelibrary.com

මුහුණ දුන් බවයි. කුමක්ද ඒ කම්පනය.? මගේ මොළයම හිරිවැටී තිබුණේ කිසිවක් සිතාගැනීමට අපහසු අයුරෙනි.

කල්පනාවේ වෙළී ඉදිරියට ගිය මා, පදික වේදිකාවේ ම නොගොස්, ඒ බවක් නොදැනම මහාමාර්ගය අයිනේ ගමන්කර ඇත. මා ඒ බව තේරුම් ගත්තේ වේගයෙන් ගමන්කළ අශ්වකරත්තයක ගැටීනොගැටී අනු නවයෙන් බේරුණු කලය. ඒ කුලීරිය ගමන්කළේ මා ගමන්කළ දිශාවටම ය. එහි සුළංපහරට මගේ හිස්වැස්ම ගැලවී ගියේය.

රිය මා පසුකර යද්දී, කුලීරියේ සිටි මගියා හිස එළියට දිගුකර, මා දෙස විමසිල්ලෙන් බැලුවේය. ඔහුට උවමනා වන්නට ඇත්තේ, පදික වේදිකාවේ නොගොස් මෝඩයෙකු ලෙස මහපාරේ ගමන් කළ මා, අනතුරට ලක්වූවාද යන්න දැනගැනීම විය යුතුය.

කුලීරියේ සිටි ඔහුගේ මුහුණ මා දුටුවේ, එක් තත්පරයක හෝ දෙකක කාලයක් පමණකි. ප්‍රමාණයෙන් විශාල ඒ මුහුණ ඉතා සුවිශේෂ එකකි. වෘකයෙකු වැනි කුරිරු පෙනුමක් තිබූ ඒ මුහුණ, මම එක් ක්ෂණයකින් හඳුනාගත්තෙමි. මගේ මුළු ඇඟම හිරිවැටී ගියේ, මා අප්‍රමාණ භයකට පත්කරමිනි. ඒ, සර් ඩැන්වර්ස් කෑරූ සාහසික ලෙස ඝාතනය කිරීම ගැන, මුළු එංගලන්තයම සොයමින් සිටි භයානක නොමිනිසා ය!



11

# මිනිමරුවෙකු හඹා යෑම

කුලීරිය ඉදිරියට යද්දී, ඇසිපිය නොහෙළා, මම කොපමණ වේලාවක් ඒ දෙස බලාසිටියාද යන්න නොදනිමි. එංගලන්තයේ සෑම අස්සක් මුල්ලක් නෑරම සොයන අපරාධකරුවා, ලන්ඩන් නගරයේ මහජනයා අධික ලෙස ගැවසෙන අඩවියක, නිර්භයව සැරිසරන හැටි! එය විශ්වාසකිරීමටත් අපහසු කරුණක් නොවේද? මවිතයට පත්ව ගල්ගැසුණු පිළිමයක් මෙන්, මම ඒ දෙස බලාසිටියෙමි.

මඳ වේලාවකට පසු ඒ අසිහියෙන් මම යළි සිහි ලැබීමි. තවත් කුලීරියක් මා සිටි දෙසට එන බැව් මට දැකගන්නට ලැබිණි. වහා පාරට පැන, රිය නවත්වන මෙන්, ඒ කුලීරියේ රියැදුරාට සංඥා කළෙමි.

මට යන්තමට දකින්නට ලැබුණේ, එම රියැදුරාගේ රතුපැහැති මුහුණ සහ සුදුපැහැයට පැසී තිබූ ඇහිබැම පමණකි. රිය නැවැත්වූ වහාම මම එයට පැනගත්තෙමි.

"අර ඈතින් වේගෙන් යන, රතුපාට වහලක් තිබෙන කුලීරියක් පෙනෙනවා නේද?" මම කෑගැසීමි. "අන්න ඒක ලුහුබැඳගෙන යමු"

"ඔබ කියන ඕනම දේකට මං ඔට්ටුයි මහත්මයා" කී රියැදුරා, එහි වේගය වැඩිකළේය.

රතුපැහැති කුලීරිය ක්වීන් ඈන් වීදියට හැරෙද්දී, අපි එයට ළංවූයෙමු. කිසිවෙකු ඔහු ලුහුබඳින බව හයිඩ් දැන නොසිටින්නට ඇත. එබැවින් එයට හුඟක්ම ළං නොවී, තරමක ඉඩක් තබා පිටිපසින් යෑමට මම තීරණය කළෙමි. වෙල්බෙක් වීදියේදී දකුණට හැරුණු රිය, විග්මෝර් වීදියේදී 'U' අකුරේ හැඩයට ආපසු හැරිණි. ඔහු, අප ගැන සැක කළ බවට ලකුණක් නොවීය. ඒ පාරේ මඳ වේගයෙන් ගමන් කළ රිය, හදිසියේම මාලිබෝන් පටුමගට හැරෙව්වේය. මේ නිසා අපට එකවරම රිය නවත්වා ගැනීමට සිදුවිණි. පාර හරහා පයින් ගමන් කළ කිහිපදෙනෙකුට අප ඉඩදෙන අතරේ, රතු කුලීරිය පලායන්නට පටන්ගත්තේය.



www.sinhalaelibrary.com

එබ්බට් හයිඩ් අප ගැන සැකකළ බැව්, මම එයින් වටහා ගත්තෙමි. එත් මොහොතකට එය නොපෙනී ගියත් මීළඟ මංසන්ධියේදී යළිත් දක්නට ලැබිණ. ඔවුන් හැරවූයේ ඔක්ස්ෆඩ් මාවතටයි. පාරේ අධික වශයෙන් හිම වැටී තිබූ නිසා, එහි ලිස්සන ස්වභාවයක් තිබිණ. එබැවින් රියේ වේගය වැඩිකිරීමට මගේ රියැදුරාට හැකි නොවිණි. එහෙත් එය නොසැලකූ හයිඩ්ගේ රියැදුරා තම රියේ වේගය වැඩිකළේය. පාරේ ගමන් කළ අය, මරහඬ දෙමින් ඉවතට පිනූහ. තම රිය ඩියුක් වීදියට හැරවූ ඔහු එතැනින් බිරුක් වීදියට පිවිසුණේය.

කෙසේ හෝ එය ලුහුබැඳ යාමට අපි දැඩි උත්සාහයක යෙදුණෙමු. දිය වූ හිම මඩ සමග ගලායාමෙන්, පාර පුරා මඩ වතුර පිරී තිබිණි. අපේ රියේ වේගය වැඩිවෙද්දී, එය පොලිස් භටයෙකුගේ අවධානයට යොමුවූ බැව් මම දුටුවෙමි. ග්‍රොව්නර් චතුරශ්‍රය අසලදී ඔහු පාරට පැන්නේ පොලිස් නළාව පිඹිමිනි. එය නොතැකූ මගේ රියැදුරා, රියේ වේගය වැඩි කළේය. ඉහළට විසිවුණු මඩවතුරෙන් පොලිස්භටයා නැහැවිණි. ක්ලැරිජස් හෝටලය අසලදී පාර අවහිරවන ලකුණක් මම ඈතදීම දුටුවෙමි. ඔහින් රාශියක් පටවාගත් අශ්වකරත්තයක්, පාර හරහා හෙමින් ගමන් කරන්නට පටන්ගත්තේය. දුන්නකින් මුදාහළ ඊතලයක් ලෙස ගිය හයිඩ්ගේ රිය, පාරේ ඉතිරිව තිබූ ඉඩෙන් රිංගා ඉදිරියට ගියේ, ඉතාම අනතුරුදායක ලෙසයි. මා රැගත් රිය එතැනට ළං වෙද්දී, මාර්ගය සම්පූර්ණයෙන්ම අවහිර වී අවසානය. එතැන තත්පර කිහිපයක් රැඳීසිටීමට අපට සිදුවිය. ඒ අතරේ හයිඩ් රැගත් රිය පලා ගියේය.

අප යළි ගමන් ඇරඹුවත්, හයිඩ් රැගත් රිය, බොහෝ ඈත නිව් බොන්ඩ් වීදිය දිගේ පලායන අයුරු මම දුටුවෙමි. ඔවුහු කිසිවිටෙකත් තම රියේ වේගය අඩු නොකළහ. කෙටිමගක ගොස් ඔවුන් අල්ලා ගැනීමට සිතූ අපේ රියැදුරා, බිරුක් බොන්ඩ් වටරවුමේදී අපේ රිය රීජන්ට් වීදියට හැරෙව්වේය. ඒ සමගම නොසිතූවක් සිදුවිණි. අපේ රිය පෙරළී ගියේ වම් පැත්තේ රෝද දෙක උඩට සිටින විලසිනි. මට එවේලේම සිහි නැතිවන්නට ඇත.

රියෙන් එළියට පැනගත් රියැදුරා, මා ද වත්තම් කරගෙන, එතැනින් පලාගිය අයුරු මට යන්තමින් මතක ඇත. අප ලුහුබැඳ ආ





පොලිස් රියක පොලිස් භටයෝ නළා පිඹිමින්, පෙරළුණු කරත්තය වටකරගත්හ.

අප හේමාකට් රඟහල අසලට ළංවෙද්දී මගේ සිහිය යළිත් හොඳ අතට හැරිණි. "මගේ ජීවිතය බේරාගැනීම ගැන ඔබට ස්තූතියි." රතුපැහැති මුහුණක් තිබූ ඒ රියැදුරාට, මුළු හදින්ම ස්තූති කිරීමට මම පටන්ගතිමි.

"ස්තූතිය පස්සෙ පුළුවනි වොට්සන්" ඔහු කියනු ඇසිණ. "පොලිස් කාරයන් ඇවිත් අපව අල්ලාගන්න කලින්, මේ පටුමග දිගේ ගිහිං බේකර් වීදියට පැනගමු!" ෂර්ලොක් හෝම්ස් ගේ කටහඬ මම හඳුනාගත්තෙමි.



www.sinhalaelibrary.com

## 12
## ගැඹුරු දියේ

"වොට්සන්. අපේ හපන්කම ගැන "ඊවනිං ස්ටෑන්ඩඩ්" පුවත්පතෙත් පළවෙලා" මගේ මිත්‍රයා කීවේ, මඳසිනාවක් සමග පුවත්පත මගේ උකුළ මතට දමමිනි. ඇතුළු පිටුවක "වගතුග" තීරයේ මෙසේ සඳහන්ව තිබිණි.

"අධික වේගයකින් එකිනෙක හඹා ගිය අශ්වකරත්ත දෙකක් නිසා, ලන්ඩන් නගරයේ බටහිර අන්තය, ඊයේ ඉමහත් කැලඹීමකට පත්විය. මෙයින් කිසිවෙකුටත් තුවාල සිදුනොවූවත්, අශ්වකරත්ත තුනකටම හානි සිදුවී ඇත. කිහිපදෙනෙකු, මරණය පෙනි පෙනී, ජීවිත ගළවාගත්තේ, දේව හාස්කමකින් මෙනි. මෙම සිද්ධිය ඇසින් දුටු පොලිස් නිලධරයන් කිහිපදෙනෙකුගෙන්ම, අපි කරුණු විමසුවෙමු. තරුණ මදයෙන් මත්වූ ගැටව්, විස්කි වලින් ද මත්වූ කල, අනර්ථකාරී ලෙස හැසිරීම පුදුමයට කරුණක් නොවන බව, පොලිස් නිලධරයෝ පැවසූහ. ගැටවර වයසේ අයට මත්පැන් අලෙවිය තහනම් කිරීමට, කාලය පැමිණ ඇත. වගකිවයුත්තන්ගේ අවධානය, ඊට වහා යොමුවිය යුතුය.

"ඒක නෙමෙයි හෝම්ස්" මම කීවෙමි. "ඔබ වෙස් වළාගෙන, මගේ ඔත්තු බලන්න යොමුවුණේ ඇයි? මට ඒක ගැන නොකියන්නෙ මොකද?"

"මගේ හිතවත් මිත්‍රයා" ඔහු කීවේ පයිප්පයෙන් දුම් වළලු අහසට නංවමිනි. "ඔබ ගැන ඔත්තු බලන්න, මගේ කිසිම බලාපොරොත්තුවක් තිබුණේ නෑ. අපි දෙන්නා ඒ වෙලාවෙ, එතැනදී එකිනෙකා හමුවුණු එක, සම්පූර්ණයෙන්ම අහඹු, අද්භූත සිදුවීමක්. අපි දෙන්නාට එකම අශ්වකරත්තයක ගමන් කරන්න සිදුවීම ගැන නම් කියන්න තියෙන්නේ, එයත් දේව හාස්කමකින් සිදුවුණු එකක් බවයි"

"ඔබ එහෙම කිව්වට, මට නම් සෑහීමකට පත්වෙන්න බෑ" මා කීවේ අතේ තිබූ පොත ඉවතින් තබමිනි. "පළමුවැනි කාරණය, ඔබ මොන උවමනාවකටද හාර්ලි වීදිය පැත්තෙ ගියේ? දෙවැනි එක, මං ඔබේ කරත්තය නවත්වද්දී, ඔබ කොහොමද හයිඩ් ගිය කරත්තය ලුහුබැඳ ගෙන ආවෙ?"

"වොට්සන් මේ වගේ අහඹු හමුවීම් දකින්නට ලැබෙන්නේ, ප්‍රබන්ධ කතාවල පමණක් බව ඇත්තයි. එහෙම ඒවා පොත්වල දුටුවාම අපි කියනවා; ඒ වගේ පුදුමාකාර දේවල් සිදුවෙන්න කිසිම ඉඩක් නෑ; ඒවා ලේඛකයන්ගේ සිත්වල මවාගත්තා ඒවා කියලා. නමුත් ඉරණම පෙරළෙන්නේ ඒ විදිහටයි. ජීවිත කාලයක් තුළදී මේ වගේ දෛවෝපගත අහඹු හමුවීම් එකක් හෝ සිදුවෙනවා.

ඔබට දොස්තර ලැනියන් හමුවෙන්න යන්න කියලා, මං වෙනත් වැඩ රාජකාරි සඳහා ගියා නේ. මං හිතුවා මුලින්ම මගේ අවධානය ජේකිල් වෙත යොමුකරන්න. මගේ හිතවත් මහලු අශ්වකරත්ත රියැදුරෙක් ඉන්නවා. රැකියාවෙන් විශ්‍රාම ගනිද්දී, ඔහු තමන්ගේ කරත්තය විකුණන්න තීරණය කළා. මං ඒක මිලට ගත්තා. නමුත් උවමනාවෙන වෙලාවලදී ප්‍රයෝජනයට ගන්න, මං ඒක ගාල්කර තබන්නේ, ඔහුගේ නිවස පිටුපස. අශ්වයෙකුත් කුලියට අරගෙන, ඒ කරත්තේ බැඳගෙන, යායුතු ගමන යන්න මං තීරණය කළා. කාටවත් මාව හඳුනාගන්න බැරි විදියේ වෙස්වළාගැනීමක් මට අවශ්‍ය බව මං දැනගෙන හිටියා. ඔබටත් මා හඳුනාගන්න නොහැකිවීමෙන්, ඒක ඉතා සාර්ථක බව, මට කියන්න පුළුවනි.

හෙන්රි ජේකිල් කියන්නේ, අපට හමුවීමට කැමැති නොවෙන චරිතයක් බව, මං ඔබට කලින් දවසකත් කිව්වා. මගේ හිතේ ලොකු විශ්වාසයක් තිබුණා, මෙන්න මේ කරුණ ගැන. මොකක්ද? එඩ්වඩ් හයිඩ් සැඟවී ඉන්නා තැන ගැන හරිහැටි දන්නේ, දොස්තර හෙන්රි ජේකිල් පමණයි. ඊළඟට මං දැක ඇති දෙයක් තමයි මේ දෙය. කාගෙ හරි ආධාර උපකාර නැතිව, මොනම හොරෙකුටවත්, දීර්ඝ කාලයක් හැංගිලා ඉන්න බෑ. ඉතින් මං තීරණය කළා, මගේ සම්පූර්ණ උත්සාහය යොදලා, ජේකිල් ගැන අවධානය යොමුකරන්න. දිනපතාම හරි ඔහුගේ නිවස අසල හැංගිලා, සෝදිසියෙන් ඉඳීම තමයි, ඒක කළයුතු පිළිවෙළ. උවමනා වුණොත් ඒ වෙනුවෙන් මාසයක් හරි ගතකරන්න, මං සූදානමෙන් හිටියේ. නමුත් මගේ වාසනාවට පළමුවැනි දවසේම සාර්ථක ප්‍රතිඵල ලැබුණා.

මං වෙස් වළාගෙන, අශ්වකරත්තයත් දක්කාගෙන බේකර්වීදියෙන් පිටත්වුණා. මං ඇවිත් ඒක ජේකිල්ගෙ නිවස අසල



www.sinhalaelibrary.com

ගාල්කරා විතරයි; සැක සහිත ආකාරයට කරත්තයක් පිටත්වුණා, කැවෙන්ඩිෂ් චතුරශ්‍රය දෙසට. මගේ හිතේ ඇතිවුණු සතුට, ඔබට හිතාගන්න පුළුවන්ද වොට්සන්?

මං බලාපොරොත්තුවෙන් හිටි හෝඩුවාව මේක වෙන්න පුළුවනි, කියා මට හිතුණා. ඒ මොහොතෙ ඉඳල, මං ඒ කරත්තය පිටුපස ආවෙ ඔවුනට නොදැනෙන්න. හැතැක්ම ගණනාවක් ලන්ඩන් නගරය පුරා ගිය ඔවුන්, මංසන්ධියකදී හරස්පාරකට හැරෙව්වා. එතකොටයි මට දකින්න ලැබුණෙ..........."

"මොකක්ද?"

"කරත්තයේ විවරවුණු කවුළුවෙන් මං දුටුවේ, ඇතුළෙ හිටිය මහියාගෙ හැඩිරුව. මං කොයිතරම් පුදුමයකට පත්වුණාද කිව්වොත්, තව ටිකෙන් ෆේන්ස්පටින්, මගේ අතින් අත්ඇරෙනවා. ඒ හිටියේ එඩ්වඩ් හයිඩ්!

මේ වෙලාවේ මගේ හිතට ආවෙත්, පසුව ඔබේ සිතේ ඇතිවුණු සිතුවිල්ම තමයි. හයිඩ් කියන්නේ, එල්ලුම්ගහට යැවිය යුතු අපරාධකාරයෙක් බව, මුළු ලන්ඩන් නගරයේම ඉන්න පොලිස් භටයන් දන්නවා. එහෙම තිබියදීත්, මහ දවාලේ මේ විදියට ඔහු බයක් සැකක් නැතුව හැසිරීම හරිම පුදුමයක්. එක්කො මෝඩකම; නැත්නම් භයනැතිකම. මේ විදියේ වෙනත් අපරාධකාරයෙකු ගැන මට මතක්කරන්නත් අමාරුයි. මොකක්ද මේකට හේතුව කියල මං හිතමින් එන අතරේදියි, ඔබ පාර අයිනෙන් මතුවුණේ. [illegible] ඉතිරිහරිය ඔබ දන්නවා වොට්සන්"

"ඒ වුණත් ඇයි රහසිගතබව?" මම ඇසීමි. "මං කරත්තයට නැගුණු වෙලාවෙ වත්, ඔබ කවුද කියා මට කියන්න තිබුණා නෙ" මම හෝම්ස්ට දොස් පැවරුවෙමි.

"මගේ හිතවත් වොට්සන්" ඔහු කීය. "එහෙනම් මේ ප්‍රශ්න සියල්ලම ඔබ මට ඉදිරිපත් කරන්නේ, කරත්තයට නැගුණු හැටියේ. ඒවා ටික තේරුම් කරලා දෙන්න ගතවෙන වෙලාවෙදි, හයිඩ් ලන්ඩනයේ අනික් කෙළවරටම ගමන් කරලා ඉඳීවි. කොහොම වුණත් ඒ ගැන සිත්වේදනාවක් ඔබේ සිතේ ඇතිවුණා නම්, මං සමාව අයදිනවා. මං හිටිය තත්ත්වයේ ඔබ හිටියා නම්, ඔබ වුණත් කටයුතු කරන්නේ මෙහෙම නේද?"

"ඔබ ඒ වෙලාවෙ පාර හරහා ගිය අර මහී අශ්වකෝච්චිය නොවෙන්න, හයිඩ් මෙලහකට හිරකූඩුවේ. ඒ ඔබේ දක්ෂ රියපැදවීම නිසා"





"මට රිය පැදවීම ඉගැන්නුවේ, පියදොර් නම් රුසියන් ජාතික අශ්වකරත්ත රියැදුරා" හෝම්ස් කීය. "මං යෙදුණු එක් විශ්මයජනක පරීක්ෂණයකදී, ඔහු මට සහායවුණා. ඒ ගැන විස්තර මං වෙනක වෙලාවකදී මං ඔබට කියන්නම්"

"හයිඩ් පැනගිය අශ්වකරත්තයේ අංකය, අපට සටහන් කරගන්න බැරිවුණු එක ලොකු අඩුපාඩුවක්" මම කීවෙමි.

"ඔබ හිතුවේ ඒක මට අහපසු වෙන්න ඇති කියලද? "හෝම්ස් ඇසීය. "අංකය 5312. රියැදුරා මෙතනට කැඳවාගෙන එන්න කියල, මං පණිවුඩයක් යවලයි තියෙන්නෙ"

"ඒ කවුරුන් අතේද?"

"ඇයි ඔබ දුටුවේ නැද්ද වොට්සන්? අපි ආපසු එන අතරේ මං විගින්ස්ට අර අශ්වකරත්තයේ අංකය දුන්නා? බේකර් විදියේ අවිධිමත් රහස්පරීක්ෂක රැළ හරිම දක්ෂයි. කවුරුවත් ඔවුන් ගැන කිසි අවධානයක් යොමුකරන්නෙ නෑ. ඒකයි ඔවුනට තියෙන ලොකුම වාසිය. ඔබට මතකද ලෝහිත පරීක්ෂණයේදී ජෙෆර්සන් හෝප්ගෙ කුලීරිය, බොහොම ඉක්මනට හොයාගන්න ඔවුනට හැකිවුණා. කිසි සැකයක් නෑ. විගින්ස්ගේ කොලුරැළ දැනටම ක්‍රියාත්මක වෙලා ඇති. දවසක් දෙකක් යන්න කලින් අපට මොනවා හරි........"

ඔහුගේ කථාවට බාධා කරමින්, නිවසේ සීනුව නාදවෙන ශබ්දය ඇසිණි. හෝම්ස් මගේ මුහුණ දෙස බැලුවේ අතිශය ප්‍රීතියට පත් අයුරෙනි. වහා අසුනෙන් නැගී සිටි ඔහු, ජනේලය අසලට ගොස් විදිය දෙස බැල්මක් හෙළුවේය.

"හරි. අපට ඕන කරන මිනිහා ඇවිත්"

තමා පිරිසිදුව තබාගත් නිවස තුළට, විදියේ සැරිසරන හිඟන කොලුරැලේ පැමිණීම දැකීමට, හඩ්සන් මහත්මිය කැමැති නොවූවාය. හෝම්ස් මහත්මයා හමුවීමට අවශ්‍ය බැව් කී විගින්ස්ගේ කටහඬ ද, එයට නොකැමැත්ත පළකළ හඩ්සන් මහත්මියගේ දොස් පැවරුම ද, අපට පැහැදිලිව ඇසිණ. අන්තිමේදී දෙදෙනෙකු තරප්පු පෙළ දිගේ උඩුමහලට පැමිණෙන ආකාරය අසන්නට ලැබිණ. මම වහා දොර විවෘත කළෙමි.

විගින්ස් අසල සිටගෙන සිටියේ, පුළුල් උරහිස් හා හැඩිදැඩි සිරුරක් තිබූ පුද්ගලයෙකි. ඔහුගේ මුහුණේ තැන් තැන්වල පැල්ලැස්තර අලවා තිබූ අතර, ඔහු කළුපැහැති කබායක් හැඳ සිටියේය.



www.sinhalaelibrary.com

"බොහොම හොඳයි විගින්ස්" කී මගේ මිත්‍රයා, කාසි අනුරක්, කොලුවාගේ අත්ල මත තැබුවේය. "මෙන්න ඔබට සිලිමක්. අනිත් අයටත් ගාස්තු අඩු නැතිව. ඔබට භාරදුන් රාජකාරිය ඔබ දක්ෂ ලෙස ඉටු කළා."

කොලුවා පිටවී ගිය පසු අපි, අමුත්තා වෙත අවධානය යොමුකළෙමු.

"කරුණාකරලා මෙහෙන් වාඩිවෙන්න රියැදුරු මහත්මයා." හෝම්ස් කීය. "ඔබ ලුහුබැඳ එද්දී, අපෙන් බේරිලා පැනයාමට සමත්වුණු කුලීරියේ රියැදුරා ඔබයි එහෙනම්?"

ඔහු අසුනෙහි හිඳගත්තත්, මුහුණේ තිබුණේ කැලඹීමක පේයාවකි.

"මගේ නම ෂර්ලොක් හෝම්ස්. මේ ඉන්නේ දොස්තර වොට්සන්. අපි දෙන්නාගේ කතාබහේදී, මගේ මිත්‍රයා කරුණු සටහන් කරගනීවි. ඒකට කමක් නැහැ නේද?"

"කමක් නැහැ"

"කරුණාකරලා මට ඔබේ නම කියන්න"

"මගේ නම මර්වින් රසල්" රියැදුරා කීය. "මොනවද ඔබට මගෙන් දැනගන්න උවමනා?"

"අපේ ඉල්ලීම පිළිගෙන මෙහි පැමිණීම ගැන, අපි ඔබට තුලියක් ගෙවනවා" හෝම්ස් කීය. "ඊට අමතරව අපි ඔබට පවුම් භාගයක් දෙනවා, එක තොරතුරක් හෙළිකරන්න පුළුවන් නම්. අපට අල්ලාගන්න බැරිතරම් වේගයෙන්, අශ්වකරත්තයේ ගෙනගිය මගියා, ඔබ බැස්සුවේ කොහෙන්ද?"

හෝම්ස් මෙම ප්‍රශ්නය විමසුවේ, පුරුට්ටු අසුරා තිබූ මඳුන, රියැදුරා වෙත පිළිගන්වමිනි. පුරුට්ටු දෙකක්ම අතට ගත් ඔහු එකක් කබා සාක්කුවේ දමාගෙන, අනෙක ඇඟිලි අතරට ගත්තේය.

"කණගාටුයි මහත්මයා" රියැදුරා කීය. "මට ඒ ප්‍රශ්නෙට පිළිතුරු දෙන්න බෑ"

"පිළිතුරු දෙන්න බෑ? ඒ ඇයි?"

"ඒකට පිළිතුර දැනගෙන හිටියා නම්, මං ඒක ඔබට බොහොම කැමැත්තෙන් කියනවා. ඒ මොකද මේ කාලේ, පවුම් බාග කියන ඒවා හරි හිඟයි. ඔහු කියූ ලිපිනයට මං කරත්තය දක්කාගෙන ගියා. ගමන ඉවරවෙලා, මගේ රියැදුරු අසුනෙන් බැහැලා, මගේ ගාස්තුව





ගන්න, කරත්තයේ දොර ඇරලා බලන කොට, එයා........... එයා හිටියේ නෑ."

"හිටියේ නෑ? ඒක හරි පුදුම වැඩක් නේ?" මම ඇසුවෙමි. "ඔබට නොදැනෙන්න ඔහු කොහොමද කරත්තයෙන් බැස්සේ?"

"වියගල්ගා චතුරශ්‍රයේ හතරමං හන්දියේදී, මං කරත්තයේ වේගය හුඟක් අඩුකළා. ඒ අනෙක් පැතිවලින් ආව වාහනවලට ඉඩදෙන්න"

"ඉතින්?"

"ඔහු කියූ තැනට ඇවිත් දොර ඇරලා බලනකොට, මිනිහා හිටියේ නෑ. ඔහු හෙමින්ම කරත්තයෙන් බැහැල ගිහිං. ඒ වගේ දේ මීට කලිනුත් මට සිදුවෙලා තියෙනවා. නමුත් ඒ මේ වගේ වැදගත් සල්ලිකාරයන් අතින් නොමෙයි. ඔහු කලින් මට පොරොන්දුවුණා, පිටිපස්සෙන් පලවාගෙන එන කුලීරියට අහුනොවෙන්න පැන ගියොත්, ඔබ අමතර පවුමක් තෑගි දෙන්න. නමුත් අන්තිමට මාත් ඒ යකාගෙ හැටියට අහුවෙලා"

"ඔහු වැදගත් සල්ලිකාරයෙක් කියල ඔබ කියන්නෙ ඇයි?" හෝම්ස් ඇසීය.

"ඇයි මහත්මයා. ඔහු ඇඳන් හිටි ඇඳුම් වලින්ම ඒ බව පෙනෙනවා නොවැ" රසල් කීය. "ඔහු කථාකළේ ආචාරශීලී විදියට. ඔහු හැඩිදැඩි ශරීරයක් තිබුණු, රතුපැහැති පෙනුමක් තිබුණු කාරුණාවන්ත කෙනෙක්"

"දෙයියන්ට ඔප්පුවෙච්චාවෙ!" මට කියැවිණි. "ඒක නම් හයිඩ්ගේ පෙනුම ගැන විස්තරයක් නොවෙයි"

"ඒ විස්තරය වඩාත් ළං වන්නේ ජෙකිල්ට. ඔබට හොඳටම විශ්වාසද මගියාගේ පෙනුම ඒ විදියයි කියලා?" හෝම්ස් විමසුවේය.

"මහත්මයා" රියැදුරා කීය. "ඔහු මගේ කරත්තයට නගින්න සූදානම්වෙලා, යායුතු තැන කිව්වා. එතකොට අපි හිටියේ ඔහොම මෙහෙම දුරින්. වැදගත් මහත්මයෙක්ව අඳුනාගැනීම මට ඒ තරම් අමාරු නෑ. රජ්ජියාදූකාරයන්, තක්කඩීන් මුදල් කීයක් ගෙවන්න සූදානම් වුණත්, ඔවුන් කුලියක අරං යන්නා අපි කැමති නෑ. ඒක අපේ ජීවිතේටත් අවදානමක් මහත්මයා"

"ඔබ කියන්නේ ඇත්තක් බව මට විශ්වාසයි" හෝම්ස් කීය. "ඒත් ඒක හරි පුදුමයක්" පිට කබායේ සාක්කුවල දෑත් රුවාගත් හෝම්ස් කාමරයේ ඉහළ පහළ සක්මන් කිරීමට පටන්ගත්තේය.



www.sinhalaelibrary.com

"ඔහුව කොහේට එක්කගෙන යන්න කියලද, මේ මහත්මයා ඉල්ලා සිටියේ?"

"හාර්ලි විදියේ විග්මෝර් කෙළවරට"

හෝම්ස් මා වෙත හැරී බැලුවේය.

"ඒ ලැනියන් පදිංචි හරිය" මම කීවෙමි.

"ඒ වුණත් රසල්, ඔබ කරත්තය ඒ හරියේ නවත්වන්නේ නැතිව, වෙනිං පාරකට හැරී ගියා නේද?" හෝම්ස් ඇසීය.

"ඔව් ඒක ඇත්ත මහත්මයා," රියැදුරා කීය. "හාර්ලි විදියේ ගමන් කරලා අපි විග්මෝර් කෙළවරට හොඳටම ළංවෙලයි හිටියේ. එක්වරම ඔහු සැරයටියෙන් වහලට තට්ටුකරලා, මට කථා කළා. ඔහු මෙහෙම කිව්වා; "මෙතැනින් ඔබින්නේ නැතිව ඉන්න, මං තීරණය කළා. ඔහේ මාව නාගෙවා ගත්ත තැනටම ආපහු යමු!"

"ඒක පුදුමාකාර ඉල්ලීමක් කියල ඔබට හිතුණේ නැද්ද?"

"මහත්මයා" රියැදුරා කීය. "මං කුලීරථ එළවීම කරන්නේ බොහොම දීර්ඝ කාලයක් ඉඳල. මට අහන්නවත් පුදුමාකාර දේ දකින්න ලැබෙනවා"

"මට කියන්න රසල්, මුලින් තිබුණාට වඩා, ඔහුගේ කටහඬේ මෘදු බවේ අමුත්තක්, ගොරෝසු වීමක් ඔබට තේරුණාද?" හෝම්ස් ඇසීය. රියැදුරාගේ නළල රැළිවැටිණි.

"මහත්මයා, ඔබ ඒක කිව්වාමයි මට මතක්වුණේ." රියැදුරා කීය. "කරත්තයට නගිද්දී ඔහුට තිබුණේ මෘදු කරුණාවන්ත මැදගත් කටහඬක්. පසුව මට අහන්න ලැබුණු හඬ ගොරෝසුයි. කථා කළ ලීලාව අශීලාචාරයි. ඒකට හේතුව මට හිතෙන්නේ, ඔහුට මොකක් හරි අසනීපයක් හැදෙන්න ඇති; ඒ නිසා වෙන්න ඇති, ඔහු යා යුතු තැන ගැන තීරණය වෙනස් කළේ"

නමුත් ලන්ඩන් නගරයේ ඉන්න තරමක් විශේෂඥ දොස්තර මහත්තුරු ඉන්නෙ, ඔය හාර්ලි විදිය පැත්තෙ නේ" හෝම්ස් කීය. "වෛද්‍ය ප්‍රතිකාර උවමනා නම් ඔහු ආපසු හැරුණේ ඇයි? කමක් නෑ. ඊට පස්සෙ මොකද වුණේ?"

"වෙනත් කියන්න දෙයක් නෑ මහත්මයා. ඒ වෙලාවෙ තමයි කරත්තයේ වහලට සැරයටියෙන් ගහල කෑගැහුවේ, පිටිපස්සෙන් එන කරත්තය කොහොම හරි මඟ ඇරල ගියොත්, අමතර පවුමක් දෙනවා කියල"





"ඔබට ස්තූතියි රසල්" හෝම්ස් කීවේ රියැදුරා වෙත මුදලක් දිගු කරමිනි. "මෙන්න මං පොරොන්දු වුණු පවුම් භාගය සහ මෙහි පැමිණීම ගැන මං ඔබට ගෙවිය යුතු කුලිය. ඔබේ උදව්ව ගැන ස්තූතියි."

රියැදුරා දොර වසාගෙන පිටවී ගියේය.

"ඉතින් වොට්සන්, ඒ කතාබහෙන් ඔබට හිතාගන්න පුළුවන් වුණේ මොනවද?"

"මට නම් මොකුත් හිතාගන්න බෑ"

"එහෙම වෙන්න බෑ මිත්‍රයා" හෝම්ස් කීය. "අහන්න ලැබුණු කාරණාවල හැටියට, මොකක් හරි උපකල්පනයක් ගොඩනගා ගන්න, ඔබට හැකිවෙන්න ඇති."

"මට නම් හිතාගන්න පුළුවන් එක දෙයයි" මම කීවෙමි. "කරත්තය එන ගමන් අතරමගදී, ජෙකිල් සහ හයිඩ්, ඔවුන්ගේ ස්ථාන මාරු කරගෙන"

"අපට හිතාගන්න තියෙන්නේ ඒ විදියෙ දෙයක් තමයි." හෝම්ස් ඒ අදහසට එකඟවිය. "ඒ වෙලාවෙ තදින්ම හිම වැටෙමිනුයි තිබුණේ. ඒකෙ ආවරණය යටතේ කාටවත් නොපෙනී, ඒ විදියේ මාරුවීමක් කරන්න බැරිකමක් නෑ. නමුත් ඇයි ඒ? මොකක්ද ඒකෙ අරමුණ?"

"මට හිතාගන්න අමාරුයි"

"ඔබට හිතාගන්න අමාරු ඒකෙ පුදුමයක් නෑ වොට්සන්. මටත් මෙක තේරුම්ගන්න අමාරුයි. මං හිතන්නේ අපට ප්‍රමාණවත් තරම් දත්ත නෑ. එහෙම නොමැතිව නිගමනයකට එන්න උත්සාහ කිරීම මෝඩකමක්. අපි මේ ගැටලුව හාරා අවුස්සන්න බලන්න ඕනෑ වෙනත් කෝණයකින්. ලැනියන් එක්ක සාකච්ඡාවෙන් ඔබට දැනගන්න පුළුවන් වුණේ මොනවද?"

මට දැනගැනීමට හැකිවූ කරුණු මම සවිස්තරව හෝම්ස්ට ඉදිරිපත් කළෙමි. මගේ අදහස වූයේ වෛද්‍යවරයා, අපට හෙළි නොකරන කරුණු රාශියක් දැනසිටි බවයි. පයිප්පයෙන් නිල්පැහැති දුම්වළලු පිටකරමින්, මගේ මිත්‍රයා නිශ්ශබ්දව මගේ විස්තරයට කන්දීගෙන සිටියේය. මගේ කථාව අවසන්වූ පසු, උදුන වෙත ගිය ඔහු, පයිප්පයේ කෝවේ තිබූ අළු උදුනට හැළුවේ මා අමතමිනි.



www.sinhalaelibrary.com

"මට හිතෙන හැටියට අද රෑ කෑමට අපට ලැබෙනවා, රෝස්ට් කළ වළිකුකුළු මස්." ඔහු කීය. "හඩ්සන් මහත්මියගේ කුස්සිය පැත්තෙන්, රෝස්ට් වෙන මස්වල සුගන්ධය, මේ පැත්තට හමාගෙන එනවා. ඒක අපට ප්‍රයෝජනවත් වෙන බවට සැකයක් නෑ."

"පුදුම කතාවක් නේ හෝම්ස් ඔබ කියන්නෙ." මම විරෝධය පළකළෙමි. "මේ අභිරහස විසඳීමට වළිකුකුළු මස් වලින් ලැබෙන ප්‍රයෝජනය මොකක්ද?"

"ප්‍රයෝජනය? යන්ත්‍රයක් ක්‍රියාකරවන්න ඉන්ධන උවමනායි. ඒ වගේ මොළය ක්‍රියා කරවන්න, ආහාරවලින් ශක්තිය ලබාදිය යුතුයි. එහෙම නේද?

ඒක නෙමෙයි මිත්‍රයා. හෙට අපි යායුතු ගමනක් තියෙනවා. අපි යන්න ඕන ඔබ මුලින් ඉගෙනුම ලැබූ එඩිංබ්‍රෝ විශ්වවිද්‍යාලය වෙත. අප යායුතු මඟ හොයාගන්න, ඔබේ මතකය උදව්වේවි. අපි බලමු මේ ප්‍රශ්නය විසඳාගන්න, බ්‍රිතාන්‍යයේ විද්වතුන්ගෙන් සහයක් ලබාගන්න පුළුවන්ද කියල"



13

# විද්වතුන් අතර

මා ලන්ඩනයේ සිට එඩිංබ්‍රෝ දක්වා දුම්රිය ගමනක යෙදුණේ, බොහෝ කලකට පසුවය. මඟ දෙපස දර්ශන ඉතා සිත් ඇදගන්නා සුලු ඒවා බැව් සැබෑය. එහෙත් එකම ඉරියව්වෙන්, එක දිගට පැය ගණනක් වාඩිවී සිටීම, වෙහෙසකර කටයුත්තක් විය.

අප එහි යද්දී එඩිංබ්‍රෝහි කාලගුණය යහපත් නොවීණි. මේ කාලයට හිම වැටීම එංගලන්තයට නම් සාමාන්‍ය සිදුවීමකි. එබැවින් නවාතැන් ගැනීමට තෝරාගත් හෝටලයේ කාමරය තුළම, අපි දින දෙකක් ගතකළෙමු. මේ කාලය මා යෙදුවේ, විලියම් ක්ලාක් රසල්ගේ මුහුදු ගමන් පිළිබඳ කථාන්තර පොතක්, යළි කියවීම සඳහාය.

මගේ මිත්‍රයා නම් ඇඩි අවධානයකින්, ඔහුගේ ක්ෂේත්‍රයටම අදාළ කටයුත්තක යෙදුණේය. අපරාධකරුවන් මිනීමැරීම සඳහා යොදාගත් විෂවර්ග ගැන, හෝම්ස් විශේෂ අධ්‍යයනයක් කර තිබිණ. ඒ ගැන සවිස්තර නිබන්ධයක් සකස් කිරීමට, ඔහු කාලය ගත කළේය. අපරාධකරුවන් යොදාගත්, විෂවර්ග 67 ක් ගැන තොරතුරු ද, ඔවුන් ඒවා යොදාගත් පිළිවෙළ ගැන ද, එහි සඳහන්ව තිබිණි. ඊට අමතරව ඒ අපරාධකරුවන්ගේ ජීවන තොරතුරු ද එහි කෙටියෙන් ඇතුළත් විය.

අන්තිමේදී අප පැමිණි කටයුත්ත සඳහා නවාතැනෙන් එළියට බැසීමට හැකිවූයේ. කළු වලාකුළෙන් අහස වැසීගිය අඳුරු උදෑසනකය.

"අපට දැනගන්න උවමනා, හෙන්රි ජෙකිල් ගැන නම්" මම කීවෙමි. "කරන්න තියෙන හොඳම වැඩේ; ජෙකිල් මෙහේ ඉගෙන ගත් කාලයේ, ඔහු සමග එකම කණ්ඩායමේ ඉගෙනුම ලැබූ වෛද්‍යවරයෙකු හමුවීම"

"ඒක ඒ තරම්ම පහසුවේවිය කියල, මං හිතන්නේ නෑ වොට්සන්" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේය. "ඒ මොකද මේ සරසවියේ උගත් අය වෛද්‍යවරුන් වුණාට පස්සේ, දැන් රටපුරාම, ලෝකෙ පුරාම විසිරිලා ගිහින් ඇති. ඒ ගැන සැකයක් නෑ. මං



www.sinhalaelibrary.com

විම්පෝල් වීදියේ, බ්‍රිතාන්‍ය වෛද්‍ය මණ්ඩලයේ කාර්යාලයට ගිහිං විමසලා බැලුවා. වෛද්‍යවරුන් හැටියට ජෙකිල් සමඟ, එකම වසරේ සමත්වෙලා, එකටම ලියාපදිංචි වුණු වෛද්‍යවරුන් ගණනකගේ නම් එහි තිබුණා. නමුත් දීර්ඝ ලෙස හොයා බැලීමේදී හෙළිවුණේ, ඔවුන්ගෙන් විශාල ගණනක්, මේ රට අත්හැර ගිහින් බව. බොහොම දෙනෙක් ඕස්ට්‍රේලියාවට, දකුණු අප්‍රිකාවට, කැනඩාවට සහ නවසීලන්තයට සංක්‍රමණය වෙලා. පුළු පිරිසක් අනික් බ්‍රිතාන්‍ය යටත්විජිතවලට ගිහිං. කිහිපදෙනෙක් මියගිහින්. ලන්ඩන් නගරය අවට පදිංචි කිහිපදෙනෙකු හමුවෙන්න මම ගියා. ඔවුන් කවුරුවත් ජෙකිල්ව ළඟින් ආශ්‍රය කර තිබුණේ නැහැ. ඔවුන් කිව්වේ දොස්තර හේස්ටි ලැනියන්ගෙන් විමසන්න කියලයි. මට ප්‍රයෝජනවත් තොරතුරක් ලබාදෙන්න, අර වෛද්‍යවරුන්ට හැකියාවක් තිබුණේ නැහැ. බාගවෙලාවට ඔවුන් ජෙකිල් ගැන අමතර තොරතුරු දැනගිටියා වෙන්නත් ඇති. එහෙත් ඒවා මට හෙළිකිරීමට අකමැති නිසා, නොදන්නා බවත් ඇඟෙව්වා වෙන්නත් පුළුවනි."

කතාව නැවැත්වූ මගේ මිත්‍රයා සාක්කුවෙන් වෙරිවුඩ් පයිප්පය ගෙන, එය දල්වා, කිහිපවාරයක් දුම් පිටකළේය.

"ඊළඟට මං ඔවුන්ගෙන් අහල බැලුවා, ජෙකිල්ව විශ්වවිද්‍යාලයේ හිටි, සමීපතම මිත්‍රයන් ගැන. ඔහුගේ කිට්ටුම මිත්‍රයන් තුන්දෙනෙක් ඉඳල තියෙනවා. ඒ තුන්දෙනා නිතරම එකට පාඩම් කටයුතු, ක්‍රීඩා සහ විනෝද ගමන්වල යෙදිලා තියෙන්නේ. එයින් දෙදෙනෙක්, මං කලින් කියූ විදේශ රටවල පදිංචියට ගිහින්. එක් අයෙක් ග්ලාස්ගෝ නුවර ඉන්නවලු. ඔහු පෝල් මැක්ලීන්ස් නම් ස්කොට්ලන්ත ජාතිකයෙක්. මං බලාපොරොත්තු වෙනවා ඔහු හමුවෙන්නත්. එහෙම නැත්නම් අපට විශ්වවිද්‍යාලයේ ලේඛනාගාරයේ පොත් පිරික්සා බැලීමට සිදුවෙනවා. අපට ප්‍රයෝජනවත් වියහැකි, වෛද්‍ය පීඨයේ ආචාර්යවරයෙකු ගැන, ඔබේ මතකයට එන්නෙ නැද්ද වොට්සන්?"

මම මඳවේලාවක් කල්පනා කළෙමි.

"මට හිතෙන හැටියට මහාචාර්ය චාල්ස් ආම්බ්‍රුස්ටර්, හෙන්රි ජෙකිල්ලගෙ කාලෙ ඉන්න ඇති" මම කීවෙමි. "මං සරසවියෙන් පිටවෙද්දී ඔහු තරුණ වයස පහුකරලා හිටියේ. ඒ කාලයේ ළමයින් අතර විහිළුවක් තිබුණා, එඩිංබ්‍රෝ විශ්වවිද්‍යාලය හදන්න මුල්ගල තැබුවෙ චාලි ආම්බ්‍රුස්ටර් කියලා"





"ඔහු තවමත් ජීවතුන් අතර ඉන්නවද?" හෝම්ස් විමසුවේය.

"ඔව්" මම කීවෙමි. "අලුත්ම වෛද්‍ය වෘත්තික කෝෂ ග්‍රන්ථයේ හැටියට, ඔහු ජීවතුන් අතර පමණක් නොවෙයි, පර්යේෂණ කටයුතුවලත් යෙදෙනවා. නමුත් හුගක්ම පරණ ශිෂ්‍යයන් ගැන, ඔහුට මතක තියෙනවාද දන්නෙ නෑ. ජෙකිල්ගෙන් පස්සෙ ශිෂ්‍යයන් දහස්ගණනක්, ආම්බ්‍රුස්ටර්ගෙන් ඖෂධවේදය හදාරන්න ඇති."

"ඔහුගේ ක්ෂේත්‍රය ඖෂධවේදය ද?

"ඔව්. ඔහු මුළු යුරෝපයේම ඒ අංශයේ ප්‍රාමාණික විද්වතෙක්" මම කීවෙමි.

"චාලි ඒ කාලෙත් ශිෂ්‍යයන් අතර හරි ජනප්‍රියයි. ඔහු ශිෂ්‍යයන්ව ආශ්‍රය කළේ මිත්‍රයන් ගණනේ. ඔවුන් සමඟ කඳු නැගීම් වලට ගියා. රුවල් බෝට්ටුවල නැගිලා, ගැඹුරු මුහුදේ මසුන් අල්ලන්න ගියා. චාලි ආම්බ්‍රුස්ටර් උගන්වන කාලයේ, පිහිනුම් ශූරයෙක්ලු. ඒ වගේම මල්ලව පොර ශූරයෙක්ලු."

මේ වනවිට අපි වෛද්‍ය පීඨයේ ගේට්ටුවෙන් ඇතුළුවී, කාර්යාලය දෙසට යමින් සිටියෙමු. පොත්පත් අතැතිව අප සිටි දෙසට පැමිණෙමින් සිටි තරුණියන් පිරිස, වෛද්‍ය ශිෂ්‍යයන් යයි සිතියහැකි විය. "සමාවෙන්න · කරදර කරනවාට" හෝම්ස් ශිෂ්‍යයෙකු ඇමතුවේය. "මහාචාර්ය චාල්ස් ආම්බ්‍රුස්ටර් අපට හමුවෙන්න පුළුවන් කොහේදීද?"

"ආ...... නාකි චාලිද?" තරුණියගේ කටහඬේ තිබුණේ සුහද බවකි. "අපේ පුස්තකාලයට ගිහින් බලන්න. ඔහු වෙන කොහේ ඉන්නද? චාලි ජීවත්වෙන්නෙ පුස්තකාලෙමයි" තරුණිය හිස නමා පෙන්නුවේ, මෑතකදී ඉදිකරන ලද අළු පැහැති ගොඩනැගිල්ලකි.

විශාල දොරටු දෙකක් පසුකරගෙන, අපි පුස්තකාලයට ඇතුළුවූයෙමු. මුලින්ම අපට හමුවූයේ කියවීම් ශාලාවය. එහි පුළුල් මේස වටා අසුන්ගෙන, සිසුසිසුවියෝ පාඩම් කටයුතුවල යෙදී සිටියහ. වයස්ගත පුද්ගලයෙකු ඒ අවට දක්නට නොලැබිණ. අපි පුස්තකාලාධිපති වරයාගෙන් විමසුවෙමු.

"මහාචාර්ය ආම්බ්‍රුස්ටර් ඇත්තේ විමර්ශන අංශයේ" ඔහු කීවේ ඈතින් පිහිටි තවත් ශාලාවක් දෙසට අත දිගුකරමිනි.

එහි දක්නට ලැබුණේ කිහිපදෙනෙකු පමණි. බිත්ති අයින් දිගට තබා තිබූ වීදුරු අල්මාරිවල දොරවල් හැරදමා තිබිණ. ශාලාවේ ඈත කෙළවරේ, ද්විපාද ඉණිමගක් මතට වී සිටි පුද්ගලයෙකු



www.sinhalaelibrary.com

අපි දුටුවෙමු. දුටු සැණෙකින් ඔහු හඳුනාගැනීම, මට අපහසු වූයේ නැත.

"අන්න ඉන්නවා අපට ඕන කරන මිනිහා" මම කීවෙමි.

ද්විපාද ඉණිමඟ මුදුනේ වාඩිවී, තම දණහිස් මත පොතක් දිගහැරගෙන, ඔහු එය කියවමින් සිටියේය. ඔහුගේ කෙසඟ ශරීරයත් පුළුල් නළල හා හිසේ පිටුපස සුදු පැහැති කෙස් ස්වල්පයත් කලකට පෙර මා දුටු අයුරුම විය. බෝතල් අඩි මෙන් ගනකම් වීදුරු සහිත උපැස්යුගළ, ඔහුට ලැබෙන්නට ඇත්තේ පසුකලෙක විය යුතුයැයි මට සිතිණ. නමුත් ඔහු හැඳ සිටි දුර්වර්ණ වූ ඉරුණු කබාය නම්, ඒ කාලයේ හැඳීමට පුරුදුව සිටි කබායම බැව්, දිව්රා කීමට මට හැකියාව තිබිණ.

"මේ මහාචාර්ය ආම්බ්රුස්ටර්ද?" හෝම්ස් විමසුවේ ඉතා ආචාරශීලීවය.

"කරුණාකරල යන්න මෙතනින්!" මහාචාර්යතුමා කීවේ ඔහු කියවමින් සිටි පොතෙන්, දෙනෙත් ඉවතට නොගෙනම ය. "පේන්නෙ නැද්ද? මං වැඩක්" ඔහුගේ කටහඬ බොහෝ දුර්වල වී තිබිණි. එකල ඔහුට තිබුණු කටහඬක් තිබූ බැව් මා සිහිකළෙමි කණගාටුවෙනි.

"මහාචාර්යතුමනි..........." ඔහු ඇමතීමට මා සූදානම් වූවා පමණි.

"තමුසෙලගෙ කන් ඇහෙන්නෙ නැද්ද? එහෙමත් නැත්නම් මං කියන දේ තේරුම් ගන්න බැරි තරම් මෝඩද?" මහාචාර්යතුමා ඇසුවේ අප දෙස බලමිනි.

"මහාචාර්යතුමා. මං ජෝන් වොට්සන්. කලකට පෙර මං මෙහේ වෛද්‍යපීඨයේ ඉගෙන ගත්තා. ඔබතුමාගෙන් ඖෂධවේදය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව හැදෑරුවා. මාව මතක නැද්ද?"

සිය උපැස්යුගළ හොඳින් සකස්කරගත් ඔහු, මා වෙත හෙළුවේ, විමසිලිමත් බැල්මකි. ඊළඟට ඔහු මොහොතක් කල්පනා කළේය.

"..........ආ ජෝන් වොට්සන්.......! තමුසෙ නේද '74 අවුරුද්දේදී මගේ පිටකබාය උණුවක ගැටගහල, කොඩිගහේ මුදුනටම එසෙව්වේ?"

"අනේ නෑ මහාචාර්යතුමා" මම පිළිතුරු දුන්නෙමි.

"වැඩක් නෑ. වැඩක් නෑ" ඔහු කීය. "ඒ කොල්ලා නම් දක්ෂ ශල්‍ය වෛද්‍යවරයෙකු වෙන ලකුණු පෙන්නුවා. තමුසෙ මොන වොට්සන්ද? කොයි කාලෙද හිටියෙ?"





"මහාචාර්යතුමා මම ජෝන්. එච්. වොට්සන්. මං හිටියේ '74 ඉඳන් '78 වෙනකුරු. පසුව මම ලන්ඩන් විශ්වවිද්‍යාලයට ඇතුළුණා. ඒ කාලේ මං රසායනාගාරයේ වැඩටත් උදවු වුණා. මගේ ඉගෙනීමට ගෙවීමට අමතර මුදලක් හොයාගන්න."

"ඔහේටත් මුදල් අමාරුකම් තිබුණා? නැතුව? එහෙනම් මගේ පිට කබායට අර වගේ වැඩක් කරන්න වටින්නෙ නෑ. ඒක අලුත්වැඩියාකරගන්න. මට සෑහෙන මුදලක් වියදම්වුණා. වොට්සන්! මට හොඳට මතකයි ඒ තක්කඩියා!"

"මහාචාර්යතුමා" මෙවර කතා කළේ හෝම්ස්ය. "අපි ආවෙ ඔබතුමාගෙ පැරණි ශිෂ්‍යයෙක් ගැන කාරණා ටිකක් දැනගන්න. ඔබතුමාට මතකද හෙන්රි ජෙකිල්?"

"හෙන්රි ජෙකිල්? හෙන්රි ජෙකිල්?" මහාචාර්යතුමා එයම පුනරාවර්තනය කළේ අපමණ සන්තෝෂයෙනි. "මොකද මතක නැත්තෙ? මට මතකයි. දැන් කෝ ඒ ඉලන්දාරියා? මට ඉඳපු විශිෂ්ටතම ශිෂ්‍යයා. ඉගෙනීමට අතිදක්ෂයෙක්. පුදුම මොළයක් ඒ මිනිහාට තිබුණෙ. කෝ ජෙකිල් ආවෙ නැද්ද ඔහෙලත් එක්ක. මට දැන් ඒ යකාව දකින්නත් ආසයි" මහාචාර්යතුමාගේ කටහඬේ තිබුණේ මැඩගත නොහැකි සන්තෝෂයකි. පොත වසා ඇමූ ඔහු ඉණිමඟෙන් බිමට බැස්සේය.

"අපට ඔබතුමා සමග කරන්න පෞද්ගලික කතාබහක් තියෙනවා" හෝම්ස් කීය. "ඒ හෙන්රි ජෙකිල් ගැන. අපි කොහේටද යන්නෙ?"

මහාචාර්යතුමා මඳ වේලාවක් කල්පනා කළේය. "යමු මගේ කාමරයට"

පුස්තකාලයෙන් පිටවූ අපි, හිමෙන් වැසුණු උද්‍යානයක් හරහා ඇවිද ගියෙමු. මීළඟට අපට හමුවූ පැරණි ගොඩනැගිල්ලක, "කිරි, කිරි" ශබ්දයක් නිකුත්වූ ලෑලි තරප්පු පෙළක ඉහළ නැගීමට පටන් ගත්තෙමු. අඳුරු බරාඳයක් පසු කළ විට අප පැමිණියේ, වසා තිබූ දොරක් අසලට ය. මීළඟට මහාචාර්යතුමා සාක්කුවෙන් යතුරක් ඉවතට ගෙන, කාමරය විවෘත කරනු ඇතැයි අපි බලාපොරොත්තු වූයෙමු. එහෙත් මහාචාර්යතුමා කළේ දොරට පා පහර දෙකක් එල්ල කිරීම පමණි. දොර විවෘත විය. එහි ඇතුළ වූ ඔහු ගෑස් පහනක් දැල්විය.

මහාචාර්ය චාලි ආම්බ්රුස්ටර්ගේ කාමරය එකම අවුල්ජාලයක් විය. එහි සෑම තැනකම දක්නට ලැබුණේ පොත්පත් ය. එක මත



www.sinhalaelibrary.com

එක ගොඩගසා, මිටි බැඳ හා විවෘත කොට තිබූ පොත්, මේසය, පුටු හා ඇඳ මතත්, බිම සෑමතැනකමත් දක්නට ලැබිණ. පොත් නොපාගා කාමරයට ඇතුළුවීමට හැකිවූයේද අපහසුවෙනි. පුටු මත ගොඩගසා තිබූ පොත් හා, ඒ අතරට දමා තිබූ ඇඳුම් ටයිපට්, මේස් ආදිය, පිළිවෙළකට අස්කිරීමට දින කිහිපයක් ගතවීමට ඉඩ තිබිණ. එහෙත් පුටු දෙකක් මත වූ පොත් හා ඇඳුම් සියල්ල ඉවතට විසිකළ මහාචාර්යතුමාට, ඒ සඳහා ගතවූයේ තත්පර කිහිපයක් පමණි. මීළඟට තම පුටුවේ හිඳගත් ඔහු, පිඟන්මැටි පයිප්පයක් ලාච්චුවකින් ගෙන, එයට දුම්කොළ පුරවා එය දල්වා ගත්තේය.

"මට ඉස්සර වෙලාම කියන්න, ඔහේල කවුද කියල" ඔහු කීය. "මං ඊළඟට දැනගන්න කැමැතියි, හෙන්රි ජේකිල් මේ විශ්ව විද්‍යාලයේ ගතකළ කාලය ගැන, තොරතුරු හොයන්නෙ ඇයි කියල. තමුසෙල පත්තර කාරයොද? එහෙනම් එක වචනයක් කතා කරන්න එපා. බහිනවා එළියට!"

"නෑ මහාචාර්යතුමා" මම කීවෙමි. "අපි පත්තර කාරයො නෙමෙයි. මං වෛද්‍යවරයෙක් බව ඔබතුමාට කිව්වනේ. මේ මහත්මයා ඔබට, ඔහු ගැන හැමදෙයක්ම කියාවි"

"එක මිසක්!" කී චාලි ආම්බ්රුස්ටර් පයිප්පයෙන් දුම් පිටකළේ මේසයට අතින් තට්ටුකරමිනි. අවුරුදු 70 ක් පමණ වයස්ගතව සිටියත්, මහාචාර්යතුමාගේ සිහිකල්පනාව හා මතකය ඉතාම හොඳ බැව් මම තේරුම් ගත්තෙමි.

"ගිය අවුරුද්දෙ අන්තිම හරියෙ, සර් ඩැන්වර්ස් කැරූ, මැරවරයෙකුගේ ප්‍රහාරයට ලක්වෙලා, ලන්ඩන් නගරයේදී මියගියා" හෝම්ස් කීවේ මහාචාර්යතුමා අනුගමනය කරමින්, තම පයිප්පය ද දල්වා ගනිමිනි. "සමහරවිට ඔබතුමාට දැනටමත් ඒක දැනගන්න ලැබිල ඇති. මගේ නම ෂර්ලොක් හෝම්ස්. මිනීමැරුම ගැන කෙරෙන පරීක්ෂණයේදී, ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට සහයවීම මට භාරවෙලා තියෙනවා."

"මොකක්ද ඔහේගෙ නම කිව්වෙ?"

"ෂර්ලොක් හෝම්ස්"

"මං එහෙම කෙනෙක් ගැන, ජීවිතේට අහල නෑ" මහාචාර්යතුමා කීවේ විමතිය පළකරන හඬකිනි. මට සිනාපහළ විය. මගේ මිත්‍රයාගේ මුහුණ රතුවෙන අයුරු මම දුටුවෙමි.





"මොකක්ද ඔහේගෙ තනතුර? ඇයි මගෙන් ප්‍රශ්න කරන්නෙ?" මහාචාර්යතුමා ගහෙන් ගෙඩි එන්නාක් මෙන්, හෝම්ස් වෙත ප්‍රශ්න එල්ල කළේය.

"මං විශේෂඥ අපරාධ පරීක්ෂකයෙක්. මේ අපරාධය ගැන සෙවීම භාරදීල තියෙන්නෙ මට."

"එතකොට, සර් ඩැන්වර්ස් කැරූ කියන්නෙ කවුද?"

"ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්" හෝම්ස් කීය. "ඒ වගේම ඔහු රජපවුලේ සමීපතම මිත්‍රයෙක්. දොස්තර හෙන්රි ජේකිල් මේ අපරාධයට හෝ මිනීමැරුවාට, කෙළින්ම සම්බන්ධයක් නෑ. නමුත් ඔහු යම් ආකාරයකින් එයට පැටලී ඇති බවයි පෙනෙන්නේ. ජේකිල් ගැන විස්තර අපට ලබාදෙන්න ඔබට පුළුවන් නම්, එය හුඟක් ප්‍රයෝජනවත් වේවි. අපි හරියටම දන්නෙ නෑ, මේතැන්දී ජේකිල් මුහුණදීල ඉන්නෙ, මොන වගේ තත්ත්වයකටද කියල. ඔහු අපරාධකාරයාගේ ග්‍රහණයට හසුවෙලා වෙන්නත් ඉඩ තියෙනවා. අන්න ඒ නිසයි අපට ඔබතුමාගේ උදවු අවශ්‍ය. අපට කියන්න මහාචාර්යතුමා, හෙන්රි ජේකිල් මොන වගේ ශිෂ්‍යයෙක්ද?"

වචනයක් හෝ කථා නොකොට මහාචාර්යවරයා පයිප්පය ඉරුවේ, තම මතකය අවදිකර ගැනීමට විය යුතුය. මිනිත්තු කිහිපයක්ම ඔහු සිටියේ නිහඬවය. ඒ තම කථාව පටන්ගත යුතු තැන ගැන සිතාගැනීමට නොහැකිවද? අන්තිමේදී ඔහු කථාව ඇරඹුවේ, පයිප්පය නිවා දමා, එය පැත්තකින් තබමිනි.

"හෙන්රි ජේකිල්.......... හෙන්රි ජේකිල්." මහාචාර්යතුමා කිහිපවරක් ඒ නම උච්චාරණය කළේය. "ජේකිල් තමා මගෙන් ඉගෙනුම ලැබූ ශිෂ්‍යයන් අතර හිටි, දීප්තිමත් ම ශිෂ්‍යයා. ඔහු මගේ යටතට වැටුණේ මං මහාචාර්ය ධුරයට පත්වුණු කාලෙ.......... මං හිතන්නේ '51 විතර. ඒ තරම් අතිදක්ෂ ශිෂ්‍යයෙක්, මට මේ තරම් කාලෙකට හමුවෙලා නෑ. විද්‍යාත්මක පර්යේෂණ ක්ෂේත්‍රයේ ඔහුට දීප්තිමත් අනාගතයක් ඇති බව, මට ඒ කාලෙම පෙනුණා"

"වෛද්‍යවරයෙක් හැටියට?"

"සාමාන්‍ය වෛද්‍යවරයෙක් වෙන්න ප්‍රමාණවත් තරමට, ඔහුට මධ්‍යම ප්‍රමාණයේ දක්ෂතා තිබුණා. රෝග හඳුනාගැනීම අතින් නම් දුර්වලයි. නමුත් රසායනාගාරයේදී අති විශිෂ්ටයෙක් බව පෙන්නුවා."

"ඒ මොන ආකාරයෙන් ද?"



www.sinhalaelibrary.com

"කෙනෙකු ආචාර්ය උපාධිය සඳහා කළයුතු පර්යේෂණ, ජෙකිල් කළේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුව සිටිය අවදියේ." මහාචාර්යතුමා කීය. "ඖෂධවේදය ගැන ඔහුට තිබුණු දැනුම පුදුමාකාරයි. ඒ කාලයේ රෝග සඳහා අප නියම කළ ඖෂධවල, අතුරුආබාධ විශාල වශයෙන් තිබුණා. ඒවායෙන් රෝගීනට හරියට අතුරු ආබාධ ඇතිවුණා."

"උදාහරණයක් කිව්වොත්............?"

"ඔහොම ඉන්න බලන්න......... මං ටිකක් මතක් කරන්න.......... ආ ඔව්. ලේ අතිසාරය සහිත පාචනයට, ඒ කාලෙ අපි දුන්නේ පොටෑසියම් සයික්ලෝ සල්ෆාඩයසීන් ඖෂධය. ඒකෙන් පාචනය හොඳවුණා. නමුත් සමහර රෝගීන්ගේ රුධිරයේ ශ්වේතානු විනාශ වී ගියා. එවිට ඔවුන් පහසුවෙන් වෙනත් රෝගවලට ගොදුරුවී මියගියා.

මේ සඳහා අතුරු ආබාධ නොමැති ඖෂධයක් සොයන්න, මං පර්යේෂණ කළා. ඒකට මං හවුල්කරගත්තේ ජෙකිල්. අපි දෙන්නා, රෑ දවල් නොබලා, මාස ගණනක් දැඩි වෙහෙස මහන්සියක් දැරුවා. අන්තිමේ අපට හැකිවුණා, අතුරු ආබාධ නොමැති ඖෂධයක් හොයාගන්න. පොටෑසියම් වෙනුවට සෙලේනියම් යෙදීමෙන්, අපට පුළුවන් වුණා ප්‍රශ්නය විසඳන්න. මේ විශිෂ්ට සොයා ගැනීමට මූලිකයා වුණේ ඔහු. මේ ඖෂධය හා එහි ප්‍රයෝජන ගැන, මං බ්‍රිතාන්‍ය වෛද්‍ය සඟරාවට ලිපියක් ලිව්වා. එය නිෂ්පාදනයට ජෙකිල්ගේ තිබුණු දායකත්වය සඳහන් කරන්න මං බලාපොරොත්තු වුණා. නමුත් ඔහු ඊට එකහෙළාම විරුද්ධ වුණා."

"මොකක්ද ඒකට හේතුව?" හෝම්ස් විමසුවේය.

"මං දන්නෙ නෑ මහත්මයා"

"ඔහු විශ්වවිද්‍යාලයෙන් පිටවුණු පසු ඔබ සමග පර්යේෂණවලට හවුල්වුණේ නැද්ද?"

"කණගාටුවට කරුණ ඒකයි මහත්මයා" මහාචාර්යවරයා කීය. "මට මතක හැටියට ඒ කාලෙ තමයි අර යුද්ධය........ මොකක්ද ඒකට කියන්නෙ............ මට දැන් මතක නෑ"

ඔහු හිස කසමින් කල්පනා කළේය.

"කමක් නෑ. මොකක් හරි..........යුද්ධයක් පටන්ගත්තා"

"ඔබ කියන්නෙ ක්‍රිමියන් යුද්ධය ද?"





"අන්න හරියට හරි. ක්‍රිමියන් යුද්ධෙ. ඔහු විශ්වවිද්‍යාලයේ ආචාර මණ්ඩලයට බැඳෙන්නේ නැතුව, යුද්ධෙට ගියා. ඔහු සහකාර කථිකාචාර්යවරයෙක් හැටියට බඳවාගන්න, පසුව මං දැඩි උත්සාහයක් දැරුවා. නමුත් මොකක් හරි හේතුවක් නිසා, ඒක සාර්ථක වුණේ නෑ.......... මං හිතන්නේ ඔහුට උවමනා වුණා, පර්යේෂණ කටයුතු ස්වාධීනව කරන්න. ඒ නිසා ඔහු ලන්ඩන් නගරයට ගිහිං, පෞද්ගලික වෛද්‍ය වෘත්තිකයෙක් බවට පත්වෙලා, පර්යේෂණ පටන්ගත්තා කියා මං දන්නවා"

"ඔහු පර්යේෂණ කළේ මොනවා සම්බන්ධයෙන් ද කියා ඔබට දන්වා එවුවාද?"

"මුලදී නම් ඔහු තමන් කළ පර්යේෂණ වල, සාර්ථක අසාර්ථක බව මට දන්වා එවුවා. පසුව ක්‍රමයෙන් එය මඟහැරී ගියා. ඔහු බ්‍රිතාන්‍ය වෛද්‍ය සඟරාවට ලියූ ලිපි නම්, මං මෑතක් වෙනතුරු කියෙව්වා. ඔහුට ශුභපතා මං ලියුම් යැව්වා. නමුත් ඒවාට පිළිතුරු ලැබුණේ නෑ"

"ඔබට වෙන මොනවද ජෙකිල් ගැන මතක?" හෝම්ස් ඇසීය.

"ෂෝපන්හවර් නම් දර්ශනවාදියා ගැනත්, ඔහු ඉදිරිපත් කළ මතවාද ගැනත් අපි දෙන්නා කථා කළා මට මතකයි" මහාචාර්යතුමා කීය. "මට මතකයි පසුව ඔහු ලියා එවූ දෙයක්. මිනිසාගේ කායික රෝග ගැන, තමා තවදුරටත් ඖෂධ නොසොයන බව, ජෙකිල් කියා තිබුණා. ඔහු පර්යේෂණ කළේ මනුෂ්‍යයාගේ දරුණු ස්වභාවය ඉවත්කර, හොඳ මිනිසා වෙන් කර ගැනීමට. ඒවා ගැන මගේ උනන්දුවක් තිබුණේ නැහැ. ඒ නිසා අපේ ලියුම් ගනුදෙනු ක්‍රමයෙන් නැවතුණා."

"හෙන්රි ජෙකිල්ගේ පෞද්ගලික ජීවිතය ගැන ඔබට මොනවාද කියන්න පුළුවන්" හෝම්ස් විමසුවේය.

"ඒ ගැන මට මොකුත් කියන්න බෑ මහත්මයා" මහාචාර්යතුමා කීය. "ඒ ගැන කිසිදෙයක් මං දන්නෙත් නෑ. මගෙන් අහන්නත් එපා. ශුභ දවසක් මහත්වරුනි!"

මෙසේ කී මහාචාර්යවරයා හිස්වැස්ම දමාගෙන කාමරයෙන් එළියට ගියේය. ඒ තවදුරටත් අප සමග කතාබහ කිරීමට අකමැති බැව් හඟවමිනි.



www.sinhalaelibrary.com

අපි එතැනින් පිටත්වී අපේ නවාතැන වූ හෝටලය වෙත ආපසු පැමිණියෙමු.

"වොට්සන් අද හවස එතරම් හොඳ කාලගුණයක් තිබින එකක් නෑ" හෝම්ස් කීවේ අහස දෙස බලමිනි. "අපි හෙට උදේ යමු දොස්තර පෝල් මැක්ලීන්ස් හොයාගෙන. ග්ලාස්ගෝ වලට"



14

# නවත් හෝඩුවාවක් පසුපස

අප ග්ලාස්ගෝ නගරය වෙත ළඟාවෙද්දී, දහවල් දොළහට ළංවී තිබිණි. වෛද්‍ය පෝල් මැක්ලීන්ස්ගේ ශල්‍යාගාරය සොයා ගැනීමට අපහසු නොවිණි. ඔහුගෙන් ප්‍රතිකාර ගැනීමට සෑහෙන සෙනගක් එහි රැස්ව සිටියේය.

"මේ ලෙඩුන්ට ප්‍රතිකාර කරන එක නවත්වලා, අප එක්ක කතාබහ කරන්න, වෛද්‍යවරයා කොහොමටවත් කැමැතිවෙන්නෙ නෑ" මම කීවෙමි.

"ඔව්" හෝම්ස් කීය. "එහෙම කලබලේට වචන දහයක් දොළහක් කතාබහ කරලා, අපට ඇති වැඩකුත් නෑ. හෙදියගේ මාර්ගයෙන් ඔබේ ආගන්තුක පත්‍රය යවන්න වොට්සන්. අපි ඇයට කියමු දොස්තර මහතා දකින්න, එක මිනිත්තුවක කාලයක් ලබාදෙන්න කියලා. ඊළඟට ඔහු සමඟ නිදහසේ කතා කරන්න වෙලාවක් යොදාගමු."

"ඔබ දෙදෙනා හමුවීමට ලැබීම ගැන සන්තෝෂයි මහත්වරුනි." ඒ ක්ෂණික හමුවීමේදී වෛද්‍යවරයා කීය. "ඒත් මේ මොහොතේ නම් ඔබ සමග සුහද කතාබහකට වෙලාවක් නෑ."

"ඒක අපට තේරෙනවා මහත්මයා" හෝම්ස් කීය. "දහවල් කෑමට පසු ඔබ විවේක ගන්නා අතරේ, පැය කාලක් අප වෙනුවෙන් වෙන් කළ හැකි නම්........"

"ඉතාම හොඳයි" දොස්තර මැක්ලීන්ස් කීය. "ඔබට දවල් එකේ සිට එකයි කාල දක්වා පැය කාලක් ලබාදෙන්න මට පුළුවනි. අපි ස්විස් හෝටලයේදී හමුවෙමු. ඔබට මා හමුවෙන්න උවමනා කුමන් සම්බන්ධයෙන්ද? මොළයට ලේ ගැලීම නිසා සිහි මූර්ජාවට පත්වෙන රෝගීන් සුවපත් කිරීමට මා සොයාගත්. "මැක්ලීන්ස්" ශල්‍යකර්මය ගැන ද?"

"නැහැ මහත්මයා" හෝම්ස් කීය. "මේක වෛද්‍ය ප්‍රතිකාර හෝ රෝගීන් ගැන කතාබහක් නෙමෙයි."

"එහෙනම්?"

"ඔබේ හිතමිත්‍ර හෙන්රි ජෙකිල් ගැන කළ යුතු විමසීමක්......"

"මොනවා? හෙන්රි ජෙකිල් ගැන?" දොස්තර මැක්ලින්ස් ඔහු හිඳගෙන සිටි පුටුවෙන් ඉහළට එසවුණේ ඔහු නොදැනුවත්වමය. "ඔහුට මොකුත් කරදරයක් නැහැනේද? ඔබ දෙදෙනා ජෙකිල්ගේ මිත්‍රයන්ද? ඔබ හමුවීමත් සතුටක් මහත්වරුනි. ජෙකිල් පිස්සා, තවම සනීපෙන් ඉන්නවා නේද? ඒකගෙ මළඉලව් පර්යේෂණ තවමත් ඉවරකරල නැද්ද? ජෙකිල් ගැන කතාබහ කරන්න මං වෙන්කරන්නම් පැයක්. අපි ඔක්කොම කතාකරමු. දවල් එකට එන්න ක්වීන්ස් හෝටලයට. මං සමග දහවල් කෑම ගැනීමට, මං ඔබ දෙදෙනාට ආරාධනා කරනවා." කී වෛද්‍යවරයා අප දෙදෙනාට අතට අත දී පිටවී යෑමට අවසර දුන්නේය.

"අපි හිතුවාට වඩා වැඩේ සාර්ථකයි. එහෙම නේද වොට්සන්? ජෙකිල් ගැන තොරතුරු දැනගන්න ඔහු ඉන්නේ නොඉවසිල්ලෙන්"

"මං හිතන්නේ අපට ඕන කරන නියම පුද්ගලයා හමුවුණා." මම කීවෙමි.

දහවල් එකට පෙර ක්වීන්ස් හෝටලය වෙත ගොස් අපි, එහි ආලින්දයේ වාඩිවී සිටියෙමු. දොස්තර මැක්ලින්ස් හරියටම දහවල් එකට එහි ළඟාවිය.

"මං ප්‍රමාද නැහැ නේද මහත්වරුනි?" ඔහු ඇසීය. "කතාබහ කරන අතරේ අපි මොනවා හරි බොමු. මොනවද ඔබ බොන්න කැමැති? මම නම් කැමැතියි බ්‍රිස්ටල් ක්‍රීම් ෂෙරි ටිකක් පානය කරන්න. ඔබත් කැමැතියි? එහෙනම් මෙහෙන් වාඩිවෙමු."

දොස්තර පෝල් මැක්ලින්ස්, ඉතාම ප්‍රසන්න, කතාබහට ලැදි පුද්ගලයෙකු බැව් අපි ඉක්මනින් වටහාගත්තෙමු.

"වෛද්‍ය විද්‍යාවත්, ශල්‍යකර්මත් ගැන කතාකරල, මට දැන් එපාවෙලා" ඔහු කීය. "පරණ මිත්‍රයන් ගැන, විශ්වවිද්‍යාලයේ ගතකළ ජීවිතය ගැන, නිදහසේ කතාකරන්න ලැබෙනවා නම් මොන තරම් සතුටක්ද? ජෙකිල්ව එක්කරගෙන ආවෙ නැත්තෙ ඇයි? මං හිතන්නෙ, මං මිනිහව දැක්කෙ නෑ, අවුරුදු දහයකින් නැත්නම් පහළොවකින්. ඒත් විනෝදයෙන් ගමනක් බිමනක් යන්න, වෛද්‍යවරයෙකුට කොයින්ද නිදහසක්. ඉතින් මට ඉස්සර වෙලාම කියන්න හෙන්රි ජෙකිල් ගැන අලුත්ම තොරතුරු"





"අපට උවමනා කරන්නෙත් ඔබේ ඒ මිත්‍රයා ගැන කතා කරන්න තමයි." කී හෝම්ස්, යහපත් වෛද්‍යවරයකු ලෙස ජෙකිල් මහජනයාගේ හොඳ හිත දිනා ඇති ආකාරය විස්තර කළේය. මිනීමැරුමකට සැකකරන හයිඩ් නම් අපරාධකාරයෙකු ජෙකිල්ගෙන් රැකවරණය ලබනවා යයි, පොලීසියට සාධාරණ සැකයක් ඇතිවී තිබෙන බව ද හෝම්ස් පැවසුවේය. අපගේ අරමුණ, ජෙකිල් මෙම අපවාදයෙන් ගලවාගැනීම බැව් හෝම්ස් පැවසුවේ, මැක්ලින්ස්ගේ විශ්වාසය දිනාගනිමිනි.

"හෙන්රි ජෙකිල් කියන්නේ ඉතාම කරුණාවන්ත, ගුණයහපත් මනුස්සයෙක්" මැක්ලින්ස් කීය. "අපි යාළුවො හතරදෙනෙක් හිටියා. ජෙකිල්, ඔනීල්, ජිගින්ස් සහ මම. අප අතර හිටි ඉතාම හැන්පත්, කිවුණු ගතිගුණ තිබුණු, ඉවසීමෙන් කටයුතු කළ, ලේසියට කේන්ති නොයන පුද්ගලයා තමයි ජෙකිල්. හැබැයි ඉතාම කලාතුරකින් කේන්ති ගියදාට, ඔහු යක්ෂයාටත් අන්තයි. නමුත් එහෙම දෙයක් අපේ මුළු ජීවිතයේදීම, අපට දකින්න ලැබුණේ, දෙතුන් වරක් පමණයි."

"ඔහු ඉගෙනීමට අතිදක්ෂයෙක් බවත්, පර්යේෂණ සඳහා කාලය කැපකළ බවත්, මහාචාර්ය ආම්බ්‍රුස්ටර් අපට කිව්වා" මම කීවෙමි.

"ආ...... ඔව්" මැක්ලින්ස් කීය. "වාලින් එක්ක එකතුවෙලා, ජෙකිල් ඖෂධවේදය සම්බන්ධ පර්යේෂණ ගණනාවක් කළා. රෝගීන්ට අහිතකර නැති, අලුත්ම ඖෂධ දෙකක් හෝ තුනක් හොයාගන්න ඔවුන්ට හැකිවුණා. ජෙකිල් ඒවාට පර්යේෂණ කළේ හරිම කැපවීමකින්.

මට මතකයි වරක් අපි නත්තල් නිවාඩුවට, බෝට්ටුවකින් ඩෙන්මාක් බලා විනෝද ගමනක් යන්න යොදාගෙන හිටියා. අයිස් කඳු පාවෙන උතුරු මුහුදේ, ඝන මීදුම ගලා එද්දී බෝට්ටුවකින් යාත්‍රාකිරීම අනතුරුදායකයි. ශීත සෘතුවේදී මෙවැනි ගමනක් යාම ඉතාම අන්තරායකාරී එකක් බව අමුතුවෙන් කියන්න උවමනා නෑ. මුලින් මේක යෝජනා කළෙත් ජෙකිල්මයි. නමුත් ඔහු කරමින් සිටි පර්යේෂණය සාර්ථක ලෙස අවසන් කරන්න බැරිවුණ නිසා, අන්තිම මොහොතේ එන්න බෑ කිව්වා. කැමැති නම් අපි තුන්දෙනාට යන්න කිව්වා. නමුත් අපට වඩා, ත්‍රාසජනක මුහුදු ගමන්වල යෙදී, අත්දැකීම හා පළපුරුද්ද තිබුණේ ජෙකිල්ට. ඒ නිසා අපි ඒ ගමන, යොදාගත් දිනේට ගියේ නෑ. ගමන සතියකින් කල්



www.sinhalaelibrary.com

දැම්මා. ජෙකිල් රෑ දවල් නොබලා මහන්සිවෙමින්, දින හතරක් ඔහුගේ පර්යේෂණ කළා. අන්තිමේදී සාර්ථක ප්‍රතිඵල ලැබුවා. උවමනා කරන ඖෂධය නිෂ්පාදනය කළාට පස්සේ, ඉතිරිවැඩ ටික වාලිට බාරදීලා, අපිත් එක්ක විනෝදගමනටත් ආවා. ඒ වෙනකොට ගිනිකොන දිගාවෙන් හමා එන කුණාටු පටන් අරගෙන. අපේ බෝට්ටුව කුණාටුවට අහුවෙලා, ග්‍රීන්ලන්තය පැත්තට ගහගෙන ගියා. කෑමබීම නැතුව දින ගණනක් බෝට්ටුවේ ගත කළ අපි, මරණය පෙනි පෙනී හිටියේ. තල්මසුන් දඩයමේ යෙදුණු නැවක් හමුවෙලා, අපි ජීවිතය බේරාගත්තා."

"දොස්තර මැක්ලීන්ස්" හෝම්ස් කීවේ ඔහුගේ වීදුරුවේ ඉතිරිව තිබූ ෂෙරි ස්වල්පය බී අවසන් කරමිනි. "ඔබේ කතාවෙන් මං තේරුම් ගත්තේ මෙහෙම දෙයක්. දොස්තර ජෙකිල්, තියුණු බුද්ධියක් ඇති, ත්‍රාසජනක වැඩවලට කැමැති, අවදානම් කටයුතුවල නිර්භයව යෙදුණු කෙනෙක් බව?"

"එපමණක් නොවෙයි" මැක්ලීන්ස් කීය. "මිනිසාගේ යහපත වෙනුවෙන්, ඖෂධ-රසායන විද්‍යාත්මක පර්යේෂණ සඳහා කැපවීමෙන් කටයුතු කළ කෙනෙක්. වේදනාවෙන් පෙළුණු දුක්ඛිත රෝගීන් වෙනුවෙන්, තමන්ගේ පෞද්ගලික මුදලින් ඖෂධ මිලට ගෙන, නොමිලේ ප්‍රතිකාර කළ වෛද්‍යවරයෙක්. ඒ වගේමයි අයුක්තිය අසාධාරණය ඉදිරියේ දණ නොනැමූ කෙනෙක්. ජෙකිල්ගේ ඒ තොරතුරු අප්‍රමාණයි. අවුරුදු හතරක පමණ අපේ සරසවි ජීවිතයේ ඒ අත්දැකීම්, ගමන් බිමන්, පර්යේෂණ, ගැන කතාකරන්න, මට දවස් දෙකක් තිබුණත් මදි" දොස්තර මැක්ලීන්ස් කීවේ, තම ඔරලෝසුව දෙස බලමිනි. මිළඟට ඔහු වේටර් කැඳවා දහවල් ආහාරය මේසයට සූදානම්ද යන්න විමසුවේය. ඒ අනුව අපි දහවල් ආහාරයට සැරසුණෙමු.

"මට සමාවෙන්න මහත්වරුනි, මං ගන්නේ නිර්මාංශ ආහාර පමණයි" මැක්ලීන්ස් කීය. "ඒත් ඔබ වෙනුවෙන් සියලුම මස්මාංශ සූදානම්"

"දොස්තර මහත්මයා" හෝම්ස් කීය. "දැන් මං කැමතියි ජෙකිල් වෛද්‍ය ශිෂ්‍යයෙකුව සිටි අවදියේ ඔහුගේ පෞද්ගලික ජීවිතය ගැන දැනගැනීමට............"

"ජෙකිල්ගේ කලණ මිත්‍රයෙක් හැටියට ඔහුගේ පෞද්ගලික ජීවිතය ගැන, මං කතාකිරීම වැරදියි" මැක්ලීන්ස් කීය.





"නමුත් අපේ අරමුණ ඔහු හයිඩ් නම් මේ අපරාධකාරයාගෙන් ගළවා ගැනීම" හෝම්ස් කීය. "අපේ හිතේ සාධාරණ සැකයක් තියෙනවා. ඒ දොස්තර ජෙකිල්, හයිඩ් නම් අපරාධකාරයාගේ ප්‍රාණ ඇපකාරයෙක් බවට පත්වෙලාද කියලා."

"ඒ කොහොමද?"

"ජෙකිල් තරුණ කාලයේ ගත කළ ජීවිතයේ රහසක් හරි තොරතුරු හයිඩ් දැනගෙන, ඒවා ප්‍රසිද්ධ කරන බව කියා ජෙකිල්ට තර්ජනය කරනවා ඇති. ඒවා හෙළිවී තමන් අපකීර්තියට පත්වේ යයි බියෙන්, ජෙකිල් අපරාධකාරයාට යටත්වෙලා ඇති. අපට තියෙන්නේ යහපත් අරමුණක්, ජෙකිල් ගළවාගැනීම සඳහා.........."

"............ කාගෙ කාගෙත් පෙට්ටගම්වල ඇටසැකිලි තියෙනවා." මැක්ලීන්ස් කීය. "එහෙම නැති කෙනෙක් මේ ලෝකෙ නෑ. ඉන්නවා නම් පැවිද්දන් වගේ ජීවිත ගතකළ අය විතරයි. ඒ වුණත් මං කොහොමද කෙනෙකුගේ පෞද්ගලික කාරණා ඔබට කියන්නේ........"

වෛද්‍යවරයා ආහාරගැනීම මඳකට නවත්වා කල්පනා කළේය. මිනිත්තු කිහිපයකට පසු යළිත් ආහාර ගැනීම ඔහු ඇරඹුවේ, තීරණයකට පැමිණි ආකාරයෙනි. "හොඳයි, මට පුළුවනි, ඔබට යම් උදව්වක් කරන්න." ඔහු කීය. "අපි කාටත් වගේ ජෙකිල්ටත්, තරුණ කාලයේ ප්‍රේම සම්බන්ධයක් තිබුණා. ඒ, විශ්වවිද්‍යාලයට අනුබද්ධ රෝහලේ තරුණ හෙදියක සමග. ධනවත් පවුලක කෙනෙකු වූ ඇගේ මව, රෝහල් උපදේශක මණ්ඩලයේ සාමාජිකාවක්. ඇය තමන්ගේ එකම දියණිය ස්වේච්ඡා හෙදියක ලෙස රෝහල් සේවයට එව්වේ, අනෙක් අයට ආදර්ශයක් ලෙස..........."

අප ඉතා උනන්දුවෙන් සවන්දෙන බැව් දුටු විට දොස්තර මැක්ලීන්ස්ගේ හිතේ තිබූ අවහිරතා ඉවත්වෙන ලකුණු පෙනිණ.

"............ මේ තරුණියගේ නම මේරියන් ඩැල්රිම්පල් - සූරියකාන්ත මලක් මෙන් සුන්දර යුවතියක්. ඇගේ පියා ධනවත් ඉංග්‍රීසි ජාතික නාවික ව්‍යාපාරිකයෙක්. මව ග්‍රීක් ජාතික කාන්තාවක්.

ඉතා කඩවසම්, කාර්යශූර, දීප්තිමත් වෛද්‍ය ශිෂ්‍යයෙකු වුණු හෙන්රි ජෙකිල්ගේ ආදරය දිනාගන්න, තරුණියන් අතර තිබුණේ සටනක්. තරුණ හෙදියන්, වෛද්‍ය ශිෂ්‍යාවන් පමණක් නොවෙයි මහාචාර්යවරුන්ගේ දියණියන් පවා මේ සටනට එක්වී හිටියා.



www.sinhalaelibrary.com

නමුත් අන්තිමේදී ජෙකිල්ගේ ආදරය හිමිවුණේ මේරියන් ඩැල්රිම්පල්ට. මං හිතන්නේ ඒ කාලයේ ඇයට වයස අවුරුදු දහහතක් දහඅටක් වෙන්න ඇති."

කථාව නැවැත්වූ වෛද්‍යවරයා, වීදුරුවෙන් වතුර උගුරු කිහිපයක් පානය කළේය. ඔහු යළිත් කථාව අරඹන තුරු, අපි නිශ්ශබ්දව කෑම ගත්තෙමු. මිනිත්තු කිහිපයක් ගෙවුණත් ඔහු කථාව අරඹන අයුරක් නොපෙනිණ. අපි පුදුමයෙන් ඔහු දෙස බැලුවෙමු. ඔහු ඉවත බලාගෙන ගැඹුරු කල්පනාවකට වැටී සිටියේය. කෑම ගැනත්, අප ගැනත් ඔහුට අමතක වී තිබූ බැව් අපි දුටුවෙමු. මැක්ලීන්ස්ගේ මුහුණේ තිබුණේ, ශෝකාකුල බැල්මකි. ඒ අතීතය සිහිවීමෙන් බැව් තේරුම් ගැනීම අපහසු නොවීය.

"මට සමාවෙන්න මහත්වරුනි" ඔහු කීවේ බිඳුණු ස්වරයකිනි. "කතාවේ ඉතිරි හරිය ඔබට කියන්න, එක් අතකින් මට ශක්තියක් නෑ. අනෙක් අතට ඒක හෙළිකරන්න, මට සදාචාරාත්මක අයිතියක් නෑ. කතාවේ ඉතිරි හරිය ඔබට ඇයගෙන්ම අහගන්න පුළුවනි. ඇය තවමත් එඩිංබ්‍රෝ නගරයේ ජීවත්ව සිටිනවා. ඇගේ නිවසේදී ඔබට ඇය හමුවිය හැකියි. අපට ඉගැන්වූ මහාචාර්ය සෙඩ්රික් විල්කොක් මීට මාසයකට පමණ පෙර මියගියා. ඒ අවමඟුලට ඇයත් පැමිණ සිටියා. ඇය තවමත් පදිංචිව සිටින්නේ ඇගේ මහගෙදර. ඒ එඩිංබ්‍රෝ විශ්වවිද්‍යාලයට නුදුරු කැන්ඩිල්මේකර් පාරේ. ග්‍රේෆ්‍රයර්ස් දෙව් මැඳුර අසල, ඔවුන්ගේ නිවසේ. ඒ බව ඇය මට කිව්වා. හෙන්රි ජෙකිල් ගැන නිවැරදි සම්පූර්ණ තොරතුරු, ඔබට ඇයගෙන් අසා දැනගත හැකියි.

ඇගේ නිවසේ අංකයද? අංකය නම් මට හරියට මතක නෑ. නමුත් නිවස හොයාගැනීම අමාරු නෑ. නිවසේ නම "ග්‍රැන්ඩිෆ්ලෝරා" එය තිබෙන්නේ රොබට් බර්න්ස් ස්මාරකය ඉදිරිපිටම යි."

හෙන්රි ජෙකිල් ගැන ඔහුට කීමට හැකි එපමණක් බව, අපි වටහාගත්තෙමු. දොස්තර පෝල් මැක්ලීන්ස්ට ස්තුතිකොට, අපි ඔහුගෙන් සමුගත්තෙමු.



15

# ග්‍රැන්ඩිෆ්ලෝරා නිවසේදී

දොස්තර මැක්ලීන්ස් දුන් උපදෙස් අනුව, ග්‍රේෆ්‍රයර්ස් දෙව්මැඳුර අසල වූ 'ග්‍රැන්ඩිෆ්ලෝරා' නිවස සොයාගැනීම අපට අපහසු නොවිණි. නිවස ඉදිරිපස තිබුණේ, අඩි අටක් පමණ උස තාප්පයකි. එය පුරා යවා තිබුණේ තන්බර්ජියා ග්‍රැන්ඩිෆ්ලෝරා නම් දම්පැහැති මල්වලින් බරවූ මල්වැල් රාශියකි. ගල්වලින් ගොඩනැංවූ ඒ නිවස අවුරුදු පනහක් පමණ පැරණි එකක් වුවත්, මෑතකදී ද තීන්ත ආලේප කර තිබූ අලංකාරව තබාගත් එකක් විය.

"කවුරු හම්බවෙන්නද?" කිසිවෙකු විමසනු ඇසී අපි වටපිට බැලුවෙමු. අප අසල සිටියේ වයස්ගත සේවකයෙකි. අත්මුල්ලුවක් අතින් ගෙන සිටි ඔහු, උද්‍යානසේවකයා වියයුතු බවට මම අනුමාන කළෙමි.

"අපි ආවෙ මේරියන් ඩැල්රිම්පල් මෙනෙවිය හමුවෙන්න" හෝම්ස් කීය. "අපට මෙහේට එව්වෙ ග්ලාස්ගෝ නගරයේ වෛද්‍ය විශේෂඥ මැක්ලීන්ස් දොස්තර මහත්තයා"

එතැනම රැඳී සිටින ලෙස අපට සංඥා කළ සේවකයා, නිවස තුළට ගියේය.

"ඇය තවමත් මෙනෙවිය ද, නැත්නම් මහත්මියක් ද කියල මැක්ලීන්ස් කිව්වෙ නැහැ." මම කීවෙමි. "කොහොම ද අපි ඇයට ආමන්ත්‍රණය කළ යුත්තේ?"

"ඒක නම් මටත් හිතාගන්න අමාරුයි" හෝම්ස් කීය. ඒ ගැන නොදන්න නිසා අපි 'මෙනෙවිය' කියල ආමන්ත්‍රණය කරමු."

සේවකයා ආපසු පැමිණියේ මිනිත්තු කිහිපයකට පසුවය. ඔහු පිටුපසින් පැමිණියේ නිවසේ ප්‍රධාන ගෘහසේවකයාය. අපට ආලින්දයේ හිඳගන්නා මෙන් දැනුම් දුන් ඔහු, ආපසු යෑමට පෙර පැමිණි කාරණය ද විමසුවේය. එය පෞද්ගලික කරුණක් යයි හෝම්ස් පැවසූ විට, තවදුරටත් ප්‍රශ්න නොකෙරිණි. ඇය පැමිණෙන තුරු සැහෙන වෙලාවක් බලාසිටීමට අපට සිදුවිය. ශාන්තාවකගේ සේද සායක රැළි එකිනෙක ගැටෙද්දී නැගෙන හඬ, අන්තිමේදී අසන්නට ලැබිණි.

ඇය ආලින්දය වෙත පැමිණි වහාම, අපි අසුන්වලින් නැගිට, ඇයට ආචාරකළෙමු. මේරියන් ඩැල්රිම්පල් මෙනෙවිය වයසින් අවුරුදු පනහට ළංව සිටින්නියක යැයි, මම අනුමාන කළෙමි. එහෙත් මැක්ලීන්ස් අපට කියූ පරිදි, සූරියකාන්ත මලක් මෙන් ඇය සතුව තිබූ රූපශෝභාව, තවමත් ඉවත්ව ගොස් නොතිබිණි. මුළු සිරුරම ආවරණය වනසේ කළු පැහැති දිග ගවොමක් ඇඳ සිටි ඇය වෙතින්, මා දුටුවේ ග්‍රීක ආදිපාදවරියකගේ පෙනුමය.

"කලින් ලියා දන්වා වේලාවක් වෙන්කර ගෙන, මෙහි නොපැමිණීම ගැන අපට සමාවෙන්න මෙනෙවිය" හෝම්ස් කීය.

"කමක් නෑ. ඔබ දෙදෙනා මෙහේට එව්වෙ දොස්තර මැක්ලීන්ස් බව මට දැනගන්න ලැබුණා." ඇය පැවසුවේ මියුරු කටහඬකිනි. "මුලින්ම මං කැමතියි ඔබ දෙදෙනා කවුද කියල හඳුනාගන්න. ඊට පස්සෙ මට කියන්න, ඔබ මගෙන් බලාපොරොත්තු වෙන උදව්ව මොකක්ද කියල." ඇය පැවසුවේ ස්කොට්ලන්තයේ අසන්නට ලැබෙන ඉංග්‍රීසි උච්චාරණයෙනි.

"මගේ නම ෂර්ලොක් හෝම්ස්. මම අපරාධ පරීක්ෂණ වලදී පොලිසියට උදව්වෙන කෙනෙක්. මේ මගේ මිත්‍රයා දොස්තර ජෝන් වොට්සන්. අපි ලන්ඩන් නගරයේ ඉඳලමයි ආවෙ." හෝම්ස් අසුනෙන් නැගිට අපේ ආගන්තුක පත් ඇය අතට දුන්නේය. ඇය ඒවා හොඳින් පරීක්ෂාකර බැලුවාය. අනතුරුව අපට හිඳගන්නා ලෙස සංඥා කළ ඇය, සැපපහසු වේවැල් පුටුවක හිඳගත්තාය.

"හොඳයි. මොනවද මගෙන් කෙරෙන්න උවමනා?"

"ඔබතුමිය පුවත්පත් වල දකින්න ඇති, සර් ඩැන්වර්ස් කැරූ නම් වයස්ගත මහත්මයා, මාස කිහිපයකට පෙර සාහසිකයෙකු අතින් මරණයට පත්වුණු බව. සර් ඩැන්වර්ස් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වගේම රජපවුලේ සමීප මිත්‍රයෙක්"

"ඔය සිද්ධිය ගැන පුවත්පත්වල පළවුණු වාර්තා මං කියෙව්වා මහත්මයා" ඇය කීවාය. "ඒවා කියවලා මං හරිම කම්පාවට පත්වුණා. අසරණ වයස්ගත කෙනෙකුට අපරාධකාරයෙක් මෙහෙම දෙයක් කළේ ඇයි කියල. මට නම් හිතාගන්නත් අමාරුයි. පොලිසියටත් තවම මේක පැහැදිලි නැහැලු. එහෙම නේද? නැතිරුම් වලදී මත්පැනෙන් සිහිවිකල් වෙලා කෙරෙන අපරාධ ගැන අපට හිතාගන්න පුළුවනි. ඒත් පාටුවේ ගිය වයසක කෙනෙකුට........? ඔබට තවමත් බැරිවුණාද ඒ අපරාධකාරයා අල්ලාගන්න?"





"අපට තවමත් බැරිවුණා" හෝම්ස් කීය. "ඔහු ලන්ඩන් නගරයේම සැඟවී සිටිනවා. නමුත් ඒ කොතැනකද කියා හොයාගන්න බැහැ. ඒ ඔද්වාට මේ අපරාධකාරයා, අසරණ වෛද්‍යවරයෙකු බීතියට පත්කරලා, ඔහු ප්‍රාණ ඇපකාරයෙකුගේ තත්ත්වයට හරවාගෙන ඇති බවයි පොලීසිය සැකකරන්නේ"

"ඉතින් පොලීසියට තියෙන්නේ, වෛද්‍යවරයා හිරභාරයට ගෙන ප්‍රශ්න කිරීම නොවැ?" ඇය කීවාය.

"ප්‍රශ්නය තියෙන්නේ ඔහු ඉතාම කාරුණික වෛද්‍යවරයෙක්." හෝම්ස් කීය. "මුළු ලන්ඩන් නගරයේම ආදරයට, ගෞරවයට පාත්‍රවුණු කීර්තිමත් වෛද්‍යවරයෙක්. එක්වරම ඔහු අත්අඩංගුවට ගැනීමෙන් කලබැගෑනියක් ඇතිවෙන්න පුළුවනි. අනෙක ඔහු අත්අඩංගුවට ගන්න තරම්, ප්‍රබල සාක්ෂි ඇත්තෙත් නැහැ. ප්‍රශ්න කිරීම් ආදිය කළා. නමුත් එයින් ප්‍රයෝජනයක් වුණේ නැහැ........"

"එතකොට මොනවද මගෙන් කෙරෙන්න ඕන?" ඇය ඇසුවාය.

"ඒ ගැන ඔබට විස්තර කරන්නයි මං මේ සූදානම් වුණේ." හෝම්ස් කීය. "මෙම අපරාධය කළ බවට සැක කරන පුද්ගලයාගේ නම එඩ්වඩ් හයිඩ්. ඔහු වෛද්‍යවරයා භයකරගෙන ඉන්නේ, වෛද්‍යවරයාගේ අතීත කාලයේ, මොකක් හෝ සිදුවීමක් දැනගෙන, ඒක හෙළිකරන බවට තර්ජනය කරමින් දෝ කියල, මගේ හිතේ සැකයක් තියෙනවා."

මේ වනතුරුත් ඩැල්රිම්පල් මෙනෙවිය, හෝම්ස් කී දෙයට සවන් දීගෙන, ඔහුගේ මුහුණ දෙසම බලාසිටියේ, ඉමහත් උනන්දුවෙනි. රෝස පැහැයට වඩා රතුපැහැයට හුරු ඇගේ මුහුණේ තිබුණේ, කුතුහලය මෙන්ම තැතිගැන්ම, බැව් මම දුටුවෙමි.

"................ ඒ කීර්තිමත් වෛද්‍යවරයාගේ නම හෙන්රි ජෙකිල්!" හෝම්ස් කීය.

එක්වරම තිගැස්සුණු ඇය, හුස්මක් ඉහළට ඇදගත්තාය. අවපාරයක් දුටු කලක මෙන් ඇගේ මුහුණ සුදුමැලි විය. ඇගේ දෙනෙත් පියවී ගිය අයුරු මම දුටුවෙමි. තව මොහොතකින් ඇය ක්ලාන්ත වී ඇදවැටෙතැයි මට සිතිණි. හෝම්ස්ට ද එසේ සිතෙන්නට ඇත. කරාව නැවැත්වූ ඔහු සූදානම් වූයේ, ඇය ඉදිරියට ඇදවැටුණොත්, වහා ඉදිරියට පැන ඇය අල්ලා ගැනීමටයි.

දෙනෙත පියාගෙන පුටුවේ පිටුපසට හේත්තු වූ කාන්තාව, මිනිත්තු හතරක් එලෙසම සිටියාය. සුදුමැලි වූ ඇගේ දෙතොල්



www.sinhalaelibrary.com

හා මුහුණ, මඳ වශයෙන් රෝස පැහැයට හැරීගෙන ආ බැව් මම දුටුවෙමි. එහෙත් එහි පෙර තිබූ ප්‍රභාව යළි මතු නොවිණි.

"............ මට සමාවෙන්න, මං ඔබේ හිතේ කැලඹීමක් ඇති කළා නම්............"

මගේ මිත්‍රයා කීවේ සමාව අයදින ස්වරයෙනි. තවත් මිනිත්තුවක් දෙකක් නිහඬව, දෙනෙත් පියාගෙන සිටි ඇය, අත එසවූයේ අපෙන් ගැහැටක් නොවූ බව හඟවමිනි.

"මහත්මයා, මං විශ්වාස කරනවා, ඔබ කරන්නේ යහපත් රාජකාරිය" ඇය පැවසුවේ බිඳුණු හඬකිනි. "අහන්න ලැබුණු දෙයින් හිතේ ඇතිවුණු කැලඹීම, මෙපමණකැයි මට වචනයෙන් විස්තර කරන්න බැහැ. නමුත් ඔබට සහායවීම මගේ වගකීමක්"

දිග සුසුමක් හෙළා ළය සැහැල්ලු කරගත් ඇය, සීනුවක් නාදකොට, සේවිකාවක කැඳෙව්වාය.

"මැඩිලින්, මට ටිකක් උදව්වෙන්න" ඩැල්රිම්පල් මෙනෙවිය කීවාය. "මට ආයෙමත් අර ක්ලාන්ත ගතිය ආවා."

ඇය සේවිකාවගේ අත තදින් අල්ලාගෙන අසුනෙන් නැගිට්ටාය.

"මැඩිලින්, අපි මේ මහත්වරුන්ට බොන්න මොනවා හරි සූදානම් කරමු."

සේවිකාවගේ අතින් අල්ලාගෙනම, ඇය නිවස තුළට ගමන් කළාය. අපි නිහඬව බලාසිටියෙමු.

මිනිත්තු කිහිපයක් ගතවෙද්දී සේවිකාව ඉදිරියට පැමිණියේ බ්‍රැන්ඩි, වයින් බෝතල් සහ වීදුරු සහිත කුඩා බීම ට්‍රොලියක් තල්ලු කරගෙනය. සේවිකාව අපට සංග්‍රහ කොට, නාමරිය වඩාත් උණුසුම් වනසේ ගිනිළුන සැකසුවාය. මීළඟට යළි නිවස තුළට ගිය ඇය, මිනිත්තු දහයකට පමණ පසු ආපසු පැමිණියේ සිය ස්වාමිදුව සමගයි.

ඩැල්රිම්පල් මෙනෙවිය තරමක් දුරට යථා තත්ත්වයට පැමිණ සිටි බැව් මම දුටුවෙමි.

"මැඩිලින්, රියැදුරාට කියන්න අද හවස මං යන්න හිටි ගමන්, හැම එකක්ම අවලංගු කළ බව. අසනීප ගතියක් නිසා මං ඒ කටයුතුවලට නො එන බව, ඒ ඒ තැන්වලට ගිහින් දැනුම් දෙන්න කියන්න.......... යන ගමන් දොර වහගෙන යන්න මැඩිලින්"

සේවිකාව, හිස නමා ආචාරකොට එතැනින් පිටවී යන අයුරු ස්වාමිදුව බලාසිටියාය.





"අවුරුදු තිහකට විතර කලින් වුණු සිදුවීම, එක්වරම මගේ මතකයට ආවා" ඇගේ කටහඬේ තිබුණේ වෙවුලන ස්වරයකි. "හෙන්රි සහ මා අතර තිබුණු සම්බන්ධය ගැන ඔබට දැනගන්න ලැබී ඇති බව පැහැදිලියි. ඒක සැඟවීමෙන් පලක් නැහැ. නමුත් ඔබට ලන්ඩන් නගරයේ විසඳන්න සිදුවෙලා තියෙන අපලට, මේක අදාළ වෙන්නේ කොහොමද කියලා නම්, මට තේරුම් ගන්න අමාරුයි"

"අපරාධකාරයා, දොස්තර ජේකිල්ගේ අතීතය හෙළිකරන බවට තර්ජනය කරමින් සිටින බවයි, අපි අනුමාන කරන්නේ" හෝම්ස් කීය.

"හෙන්රිගේ හා මගේ තිබුණු ප්‍රේම සම්බන්ධය ගැන, ඒ කාලෙ විශ්වවිද්‍යාලයෙන්, එඩිංබ්‍රෝ රෝහලෙත් හැමදෙනෙක්ම දැනගෙන හිටියා" ඇය කීවාය. "පසුව ඒක බිඳීගිය බවත්, ඒ කාලෙ අයට රහසක් නෙමෙයි. ඒ නිසා ඒ කරුණ හෙළිකිරීම ගැන හෙන්රි භයට පත්වේවි කියල මං හිතන්නේ නෑ..........."

"ඩැල්රිම්පල් මෙනෙවිය" හෝම්ස් කීය. "මට කියන්න හෙන්රි ජේකිල් මහත්මයා මොන වගේ කෙනෙක්ද කියලා. ඔහු ඉගෙනීමේ කටයුතුවලදී ඉතාම දීප්තිමත් ශිෂ්‍යයෙකුව හිටි බව, මහාචාර්ය ආම්බ්‍රස්ටර් අපට කිව්වා. ඖෂධවේදයේ ඔහු කළ පර්යේෂණ මගින්, අනාගතයේදී කීර්තිමත් විද්‍යාඥයෙකු වේවි කියා තමන් අනුමාන කළ බව මහාචාර්යතුමා අපට කිව්වා. දොස්තර මැක්ලින්ස් ඒ කරුණු සනාථ කළා. එපමණක් නොවෙයි. ත්‍රාසජනක ගමන්වල යෙදීමට, නිර්භයව, අවදානම් අභියෝග භාරගන්න ජේකිල් හපනෙක් බවත් කිව්වා."

"වෙන මොනවද මැක්ලින්ස් කිව්වේ?"

"ඔවුන් තරුණ කාලයේ යෙදුණු ත්‍රාසජනක ගමන්බිමන් ගැන කිව්වා. නමුත් ජේකිල් මහත්මයාගේ පෞද්ගලික ජීවිතය, ප්‍රේම සම්බන්ධතා ගැන ඇහුවාම ඒවා කීම ප්‍රතික්ෂේප කළා. මං හිතන්නේ ඔහුගේ පැත්තෙන් බැලුවාම එය නිවැරදියි.

නමුත් මං ඔහුට මතක් කර දුන්නා, මේක අපරාධයක් සම්බන්ධ කටයුත්තක්. මේ ඝාතකයා තවමත් නිදහසේ ගැවසෙනවා. ඔහු අල්ලා නොගත්තොත්, තවත් අසරණ මිනිසුන් කී දෙනෙක් මරා දමාවිද අපි දන්නෙ නෑ. දොස්තර ජේකිල්ගේ ජීවිතයත් අනතුරේ. අපරාධකාරයා යන්නමින් හෝ සම්බන්ධ, දොස්තර ජේකිල්ට පමණයි. ඒ නිසා ඔහු සම්බන්ධ සෑම හෝඩුවාවක් පිටුපසම අප



www.sinhalaelibrary.com

හඹා යනවා. ජෙකිල් මහත්මයාගේ අතීත තොරතුරු අපි හාරා අවුස්සන්නේ ඒ නිසා. ඒ මිස ඔබටවත් වෛද්‍යවරයාටවත්, සිත් වේදනාවක් ඇති කිරීමට නම් නොවෙයි. මගේ වචන විශ්වාස කිරීමට අපහසු නම්, කරුණාකර මේ ලිපිය කියවා බලන්න"

තම ඇතුළුකබායේ සාක්කුවට අත යැවූ හෝම්ස්, ඔහුට බලහල පවරා මහජින නිකුත් කළ ලියමන, ඩැල්රිම්පල් මෙනෙවියගේ අතට පත්කළේය. එය කියවා බැලූ පසු, ඇය සැහීමකට පත්වූ බවක් පෙනිණ.

"අපේ අරමුණ මේ අපරාධකාරයා අල්ලා ගන්න ගමන්, ඔහුගේ ග්‍රහණයෙන් දොස්තර ජෙකිල් නිදහස් කර ගැනීම." හෝම්ස් යළිත් කීය. "ඒ නිසා ඔබ දන්න හැම දෙයක්ම, මට හෙළිකරන මෙන්, මං ඔබට ආයාචනා කරනවා"

"හෝම්ස් මහත්මයා. මං ඔබට හැමදෙයක්ම කියන්නම්" ඇය කීවාය. "නමුත් මේක අතිශයින්ම රහසිගතයි. මා සහ හෙන්රි ජීවත්ව සිටින තුරු, මේ කතාවගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ඔබ දෙදෙනාම, මට දිවුරා පොරොන්දු විය යුතුයි."

අපි වෙන් වෙන්ව ඇයට පොරොන්දු වී ඒ බැව් සහතික කළෙමු.

"මගේ ආදරණීය පියා ජෝන් ඩැල්රිම්පල්, ස්කොට්ලන්තයේ නැව් නිෂ්පාදන සමාගමක් හිමි පෙළපතකින් පැවත එන්නෙක්. මගේ පියා සහ ඔහුගේ සහෝදරයන් "වයිට් යුනියන්" නැව් නිෂ්පාදන සමාගමේ කොටස්කරුවන්. ඒ නිසා අපට කවදාවත්, මුදල් අතින් අගහිගයක් තිබුණේ නෑ. මගේ පියා ඉලාට වටා කළ සංචාරයකදී, ඔහුට මගේ මව හමුවී තිබුණේ ග්‍රීසියේදී. ඇය ඇතන්ස් නගරයේ මධ්‍යම පන්තියේ පවුලක ඉපැදුණු, ග්‍රීක ජාතික කාන්තාවක්. මගේ පියා හමුවෙන කාලයේදී ඇය ඇතැන්ස්හි රෝහලක, හෙදි සොහොයුරියක ලෙස සේවය කර තිබුණා. පසුව ඇය විවාහ කරගත් මගේ පියා, ඇය මේ ස්කොට්ලන්තයට කැඳවාගෙන ආවා.

මගේ මවට රැකියාවක් යන්න උවමනාවක් තිබුණේ නැහැ. ඒ වුණත් ඇය හිලාහා උපස්ථානයට දැක්වූයේ ලොකු කැමැත්තක්. ඒ කාලයේ එඩින්බ්‍රෝ නුවර තිබුණ රෝහලේ සාත්තු සේවය තිබුණේ දුර්වල තත්ත්වයක. රෝහල් උපදේශක තනතුරක් මගේ මව භාරගත්තා. එතකොට මට වයස 16 ක් විතර ඇති. ඇය රෝහලට යන සැමවිටකම මාවත් කැඳවාගෙන ගියා. වැටුපක් නොමැතිව





ස්වේච්ඡාවෙන්, හෙදියක ලෙස රෝහලේ වැඩ කරන්න, මගේ මව මට නියමකළා. ඔන්න ඔය කාලෙදී තමයි මට හෙන්රි ජෙකිල් හමුවුණේ.

එතකොට ඔහු තුන්වැනි වසරේ වෛද්‍ය ශිෂ්‍යයෙක්. ඉතා කඩවසම් පෙනුමක් තිබුණු ඔහු, කරුණාවන්ත ගතිගුණ තිබුණු දීප්තිමත් ශිෂ්‍යයෙක්. ඒ වගේම කඳුනැගීම වල, ඇත මුහුදේ බෝට්ටු සංචාර වලට නිර්භයව ඉදිරිපත්වුණු කෙනෙක්. ඉතාම මියුරු ලෙස වයලීනය හා පියානෝව වාදනය කරන්න, හෙන්රිට හැකියාව තිබුණා. මේ හැමදේකටම වඩා ඔහු, මහාත්ම ගතිගුණ තිබූ, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මහත්මයෙක්. වෙන මොනවද මහත්මයා අපට ඕනෑ? ඔහුගේ ආදරය දිනාගන්න තරුණියන් දුසිමකට වඩා පොරකන්න ඇති. නමුත් ඔහුගේ ආදරය හිමිවුණේ මටයි.

අප දෙදෙනාගේ ආදරයට දෙමව්පියන්ගේ මෙන්ම, නෑදෑහිතවතුන්, හැම කෙනෙකුගේම ආශිර්වාදය හිමිවුණා. අප විවාහ ගිවිසගත්තා. අපි බලාපොරොත්තුවුණේ හෙන්රිගේ අවසන් විභාගය නිමවුණු පසු අතිනත ගන්නයි. ඒකට සියලුම කටයුතු සම්පාදනය වුණා. නමුත් අපේ බලාපොරොත්තු කඩවුණේ නොහිතූ පිළිවෙළට.

ඔබට මතක ඇති '53 සිට '56 දක්වා පැවැති ක්‍රිමියන් යුද්ධය ගැන? වෛද්‍ය විද්‍යාලයෙන් පිටවුණු වහාම, ක්‍රිමියන් යුද පෙරමුණට යෑම තරුණයන්ට අනිවාර්ය වුණා. ඔවුන් එහි ගියේ ස්කුටාරි රෝහලේ වෛද්‍යවරුන් ලෙස, තුවාල ලබන ඉංග්‍රීසි යුද භටයන්ට ප්‍රතිකාර කරන්නයි. ඉතින් අපේ විවාහය කල්දමලා හෙන්රි, ක්‍රිමියන් යුද පෙරමුණ වෙත පිටත්වී ගියා. ඔහු සමග එම රෝහලේ හෙදියක ලෙස සේවය කිරීමට යන්න, මගේ කැමැත්තක් තිබුණා. නමුත් මගේ පියා මට ඒකට ඉඩදුන්නේ නෑ. මම තමයි ඔවුන්ගේ එකම දරුවා. මගේ පියා කීවේ තවත් අවුරුදු දෙක තුනක් යද්දී, යුද්ධය අවසාන වේවි. එතකොට හෙන්රි ආපහු ආවාම අපට විවාහ විය හැකි බව.

යුද්ධය අපි හිතුවාටත් වඩා ඉක්මනින් අවසන් වුණා. නමුත් හෙන්රි ගැන කිසිම ආරංචියක් නොලැබී ගියා. ඔහු සේවය කළ රෝහලට සතුරන්ගේ කාලතුවක්කු ප්‍රහාරයක් එල්ල වුණාලු. එහි සේවය කළ වෛද්‍යවරුන් හා හෙදියන්ටත් තුවාල සිදුවුණාලු. එවිට ඔවුන්ව වෙනත් රෝහලකට ගෙන ගොස් තිබුණා. මරණයට



www.sinhalaelibrary.com

පත්වුණේ කවුද, තුවාල ලබා මැරුණේ කවුද කියා, කිසිවෙක් හරිහැටි දැනගිටියේ නෑ. නමුත් මගේ හෙන්රි ජීවතුන් අතර ඇති කියලා මගේ විශ්වාසයක් තිබුණා. ඔහු ආපහු එනතුරු මං බලාගෙන හිටියේ එක හිතෙන්. යුද්ධය අවසන් වෙලා මාස නවයක් පමණ ගතවුණත් හෙන්රි ආපහු ආවේ නෑ.

අපි නොහිතූ දෙයක් සිද්දවුණේ ඔය අතරෙදියි. මගේ මව ග්‍රීක ජාතික කාන්තාවක් කියලා මං ඔබට කිව්වා. නැව් වල සේවය කළ ඈගේ ඥාති ග්‍රීක් ජාතිකයන්, ඔවුන්ගේ නැව ඩන්ඩි හෝ මොන්ට්‍රෝස් වරායට සේන්දු වුණාම, අපේ ගෙදරටත් ඇවිත් ගියා. මේ අතර හිටියා මගේ මවගේ ඥාති සොහොයුරෙකුගේ පුතෙක්, නිකොලස් ඩිමෙට්‍රියස් නම් වූ ඔහු, අවුරුදු 25 ක පමණ තරුණයෙක්. ඔහු මට විවාහ යෝජනාවක් ගෙන ආවා. නමුත් ඔහු සමග විවාහවෙන්න මගේ කැමැත්තක් තිබුණේ නැහැ. මං එකහිතින් බලාගෙන හිටියේ, හෙන්රි ආපහු එනතුරු. මේ කාලය වෙනකොට මගෙ දෙමව්පියන් දොස්තර හෙන්රි ජේකිල් ගැන බලාපොරොත්තු අත්හැර තිබුණා. ඔවුන් දිගටම කීවේ රෝහලට එල්ල වුණු ප්‍රහාරයේදී හෙන්රි මියයන්න ඇති කියලයි. අවුරුද්දක් ගත වෙලත් හෙන්රි ආපහු නොආවාම, දෙමව්පියන්ගේ ඉල්ලීමට කැමැතිවෙන්න මට සිද්දවුණා. මං නිකොලස් ඩිමෙට්‍රියස්ගේ අතගත්තේ, හෙන්රි වෙනුවෙන් මගේ හදවත වැලපෙද්දී.

අපට පදිංචියට වෙනම නිවසක් ලැබුණා. නමුත් අපි දෙන්නා අතර සණ්ඩු සරුවල් පටන්ගන්න වැඩි දවසක් ගතවුණේ නැහැ. නිකොලස්ගේ හිතේ මා ගැන ආදරයක් තිබුණේ නැහැ. ඔහු කපටියෙක්. ඔහුට උවමනා වෙන්න ඇත්තේ, මගේ පියාගෙන් මට උරුම වෙන දේපොළ අයිතිකරගන්න. නිකොලස් අධික ලෙස මත්පැන් පානය කළා. ඒ වෙලාවට ඔහු හැසිරුණේ තිරිසනෙක් වගේ. ඔහු මට පහරදෙන බව ආරංචිවෙලා, ඒකට මැදිහත්වෙන්න මගේ පියා අපේ ගෙදරට ආවා. එවිට නිකොලස් මගේ පියා සහ මව මරාදමන බවට තර්ජනය කළා. මගේ දෙමව්පියන්ට තිබුණු ආදරය නිසා මං සියල්ල ඉවසාගෙන හිටියා. මගේ කුසයේ දරුවෙකු පිළිසිඳගත්තා. මං ගැබිණියක්ව සිටි කාලයේත්, නිකොලස් මට පහර දුන්නා. ඊළඟට අපි හැමදෙනාම අතිශය මවිතයට පත්කළ සිදුවීමක් වුණා.

යුද පෙරමුණේදී මියගියා යයි කවුරුත් සිතූ හෙන්රි ජේකිල් ආපසු එඩින්බ්‍රෝ වෙත ආවා. ඔහු සේවය කළ රෝහලට එල්ල කළ





ප්‍රහාරයේදී ඔහු තුවාල ලබලා. ඔහුගේ හිසටයි තුවාල සිදුවී තිබුණේ. තුවාලකරුවන් ඒ රටේ රෝහල් ගණනාවකට ගෙන ගොස් තිබෙනවා. හිසට සිදුවූ තුවාල නිසා, හෙන්රිට තාවකාලිකව සියල්ල අමතකවීමේ තත්ත්වයකට ගොදුරු වුණාලු. අන්තිමේදී සම්පූර්ණ සුවය ලබලා, ස්කොට්ලන්තයට ආවේ මාව විවාහ කරගන්න. නමුත් එනකොට ප්‍රමාදවැඩියි. මගේ මවගේ හා පියාගේ ඉක්මන්කම නිසා මා පත්ව තිබූ තත්ත්වය දැකලා, හෙන්රි හරියට කම්පාවුණා.

මේ අතර ඔහුට එඩින්බ්‍රෝහි මහරෝහලේ ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස පත්වීමක් ලැබුණා. මගේ කලින් පෙම්වතා ආපහු ඇවිත් සිටින බව දැනගත් නිකොලස් පෙරටත් වඩා දරුණුවුණා. එක් දවසක් සමාජ ශාලාවේ සිට බීමතින් ගෙදර ආ ඔහු, මට දරුණු විදියට පහරදුන්නා. ඒ ප්‍රහාරයේදී මා ගෙදර තරප්පුපෙළෙන් පහළට වැටුණා. එයින් මට බරපතළ තුවාල සිදුවුණා.

මගේ එක් අතක් හා ඉළඇට කිහිපයක් බිඳී ගියා. කුසේ සිටි දරුවාත් මට අහිමිවුණා. මා රෝහල් ගත කළාම, මගේ අම්මා ඒ දවස් දෙකේ මා ළඟට වෙලා මට සාත්තු කළා. ශල්‍යවෛද්‍යවරයෙකු ලෙස මා පරීක්ෂා කරන්න ආවේ, හෙන්රි ජේකිල්. නිකොලස් මට සිදුකර තිබූ තුවාල දුටු හෙන්රිගේ, කරුණාවන්ත ස්වභාවය වෙනස්වුණු බව මං දුටුවා. ඔහුගේ හිතේ නිකොලස් ගැන ඇතිවුණේ දැඩි වෛරයක්.

ඒ දවස්වල මගේ අම්මා, මගේ ඇඳ ළඟින් හෙළවුණේ නෑ. ඇය හඬා වැලපෙමින් මාව රැකබලාගත්තා. මා සිටි වාට්ටුවේ වෛද්‍යවරයා ලෙස හෙන්රි නිතරම ඇවිත්, මගේ අසනීප තත්ත්වය ගැන හොයා බැලුවා.

එක දවසක් ඒ නිකොලස් රෝහලට ආවේ අධික ලෙස බීමත්ව. ඒ වෙලාවේ මගේ අතේ තිබුණු බිඳුණු අස්ථිවලට හෙන්රි ප්‍රතිකාර කරමින් සිටියා. මගේ අම්මා හිටියේ ඔහුට උදව්වෙමින්. ඒ දුටු නිකොලස් යක්ෂාවේශ වුණා. ඔහු මගේ අම්මාට නරක වචනයෙන් බැණවැදී, අම්මාට පහර දෙද්දී ඇය බිම ඇද වැටුණා. ඊළඟට ඔහු පහර එල්ල කළේ හෙන්රිට. මගේ අතේ බිඳුණු අස්ථි, නිවැරදිව සකස් කර, වෙලමින් සිටි හෙන්රිට, ඉවතට පැනගන්න වෙලාවක් තිබුණේ නෑ. අසල තිබූ කුඩා පුටුවක් අතට ගෙන නිකොලස් එල්ල කළ පහර වැදුණේ හෙන්රිගේ හිසේ පැත්තකට. ඔහු ගේ කනෙන්



www.sinhalaelibrary.com

නොනවත්වාම ලේ ගලන්න පටන්ගත්තා. ප්‍රහාරය නිසා බිම ඇදවැටුණත් හෙන්රි බිම වැටී හිටියේ නෑ. ඔහු නැගිටලා මගේ සැමියාට ප්‍රතිප්‍රහාර එල්ල කළා. රෝහලේ සේවකයන්, ඒ දෙදෙනාව දෙපැත්තට කළත්, සණ්ඩුවේ අවසානය එය නොවෙන බව මං දැනගෙන හිටියා.

දින දෙකකට පසු මගේ සැමියා නිකොලස් ඩිමෙට්‍රියස් ගේ මළ සිරුර පාලම අසල, ගං ඉවුරේ තිබී පොලීසියට හමුවුණා. පුවත්පත් වල පළවුණේ, සිරුරේ කකුල් දෙකේ, හා අතක අස්ථි බිඳ දමා තිබූ බවත්, විසිතිස් පොළකට උල් ආයුධයකින් ඇණ තිබූ බවත්.

ඒක කළ අපරාධකාරයා පොලීසියට හමුවුණේ නෑ. ඒ මරණය ගැන කාටවත් දුකක් ඇතිවුණේත් නෑ. දොස්තර හෙන්රි ජෙකිල් එදා සිට සේවයට වාර්තා කළෙත් නෑ. මේ අපරාධය ගැන පොලීසියේ සැකය යොමුවුණේ හෙන්රි වෙත බව, මං ඔබට අමුතුවෙන් කියන්න උවමනා නෑ. මේ තරම් කරුණාවන්ත සිතක් තිබූ හෙන්රිට, සතුරකු වුණත් අර පිළිවෙළට මරාදමන්න හැකිවුණාද කියා, මට නම් පුදුම හිතුණා. සෑම පුද්ගලයකු තුළම හොඳ මිනිසෙකු හා නරක මිනිසෙකු ජීවත්වෙන බවට, ඔහුම කියා තිබූ කථාව මට යළිත් සිහිවුණා.

මාස කිහිපයකට පසු හෙන්රි මා සොයාගෙන ආවා. නමුත් ඒ වනවිට මම, ජීවිතය ගැන අන්තිමටම කලකිරිලයි හිටියේ. හෙන්රි සමඟ විවාහවෙන්න, මගේ හිත කැමැතිකරගන්න, මට හැකියාවක් තිබුණේ නෑ. මට මුහුණදීමට සිදුවුණු වේදනාත්මක සිදුවීම් නිසා, මුළු ජීවිතයම අවිවාහකව ගත කරන්න මං තීරණය කළා. දැන් මං මගේ කාලය යොදවන්නේ අනාථ නිවාසවල, වැඩිහිටි නිවාසවල හා රෝහල්වල රෝගීන් ගැන සොයා බැලීමට. මගේ ධනය මං ඔවුන්ගේ යහපත වෙනුවෙන් වියදම් කරනවා. හෙන්රි එඩිංබ්‍රෝ අතහැර ලන්ඩනයේ පදිංචියට ගියා. කවදාවත් විවාහ නොවුණු ඔහු, රෝගීන් සහ පර්යේෂණ වෙනුවෙන් ජීවිතය කැපකර ඇති බැව් මට අහන්න ලැබුණා.

ඉතින් මහත්වරුනි. මට කීමට තියෙන්නේ එපමණයි. මට වුණු [illegible] ඔබ එලෙසින්ම ආරක්ෂා කරාවි කියල මං විශ්වාස කරනවා"

මේරියන් ඩැල්රිම්පල් මෙනෙවිය සිය දීර්ඝ කතාව අවසන් කළාය.



# 16

# පැටළුණු අවුල්

දින කිහිපයකට පසු අපි ලන්ඩනයේ කිංස්ක්‍රොස් දුම්රියපොළේ සිට කුලීරියකින් නිවහන බලා එමින් සිටියෙමු.

එඩිංබ්‍රෝහි ගතකළ ඉතිරි දින කිහිපය මගේ මිත්‍රයා ගතකළේ, ඉන්දියානු තාපසයකු ධ්‍යානයකට සමවැදුණාක් මෙන් නිහඬවය. මා ඇසූ ප්‍රශ්නවලට "ඔව්" "නැහැ", "හ්ම්" කියා මිස ඔහුගෙන් සතුටුදායක පිළිතුරක් නොලැබිණ.

"එක අබිරහසක් විසඳාගන්න අපට හැකිවුණා. එහෙම නේද හෝම්ස්?" මා ඇසුවෙමි. ලන්ඩන් නගරයට පැමිණි පසුව වත් ඔහු මේ දීර්ඝ නිහඬතාවෙන් අවදිකර ගැනීමේ අරමුණෙනි. එඩිංබ්‍රෝහි පදික වෙළඳසැල්වල, පරණ පොත් කඩ සොයා ගිය මගේ මිත්‍රයා, ඒ තැන්වලින් පොත් රැසක් එකතුකරගෙන තිබිණ. ඊට අමතරව නවීන පොත් වෙළඳසැල් වලින් ද ඔහු පොත් කිහිපයක් මිලට ගත්තේය. දිගු දුම්රිය ගමනේදී ඔහු කළ එකම කටයුත්ත, තම වෙරිවුඩ් පයිප්පයට දුම්කොළ පිරවීමත්, එය නිවී යද්දී නැවත නැවතත් දල්වා ගැනීමත් පමණි.

"මොන අබිරහසද වොට්සන් අපි විසඳගත්තේ?"

"ඇයි හෝම්ස්; අර ග්‍රීක නාවිකයා - නිකොලස් ඩිමෙට්‍රියාස්ගේ මරණයට වගකිවයුත්තා. හෙන්රි ජෙකිල් විය යුතුයි නේද?" මම කීවෙමි. "ඒක ගැන පොලීසියෙන් මොකක්වත් කෙරුණු බවක් අපට අහන්න ලැබුණේ නෑ. කවුද දන්නෙ ඒව එළිකරන බව මතක් කරමින් හයිඩ්, ජෙකිල්ගෙන් ප්‍රයෝජන ගන්නවාද කියල"

"ඒක මට සැකයි"

"ඇයි ඒ?"

"ඒ අපරාධයට වගකිවයුත්තා ජෙකිල් බව කිව්වාට මදි" හෝම්ස් කීය. "ඒක ඔප්පු කරන්න සාක්ෂි තිබිය යුතුයි නේ. මං හිතන්නෙ නෑ ඒ කාලෙ එඩිංබ්‍රෝ පොලීසියට හොයාගන්න බැරිවුණු සාක්ෂි, හයිඩ් ළඟ දැන් කාලෙ ඇති කියල. ඔය සිදුවීම වෙලා දැන් අවුරුදු 25ක් 30 ගතවෙලා. හැබැයි ඒ මිනීමැරුම කළේ, ජෙකිල් හයිඩ් දෙන්නා හවුලේ නම් තත්ත්වය වෙනස්"



www.sinhalaelibrary.com

"එහෙනම් මොකක් ගැනද හයිඩ්ට හැකිවෙලා තියෙන්නේ ජෙකිල්ව යටත්කර ගන්න?"

"එහෙම මොකුත් ඇතිබවක් මට නම් හිතාගන්න බෑ" හෝම්ස් කීය. "ඒක නෙමෙයි. ඔබට හුගක් මහන්සි නැත්නම්, අපි යන අතරේ, ජෙකිල්ගෙ ගෙදරට ගොඩවැදිලා යමු. මං රියැදුරාට කිව්වා, ඒ පාරට හරවලා, මදකට ඒ හරියේ රිය නවත්වන්න කියලා"

"හෝම්ස්" මම කීවෙමි. "දෙවියන්ගෙ නාමයෙන් අපි වරකට එක ප්‍රශ්නය බැගින් ගමු. ඔක්කොම එකට පටලවා ගන්නෙ මොකටද?"

"මගේ හිතවත් වොට්සන්. ඔය හයිඩ්ගේ තර්ජනය, හංගගත් රහස සහ ප්‍රාණඅපකාර කතා, ඔබේ හිතෙන් ඉවත්කරන්න. එතකොට අවුලෙන් බාගයක් ලිහෙනවා"

"හෝම්ස් එතකොට ඔබ කියන්නෙ, මෙතැන එහෙම දෙයක් නැහැ කියලද?"

"කොහොමටවත් නෑ" හෝම්ස් කීය. "කවුද දන්නෙ? දොස්තර ජෙකිල් තමන්ගේ රැකියාව පරදුවට තබා කරන්නේ, හිතවත් මිත්‍රයෙකු ආරක්ෂා කරගැනීම වෙන්නත් පුළුවනි."

"මෙතැන වෙන්නේ එහෙම දෙයක් කියල මම නම් කොහොමටවත් හිතන්නෙ නෑ"

"ඇයි බැරි?" හෝම්ස් ඇසීය. "නිකං හිතන්න. ඔබ හෙට උදේ ටයිම්ස් පත්තරය අරගෙන කියවන කොට ඒකෙ තියෙනවා - ඔබේ මිත්‍රයා ෂර්ලොක් හෝම්ස් මිනීමැරීමේ අපරාධයකට අත් අඩංගුවට ගන්න හොයනවා කියල. වොට්සන් මොකද කරන්නේ?"

"ඔබ ඒ චෝදනාවෙන් නිදහස් කරගන්න, මං මගේ සම්පූර්ණ උත්සාහය යොදනවා" මම කීවෙමි.

"ඇයි ඔබ එවැනි උත්සාහයක යෙදෙන්නෙ?"

"මට හොඳටම විශ්වාසයි මගේ මිත්‍රයා, මේ විදියේ අපරාධයක් කළේ නැහැ; ඔහු අහිංසකයෙක් බව"

"විශිෂ්ටයි" හෝම්ස් කීය. "හෙන්රි ජෙකිල් හයිඩ්ව ආරක්ෂා කරන්නෙත් අන්න ඒ හැඟීමෙන් වෙන්න ඇති"

"මම නම් හිතන්නෙ, මෙතැන එහෙම මිත්‍රත්වයක් තියෙන්න හැටියක් නෑ" මම කීවෙමි. "ඒ දෙන්නා අහසට පොළොව වගේ වෙනස් අන්න දෙකක දෙන්නෙක් - චරිතය, හැසිරීම, ගතිගුණ, පෙනුම - මේ හැමදේකින්ම"





"අපි දෙන්නා ගැන හිතුවත්, ඒ විදියයි නේද වොට්සන්, තරමක් දුරට හරි? මං, ගෙදර විසිත්ත කාමරය ඇතුළෙ ඉලක්කයට වෙඩි තැබීම පුහුණු වෙනවා. මරණයෙන් පස්සේ සිරුරේ සිදුවන තැලීම් ගැන බලන්න, මළසිරුරු වලට වේවැලෙන් පහරදෙනවා. මගේ කාමරය, මේසය හැමතැනක්ම අවුල්. නමුත් ඔබ ඒකෙ අනික් පැත්ත"

"හෝම්ස්. ඔබේ ඔය තර්කය මෙතැනට ගැළපෙන්නෙ නෑ" මා කියද්දී, අප ගිය කුලීරිය ජෙකිල්ගේ නිවස අසලට ළඟාවී තිබිණි. රියැදුරාට රිය රඳවාගෙන සිටින ලෙස දැනුම් දී, අපි ඉදිරිදොර වෙත ගියෙමු. අපේ දොරට තට්ටුකිරීමට පිළිතුරු ලෙස, දොර විවෘත කිරීමට පැමිණියේ, වයස්ගත සේවක පූල් ය.

"පූල්, ඉතාම වැදගත් කාරණයක් ගැන, ඔබේ ස්වාමියා සමග අප කළයුතු කතාබහක් තියෙනවා" හෝම්ස් කීය. "ඒක ඉතාම වැදගත් කාරුණක්"

"මට කණගාටුයි මහත්මයා" පූල් කීය. "ඔබට මේ වෙලාවේ දොස්තර මහත්මයා හමුවෙන්න පිළිවෙළක් නෑ. එතුමා අසනීපෙන්. අමුත්තන් සමග එක වචනයක්වත් කතාකරන්න කැමැති නෑ. ඔබ කැමැති නැද්ද, ඔබේ පණිවුඩය ලියා තියායන්න?"

"පූල්" හෝම්ස් කීය. "ඔබ ස්වාමියාට පක්ෂපාත, අවංක සේවකයෙකු බව අපි දන්නවා. තවත් ඉදිරියටත් ඒ පක්ෂපාතිත්වය රැකගන්න හදල වැඩක් නෑ. මේ වහල යට අපරාධකාරයෙක් හැංගිලා ඉන්න බවට සාක්ෂි තියෙනවා. ඒ අපරාධකාරයා වෙනිං කවුරුවත් නෙමෙයි — වෙස්ට්මින්ස්ටර් මිනීමරුවා වන එඩ්වඩ් හයිඩ්. ඔබ අපට ඇතුළුවෙන්න ඉඩ නොදුන්නොත්, මං මෙහාට පොලීසිය කැඳවනවා. ඔවුන් ගේ සෝදිසිකිරීමට වරෙන්තුවක් අරගෙනම ඒවි. ඒකට වැඩිවෙලාවක් ගතවෙන එකක් නෑ. ඔබට උවමනා කරන්නේ එයින් කොයි පිළිවෙළද?"

හෝම්ස් හා පූල් එකිනෙකා දෙස බලාසිටියේ තත්පර කිහිපයක් පමණි. මිළඟට පූල්ගේ විධානය නිකුත්වූයේ ඔහු පිටුපසින් සිටි තැනැත්තාටය.

"බ්‍රැඩ්ශෝ! මේ මහත්වරු දෙන්නා ආපහු යන්නයි හදන්නේ. ඒ දෙන්නා ඔවුන්ගේ කුලීරිය වෙත කැඳවාගෙන යන්න!"

බ්‍රැඩ්ශෝගේ නියම ස්වභාවය අපට දකින්නට ලැබුණේ, ඔහු අප ඉදිරියට පැමිණි පසු ය. හෝම්ස්ටත් වඩා අඟල් හයක් උස,



www.sinhalaelibrary.com

මාංශපේශී හොඳින් වැඩුණු, යෝධ ශරීරයක් තිබූ ඔහු මට සිහිපත් කළේ වෘත්තීය බරඉසිලීමේ ක්‍රීඩකයෙකි. ඔහු කෙනෙකු නිවසෙන් එළියට කැඳවාගෙන යන්නේ හොඳින් නොව නරකින් බව මම දැනසිටියෙමි. එයට සූදානමෙන් ඔහු හිස පහත්කරගෙන ඉදිරියට ආවේය.

"මේ වෙලාවෙ කරන්න තියෙන නුවණැති වැඩේ මෙතැනින් පිටවෙලා යන එකයි" මම කීවෙමි. මගේ මිත්‍රයා හිස සොලවා එයට එකඟත්වය පළකළේය. අපි ආපසු පැමිණ, කුලීරියට නැගුණෙමු. පූල් හා බ්‍රැඩ්ෂෝ ඉදිරිදොර අසලට වී, අප පිටවී යන අයුරු බලාසිටියහ. මීළඟට හෝම්ස්ගේ උපදෙස් අනුව රියැදුරා, රිය හරවා ගෙන වෙනත් මඟකට පිවිසියේ ය. මෙවර එය පැමිණ නැවැත්වූයේ දොස්තර ජෙකිල්ගේ ගෙදර, පිටුපස දොරටුව අසලය.

"වොට්සන්" මගේ මිත්‍රයා කීවේ තම කබා සාක්කුවෙන්, ඉස්කුරුප්පු නියන් සහිත ආයුධ කට්ටලය අතට ගනිමිනි. "මට කරන්න තියෙන්නේ නීතිවිරෝධී වැඩක්. ඒකට ඔබේ සහයෝගය මට ලැබෙනවද?"

"ඒක කරන්නේ යහපත් අරමුණකින්ද?"

"ඔව්"

"එහෙනම් මගේ විරුද්ධත්වයක් නෑ"

දොර අගුලේ යතුරුකට තුළට, සිහින් ඉස්කුරුප්පු නියනක් දැමූ හෝම්ස් ඉක්මනින් ක්‍රියාත්මක විය. අගුළ පැරණි එකක් වූ නිසාදෝ, ඔහුට තරමක වෙලාවක් ගතවිණි. අන්තිමේදී එය හැරගැනීමට මගේ මිත්‍රයා සමත්විය. ඔහු ඉතා පරෙස්සමින් දොර ඇතුළට තල්ලු කළේය. යන්තමින් සෙලවුණත් දොර හැරුණේ නැත.

"ඇතුළෙන් සොයිබයක් දමලා" හෝම්ස් මට කීවේ කෙඳිරිලි හඬිනි.

"පූල්! මං තමුසෙට කිව්වා නේද මෙහේ එන්න එපා කියල" කාමරය ඇතුළතින් ජෙකිල්ගේ කටහඬ අසන්නට ලැබිණ. "මම පැහැදිලිවම කිව්වා මගේ වැඩවලට බාධාකරන්න එපා කියල!"

"මං පූල් නොවෙයි, ෂර්ලොක් හෝම්ස්. දැන් මා එක්ක කතාබහ කළොත්, සමහර විට පොලීසිය මේ ගෙදරට කඩාවදින එක නවත්වන්න පුළුවනි."

නිශ්ශබ්දතාවය මිනිත්තු කිහිපයක් පැවතිණ. අන්තිමේදී වෛද්‍යවරයාගේ පියගැටෙන හඬත්, දොර අවහිර කළ සොයිබය





ඉවත්වන හඬත් අසන්නට ලැබිණ. දොර විවෘතකරන ලද්දේ සුදු පැහැති පිටකබායකින් සැරසුණු දොස්තර ජෙකිල් විසිනි.

අප අන්තිම වරට ඔහු දැක තිබුණේ, ඊට මාස ගණනාවට පෙරදී ය. එදා දුටුවාට වඩා ඔහුගේ පෙනුම වෙනස්වී තිබූ බැව් මම දුටුවෙමි. කලින් මා නොදුටු රැලිගැසීම්, ඇස්වලට යටින් දකින්නට ලැබිණ. අනතුරක සේයාවක් දුටු කලක මෙන්, සෑම තත්පර කිහිපයකට වරක්ම, ඔහුගේ දෙනෙත් විසිර දිශාවලට යොමුවිය. ඔහුගේ හිසකෙස් තවත් වැඩියෙන් පැසී තිබිණ. මේ ලකුණු වලින් මා තේරුම් ගත්තේ, පසුගිය දීර්ඝ කාලය තුළ ඔහු, දැඩි කායික මෙන්ම මානසික පීඩනයක් යටතේ ජීවත්වී ඇති බවයි. කලම්පයකට සවිකළ රසායන ද්‍රව්‍ය සහිත වීදුරු ප්ලාස්කුවක්, බන්සන් දැල්ලක් මත රත්වෙමින් තිබිණ.

"මේ විදියට මගේ ගෙදරට කඩාවදින එකේ තේරුම මොකක්ද?" ජෙකිල්ට කෑගැසිණ. "වහාම මට කියනවා ඒකට හේතුව. නැත්නම් පොලීසිය කැඳවන්නේ තමුසෙලා නොවෙයි මම"

ඔහු කෝපයට පත්වී සිටියත්, ජෙකිල් දැඩි උත්සාහයක් දැරුවේ, වෙවුලමින් තිබූ තම ශරීරය පාලනය කරගැනීමට බැව් බැලූබැල්මටම පෙනිණ.

"ඔබ ඒකට කැමැතිවෙන එකක් නෑ ජෙකිල් මහත්මයා" හෝම්ස් කීය. "ඒ මොකද සර් ඩැන්වර්ස් කැරූ ගේ මිනීමරුවා — එඩ්වඩ් හයිඩ්, මේ වහල යට ඉන්නා බව, සැකයකින් තොරව මට ඔප්පු වෙලා තියෙනවා."

"ඒක මහා බරපතළ චෝදනාවක්" ජෙකිල් කීය. "ඔහේ මෙක සාක්ෂිකරුවෙකු ඉදිරිපිට කිව්වා නම්, මට තිබුණා ඒ අපහාසය ගැන උසාවි යන්න"

"ඔය විහිළු කතාවලින් වැඩක් නෑ" හෝම්ස් කීය. "ඔබ කැමැතිද මේ වත්ත පිටිය ඔක්කොම, පොලිසියේ තියුණු සෝදිසියකට ලක්වෙන අයුරු දකින්න?"

"මං ඒකට කොහොමටවත් ඉඩ දෙන්නෙ නෑ"

"ඉඩම අයත්වෙන්නේ ඔබට නිසා ඒකට විරුද්ධ වෙන්න පුළුවනි. ඒත් පොලීසිය වරෙන්තුවක් රැගෙන ආවොත්....... ඔබේ විරුද්ධත්වයෙන් වැඩක් වෙන්නේ නෑ"

ජෙකිල්ගේ සිත අවුල් ජාලයක පැටළුණු බැව් පෙනිණ. වේගයෙන් ක්‍රියාත්මක වූ ඔහුගේ මොළයට, සියල්ල ඉක්මනින්

පසක් වූ අයුරු මට මැවී පෙනිණ. අන්තිමේදී ඔහු පිටුපසට වෙමින් දොර හැරදැම්මේය.

"මං වැඩරාජකාරි අධික මිනිහෙක්" ඔහු කීය. "මට නාස්ති කර කර ඉන්න කාලයක් නෑ. නිල ඇඳුම් වලින් සැරසුණු ගවයින් රැළක්, මෙතෙක උපකරණ පෙරලා දමමින් කරන පිස්සුවකට, මං කොහොමටවත් කැමති නෑ. ඔහේගේ මළඉළව් පෝදිසිය ඉක්මනට කරලා මෙහෙන් මකබෑ වෙනවා"

ගෙදරක දකින්නට ලැබෙන ඉතා විශාල කාමරයක් වුවත්, එහි තිබුණේ අංගසම්පූර්ණ රසායනාගාරයක පෙනුමය. පරීක්ෂණ නළ, වීදුරු ෆ්ලාස්කු, පලිස, හංසපානික, පිපෙට්ටු, බියරට්ටු, රසායන ද්‍රව්‍ය පිරවූ විවිධ හැඩවල, ප්‍රමාණවල හා වර්ණවල බෝතල් මෙහි දක්නට ලැබිණ.

සුදුපැහැති කුඩු ස්වල්පයක් ඇතිරූ වීදුරු කැබැල්ලක්, පරීක්ෂාවට සූදානමෙන්, අණ්වීක්ෂයක තබා තිබෙනු දුටුවෙමි. මේසය මත නිල් පැහැති දැල්ලක් නිකුත්කළ බන්සන් දාහකයකින්, වීදුරු ෆ්ලාස්කුවක් රත්වෙමින් තිබිණ. ඒ තුළ කහ පැහැති දියරයක් බුබුළු දමමින් තිබූ අයුරු දැකිය හැකි විය. රසායන විද්‍යා ග්‍රන්ථ රැසක් රාක්කයක තිබූ අතර, මේසයක් මත තවත් පොත් දෙකක් විවෘතව තිබිණ. ඒවා නිතර නිතර පරිහරණය කිරීම නිසා, දුර්වර්ණ වී තිබූ බැව් අපි දුටුවෙමු. ගිනිඋදුනේ හොඳින් ඇවිළෙමින් තිබූ ගිනිමැලයකි. ඒ කාමරයේ ඈත කෙළවරේය. ඒ සමීපයේ හාන්සි පුටුවක් ද, එහි අත්රඳවනය මත, බාගෙට කා අවසන් කළ, කෑම පිඟානක් ද විය. මැදමිදුල පැත්තට තිබූ ජනේල තුනම වසා තිබිණි. ඒ ජෙකිල්ගේ අනෙක් නිවස තිබූ පැත්තයි.

කාමරය තුළ රවුමක් කරකැවී, එය ඉක්මනින් පරීක්ෂා කළ හෝම්ස්, ආපසු හැරී, වෛද්‍යවරයා සිටි තැනට පැමිණියේය. "ඔබට ස්තූතියි දොස්තර මහත්මයා. මට කරන්න අවශ්‍යව තිබූ පෝදිසිය, මං කරල අවසන්" යයි කීය.

මීළඟට හෝම්ස් දෙනෙත් දල්වා වෛද්‍යවරයා දෙස බැලුවේ, අතිශය පුදුමයට පත් අයුරෙනි. "ජෙකිල් මහත්මයා, ඔබට මොකක් හරි අසනීපයක් හැදීගෙනද එන්නෙ?"

ජෙකිල්ගේ මුහුණ සුදුරෙද්දක් මෙන් සුදුමැලිව තිබූ අයුරු මම ද දුටුවෙමි.

"දෙයියනේ!" ජෙකිල්ට කෑගැසුණේ දුර්වල කටහඬකිනි. "ගිය සැරේට වඩා ඉක්මනට! බොහොම ඉක්මනට!"





හෝම්ස් යළිත් වරක් තම ප්‍රශ්නය ඉදිරිපත් කළේය.

"මට ඇති අමාරුවක් නෑ" ජෙකිල් කෑගැසුවේ නොඉවසිල්ලෙනි. "කරුණාකරල මෙහෙන් යනවා!"

එහෙත් ජෙකිල්ගේ මුළු සිරුරම වෙවුළමින් තිබූ අයුරු, අපි පැහැදිලිවම දුටුවෙමු. ඒ කුමක් හෝ බරපතළ රෝගයක් වැලඳීමට ඔන්න මෙන්න කියා තිබියදී මෙන් ය.

"මේ වොට්සන් වෛද්‍යවරයෙක්. බාගවෙලාවට ඔබට......."

"මට අසනීපයක් නෑ කියල මම කිව්වා නේද" ජෙකිල් උස් හඬෙන් කෑගැසුවේය. අනතුරුව තම දෑත් අපේ උරහිස්මත තබා, අප එකා බැගින් දොරටුවෙන් එළියට තල්ලුකර දැම්මේය.

"බහිනවා එළියට!" යයි කෑගැසූ ඔහු, අප දෙදෙනා එළියට තල්ලුවූ වහාම, "දඩාස්" ගා දොරවසා දැම්මේය.

අප මොහොතක් එතැන රැඳුණේ, මීළඟට ගතයුතු පියවර කුමක්දැයි සිතාගැනීමට නොහැකිවය. නිවස තුළින් අසන්නට ලැබුණේ වීදුරු බඳුනක් බිම වැටී, කැබලි වලට බිඳී යන හඬකි. ඒ සමගම, මීමැස්මාර රෝගයට ගොදුරු වූ රෝගියෙකු ගේ උගුරෙන් නිකුත්වන "ගොර ගොර" ශබ්දය වැනි එකක්ද අසන්නට ලැබිණි.

හෝම්ස් යළිත් වරක් දොරට තට්ටු කළේ, පිළිතුරක් ලැබේ යයි විශ්වාසයකින් නොවේ.

"කවුද ඔය?" මෙවර එම ප්‍රශ්නය නැඟුණේ රළු කටහඬකිනි. ඒ හඬට මගේ මිත්‍රයා තිගැස්සුණු අයුරු මම දුටුවෙමි. "මම ෂර්ලොක් හෝම්ස්. අපි තවමත් මෙතැන. ඔබට මොකක් හරි කරදරයක්ද?"

"මට කරදරයක් නෑ! යනවා යන්න!"

අපි එතැනින් පිටත්වී ආවෙමු.

"හෝම්ස්. ඔබට හිතෙන්නේ ඇතුළේ මොකක් හරි කලබලයක් සිද්ධවුණා කියලද?" මා විමසුවේ අප යළිත් කුලීරියට නැඟුණු පසු ය.

"එහෙම දෙයක් වුණා කියල හිතන්නත් අමාරුයි" හෝම්ස් කීය.

"ඔබ හිතුවේ මිනිහා හයිඩ්ව, ගේ ඇතුළෙ කොහේ හරි හංගාගෙන හිටියා කියලද?"

"මුලදී නම් හයිඩ් ගැන මගේ ඔළුවට ආවෙ නෑ" හෝම්ස් කීය. "මට උවමනා වුණේ ජෙකිල්ගේ පර්යේෂණාගාරයේ ඇතුළත බලාගන්න. මගේ හිතේ ඇතිවී තිබූ සැකයේ, හරි වැරැදි බව තහවුරු කරගන්න. ඒ කටයුතු නම් සාර්ථක වුණා. ඒ වුණත් අපි පිටවුණාට පස්සේ, හයිඩ් පර්යේෂණාගාරය ඇතුළට මතුවුණාද? එහෙම වුණා නම් ඒ කොහොමද? අන්න ඒ හරිය මට ටිකක් පැහැදිලි මදි......."

කටේ ගසා ගත් පයිප්පය දල්වා නොගෙනම, මගේ මිත්‍රයා කල්පනාවේ වෙළී සිටියේය. මිනිත්තු කිහිපයකින් එයින් මිදුණු ඔහු මා ඇමතුවේය.

"වොට්සන්. ඔබ කල්පනා කරන්න ඇති, මේ තරම් දුරකතරක් ගෙවා ගෙන, මං එඩිංබ්‍රෝ වෙත ගියේ ඇයි කියල. මං මහාචාර්යතුමා සහ දොස්තර මැක්ලින්ස් හමුවුණේ ඇයි කියල"

"මගේ හිතේ මුලින් නම් ඒ ප්‍රශ්න පැන නැගුණු බව ඇත්තයි" මම කීවෙමි. "ඒ වුණත් ඒ පුද්ගලයන් හමුවෙද්දි කාරණා එකින් එක දිගහැරුණ නේ. දොස්තර ජෙකිල්ගේ ඉතිහාසය ගැන, අප හීනෙන්වත් නොහිතූ පැත්තක්, අහන්න ලැබුණා නෙ. මෙරියන් ඩැල්රිම්පල් මෙනෙවිය සමග කළ සාකච්ඡාවෙන් පස්සේ, මේ පැටළුණු අවුල් විකෙන් වික ලිහෙන්න පටන්ගත්තා නේද?"

"ලිහෙන්න?"

"මං දන්නෙ නෑ හෝම්ස්. ඒ මට පෙනෙන හැටි. කොහොම වුණත් ඒකට සුදුසු වෙලාව ආවම, ඔබ හැම දෙයක්ම මට තේරුම් කරන බව මං දන්නවා"

"ඔබේ තියෙන ඉවසීම මං හැමවිටම අගය කරන දෙයක් වොට්සන්" හෝම්ස් කීය. "ජෙකිල්ගේ මේ වෙනස්වීමට, මෑතකාලයේ හැසිරීම්වලට හේතුව මොකක්ද කියලා මං හිතුවා. මං ඒ ගැන දීර්ඝ ලෙස කල්පනා කළා, එතකොට මට හිතුණා මෙහෙම දෙයක්. ජෙකිල්ගේ මේ හැසිරීමට මුල, ඔහුගේ විශ්වවිද්‍යාල ජීවිතයට සම්බන්ධ යම් දෙයක් වෙන්න පුළුවන් බව.

මහාචාර්යතුමා මොකක්ද අපට කිව්වේ? ඔහුගේ ජීවිතයේදී දකින්න ලැබුණු, දීප්තිමත්ම ශිෂ්‍යයා ජෙකිල් බව. ඔහු තමන්ගේ අවධානය යොමු කළේ මොන ක්ෂේත්‍රයට ද කියන එක මහාචාර්යතුමාට මතක තිබුණා. ඒක අතකින් ඒකෙ පුදුමයකුත් නෑ.

මං කියන මේ කරුණ හරිහැටි තේරුම් ගන්න උත්සාහ කරන්න වොට්සන්. යම්කිසි උප විෂයයක් තමන්ගේ පර්යේෂණවලට තෝරාගෙන, ඒක මහාචාර්යතුමා බැහැර කරනවා. ඇයි? ඒ උපවිෂයය ඔහු විකාර බහුලිත එකක් කියල. නමුත් ඔහුගේ දීප්තිමත්ම ශිෂ්‍යයා මොකද කරන්නේ? ගුරුතුමා බැහැර කළ ක්ෂේත්‍රයම තෝරාගෙන, දිගින් දිගටම ඒ ගැන පර්යේෂණ කරනවා. මං කියන දේ ඔබට පැහැදිලිද?"

"පැහැදිලි මදි" මම කීවෙමි.





"තමත් නෑ. අපි ඒ හරියට පස්සෙ එමු" ඔහු කීය. "මය ක්ෂේත්‍රයට අදාල පොත්පත් හුගක් දැනට මුද්‍රණයෙන් නෑ. නමුත් කිහිපයක් හරි සොයාගන්න ලැබුණු එක මගේ වාසනාවක්" ඔහු කීවේ එඩිංබ්‍රෝ සිට ගෙන ආ පාර්සල් කිහිපයකට අතෙන් තට්ටුකරමිනි.

"දැන් ටිකවෙලාවකට කලින්, ජෙකිල්ගේ නිවසේදී අපට ලැබුණු අත්දැකීම, ඔවට සම්බන්ධ වෙන්නෙ කොහොමද?" මම ඇසීමි. "මට ඒක කොහොමටවත් හිතාගන්න බෑ"

"මෙම ලිපිලේඛන, පොත්පත්, හුගක් සම්බන්ධවෙන්නේ රසායන විද්‍යාවට සහ ගුප්තවාදයට" ඔහු කීය. "නමුත් මහාචාර්යතුමා කිව්වා මතකද? ජෙකිල් කළ සමහර පර්යේෂණ වෛද්‍යවිද්‍යා පාඨමාලාවට අදාළ ඒවා නොවෙන බව?"

"ඔව් මට මතකයි"

"ඒ වුණත් දැන් ජෙකිල්ගේ පර්යේෂණාගාරය තුළට මං හෙළූ එක බැල්ම ම මට ප්‍රමාණවත් වුණා"

"ඒ මොකකටද?"

"ජෙකිල් තවමත් නොනවත්වාම, රසායන විද්‍යාත්මක පර්යේෂණවල නිරත වෙන බව මට තහවුරු වුණා. ඔහු සම්බන්ධයෙන් මං දැන් වැටිලා ඉන්නේ නිවැරදි පාරකට බව මට විශ්වාසයි"

"මොකක්ද ඒ නිවැරදි පාර? ඒක කොහේට යන පාරක්ද?" මම ඇසීමි.

"මගේ හිතවත් වොට්සන්" හෝම්ස් කීය. "ඒක යන්නෙ හරියටම කොහේටද කියලා මං තවමත් දන්නෙ නෑ. ඒක හරියටම දන්නවා නම්, තවත් සති ගණනාවක් මහන්සි නොවී, මට ඒ කාලය ඉතිරි කර ගන්න පුළුවනි. මේ පොත්පත් තවදුරටත්, ගැඹුරින්ම අධ්‍යයනය කරලා බලන්න ඕන. හෙන්රි ජෙකිල් ඔහුගේ විනාශය කරා යැවීමට, මේවා සමත්වුණේ කොහොමද කියලා හොයා බලමු. සමහර වෙලාවලදී මම, අපරාධකාරයෙකුගේ පා සටහන් වලින් ඔහුව හඳුනාගන්නවා. ඔහුගේ අරමුණ වුණේ මොකක්ද කියන එක, පැහැදිලි කරගන්නවා. දැනුත් මම කිරීමට බලාපොරොත්තු වෙන්නෙ එම දේ ම යි. අතිදක්ෂ විද්‍යාඥයෙකු ඔහුගේ තීක්ෂණ බුද්ධිය යොදවලා, ගමන් කරලා තියෙන්නෙ මොන පැත්තටද,



www.sinhalaelibrary.com

මොන අරමුණකින්ද කියා හොයා බැලීම. අවුරුදු 30ක් තිස්සේ ඔහු කළ පර්යේෂණ මගින්, ළඟාවුණු ඉලක්කය කුමක්ද කියා හඳුනාගැනීම. ඒක කිසිසේත් කිරීමට නොහැකි වැඩක් කියල මං හිතන්නේ නෑ. ඒ වුණත් සති කිහිපයකින් ඒක විසඳීම නම් අමාරු කාරියක් වේවි. නමුත් මට වෙන විකල්පයක් නෑ. යාමට තියෙන්නේ ඉතාම දුෂ්කර මඟක"

"ඒ අතරෙදි?"

"ඒ අතරෙදි ලන්ඩනයේ වීදි පුරා නිදහසේ සැරිසරන්න අපරාධකාරයාට හැකිවේවි. අපි ප්‍රාර්ථනා කරමු, ඔහු අතින් මිනිස් සංහතිය විනාශ නොවේවා කියල"

මා සමඟ කතාබහ අවසන් කළ මගේ මිත්‍රයා, දුඹුරු කඩදාසියකින් ඔතා තිබූ ඔහුගේ පාර්සලයක් විවෘත කර, එහි උඩින්ම තිබූ පොත අතට ගත්තේය.

ජෛව රසායන විද්‍යාවේ මූලධර්ම - කැන්ට්‍රෝ සහ ෂෙපාඩ්ස් යනුවෙන් එහි කවරයේ සඳහන්ව තිබිණි. හෝම්ස් එහි පළමුවැනි පිටුවේ සිටම කියවීම ඇරඹීය.



17

# වේගවත් ගමනක

ශීත සෘතුවේ දුක් ගැහැට, වසන්ත සෘතුව දක්වාම පැතිරයාම, ලන්ඩන් නගරයේ දුර්ලභ සිදුවීමක් නොවේ. 1885 වසරේ වසන්ත සෘතුවද, සීතල සුළඟින් හා හිමකැට ඇදහැළුණු වැස්සෙන් පිරුණු එකක් විය. අළු පැහැති වලාකුළු මෙන් ඝන මීදුමක්, නගරය පුරා විසිරී තිබිණි. අනෙකුත් ලන්ඩන් නගරවාසීන් මෙන්, අපි දෙදෙනා ද අපේ කාමර තුළ සිරවී සිටියෙමු. කෙසේ වෙතත් මගේ මිත්‍රයාට නම්, ඒ කාලය තුළ යෙදීමට කටයුත්තක් තිබිණි.

ස්මොකොට්ලන්තයේ සිට ගෙන ආ පොත්, හාන්සිපුටුව අසල ගොඩගසා ගත් හෝම්ස්, ඒවා ඉතා වේගයෙන් කියවමින් සිටියේය. සමහර අවස්ථාවල පිටු ගණන් අත්හරිමින්, එම පොත් ඔහු දවසකට එකක් හෝ දෙකක් අවසන් කළේය. ඒ අතරම අනාගත පොතක, ඔහු කරුණු සටහන් කරගත් ආකාරය ද මම දුටුවෙමි. කියවා අවසන් කළ ඒවා එකපිට එක ගොඩගැසිණි. සමහර පොත් ගොඩවල් අඩි කිහිපයක් උස් වෙද්දී බිමට පෙරළිණි. එයින් විසිත්ත කාමරය අවුල්වෙද්දී, මගේ මිත්‍රයා ඒ දෙසවත් නොබැලුවේය. දිගින් දිගටම පයිප්පයෙන් දුම් පිටකරමින්, ඔහු කියැවීමේ යෙදුණේය. මේ අතර මම නිහඬව පුවත්පත් කියවූවෙමි.

"කීර්තිමත් වෛද්‍යවරයෙකුගේ අභාවය"

"මෝනිං ක්‍රොනිල්" පුවත්පතේ වූ එම සිරස්තලය මම ශබ්ද නඟා කියවීමි. ෂර්ලොක් හෝම්ස් වාඩිවී සිටි පුටුවෙන් ඉහළට පැන්නේ සර්පයෙකු විසින් දෂ්ට කළ පුද්ගලයෙකු විලසිනි.

"මොනවා? වොට්සන්? කවුද මියගිහින් තියෙන්නේ?" අසද්දී ඔහුගේ මුවේ තිබූ පයිප්පය බිම වැටිණි.

"දොස්තර ලැනියන් මියගිහින්" මම කීවෙමි.

"ආ........ ඒක මිසක්." හෝම්ස් කීය. "මට හේස්ටි ලැනියන් ගැන අමතක වුණා. අසරණ මනුස්සයා. තමන් මේ කාලයේදී මියයාවි කියල, ඔහු සති කිහිපයකට කලින් අපට කිව්වා නොවැ?"



www.sinhalaelibrary.com

"ඔව්" මම කීවෙමි. "ඒ වුණත් පත්තරේ තියෙන්නෙ, රෝගීන් වෙනුවෙන් පමණ ඉක්මවා වැඩකිරීම නිසා ඇතිවූ විඩාව නිසාත්, සිරුර දුර්වල වීමෙනුත් ලැනියන් අකාලයේ මියගියා කියලයි."

මගේ පිළිතුර අනුමත කරමින් හිස සොලවූ මගේ මිත්‍රයා, යමක් සිහිවූ කලක මෙන් පොත්පත් ඉවතට දමා අසුනෙන් නැගිට්ටේය.

"අයහපත් කාලගුණය හරියන තුරු බලාගෙන ඉඳල වැඩක් වෙන්නෙ නෑ මිත්‍රයා" හෝම්ස් කීය. "අප කළ යුතු වැඩ තියෙනවා. මගේ රසායන විද්‍යාත්මක පරීක්ෂණ හුඟක් අතපසු වුණා. සමහර රසායන ද්‍රව්‍ය ඉවරවෙලා. ඒවා කිහිපයක් හොයාගෙන එන්නත් තියෙනවා."

ඔහු හැඳපැළඳගැනීම සඳහා කාමරයට ගියේය. මඳ වේලාවකින් හෝම්ස් නිවසෙහෙන් පිටත්වී ගියේ, වැහිකබා, හිස්වැසුම් ආදියෙන් සැරසීමෙන් අනතුරුවය. ඔහු ආපසු එද්දී සවස්වී තිබිණි.

"ප්‍රමාණවත් තරම් දත්ත නොමැතිව, නිගමනවලට එළැඹීම කොයිතරම් වැරැද්දද? මං ඒ බව කොයිතරම් වාරයක් ඔබට කියල තියෙනවද වොට්සන්?" හෝම්ස් කීවේ ඔහුගේ වැහිකබාය ඉවත්කරමිනි.

"ඇයි? මොකක්ද ප්‍රමාණවත් තරම් දත්ත නොමැතිව මං කළ නිගමනය?" මම ඇසීමි.

"නෑ නෑ. ඔබ ගැන හිතලා මං එහෙම කිවුවා නෙමෙයි" ඔහු කියද්දී ඔහුගේ මුහුණට සිනාරැල්ලක් නැඟිණ. "මෝව් ඇන්ඩ් බේකර් රසායන - ඖෂධ වෙළඳ සමාගමේදී, මට හමුවුණා අඳුනන කෙනෙක්. ඒ කවුද කියල ඔබට අනුමාන කරන්න පුළුවන්ද?"

"මට හිතාගන්න අමාරුයි"

"අපේ මිත්‍රයා පූල් - ජෙකිල්ගේ ගෘහසේවකයා"

"මොනවා පූල්? ඔහුට මොකක්ද මෝව් ඇන්ඩ් බේකර් එකේ තියෙන රාජකාරිය?"

"සැකයක් නෑ" හෝම්ස් කීය. "ඔහුගේ ස්වාමියා වෙනුවෙන් මොනවා හරි මිලට ගන්න පූල් එන්න ඇති. කොහොම වුණත් ඔහුගේ බලාපොරොත්තු ඉටුවුණේ නැහැ. ඔහු ඉල්ලූ රසායන ද්‍රව්‍යය අවසන් වුණේ, මාස ගණනකට කලින්ලු. ඒ බව සමාගමේ කළමනාකරු බේකර් කියනවා මට ඇහුණා. ඒ රසායන ද්‍රව්‍යයේ ඔවුන් සතුව තිබුණු අන්තිම තොගයම මිලට ගත්තේ දොස්තර ජෙකිල්ම බව බේකර් කිව්වේ, බෙහෙත් තුණ්ඩුව ආපසු දෙමින්.





ඒක ඇසූ පූල්ගේ මුහුණ තරක් වුණා. ඔහු කොයිතරම් කැලඹීමට පත්වුණාද කිව්වොත්, තමන්ගේ හිස්වැස්මත් අමතක කරලා දාලා, මටත් නොකියයි පිටත්වුණේ. මං හිස්වැස්ම පූල්ට අරගෙනිහින් දුන්නා.

"ස්තුතියි මහත්මයා" කිව් ඔහු වහාම පිටවෙලා ගියේය. මා එක්ක එක වචනයක් හෝ කථා නොකර. බොහොම වෙලාවට ඒ, ජෙකිල්ගේ උපදෙස් අනුව වෙන්න ඇති. කොහොම වුණත්, මට එකක් හිතාගන්න පුළුවන් වුණා. වොට්සන්. මෙතැන සිදුවෙන්නේ මොකක්ද කියන එක ගැන, මට වඩා සැරුණු මොනවා හරි, පූල් දන්නවා. මං ආපහු හිමින් ඒ රසායන ද්‍රව්‍යය මොකක්ද කියල බේකර්ගෙන් ඇහුවා. ඔහුත් බොහොම වයස්ගත කෙනෙක් නේ. ඒක මොකක්ද කියල මං පැහැදිලිකරන්න ඔහු කැමැතිවුණේ නෑ. මං හිතන්නෙ ඒවා පිට අයට කීම, ඔවුන්ගේ වෘත්තීය සාරධර්ම වලට විරුද්ධයි. කොහොමහරි වුණත් ඒක දැනගැනීම එච්චර වැදගත් නෑ"

"ඇයි හෝම්ස් ඔබ එහෙම කියන්නෙ?"

"තවත් දවස් කීපයක් යනතුරු මගෙන් ඒ ගැන අහන්න එපා වොට්සන්" කී මගේ මිත්‍රයා, ඔහුගේ බඩුපොදිය විවෘත කොට, එහි අඩංගු දෑ, මේසය උඩින් තැබීමට පටන්ගත්තේය. එහි තිබුණේ මා නැමවිටම දැක තිබෙන, විවිධ වර්ගයේ හැඩ, ප්‍රමාණ හා ස්වභාව ගත් රසායන ද්‍රව්‍ය අඩංගු බෝතල් රැසකි. කුඩුවර්ග, පෙතිවර්ග, දියරවර්ග සහිත බෝතල්, ඔහු රසායන ද්‍රව්‍ය රාක්කයේ අසුරා, පරීක්ෂණ නළ අඩංගු පෙට්ටියක් ලාච්චුවට දැම්මේය. ඊළඟට ඔහු මා දෙසට හැරුණේය.

"මං මේ තරම් දවසක් පොත්පත් කියවමින් කල්පනා කරමින්, එක්තරා උපකල්පනයකට ආවා. ඊළඟට ඒක පියවරෙන් පියවර ගොඩනැඟුවා. අද ලැබූ අත්දැකීමෙන් වුණේ, මගේ උපකල්පනය වඩාත් තහවුරු වුණු එකයි. මං බලාපොරොත්තු වුණේ......"

කිසිවෙකුගේ දොරට තට්ටු කිරීම නිසා, හෝම්ස් පටන්ගත් කථාවට බාධා ඇතිවිය. දොර විවෘත කරගෙන විසිත්ත කාමරයට පිවිසියේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක නිවසනෙක් බව මම දුටුවෙමි.

පසුගිය සති දෙක ඇතුළත ඔහු සත් වතාවක් පමණ අප හමුවන්නට පැමිණ ඇති බව, මගේ සටහන්වල සඳහන් වේ. ඒ සෑම වතාවකම ඔහු අපේ නිවසෙන් පිටවී ගියේ හිත හොඳින්



www.sinhalaelibrary.com

නොවේ. ඊට හේතුව සම්පූර්ණයෙන්ම වැරදි අදහසක්, නිව්කමෙන් තම මොළයට ගෙන තිබීමය. හයිඩ් සිද්ධිය පිළිබඳ පරීක්ෂණයට, හෝම්ස්, බ්‍රිතාන්‍ය රජයෙන් විශාල මුදලක් අයකළේත්, ගැටලුව විසඳීමට කිසිදු උත්සාහයක් නොගත්තේය යන්න, ඒ වැරදි අදහස ය. (නමුත් සත්‍යය නම්, මෙම ගැටලුව විසඳීම හෝම්ස් භාරගත්තේ, කිසිදු මූල්‍යමය වාසියක් බලාපොරොත්තුවෙන් නොවේ)

"ඔබේ සොහොයුරා මයික්‍රොෆ්ට් මහත්මයාගෙන්, මේ පරීක්ෂණය සඳහා, මීට වඩා උදව් ලැබේවි කියලයි මං හිතුවේ" නිව්කමෙන් කීවේ උපහාසාත්මක හඬෙනි.

"නිව්කමෙන්ල වැනි අතිදක්ෂ නිලධරයන් ඉන්නා ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියටත්, හයිඩ් ගැන මොකක්වත් හොයාගන්න තවමත් බැරිවුණා" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේ ද උපහාසයෙනි. "ඉතින් ෂර්ලොක් හෝම්ස්ල මයික්‍රොෆ්ට් හෝම්ස්ල වගේ පොඩි මිනිස්සු මොනවා කරන්නද?"

එම පිළිතුරෙන් පොලිස් නිලධරයා කෝපයට පත්වූ බැව් මම තේරුම් ගතිමි.

"හෝම්ස් මහත්මයා" නිව්කමෙන් කීය. "පිස්සු හැදුණු මිනීමරුවෙක්, ලන්ඩන් නගරය පුරා සැරිසරමින් අසරණ මිනිසුන් කෲර ලෙස ඝාතනය කරනවා. ඔබ මොනවද කරන්නේ? උපකල්පන ගොඩ නංවමින්, ඒ පැත්තට මේ පැත්තට තර්ක විතර්ක කරමින් ප්‍රහේලිකා හදනවා.

කවුද මේ හයිඩ් පිටුපස ඉන්න මිනිහා? දෙවියන්ගෙ නාමයෙන් මට අන්න ඒක කියන්න. ඔබ හැම තිස්සෙම කියන්නෙ, කවුරු හරි කෙනෙක් හයිඩ් පිටුපස ඉඳගෙන, මේ අපරාධ මෙහෙයවන බව නේ. ඉතින් කෝ ඒ මිනිහා? කවුද ඒ මිනිහා? ඔබ කියන්නේ ඒ ඔබේ හතුරා වන මහාචාර්ය............?"

"කලබල වෙන්න එපා නිව්කමෙන්" හෝම්ස් කීවේ, පයිප්පයෙන් දුම් වලල්ලක් පිටකරමිනි. "ප්‍රමාණවත් තරම් දත්ත නොමැතිව, නිගමනවලට එළඹීම මහා මෝඩ ක්‍රියාවක්. විශ්වාස කරන්න, මං ඒ බව දොස්තර වොට්සන්ට කියල, මිනිත්තු පහක් ගතවුණේ නෑ. මගේ උපකල්පන මට තිබිච්චාවෙ.

මං තවමත් කිසිම දෙයක් හෙළිකරල නැති බව ඇත්තයි. ඒ මොකක් නිසාද? මට තවමත් නිශ්චිත නිගමනයකට එන්න





බැරිවුණු නිසා. මේ එඩ්වඩ් හයිඩ් කියන අපරාධකාරයා වටකරගෙන, අන්ධකාර, ගනකම් මීදුම් පටලයක් තියෙනවා. ඒකෙ ඇතුළත හරිම නොපැහැදිලියි. ඒක බිඳගෙන ඉදිරියට යන්න කලින්, ඇතුළත මොන වගේද කියල අපි දැනගෙන ඉන්න ඕන. ඒ අන්ධකාර පටලය තුළ තිබෙන, අබිරහස් බව, ගුප්ත බව, තේරුම් ගැනීම හරිම අමාරුයි. ඒ අඳුර විනිවිද යන්න පුළුවන් වුණොත්, මට නිශ්චිත නිගමනයකට එන්න හැකිවේවි. එදාට මං සොයා ගන්නා තොරතුරු, මුලින්ම දැනුම් දෙන්නේ ඔබට"

"ඒකට මට තව කොච්චර කාලයක් බලාගෙන ඉන්න වේවිද හෝම්ස් මහත්මයා?" නිව්කමෙන් ඇසීය. "මේ මිනීමැරුම් ගැන ස්කොට්ලන්ඩ්යාඩ් එකට, තවමත් කිසිදෙයක් හොයාගන්න බැරිවුණා කියල, පත්තර කාරයින් කෑගහනවා. උන් කියන්නෙ මගේ පඩි ගලවන්නලු. ඉක්මනින් මොනවා හරි නිශ්චිතව හොයාගන්න බැරිවුණොත්, මට අත්වෙන ඉරණම මොකක්ද දන්නවද? සාමාන්‍ය පොලිස් භටයෙකුගේ නිල ඇඳුමක් ඇඳගෙන, පොලිස් තළාවක් අතේ ගහගෙන, රාත්‍රියට වීදි වල මුර සංචාරය කරන්න මට සිදු වේවි. අනේ හෝම්ස් මහත්මයා. දෙවියන්ගේ නාමයෙන් මට මොකක් හරි හෝඩුවාවක් දෙන්න. එඩ්වඩ් හයිඩ් හෙවීමට මම මොනවා හරි කරනවා කියල........ අඩු ගණනේ රටට පෙන්වන්න........ මොනවාම හරි දෙයක්..........?" නිව්කමෙන් පැවසුවේ බැගෑපත් ස්වරයෙනි.

හෝම්ස් නිව්කමෙන් වෙත හෙළුවේ, අනුකම්පා සහගත බැල්මකි.

"නිව්කමෙන්, මේ වෙලාවෙ නම්, මට කළ හැකි කිසිම දෙයක් නෑ, නමුත් මං ඔබට එක දෙයක් සහතික කරලා කියන්නම්. මේ මාසෙ අන්තිම වෙද්දී, මේ ගැටලුව සම්පූර්ණයෙන්ම විසඳේවි. කිසිම අබිරහසක් ඉතිරිවෙන්නෙ නෑ. මේ හැමදේකටම වගකිවයුතු පුද්ගලයෙක් ඉන්නා බව ඇත්තයි. අපි වාසනාවන්ත වුණොත්...... ඔව්. අපි වාසනාවන්ත වුණොත් ඔහු නීතියේ රැහැණට හසුවේවි. ඒ හැරෙන්න ඔබට දිය හැකි පොරොන්දු කිසිවක් මා ළඟ නෑ"

"ඒ පොරොන්දුව හරි අවිනිශ්චිත එකක් නේද හෝම්ස් මහත්මයා?" නිව්කමෙන් විමසුවේය. එහෙත් මෙවර ඔහුගේ කටහඬේ තිබුණේ බලාපොරොත්තු සහගත තත්ත්වයකි.



www.sinhalaelibrary.com

"ඒකට හේතුව මෙකයි" හෝම්ස් කීය. "ඉස්සරහට මොනා මොන දේවල් සිදුවේවිද කියන එක මං දන්නෙ නෑ. මට අනාවැකි කියන්න හැකියාවක් නෑ. මෙතෙක් මට එකතුකරගන්න හැකිවුණු දත්ත අනුව, මම යම්කිසි උපකල්පනයක් කරල තියෙනවා. මෙන්න මේ පොත්වලින් සොයාගත් කරුණු සහ මගේ මොළයෙන් කළ කල්පනා තමයි, ඒකට පදනම් වුණේ. ඒක මහා අද්භූත එහෙමත් නැත්නම් අභූත උපකල්පනයක්. මං ඒක දැන්ම ඔබට කිව්වොත්, ඔබ හිතාවි මට පිස්සු හැදිල කියල. මේ සාධක හැම එකක්ම, පියවරෙන් පියවර, පුරුකෙන් පුරුක, තවම හරිහැටි සම්බන්ධ වෙලා නෑ.

ඒ නිසා, මේ අපරාධය, ඒකට සම්බන්ධ පුද්ගලයා, ඔහු එහෙම හැසිරුණේ ඇයි කියල, මටත් තවම හරිහැටි පැහැදිලි නෑ. ඒ වුණත් මං නිවැරදි නම්? ඔව් එහෙම නම්, මෙක රටේ සාමාන්‍යයෙන් දකින්න ලැබෙන අපරාධවල සීමාවට ඉහළින් යන, අපූර්ව ගණයේ සංකීර්ණ අපරාධයක් වේවි. මං ඒක ඔබට සහතික කරලා කියන්නම්. කවුරු හරි ඉතිහාසඥයෙක්, මේ කරුණු එකතු කරලා පොතක් ලියාවි. ඒක අපේ ජීවිත කාලය තුළම කෙරෙන බවට සහතිකයි.

කවුද දන්නෙ? කාටද විශ්වාස කරන්න පුළුවන්? ජීවිතේ කවදාවත් මුහුණ නුදුන් ආකාරයේ, බිහිසුණු අර්බුදයකට අප මුහුණදීල සිටිනවා වෙන්නත් පුළුවනි. මේ භයානක අපරාධකාරයාගෙ අවසන් සීමාව කොතැනද කියා ඔබ ඇහුවොත්, මට ඒකට පිළිතුරක් නෑ"

"හෝම්ස් මහත්මයා" නිවිකමෙන් කීය. "ඔබ ඉතා දක්ෂයෙක්, ක්‍රමානුකූලව ගැටලු විසඳන කෙනෙක්, බව බොහෝ දෙනෙක් මට කියල තියෙනවා" එසේ කියා පුටුවෙන් නැඟී සිටි පොලිස් නිලධරයා දොර අසලට ගොස්, මොහොතකට නැවතී හෝම්ස් දෙසට හැරුණේය.

"හොඳයි. එහෙනම් අපි මේ මාසෙ අන්තිම වෙනතුරු බලමු. ඒ වෙනතුරුත් ප්‍රශ්න නොවිසඳුණොත් වගකීම ඔබේ" කී ඔහු දොර වසාගෙන යන්නට ගියේය.

"මගේ මිතුවත් වොට්සන්" හෝම්ස් කීවේ ඉන් ඉක්බිතිව ය. "කරුණාකර පහළ තට්ටුවට බැහැල, දොරවල් වහල දමන්න. මගේ වයලීනයත් මා අතට දෙන්න. වයලීන වාදනයක් කරලා, මං මගේ





ස්නායු සන්සුන් කරගන්න ඕන. නිදන්න කලින් එහෙම නොකොළොත් මට හීනෙන් දකින්න ලැබෙන්නේ, "[illegible]" විසින් විස්තර කර තිබෙන තරකාදිය: සුව නින්දක් ලබාගන්න නම් එතකොට හැකිවෙන එකක් නෑ"

මා ආපසු තරප්පු පෙළ නැග ඇවිත්, මගේ කාමරයට පිවිසෙද්දීත්, හෝම්ස් තම වයලීනයෙන් නැගූ සංගීතරාවය මට අසන්නට ලැබිණ. ඇඳුම් මාරු කරගෙන, ඇඳට නැගුණු පසු මගේ හිත සන්සුන් වූයේ, ඔහුගේ ඒ සංගීතවාදනයට සවන්දීමෙනි. ගිනි උදුන අසලට වී, පැය කීයක් ඔහු එම කටයුත්තේ යෙදුණාදැයි මම නොදනිමි. ඒ අතර මට නින්ද යන්නට ඇත.

මා පැය කීයක් පුරාවට නිදාගත්තාද යන්න, මට නිශ්චිතව පැවසිය නොහැක. එහෙත් එක්වරම මා තිගැස්සී අවදිවූයේ, මගේ මිත්‍රයාගේ කටහඬ ඇසීමෙනි. ඔහු මගේ ඇඳ අසල බලාසිටියේය.

"වොට්සන්"

"හෝම්ස්. ඇයි මොකක්ද ප්‍රශ්නේ?"

"ඒවා තේරුම් කර කර ඉන්න වෙලාවක් නෑ මිත්‍රයා" ඔහු කීය. ඔහුගේ කටහඬේ තිබුණේ තැතිගැනීමට පත්, අතිශයින්ම කැලඹිලි හඬකි. "මාත් එක්ක එන්න කැමැති නම්, වහාම ඇඳ පැළඳ ගන්න. ඒ අතරේ මං උත්සාහ කරලා බලන්නම්, කුලීරියක් අල්ලාගන්න"

ජනේලයෙන් ඉවත බැලූ මා දුටුවේ, තවමත් නිවසෙන් පිටත දකින්නට ලැබුණු අන්ධකාරයයි. වලාකුළු අතරින් පෙරී ආ සඳකිරණ කිහිපයක්, මගේ ජනේලයේ වීදුරුව මතට වැටී තිබිණ. මධ්‍යම රාත්‍රිය පසුවී පැය දෙකක් පමණ ගතවන්නට ඇතැයි, මම අනුමාන කළෙමි. හෝම්ස් ගනකම් කබායක් හැඳ, දෙකන ද ආවරණය වන සේ හිස්වැස්මක් පැළඳ සිටියේය.

"වොට්සන්. ඔබේ රිවෝල්වරය සාක්කුවට දමාගන්න, අමතක කරන්න එපා. මං හිතූ හැටි නිවැරදි නම්, අපට තව පමාවෙන්න කාලයක් නෑ" කියූ හෝම්ස්, කාමරයෙන් පිටවී පහළ තට්ටුවට බැස්සේය. මේ අවේලාවේ කුලීරියක් අල්ලා ගැනීම, එතරම් පහසු නොවන බව අප හොඳින් දැනසිටි කරුණකි.

එහෙත් මිනිත්තු පහක් ගතවෙද්දී, අපි කුලීරියක නැගී ලන්ඩනයේ නැගෙනහිර දිශාවට වේගයෙන් ගමන්කරමින් සිටියෙමු. වෙනත් වාහන හා මහජනයා මාර්ගයේ නොවූ බැවින්, අශ්වකරත්තය වේගයෙන් දක්කාගෙන යාමේ අපහසුවක් නොවීය.



www.sinhalaelibrary.com

එහෙත් හිමවැටීම නිසා පාරේ තිබුණේ, ලිස්සනසුලු ස්වභාවයකි. ඒ නිසා රථය අනතුරට පත්වීමේ අවදානමක් තිබිණි. ඒ ගැන සිතූ රියැදුරා වංගු වලදී, වඩාත් පරෙස්සම් වී රියේ වේගය අඩුකළේය. එහෙත් හෝම්ස් තම සැරයටියෙන් රියේ වහලට වේගයෙන් තට්ටු කළේ, පමාවිය නොහැකි බැව් හඟවමිනි.

හමා ආ සුළඟේ ඇඟට කාවදින තද සීතලක් රැඳී තිබිණ. "මේ සැරේ අපි යන්නේ කොහේටද?" මා විමසුවේ අශ්ව කුරහඬ ඉක්මවන හඬකින් කථාකරමිනි.

"ජෙකිල්ගේ ගෙදරට" ඔහු කීය. පාරේ තැනින් තැන තිබූ ගෑස් ලාම්පු වල එළිය, වරින් වර රිය තුළට වැටිණි. ඔහුගේ මුහුණේ තිබූ කැලැඹීම දැකීමට, ඒ එළිය ප්‍රමාණවත් විය. "මං විශ්වාස කරනවා අපි දැනටමත් ප්‍රමාද නැහැ කියල. මං වගේ මෝඩයෙක්. අන්ධයෙකුට වගේ මේ කාරණා මට නොපෙනුණු හැටි!"

ප්‍රධාන පාරේ පැමිණි අප, ජෙකිල්ගේ නිවසේ පිටුපස දොරටුව විවෘතවෙන පටුමගට රිය හැරෙව්වා පමණි. ඒ පැත්තේ සිට අප ඉදිරියට වේගයෙන් පැමිණි අශ්වකරත්තයක නොගැටී, අපි අනූ නවයෙන් බේරුණෙමු. අපේ කුලීරථ රියැදුරාගේ දක්ෂකම නිසා කරත්තයේ රෝද පදිකවේදිකාව උඩින් ගමන් කරවා, හැප්පීම වලක්වාගැනීමට ඔහුට හැකිවිය. අප පැමිණි දිශාවට ගමන්කළ ඒ රියේ සිටියේ එක් මගියෙකු පමණි. මංසන්ධියේ වූ ලොකු ගෑස් පහනේ එළියෙන් ඔහු හඳුනාගැනීම මට අපහසු නොවිය.

"හෝම්ස්. ඒකෙ හිටියෙ ජෙකිල්ගේ සේවකයා – පූල්!"

මා කියූ දෙය අනුමත කරමින් හිස සොලොවා මිස, හෝම්ස් කිසිවක් කීවේ නැත. දෙතොල් එකට තදකරගෙන, ගැඹුරු කල්පනාවකට වැටී සිටි ඔහුගේ මුහුණේ, බැරෑරුම් ප්‍රශ්නයකට මැදිවූ ලකුණු දක්නට ලැබිණ.

ජෙකිල්ගේ නිවස ඉදිරිපිට රිය නැවැත්වූ වහාම, හෝම්ස් එළියට පැන්නේය. නිවසේ සියලුම පහන් දල්වා තිබිණ.

"මං හිතුවා හරි වොට්සන්. ඔක්කොම ඉවරයි. වෙන්න තියෙන හැමදෙයක්ම සිදුවෙලා."

විවෘතව තිබූ කුඩා ගේට්ටුවෙන් ගෙමිදුලට පිවිසි අපි, වහාම දොරටුව වෙත දිව ගියෙමු. දොර බෝලය කරකැවූ වහාම දොර විවෘත විය. ඔහුට තිබූ කලබලය නිසා, දොර යතුරු දැමීමට පූල්ට අමතක වන්නට ඇත. අපි වහාම ඇතුළට පිවිසියෙමු. එම





කාමරයේ ඈත කෙළවරේ, එක් පුද්ගලයෙකු සිටගෙන සිටි ආකාරය අපට දක්නට ලැබිණ. දොර විවෘත වෙද්දී නැඟුණු ශබ්දය නිසා, ඔහු ආපසු හැරී බැලුවේය.

නිවස තුළ තිබූ අඩ අඳුර නිසා, මට ඔහු හඳුනාගැනීමට නොහැකි විය. ඔහු කවුරුන් වුවත්, අප දුටු වහාම කලබලවී, ඈත ශාලාව වෙත දිවගිය බැව් අපි දුටුවෙමු. ඒ වෛද්‍යවරයාගේ රසායනාගාරය දෙසටයි.

"අන්න අපට ඕන කරන මිනිහා! අල්ලාගමු ඒකව" හෝම්ස් කෑගැසීය.

බ්ලැක් හීත් කණ්ඩායම වෙනුවෙන් මා රග්බි පාපන්දු ක්‍රීඩා කළේ තරුණ කාලයේදීය. එකල ප්‍රතිවාදීන් අල්ලා ගැනීමට මා දැක්වූ දක්ෂතාවය නිසා, මට තරමක කීර්තිනාමයක් ද ලැබී තිබිණ. එහෙත් මෙදින නම් හෝම්ස් සිටියේ, මට පියවර කිහිපයක් ඉදිරියෙනි. අපි සතුරා ලුහුබැඳ ගියෙමු. දොස්තර ජෙකිල්ගේ රසායනාගාරයේ දොර විවෘත කර ගැනීමට, පැන දිවූ පුද්ගලයාට තත්පරයක් හෝ දෙකක් ගතවිය. එයින් ප්‍රයෝජන ගෙන, අපි ඒ දෙසට කඩාපැන්නෙමු. ඔහු දොර වසද්දී එසේ කිරීමට නොහැකිවන සේ, අපි දෙදෙනාගේම ශක්තිය යොදා දොර ඔහු දෙසටම තල්ලු කරගෙන, කාමරය තුළට කඩාවැදීමට අපි සමත්වීමු. විශාල දොර අතහැර, පැනදිවීමේ අරමුණෙන් ආපසු හැරුණත්, ඔහු විසිවීගොස් බිම ඇදවැටුණේය. ඒ සමගම කෝපාවිෂ්ටව කෑගැසූ ඔහු වෙතට, මගේ රිවෝල්වරය එල්ල කළෙමි. බිත්තියේ සවිකර තිබූ ගෑස්පහනේ ආලෝකයෙන් අපට දකින්නට ලැබුණේ කවුරුන්ද? ඒ වෙස්ට්මින්ස්ටර් ඝාතකයා එඩ්වඩ් හයිඩ්ය.

www.sinhalaelibrary.com

## 18

## කම්පනයක්!

මා පවසන දේ බොළඳ යයි පාඨකයා පවසනු නොඅනුමානය. එඩ්වඩ් හයිඩ් මොන තරම් කෲර බිහිසුණු පුද්ගලයෙකුද යන්න, අපි හොඳින් දැනසිටියෙමු. ඔහු ගැන අපේ සිත්වල තිබුණේ දැඩි පිළිකුලකි. එහෙත් ඔහු දුටු මේ මොහොතේ, මගේ සිතේ ඇතිවූයේ, යටපත් කරගත නොහැකි හාස්‍යයකි. ඔහු මේ කරන්නේ කුමන විහිළු රංගනයක්ද? රිවෝල්වරය අතේ තිබුණත්, මට හඬනගා සිනාසීමට හැකියාව තිබිණි.

හේතුව මෙයයි. හයිඩ් මේ වෙලාවේ සැරසී සිටියේ, ඔහුට කිසිසේත් නොගැළපෙන ඇඳුම්වලිනි. උස මහත පුද්ගලයෙකු වූ දොස්තර ජෙකිල්ගේ, සුදුපැහැති පිටකබාය, කෙට්ටු කුරුමිට්ටෙකුට කෙසේ නම් ගැළපේද? ජෙකිල් සඳහා සකස් කළ කොලරයක්, හයිඩ්ගේ කරවටා තිබිණි. එය බිඳුණු කටුවකින් හිස එළියට දමන කුකුළු පැටියෙකුගේ පෙනුමට සමාන විය. හයිඩ් පැළඳ සිටියේ, ඔහුගේ කකුල් වලට කිසිසේත් නොගැළපෙන පාවහන් යුගලකි. ඒ ජෙකිල්ගේ පාවහන් බැව්, දුටු වහාම මම හඳුනාගතිමි. මට එක්වරම සිහිවූයේ, කුඩාදරුවෙකු තම පියාගේ ඇඳුම් සැළඳුම් පළඳවාගෙන කරන විහිළු රංගනයකි. එහෙත් මේ වෙලාවේ මගේ සිනාව නැවතී, සිතේ දැඩි බියක් ඇතිවිය. ඒ හයිඩ්ගේ මුහුණට නැඟුණු බැල්ම දුටුවිටය. එය වඩාත් සමාන වූයේ කෝපාවිෂ්ඨ වූ ව්‍යාඝ්‍රයෙකුගේ මුහුණටයි.

හයිඩ්ට කොහොමටත් තිබුණේ, ඔහුගේ ශරීරයට නොගැළපෙන ලොකු හිසක් බව, මා ඊට කලින් සඳහන් කර ඇත. වියරු සුනඛයෙකුගේ දෙනෙත්වලින්, කෝපයේ ගිනිපුලිඟු පිටවන ආකාරයට, හයිඩ්ගේ දෙනෙත්වලින් කෝපයේ ගිනිදැල් පිටවිය. ඔහුගේ කට විවරව තිබුණේ, සතුරන්ට කොටු වූ වන මෘගයකු, කඩා පැනීමට සූදානම්ව දත් විලිස්සන ආකාරයටය. එවැනි සතෙකු සතුරන් භයකිරීමට පිඹින ආකාරයක ශබ්දයක් ද, හයිඩ්ගේ කටෙන් නිකුත් විය.





රසායනාගාරයේ මේසය මත තිබුණේ කුමාංකිත, සිලින්ඩරාකාර වීදුරු බඳුනකි. එහි තුන්කාලක් පමණ, තද කහ පැහැති දියරයකින් පිරී තිබිණ. වීදුරුවකට සෝඩා වත් කළ විටෙක මෙන්, එයින් බුබුළු නැඟුණු අතර, දියරය මතුපිටින් දුමාරයක් නැඟිණ. මෙම බඳුන එක්වරම තම අතට ගත් ඔහු, එය අප දෙසට දිගුකොට අල්ලාගෙන සිටියේ, අනතුරු ඇඟවීමක් ලෙසිනි.

"මෝඩ මූරුවෝ!" යයි ඔහු ගුගුරද්දී මම ඒ කටහඬ හඳුනාගතිමි. "මගේ පුද්ගලික වැඩවලට ඇඟිලි ගහන්න, උඹලට තියෙන අයිතිය මොකක්ද?"

අසල දල්වා තිබූ බන්සන් දාහකයෙන්, වීදුරුබඳුනක ඔහු රත්කරන්නට ඇත්තේ, මා සඳහන් කළ කහපාට දියරය විය යුතුය. අප එන්නට මොහොතකට පෙර, ඔහු එම කටයුත්තේ යෙදී සිටින්නට ඇත. ඒ නිසයි එය බුබුළු නගිමින් දුම්දමමින් තිබුණේ.

"අපට තියෙන අයිතිය?" මා නිර්භයව හඬ නැඟුවෙමි, රිවෝල්වරය ඔහු දෙසට යොමුකොට එල්ලය ගනිමිනි. "බිහිසුණු අපරාධකාරයෙක් නීතියට හසුකරදීම, සෑම රටවැසියෙකුගේම යුතුකමක්"

එක් මොහොතකට ඔහුගේ තිබුණේ නිහඬ බවකි. ඊළඟ මොහොතේ යළිත් ඔහු මුව විවර කළේ, ව්‍යාඝ්‍රයෙකු කෝපයෙන් කරන්නාක් වැනි ගෙරවීමක් සමඟිනි.

"බිහිසුණු අපරාධකාරයෙක්?" ඔහු ප්‍රතිරාවය කළේය. "පරම්පරා ගණනක් තිස්සේ සැඟවී තිබූ රහසක්, එළිදරව් කිරීමේ හපන්කමට, ඒක අපූරු නම්බුනාමයක්. අප ජීවත්වන මේ ලෝකයේ මනුෂ්‍ය වර්ගයාගේ අනාගතය, සම්පූර්ණයෙන්ම වෙනස් කළ හැකි සොයා ගැනීමක් මා කළා. ඒ වෙනුවෙන් එක මිනිස් ජීවිතයක් කැපකිරීමේ ඇති වැරැද්ද මොකක්ද?"

"මේ! බහුබූත දොඩවලා, අපේ මොළ අවුල්කරන්න හදන්න එපා" මම කෑගැසුවෙමි. "අපි ඔහේ පසුපස්සෙ එළවන්නේ බොහොම කාලයක ඉඳල. ඔහේගේ වැඩ කටයුතු ගැන අපි හොඳට දන්නවා."

මෙවැනි අවස්ථාවල, එනම් අපරාධකරුවන් ඉදිරියේ හැමවිටම පෙරමුණ ගන්නේ මා නොව ෂර්ලොක් හෝම්ස්ය. එහෙත් අද ඔහුගේ තිබෙන්නේ නිහඬ බවකි. මම ඔහු දෙස ක්ෂණික බැල්මක්



www.sinhalaelibrary.com

හෙළීමි. ඔහු කබාසාක්කුවෙන් එළියට රිවෝල්වරය ඇදගත්තත්, එය හයිඩ් දෙසට එල්ලනොකොට, පහත හෙලාගෙන සිටියේය.

"හෝම්ස්?" මා ඔහු ඇමතුවේ විමතියට පත්වය.

"ඔහුට කැමැති දෙයක් කියන්න, කරන්න ඉඩහරින්න වොට්සන්"

"ඒ වුණත් හෝම්ස්....."

හයිඩ්ගේ මුවෙන් පිටවූයේ අවඥා සහගත සිනාවකි. එය ඇසූ මගේ ඇඟ කිලිපොළා ගියේය.

"කන්දෙනවා තමුසෙගෙ මිත්‍රයාට" හයිඩ් කීය. "ෂර්ලොක් හෝම්ස් මහත්මයා, මේ දේවල් තේරුම් ගන්න පුළුවන් බුද්ධිමතෙක්. මේ අවාසනාවන්ත රාත්‍රියේ මෙහි පැමිණීමෙන් පෙනෙන්නේ, ඔබ හැමදෙයක්ම තේරුම් ගෙන ඇති බවයි. ඒක එහෙමද මහත්මයා?"

"මං මෙහෙම දෙයක් සැකකළේ, මීට මාස දෙකකට කලින්" හෝම්ස් කීවේ නිවුණු නැත්පත් අයුරෙනි. "ඒ, මේ දොරට ඇතුළෙන් ඔබේ කටහඬ අහන්නට ලැබුණු දවසේ. ඒ වුණත් මට සත්‍යය හරි හැටි අවබෝධ වුණේ මීට පැය කීපයකට කලින්"

හෝම්ස් කී දෙයට ප්‍රතිචාර ලෙස, හයිඩ්ගේ කෝපය පහව ගිය බැව් මම දුටුවෙමි. ඔහු අතිශය සතුටට පත්වූ බවක් පෙනිණ.

"ඒක හරි පුදුමයක් නේ. මේ ලෝකෙ මෙහෙම දෙයක් අවබෝධ කරගන්න පුළුවන් එකම විද්‍යාඥයා, ජෙකිල් පමණක් කියලයි මම හිතාගෙන හිටියේ. ඒක අවබෝධ කරගන්න, ඒ තත්ත්වයට එන්න, ඔහුටත් අවුරුදු 30 ක් පමණ පර්යේෂණ කරන්න සිදුවුණා. ඒකෙන් තේරෙන්නේ ජෙකිල් බොහොම හෙමින් කාරණා වටහගන්න කෙනෙක් කියලද? ඔබට තියෙනවද ජෙකිල්ට වඩා තීක්ෂණ බුද්ධියක්?"

"ඒ දෙකම නොවෙයි" හෝම්ස් කීය. "ජෙකිල් ඒ මඟ හෙළිකරගත්තේ, ඇඩි උත්සාහයකින්, අප්‍රමාණ කැපවීමකින්, පර්යේෂණ වල යෙදිලා. මට කරන්න තිබුණේ ස්වල්පයයි, මෑත කාලවල වුණු සිදුවීම නිරීක්ෂණය කරලා, ඒ මඟින් නිගමනයන්ට එළඹෙනවයි"

එවිට හයිඩ් හා හෝම්ස් අතරේ මෙවැනි සංවාදයක් ඇතිවීම මම කිසිසේත් ප්‍රිය නොකෙළෙමි.





"නවත්වන්න ඔය කතාව" මම කෑගැසීමි. "මෙතැන මොකක්ද සිදුවෙන්නේ? ඔගොල්ලගේ කතාවල් මට තේරුම් ගන්න බෑ. කෝ දොස්තර ජෙකිල්? ඔහුට මොකද වුණේ!"

"මොහු කිසිදෙයක් තේරුම් අරගෙන නැද්ද?" හයිඩ් හෝම්ස්ගෙන් විමසුවේය. මගේ මිත්‍රයා හිස පහත්කොට, එය නිවැරදි බව හැඟවිය.

"එහෙම නම් ඔබේ ප්‍රශ්නය සාධාරණයි දොස්තර වොට්සන්" හයිඩ් කීවේ කිසිදු ගණනකට නැතිවය. දොස්තර ජෙකිල් විනාශමුඛයට යවා, හයිඩ් නිර්භයව පොඩිවන ආකාරය, මගේ සිතේ ඇතිකළේ කෝපයක් මෙන්ම පිළිකුලකි. ඔහු ජීවිතක්ෂයට පත්වෙනසේ රිවෝල්වරයේ මුකුට ගැස්සීමට, මගේ ඇඟිලි තලියන්නට විය. එය පාලනය කරගැනීම සඳහා, ඇඩි උත්සාහයක් යෙදීමට මට සිදුවිණි.

"කෝ ජෙකිල් කියල නේද ඔබ ඇහුවේ?" හයිඩ් ඇසීය. "ඒක බොහොම දිග කතාවක්. ඒක මෙහෙම කියන්න බෑ. ඒකට පොතක් ලියියක් උවමනායි. ඒක තේරුම් කරන්න දිග කාලයක් ගතවේවි. නමුත් මට ඒ හැටි කාලයක් ඉතිරිවෙලා නෑ, වොට්සන් මහත්මයා. ඔබේ සෞඛ්‍ය තත්ත්වය කොහොමද? විශේෂයෙන්ම හෘදයවස්තුව? ලේ ගමන?"

මේ මා කිසිසේත් බලාපොරොත්තු වූ ප්‍රශ්නයක් නොවේ. නමුත් එයට නොබියව පිළිතුරු දීමට මම තීරණය කළෙමි.

"මගේ සෞඛ්‍ය තත්ත්වය ඉතාම හොඳයි" මම කීවෙමි. "හෘදය නිරෝගියි. රුධිර පීඩනය සාමාන්‍ය තත්ත්වයේ. ඇයි ඒව ඇහුවේ?"

"මං එහෙම ඇහුවෙ ඔබේ යහපත වෙනුවෙන්" හයිඩ් කීය. "ඒ මොකද, තව ටිකකින් ඔබට දකින්නට ලැබෙනවා, යම් දර්ශනයක්. ඒක දැකපු දොස්තර හේස්ටි ලැනියන්, අකාලයේ ස්වර්ගස්ථ වුණා. ඔන්න බලාගන්න!" පෙණ දමමින් තිබූ කහපැහැති දියරය සහිත විදුරුබඳුන, ඔහු ඉහළට එසෙව්වේය. මීළඟට බඳුනේ කට දෙතොල් වෙත ළං කළ ඔහු, දියරය බීගෙන, බීගෙන ගියේය.

එයින් ඇතිවූයේ ක්ෂණික මෙන්ම අද්භූත ප්‍රතිඵලයකි. ඔහු අතින් අත්හැරුණු විදුරු බඳුන බිම වැටී, කැබලි වලට බිඳීගියේය. තව මොහොතෙන් හයිඩ් ද බිම ඇදවැටීමට ඉඩ තිබිණි. ඔහුගේ සමබරතාවය නැතිවී යද්දී, ඔහු මේසයේ කෙළවරක් තදින් අල්ලා ගත්තේය. ඔහුගේ මුහුණ දම් පැහැයට හැරිණි. මීළඟට තම බඩේ



www.sinhalaelibrary.com

ඇතිවූ තද වේදනාවක් නිසාදෝ, ඔහු බඩ එක් අතකින් තදකරගෙන දෙකට නැමුණේය. ඔහුගේ උගුරෙන් නිකුත්වූයේ, අපහසුවෙන් හුස්මගන්නා හඬක් හා වේදනාවෙන් කළ කෙඳිරිගෑමකි.

"ඔහු වස බිව්වා!" මට කෑගැසිණි. මම ඒ ඉදිරියට පැන්නෙමි. හෝම්ස් මගේ අතකින් තදින් අල්ලාගෙන, මා රඳවා ගත්තේය. මුහුණ පොළොවට ළංවෙන තරමට, ඉදිරියට නැමී සිටි හයිඩ්, හතිදැමීමට පටන්ගත්තේය. ඔහුගේ මුහුණ පුරා ඩහදිය ගලා ගියේ, උල්පතකින් වතුර ගලායන ආකාරයටය. දැඩි වේදනාවෙන් පෙළෙන, වකුගඩු වල ගල් සෑදීමේ රෝගයට ගොදුරු වූ රෝගීන්, මම දැක ඇත්තෙමි. ඔහුගේ මුළු සිරුරම ඇඹරීමට ලක්වූයේ, එවැනි රෝගයකට ගොදුරු වූ පුද්ගලයෙකු විලසිනි.

මීළඟට සිදුවූයේ මහත් අද්භූත දෙයකි.

හිස් බැලූනයකට සුළං පිරෙන්නාක් මෙන්, හැකිළී තිබූ ඔහුගේ ඇඳුම්, ක්‍රමයෙන් පිරී යන්නට පටන්ගත්තේය. ඔහුගේ අඟුටුමිටි සිරුර ක්‍රමයෙන් උසෙන් වැඩිවී සෘජුවිය. පාවහන් පිරෙන සේ දෙපා විශාල විය. කමිස, කබා, කලිසම් තදවන සේ, සිරුර ප්‍රමාණයෙන් වැඩිවිය. තද කළු පැහැයට තිබූ හයිඩ්ගේ හිසකෙස්, ක්‍රමයෙන් රිදීපාට මිශ්‍ර රන්වන් පාටට හැරිණි. හුස්ම ගැනීම ක්‍රමවත් විය. ගිසේ තිබූ විකෘති හැඩය වෙනස් වී, සාමාන්‍ය හැඩයක් ලැබුණු අතර, දුඹුරු පැහැති සම, වඩාත් සුදු පැහැයකට හැරිණි.

මොහොතකින් අප දුටුවේ කුමක්ද? මෙතෙක් වේලා අප ඉදිරියේ සිටි එඩ්වඩ් හයිඩ් අතුරුදන්වී ගොස්, දෙව හාස්කමකින් මෙන් දොස්තර හෙන්රි ජේකිල් අප ඉදිරියේ "පහළවූ" ආකාරයකි. ඔහු තම නිල්පැහැති දෙනෙත් අප වෙත යොමුකරගෙන, බලාසිටියේය.



## 19
## දොස්තර ජේකිල් සහ එඩ්වඩ් හයිඩ්

මගේ ඇස් නිලංකාර වී, අවට ලෝකය අඳුරු වී යන බවක් මට පෙනිණ. ඒ සමගම මගේ සිරුර පුරා සීතල ඩහදිය ගලායද්දී, දෙපා අප්‍රාණික විය. මගේ අතේ තිබූ රිවෝල්වරය, බිම ඇදවැටෙන ශබ්දය මට ඇසිණ. එහෙත් එය අහුලා ගැනීමට, මට ශක්තියක් නොවීය. බිම ඇදනොවැටී සිටීමට, මම අසලවූ දොරක එල්ලුණෙමි.

මගේ තත්ත්වය මදක් යහපත් අතට හැරෙද්දී, මගේ දෙනෙත් යොමු වූයේ හෝම්ස් දෙසටයි. කිසිවකින් නොසැලෙන ඔහුගේ මුහුණ සුදුමැලිවී තිබිණ. ඔහු ද දැඩි කම්පනයකට පත්වී සිටි බැව්, මම තේරුම් ගතිමි. මා තරම් දුර්වල නොවූවත්, වචනයෙන් කිව නොහැකි විස්මය නිසා හෝම්ස්ගේ දෙනෙත් විශාල වී තිබිණ.

තම අවුල් වූ කෙස්වැටිය මතින් අත යැවූ හෙන්රි ජේකිල්, මත් පැනින් වෙරි වූ පුද්ගලයකු මෙන්, එහාට මෙහාට වැනුණු අයුරු අපි දුටුවෙමු. එහෙත් පානය කළ ඖෂධය නිසා, ඔහුට බරපතළ විපතක් වූ බවට සලකුණක් නොවීය. අසහනයට පත්ව සිටි අප දෙදෙනා, යථා තත්ත්වයට පත්වෙද්දී, ජේකිල් අප සමග සිනාසීමට උත්සාහ කළේය.

"මහත්වරුනි, ඔය දොර වහල අගුළු දමන්න පුළුවන් නම්, මං ඔබට කෘතඥවෙනවා" ඔහු කීවේ විඩාපත් හඬකිනි. "මගේ සේවකයා පූල් කොහේ ගියාද කියල මං දන්නෙ නෑ. ඔහු තනියම ආපහු ඒවිද, නැත්නම් තවත් අය කැඳවාගෙන ආපහු ඒවිද කියන එක මං දන්නෙ නෑ"

මීළඟට ඔහු අමාරුවෙන් පා නැගුවේ, ගිනිඋදුන අසල වූ තම හාන්සිපුටුව වෙතය. ඒ සමගම අපට ද ඒ අසලින් අසුන්ගන්නා මෙන් සංඥා කළේය.

"මහත්වරුනි. කරුණාකරල මෙහෙන් වාඩිවෙන්න" ජේකිල් කීය. "මං දන්නවා මේ හැමදෙයක්ම ඔබට තේරුම් කරල දීම, මගේ වගකීමක්. මං ඒකට බැඳී සිටිනවා. ඒ වුණත් ඒ සඳහා මට ඉතිරිවෙලා තියෙන්නේ බොහොම කෙටි කාලයක් විතරයි.



www.sinhalaelibrary.com

ඒ කාලය ගතවෙද්දී දොස්තර හෙන්රි ජෙකිල්, මේ පොළොවෙන් අතුරුදන්වෙලා, වාෂ්පවෙලා යාවි. ජෙකිල්ව ආපහු මේ ලෝකෙට ගේන්න, ස්වර්ගයේවත් අපායේවත් කිසිකෙනෙකුට හැකිවෙන්නේ නෑ"

මා අසලින් වූ පුටුවක හෝම්ස් හිඳගත්තේ, කබාසාක්කුවෙන් පයිප්පය ගෙන එය දල්වා ගනිමිනි.

"ඔය කතාව අපට මුල ඉඳලම කියන්න ජෙකිල් මහත්මයා" හෝම්ස් කීවේ දල්වා ගත් පයිප්පය අතට ගනිමිනි.

"මේක බොහොම දීර්ඝ කතාවක්" ජෙකිල් කීය. "ඒත් එය කෙටියෙන් කියන්න මං උත්සාහ කරන්නම්.

මනුෂ්‍යයා කියන සත්ත්වයා ගැන, මං දිගු කාලයක් අධ්‍යයනයක යෙදුණා. එකම ශරීර කුඩුව නැතහොත් මිනිස් සිරුර තුළ, පුද්ගලයින් දෙදෙනෙක් ජීවත්වෙනවා. ඒකයි මගේ සොයා ගැනීම. මෙයින් එක් කෙනෙක් ඉතාම හොඳ ගතිගුණ ඇති, ගුණයහපත් කෙනෙක්. අනෙකා ඉතාම කෲර ගතිගුණ ඇති, නීච අධම පුද්ගලයෙක්. ඒ නිසාම එක මිනිසෙකුට තියෙන්නේ, එකම මනසක් නොවෙයි, දෙබිඩි මනසක්. එකක් උතුම් මනසක්. අනෙක අධම මනසක්.

අවාසනාවකට වගේ මේ විඥාන ධාරා දෙක, සම්පූර්ණයෙන්ම වෙන්වෙලා පවතින්නේ නෑ. උතුම් මනස මතුපිට තියෙද්දී, යටිසිතේ අධම මනස සැරිසරනවා. අධම මනස අවදිවෙන්නේ කොයි වෙලාවලටද? උතුම් මනස කල්පනා ලෝකවල සැරිසරන වෙලාවට.

මේ මිනිස් ස්වභාව දෙක, එකම පුද්ගලයෙකු තුළ එකට ජීවත්වෙන බව මං හොඳින් වටහාගත්තා. ඒ මං එඩින්බ්‍රෝ සරසවියේ වෛද්‍ය පීඨයේ ඉගෙනුම ලැබූ කාලයේදී. මේ ගැන මං දිගින් දිගටම කල්පනා කළා. එකම මිනිසා තුළ ඉන්න හොඳ මිනිසා බේරාගෙන, නරක මිනිසා වෙන්කරලා ඉවත්කරන්න බැරි ඇයි, කියලා මං කල්පනා කළා. මං ඒ ගැන දිගින් දිගටම පොත්පත් කියෙව්වා. මේ ගැන ඉගෙන ගනිද්දී, මට තවත් කරුණක් තේරුම් ගියා. ඒ තමයි, රසායන විද්‍යාත්මක සංයෝග භාවිත කරමින්, සිරුරේ ජීවරසායනය, විපර්යාසයකට භාජනය කළ හැකි බව. මං වෛද්‍යවරයෙකු වූ පසු, මගේ පර්යේෂණ යොමුකළ යුත්තේ මේ පැත්තට. මුළු ජීවිතයම කැපකරලා හරි මේ දේ කරන්න, මං අධිෂ්ඨාන කරගත්තා.





මගේ පර්යේෂණ කටයුතු සාර්ථක ලෙස අවසන් වෙන්න කලින්, මං මියයෑමට ඉඩ ඇති බව මං තේරුම් ගත්තා. ඒ නිසා මං හිතුවා, මේ පර්යේෂණ සඳහා වෙනත් වෛද්‍යවරයෙකුගේ සහයෝගය ලබාගන්න. එතකොට ඔහුට හැකිවේවි, මා කළත් පර්යේෂණ කටයුතු ඉදිරියට ගෙනියන්න. ඒ සඳහා මං තෝරා ගත්තේ මගේ හිතවත් දොස්තර හේස්ටි ලැනියන්.

මං මගේ අදහස ඔහුට කිව්වා. මගේ අරමුණ, මං ලබා තිබූ සාර්ථකත්වය ඔහුට පැහැදිලි කළා. හැබැයි ඔහු මොකක්ද කළේ? ඔහු කිව්වේ මගේ මතය, කිසිදු විද්‍යාත්මක පදනමක් නැති මනුලින විකාරයක් ලෙසයි. මගේ සොයාගැනීම් ඇතුළු සියලුම දේවල්, ඔහු අවඥාවෙන් බැහැර කළා. එදා අපි දෙන්නා අතර හිතවත්කම බිඳී ගියේ, යළිත් කවදාවත් එක් නොවෙන අයුරින්.

මට තනියෙන් අවශ්‍ය වුණේ, මනුෂ්‍ය ආත්මයේ හොඳ මිනිසාගෙන් නරක මිනිසා වෙන්කරගෙන, ඔහු පලවා හැරීමටයි. ඒ සඳහා මට උවමනා වී තිබුණා සුදුසු ඖෂධයක්, රසායන විද්‍යාත්මකව නිෂ්පාදනය කිරීමට. ඊට අවශ්‍ය මූලික ද්‍රාවකය ලෙස, කාබනික රසායනයේ ද්‍රාවකයක් මං තෝරා ගත්තා. එක මිනිස් සිරුරට එතරම් අහිතකර ප්‍රතිඵල ගෙන නොඑන රසායන ද්‍රව්‍යයක්. මිළහට නොයෙකුත් රසායනික සංයෝග, කුඩු වශයෙන් හෝ දියර වශයෙන් අරගෙන, අර ද්‍රාවකයේ දියකරමින් අත්හදා බැලීම් පටන්ගත්තා. එම අත්හදා බැලීම් වලට මං යොදාගත්තේ රටහාවුන්. අන්තිමේදී සාර්ථක ප්‍රතිඵල ගෙන ඒමට සමත්වුණේ සුදුපැහැති එක්තරා කුඩුවර්ගයක්. එහි නම මං ඔබට හෙළිකරන්නේ නැහැ.

මා කලින් සොයාගෙන තිබූ ලවණ කිහිපය දියකළ ද්‍රාවකය රත්කොට, එයට සුදුපැහැති කුඩුවර්ගය එකතුකිරීම පමණයි, කරන්න තිබුණේ. එතකොට මට ලැබුණේ ඔබ දුටු කහපැහැති ඖෂධය. මං එය හාවුන් කිහිපදෙනෙකුට පෙව්වා. මිනිත්තු කිහිපයක් ඇතුළත උන්, පෙනුමෙන් මීයන්ට තරමක් සමාන, විරූපී නපුරු සතුන් බවට පත්වුණා. එකිනෙකා සපා ගනිමින් ඔවුන් හැසිරුණේ භයානක කොටිපැටවුන් ලෙසයි. මගේ ඖෂධය යළිත් වරක් උන්ට පෙවීමෙන්, උන් යළිත් පෙර සිටි අහිංසක හාවුන් බවට පත්වුණා.

මෙහිදී මං ඔබට එක්තරා කරුණක් මතක් කළ යුතුයි. මං යොදාගත් ඒ විශේෂ රසායනික කුඩුවර්ගය, යුරෝපයේ රටවල්

ගණනාවකම නිෂ්පාදනය කරලා, ඉතාම පිරිසිදු තත්ත්වයෙන් එංගලන්තයට එවනු ලබනවා. ඒ නිසාම මෙහේ වෙළඳපලෙන් පහසුවෙන් මිලට ගන්න පුළුවනි. නමුත් මට සාර්ථක ප්‍රතිඵල ලැබුණේ, දකුණු ඇමරිකාවේ එක්තරා දුප්පත් රටකින් ගෙන්වූ, එම රසායන ද්‍රව්‍යයේ, තරමක් අපිරිසිදු සාම්පලයක් යොදාගැනීමෙන්. මොකක්ද මේකට හේතුව? මං ඒ ගැන දීර්ඝ ලෙස පරීක්ෂණ කළා. එතකොට ඒකට හේතුව සොයාගැනීමට මට හැකිවුණා.

මට සාර්ථක ප්‍රතිඵල ගෙන ආ රසායනය, ඉතාමත් පිරිසිදු ලවණයක් නොවෙන බව, මට පෙනී ගියා. එහි සියයට එකක පමණ ප්‍රමාණයකට, වෙනත් රසායන ද්‍රව්‍යයක්, අපද්‍රව්‍යයක් ලෙස මිශ්‍රවී තිබුණා. ඒක එක්තරා මූල ද්‍රව්‍යයක තයෝසල්ෆේට් ලවණය බව මං හොයා ගත්තා. මේක වුණේ කොහොමද? එක්කෝ එය අර රසායනික නිධියේ ස්වාභාවිකව පිහිටි අපද්‍රව්‍යයක්. එහෙමත් නැත්නම්, රසායන ද්‍රව්‍යය නිස්සාරණය කිරීමේදී යොදාගත් නොදියුණු ක්‍රමය නිසා, එකතුවුණු අපද්‍රව්‍යයක්. මට අවශ්‍ය සංයෝගය සෑදීමේදී, ඒ අපද්‍රව්‍යය උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කළා. මහත්වරුනි. ඔබ දන්නවා උත්ප්‍රේරකයක් කියන්නේ, සංකීර්ණ රසායනික ක්‍රියාවලියක් සිදුකිරීමට, ඉතාම ස්වල්ප වශයෙන් යෙදිය යුතු රසායනික ද්‍රව්‍යයක්.

මෙම රසායන ද්‍රව්‍යය එංගලන්තයට ගෙන්වූ සමඟම ගිහින්, මං ඔවුන්ගේ මුළු තොගයම මිලටගත්තා. ඊළඟට එය අදාළ රටෙන් අලුත් තොගයක් ගෙන්වා දෙන මෙන් ඇණවුමක් දුන්නා. නමුත් එය එංගලන්තයට ළඟාවීමට, දීර්ඝ කාලයක් ගතවිය හැකිබවය, ඔවුන් කිව්වේ.

මගේ අත්දැකීම ගැන දීර්ඝ විස්තරයක් මං ලියූ පාපෝච්චාරණයේ අඩංගු වෙනවා. අර මේසය උඩ අටර්සන් නමට යොමුකළ ලොකු කවරයක් ඔබට පෙනෙනවා ඇති. ඒකෙ අවසන් පිටු කිහිපය තවමත් මං ලියා අවසන් කළේ නැහැ.

අහිංසක හාවුන් කුරිරු සතුන් බවට පත්කළ එම ඖෂධය මම පානය කළා. මගේ ඒ රසායනික පර්යේෂණයෙන් බිහිවුණු පුද්ගලයා, මං එඩ්වඩ් හයිඩ් ලෙස නම් කළා. ඔහු හෘදසාක්ෂිය කියන යකඩ දම්වැල් වලින් බැඳිලා හිටියෙ නෑ. අනෙක් අය වගේ නෙමෙයි; ඔහුගේ බිහිසුණු බවට, කෲරකමට, සීමාවක් තිබුණේ නෑ.





ඒ හැඟීම් මර්දනය කරන්න, විධිවිධාන හෝ ආඥා මොළයෙන් ලබාදුන්නේ නෑ. එම අවහිරතා නොමැති නිසා, සීමාවකින් තොරව, කෲරව, බිහිසුණු ලෙස කටයුතු කරන්න හයිඩ්ට හැකිවුණා. ඒ ගතිගුණ, ඒ හැඟීම් ඔහුගේ මුහුණෙන් පිළිබිඹු වුණා. ඒකයි ඔහු දුටු වහාම, මිනිසුන් භීතියෙන් වෙව්ලා ගියේ.

මගේ පර්යේෂණ මෙතැනින් නැවතුණේ නැහැ. මං ඒ බව සිහිකරන්නේ සිතේ වේදනාවෙන්. හයිඩ් චරිතයට පිවිසිලා කුරිරු කටයුතු, නොපනත්කම් නිදහසේ භුක්තිවිඳින්න, මට හැකියාව ලැබුණා. මේ අතරේදී ප්‍රශ්න වලට මුහුණපාන්නත් සිදුවුණා. හයිඩ් අතින් ගැහැනු ළමයෙකුට පෑගී තුවාල වුණු සිද්ධිය ඔබ දන්නවා. මේ ප්‍රශ්න විසඳාගන්නයි, මං සොහෝ පැත්තෙන් හයිඩ් වෙනුවෙන් නවාතැනක් කුලියට ගත්තේ. ඔහුගේ නමින් බැංකු ගිණුමක් ඇරියෙත් ඒ නිසා.

මගේ පර්යේෂණ වල අරමුණ වුණේ, මිනිසා තුළ ජීවත් වන උසස් සිත, අධම චරිතය වෙන්කරලා, එය පිටුදැකීම. නමුත් හයිඩ් චරිතයට පිවිසුණාට පස්සේ මං ඒකෙන් ලොකු ආශ්වාදයක් ලැබුවා. ඒ ජීවිතයට ඇබ්බැහි වුණා. මගේ ශරීරයෙනුත් ආත්මයෙනුත්, දෙබිඩි ජීවිතයක් ගත කරන්න මං හුරු පුරුදු වුණා. දවල් කාලයේදී හෙන්රි ජෙකිල් ධනපතියෙක් ලෙස, මිනිස් වර්ගයාගේ යහපත සඳහා මුදල් පරිත්‍යාග කරමින්, සමාජයට සේවයක් කළා. රාත්‍රී කාලයේදී එඩ්වඩ් හයිඩ් කළේ, ඒකෙ අනෙක් පැත්ත. ජෙකිල් සමාජයට උතුම් චරිතයක් වෙද්දී, හයිඩ් සමාජයට ශාපයක් වුණා.

ළඟදීම මහා අනතුරකට මුහුණදීමට සිදුවෙන බව මං තේරුම් ගත්තේ, ඊට මාස කිහිපයකට පස්සේ. මං හෙන්රි ජෙකිල් හැටියට නින්දට ගියා. නමුත් උදේ අවදිවුණේ එඩ්වඩ් හයිඩ් ලෙස. මට තේරුම් ගන්න අමාරු කුමන හෝ හේතුවක් නිසා, ශරීරය එකකින් අනෙකට හැරීම ස්වයංක්‍රීයව සිදුවුණා. මෙහෙම වෙලාවට ආපසු ජෙකිල් බවට හැරීමට, මං පානය කළ යුතු ඖෂධ ප්‍රමාණය දෙගුණයකින් වැඩි කරන්න මට සිදුවුණා.

ඒක බොහොම භයානක තත්ත්වයක් බව මට වැටහුණා. ජෙකිල්ගේ චරිතය අභිබවා, හයිඩ් තමන්ගේ බලය පතුරුවන්න පටන්ගත්තා. ඔබ දන්නවා එදිනෙදා සමාජයේ සිල්වත්, සත්පුරුෂ යහපත් අයගේ පැවැත්ම යටපත් කරමින්, බලය පතුරුවන්නෝ



www.sinhalaelibrary.com

අධම හැරවරයින්. මේක දිගින් දිගටම මේ විදියට සිදුවෙන්න ඉඩ හැරියොත් මොකද වෙන්නෙ? හයිඩ් මෙතැන ප්‍රධාන චරිතය බවට පත්වෙලා, හැමදෙයක් ගැනම තීරණ ගනීවි. ජෙකිල් අවශේෂ චරිතයක් බවට පත්වෙලා හයිඩ්ගේ රූකඩයක් වේවි; සමාජයෙන් ගරුබුහුමන් ලැබූ වයස්ගත වෛද්‍යවරයා, අකාලයේ අතුරුදන් වෙලා යන්නත් පුළුවනි. වෙන්න පුළුවන් නරකම දේ ගැන හිතලා අන්තිම කැමති පත්‍රයක් ලියන්න මං තීරණය කළා. මේක අටර්සන්ගෙ හිතේ ඇති කළේ ලොකු කැලඹීමක්. ඔහු මේක හෝම්ස් මහත්මයා ළඟට අරගෙන එන්න තීරණය කළේත් ඒ නිසයි. මං එම අන්තිම කැමති පත්‍රය ලියවා තිබූ ආකාරය, ප්‍රදුමාකාර බව ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැ නේද? එකඅතකින්. ඒකෙන් පිළිබිඹු වුණේ, මගේ ආත්මාර්ථකාමී භාවය වෙන්න පුළුවනි. මං සදහටම හයිඩ් බවට පත්වුණොත්, මට යන එන මං නැති වෙන බව මං තේරුම් ගත්තා. මගේ අන්තිම කැමැත්ත මං ඒ විදියට සැකසුවෙ, හයිඩ්ට මුදල් හදල් නොමැති වීම හෝ හිසට වහලක් නොමැති වී, අසරණවීම වළක්වන්නයි.

ඒ එක්කම මගේ හිතේ තවත් හැඟීමක් ඇතිවුණා. ඒ, මේ දෙබිඩි ජීවිතයෙන් මිදෙන්න මං උත්සාහයක් දැරිය යුතුයි කියන හැඟීම. සොබාදහමටත්, දෙවියන් වහන්සේටත් විරුද්ධ, මේ පාපිෂ්ඨ ඖෂධය බීමෙන් වැළකී ඉන්න, මං උත්සාහයක් දැරුවා. මාස දෙකක් එයින් වැළකී ඉන්න, මට හැකියාව ලැබුණා. නමුත් මගේ හිතේ ඇතිකර ගත් අධිෂ්ඨානය, සවිමත් වුණේ නෑ. එහෙම සවිමත් වුණා නම්, මට තිබුණා මගේ සටහන් විනාශ කර දමන්න. මගේ රසායන ද්‍රව්‍ය කසළ ගොඩට විසිකර දමන්න තිබුණා. එහෙම නම් මට ප්‍රීතිමත් මිනිසෙකු වෙන්න තිබුණා. මේවා අප අත නොතැබිය යුතු දෙවියන්ගේ අඩවි. නමුත් පරීක්ෂණ මගින් එම අඩවි ගවේෂණය කරන්න, මගේ හිතේ තිබුණේ දැඩි ආශාවක්. එය යටපත් කරගන්න, මට හැකිවුණේ නෑ. මගේ හිත යළි යළිත් දිවගියේ, අර හයිඩ්ගේ ජීවිතයට පිවිසෙන්න. අබිං කන මිනිහා එයට ඇබ්බැහිවුණා වගේ, මේ දෙබිඩි ජීවිතයටත් මං ඇබ්බැහි වුණා. මෙයින් සදහටම එළියට ආ හැකි මඟක් මට පෙනුණේ නෑ.

එවවිට හයිඩ් අපට නොපෙනෙන ලෝකයක ගතකළේ මාස දෙකයි. ඒ මාස දෙකට ඔහු ඉතාම දරුණු ලෙස වෙනස්වී තිබුණා. කලින් ඔහු කොතරම් දරුණු වුණත්, විනෝදය ප්‍රිය කළ, යම්තරමකින් මට පාලනය කළ හැකි පුද්ගලයෙකුව සිටියා. වැඩිදී





වැඩවල යෙදුණාම, ඒකවර්ණය පැතුවේ, මගේ ශරීරකූඩුව බවට පත්වෙමින්. නමුත් මාස දෙකකට පස්සේ ඔහු හමුවෙද්දී, මේ තත්ත්වය වෙනස් වී තිබුණා. මං මේ කියන දේ තේරුම් ගන්න, ඔබට ටිකක් අමාරු ඇති. මාස දෙකකට පසු මට දැනගන්න ලැබුණේ, මගේ අනිත් ආත්මය වන හයිඩ්, ජෙකිල්ට ද්වේෂ කරන, ඊර්ෂ්‍යාකරන, තුච්ඡ පුද්ගලයෙකු බවයි. ඔහුට උවමනා වෙලා තිබුණේ, මගේ මේ ආත්මයෙන් පළිගන්න. මට ශාරීරිකව වධ හිංසාවක් කළොත්, ඒක ඔහුගේ ශරීර කූඩුවටත් බලපානවා. ඒ නිසා ඒක කළේ නැහැ. තිරිසනා මගේ අන්තයට යෑම මගින්, මගේ ආත්මයට හිරිහැර කොට, එයින් පළිගත හැකි බව හයිඩ් දැනහිටියා. දරුණු අපරාධයක් කොට, මාව ඒකට පැටලෙව්වොත්, මට සමාජයට මුහුණදෙන්න බැරිවෙන බව ඔහු වටහාගත්තා. ඒ නිසා මගෙන් පළිගන්න හොඳම ක්‍රමය එය බව හයිඩ් තේරුම් ගන්න ඇති. මේ කාරණා මට පැහැදිලි වුණේ කොහොමද? ජෙකිල් හා හයිඩ් කියන්නේ පුද්ගලයන් දෙදෙනෙකු වුණත්, දෙන්නටම තිබුණේ එකම මනසයක්.

සර් ඩැන්වර්ස් කැරූ සිද්ධිය ගැන තොරතුරු, මුල ඉඳන් ඔබට කීමට අවශ්‍ය නැහැ. නමුත් මං මේ ටිකත් කිව යුතුයි. සර් ඩැන්වර්ස්, හයිඩ්ව අඳුනන්නෙ නෑ. සර් ඩැන්වර්ස් තමන්ගේ නිස්වැස්ම ඉවත් කරලා ඇතුවෙ, එක්තරා අවන්හලක් වෙත යන ගමන් මඟ. හයිඩ් මේක ප්‍රයෝජනයට අරගෙන, සර් ඩැන්වර්ස්ට දරුණු ප්‍රහාරයක් එල්ලකරලා. ඔහුව මරාදැම්මා. තමන් අස්වාභාවිකව උපත ලද, අස්වාභාවික මිනිසෙකු බව හයිඩ් දැනහිටියා. ඒ නිසා ස්වාභාවිකව උපන් මිනිසුන් ගැන, ඔහුගේ තිබුණේ දරුණු වෛරයක්. උමතු පුද්ගලයෙකු ඉදිරියේ සර් ඩැන්වර්ස් කෙසේ නම් ජීවිතය ගළවාගන්නද?

මේ අපරාධය කළාට පස්සේ. ඒ ගැන, හයිඩ්ගේ හිතේ ඇතිවුණේ මොන වගේ හැඟීමද කියලා ඔබ අහවි. ඔහුට උවමනා වුණේ, කෙසේ හෝ එතැනින් පැනයන්න. ඒ කිට්ටුවක වෙන කවුරුවත් නොසිටි බව ඔහු දුටුවා. වහාම සොහෝ වෙත පැනගිය හයිඩ්, තමන් ජෙකිල් හා සම්බන්ධ කරන, ලියවිලි පුළුස්සා දමලා මෙහේට පැන ආවා. මගේ ආත්මය විනාශවෙන ආකාරයට, මගෙන් පළිගැනීම, ඔහු සම්පූර්ණ කළා. යළිත් ජෙකිල් බවට පත්වුණාම මං තීරණයක් ගත්තා. එවවිට හයිඩ්ගෙන් සදහටම සමුගන්න, මම දැඩි අධිෂ්ඨානයකට ආවා.



www.sinhalaelibrary.com

හයිඩ්ට මගේ රසායනාගාරයට ඇතුළුවීමට, මං ලබාදුන් යතුරක් තිබුණා. මං ඒක පාගා විනාශකර දැම්මෙමි. ඔහුගෙන් මිදීමේ අරමුණෙන්. ඊට පස්සේ මං හයිඩ්ගේ අත්සන යොදලා, අටර්සන්ට ලියුමක් යැව්වා. ඒ මා සහ හයිඩ් අතර මින් ඉදිරියට සබඳතාවක් නැතිබව සඳහන් කරමින්. ඊට පස්සේ පර්යේෂණ නවත්වා දැම්මා. මං යළිත් වරක් වෛද්‍යවරයෙකු ලෙස රෝගීන්ට ප්‍රතිකාර කරන්න පටන්ගත්තා. හැකිතරම් අනුන්ට පිහිටවෙමින්, මගේ තැන්පත් මුදල්, අනාථ ළමා නිවාස හා වැඩිහිටි නිවාස වලට පරිත්‍යාග කළා. ලන්ඩනයේ සුප්‍රසිද්ධ රෝහල් කිහිපයක ගොඩනැගිලි අලුත්වැඩියා කරන්න, මං පවුම් දහස් ගණනින් පරිත්‍යාග කළේ නිර්නාමිකව. මෙතෙක් කල් මගේ ආශ්‍රයෙන් මගහැර සිටි මිතුරන්, යළිත් සුහදව ආශ්‍රය කිරීමට පටන්ගත්තා. ඒ හැමදේකටම වඩා, අවුරුදු දහයකට කලින් මා සමග අමනාප වූ, දොස්තර හේස්ටි ලැනියන් සමග මිත්‍රත්වය, යළි ගොඩනගා ගත්තා. අවදියෙන් සිටි සෑම මොහොතක්ම මං කැපකළේ, මට සමීප ජනයාගේ යහපත වෙනුවෙන්. එඩ්වඩ් හයිඩ් නිසා විනාශවී ගිය මනුෂ්‍ය ගුණධර්ම, යළිත් සකසාගන්න මට හැකිවුණා. මාස තුනක කාලයක් මං ගතකළේ තාප්තිමත් ජීවිතයක්.

නමුත් අවාසනාවක මහත! එක දවසක් මං රිජන්ට් උද්‍යානයේ ඇවිදින්න ගියා. විවේකව ඇවිදිමින් ඉන්න වෙලාවෙ, මගේ හිතේ අයහපත් සිතිවිල්ලක් ඇතිවුණා. ඒ විගාම මට මගේ ශරීරයේ වෙනසක් දැනුණා. එයට ගතවුණේ ඉතාම කෙටි කාලයකි. සුප්‍රකට වෛද්‍යවරයා, කාගේත් බුහුමනට ලක්වූ දානපතියා, දොස්තර ජෙකිල් අතුරුදන්වී ගියා. එතැනින් මතුවුණේ - මිනීමරුවා එඩ්වඩ් හයිඩ්!

මගේ සිතේ ඇතිවූ භීතිය හා කම්පනය මට වචනයෙන් විස්තර කරන්න බැහැ. මං හිතුවේ නැහැ, ජීවිතේ කවදාවත්, ඖෂධ ගැනීමකින් තොරව, දොස්තර ජෙකිල්, එඩ්වඩ් හයිඩ් බවට පෙරළේවි කියලා. නමුත් ඒ විශ්වාසය එක මොහොතකින් විනාශ වී ගියා. මගේ මොළයේ ඇතිවුණේ වියරු සිතිවිලි. දැන් මං මොකක්ද කළ යුත්තේ? ලන්ඩන් නගරයේ හැමතැනකම පොලිස්භටයන් ඉන්නවා. හයිඩ්ගේ හැඩරුව ගැන විස්තර හැම පොලිස්භටයෙකු ළඟම ඇතිබව මට විශ්වාසයි. මං කොහොමද ඔවුන්ගෙන් ගැළවිලා, මගේ ගෙදරට යන්නේ?





මං කොහොමද ආපහු ජෙකිල් බවට හැරෙන්න නියමිත ඖෂධය පානය කරන්නේ? ඊකට විසඳුම එක් සැණෙකින් මගේ මොළයට ආවා. හේස්ටි ලැනියන්! පරණ තරහ මරහ අමතක කරලා, අපි දෙන්නා සමාදාන වුණේ. කලින්දා ඒ හැම වෙලාවෙදී, විද්‍යාඥයකු ලෙස මං උමතු පර්යේෂණවල යෙදෙද්දී, ඔහු මාව ප්‍රතික්ෂේප කළ බව ඇත්තයි. ඒත් මේ වෙලාවෙ ඔහු මට පිහිට නොවී ඉන්න එකක් නෑ. මං ලියුවා ඔහුට ලියුමක්.

මගේ හිතවත් ලැනියන්,

මේ ලිපිය ලියන්නේ ඔබේ හිත මිත්‍ර හෙන්රි ජෙකිල්. අප දෙදෙනාගේ මිත්‍රත්වය ඉතාම පරණයි. සමහර අවස්ථාවල අප දෙදෙනා අතර ප්‍රශ්න ඇතිවුණා. ඒ විද්‍යාත්මක කරුණු ගැන. ඒ හැර මගේ අතින් ඔබට පෞද්ගලිකව වැරැද්දක් සිදුවුණු බවක් නම්, මට මතක නැහැ.

දීර්ඝ කාලයක් තිස්සේ තිබූ අමනාපකම් අමතක කර දමා, අපි එකේ සමගිවුණා. ඒක මොන තරම් වාසනාවක්ද? මා මේ කෙටි ලියුම ඔබ වෙත එවන්නේ, විශාල උපකාරයක් බලාපොරොත්තුවෙන්. එය කිසිසේත් ප්‍රතික්ෂේප නොකරන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි.

මගේ ජීවිතය, මගේ සිහිකල්පනාව සහ සමාජයේ මට යම් ගෞරවයක් හිමිවී ඇත්නම් එය, දැන් සම්පූර්ණයෙන්ම රැඳී තිබෙන්නේ ඔබේ අතේ. මා ඔබෙන් කරන ඉල්ලීම මෙයයි.

අද රෑට කළයුතු මොනවාහරි වැඩක් ඔබ යොදාගෙන ඇත්නම්, ඒ හැම දෙයක්ම, මා වෙනුවෙන් කල්දමන්න.

අසනීප වූ රජතුමෙක්, ප්‍රතිකාර ලබාගැනීම සඳහා ඔහුගේ ඇඳ ළඟට එන මෙන් දන්වා තිබුණත්, එයත් කල්දමන්න. ඔබේ ගේ දොරකඩ අසල, ඔබේ රිය නැත්නම්, කුලීරියක නැගී යන්න. උපදෙස් සඳහා මේ ලියුමත් රැගෙන, කෙළින්ම මගේ නිවස වෙත යන්න.

මගේ ගෘහසේවක පූල්ට, මං උපදෙස් දීලයි තියෙන්නේ. ඔබ එතැනට ළඟාවෙද්දී, යතුරු අගුලු කාර්මිකයෙක් සමග පූල් එතැන බලා ඉඳීවි. මගේ රසායනාගාරයට ඇතුළුවෙන දොරේ, අගුළු කඩා විවෘත කර ගැනීමයි, මීළඟ පියවර. නමුත් එය ඇතුළට ඔබ යා යුත්තේ තනිවම. ඇතුළු වුණාම වම් පැත්තේ ඇති වීදුරු කබඩ් හා



www.sinhalaelibrary.com

ලාච්චු පේළියක්. ඒ දෙසට ඔබේ නෙත් යොමු කරන්න. එහි 'E' අකුර ඇඳ තිබෙන ලාච්චුව ඔබට දකින්න ලැබේවි. මෙත උඩ සිට පහළට ගණන් කළොම හතරවැනි එක. පහත සිට ඉහළට බැලුවොත් තුන්වැනි එක. එහි අගුල හඩා හෝ මෙම ලාච්චුව විවෘත කරන්න.

මේ ලාච්චුවේ තිබෙන්නේ, කුඩු වශයෙන් තිබෙන රසායනික ද්‍රව්‍ය අඩංගු, කුඩා බෝතල් රාශියක් පමණක් බව ඔබට පෙනේවි. ලාච්චුව එහි අඩංගු දේ සමග එහෙම පිටින්ම කැවෙන්ඩිෂ් චතුරශ්‍රයේ ඔබේ නිවසට අරගෙන එන්න. මධ්‍යම රාත්‍රියට පෙර නිවසට ළඟාවෙන්න ඔබට හැකිවේවි. ඒ තමයි ඔබේ රාජකාරියේ පළමුවැනි කොටස. දැන් දෙවැනි කොටස.

දෙවැනි කොටසේ වැඩ සඳහා, ඔබේ සේවකයන් හැමදෙනෙකුම නින්දට ගොස් සිටීම වඩා යහපත්. ඉතින් මා ඔබෙන් ඉල්ලා සිටින්නේ, මැදියම් රැයේ, රෝගීන් පරීක්ෂා කරන කාමරයේ, ඔබ තනියම රැඳී ඉන්නා ලෙස. නාඳුනන මිනිහෙක් ඒවි ඔබේ නිවසට, මගේ නම සඳහන් කරමින් එන ඔහු, ඔබේ චිකිත්සාගාරය තුළට කැඳවාගෙන යන්න. ඔබ ගෙන ආ රසායන ද්‍රව්‍ය අඩංගු ලාච්චුව ඔහුට භාරදෙන්න. එතකොට ඔබ විසින් කළ යුතු වැඩ කොටස අවසන්. මගේ සම්පූර්ණ කෘතඥතාවය ඔබට හිමි වෙනවා. මෙහෙම කිරීමට හේතු පැහැදිලි කිරීමක් ඔබට අවශ්‍ය ඇති. මිනිත්තු පහක් ගතවෙද්දී, ඒ හැමදෙයක්ම ඔබට දකින්න සහ අහන්න ලැබේවි.

හිතවත් ලැනියන්. මේ මා ඔබෙන් උදව්වක් ඉල්ලන මුල්ම හා අවසාන අවස්ථාවයි. මගේ වෘත්තීය සගයෙකු වශයෙන් පමණක් නොව, අවංක ක්‍රිස්තියානු භක්තිකයෙකු ලෙස, මගේ ඉල්ලීම නොවරදවා ඉටු කරන්න. ඔබට මෙය කිරීමට නොහැකි වුවහොත්, දොස්තර ජෙකිල්ගේ මළසිරුර තේම්ස් ගඟේ පාවෙද්දී, පොලීසියට හමුවූ බව, ඔබට පුවත්පත් මගින් කියවන්නට ලැබේවි.

කරුණාකර මෙය රහසක් ලෙස තබාගන්න. දෙවියන් වහන්සේගේ නාමයෙන්, මා වෙනුවෙන් මේ ඉල්ලීම ඉටුකරන්න.

මේ ඔබේ
අවංක මිත්‍ර
හෙන්රි ජෙකිල්





පසුව ලියමි.

මේ ලියුම තැපැල් කාර්යාලයේ දී පමාවුණොත් ඇතිවන්නේ මහ අවුලකි. ඒ ගැන දැන් මගේ සිතට භයක් ඇතිවෙනවා. ඒ නිසාමයි මෙය ඔබට අද හවස නොලැබී, හෙට උදේ ලැබුණොත්? එහෙනම් ඔබට පහසු විදියට, හෙට දවල් කාලයේදී මේ කටයුත්ත කරන්න. අර මා කී මගේ නියෝජිතයා, හෙට මැදියම් රැයේ ඔබ හමුවට ඒවි. සමහරවිට එතකොට ප්‍රමාද වැඩිවෙන්නත් පුළුවනි. රෑට කවුරු හරි නොආවොත්, හෙන්රි ජෙකිල් ආයින් දකින්න නො ලැබෙන බව ඔබට හිතාගත හැකිවේවි.

එච්. ජේ.

හයිඩ් (මම) මේ ලිපිය ලියාපදිංචි තැපෑලෙන් ලැනියන් වෙත යැව්වා. තවත් ලිපියක් ලියුවා පූල්ට. ඒ දොස්තර ලැනියන් පැමිනි වහාම, ඔහුට සම්පූර්ණ සහයෝගය දෙන ලෙස. රසායනාගාරයේ E ලාච්චුව එහි අඩංගු බෙහෙත් සමග ලැනියන්ට භාරදෙන මෙන්, මේ එවින් උපදෙස් දුන්නා.

නියමිත රාත්‍රියේ මං ලැනියන් ගේ නිවසට ගියා. ඔහුගේ නිවසට ඇතුළුවී, මා කලින් ලියාගෙන ගිය ලිපිය ඔහුට දිගුකළා. එහි සඳහන්ව තිබුණේ මෙයයි.

"මා හිතවත් ලැනියන්.

මේ ලිපිය රැගෙන එන්නේ, කලින් මා එවූ ලිපියේ සඳහන් කළ නියෝජිතයාය. මගේ බෙහෙත් ලාච්චුව ඔහුට භාරදෙන්න. ඖෂධ සංයෝජනය සඳහා, ඔහුට ඔබේ රසායනාගාරය පාවිච්චි කිරීමට අවශ්‍යයි. කරුණාකර ඒ සඳහා ඔහුට ඉඩදෙන්න. එයට වැඩිකාලයක් ගත නොවනු ඇත. ඔබට දෙවියන්ගේ ආශිර්වාදය ලැබේවා"

ලියුම් කැබැල්ල කියවා හයිඩ් වෙත තියුණු බැල්මක් හෙළූ ලැනියන්, අමුත්තාව රසායනාගාරය වෙත කැඳවාගෙන ගියා. ඒ වෙලාවේ ගෙදර වෙන කිසිවෙකු පෙනෙන්න සිටියේ නෑ. ඖෂධය නිතර නිතර සාදාගෙන ඒ ගැන තිබූ පුරුද්ද නිසා, ඒ කටයුත්තට එච්චර වෙලා ගතවුණේ නැහැ. මද කාලයක් ගතවුණේ ලැනියන්ගේ බන්සන් දාහකයෙන්, අවශ්‍ය රසායන ද්‍රව්‍ය උණුකර ගැනීමට පමණයි. රසායනාගාරයේ මේසය ළඟ උස පුටුවක්



www.sinhalaelibrary.com

තිබුණා. ඒකෙ නිදහන් ලැනියන් මේ කටයුතු බලාගෙන හිටියේ පුදුමයෙන්; ඒ වගේම දැඩි අවධානයකින්.

ඖෂධය හදාගත් වහාම, හයිඩ් එය පානය කරන හැටි ලැනියන් බලාගෙන හිටියා. හයිඩ් ගේ සිරුර මේ විෂ ඖෂධය නිසා වෙනස් වී ඔහු ජෙකිල් බවට පත්වෙන හැටි ලැනියන් බලාගෙන හිටියේ භීතියෙන් දෑස් ලොකුකරගෙන. එයින් ඇතිවුණු කම්පනයෙන්, ලැනියන් ඒ මොහොතේම මියයාවි කියලයි මට හිතුණේ. ඔහු ඒ තරම් භීතියට පත්වුණා. අන්තිමේදී ඔහු සිහි විසඥවුණා........"

"දොස්තර මහත්මයා" හෝම්ස් කීය. "මං හිතන්නේ ඔබ කියූ හරිය අපට ප්‍රමාණවත්. හයිඩ්, දොස්තර ජෙකිල් බවට හැරුණු හැටි දැකීමෙන් ලැනියන්ගේ ඇතිවුණු කම්පනය, ඔහුගේ හදවතට තදින්ම බලපෑ බව රහසක් නෙමෙයි"

"මගේ මේ පර්යේෂණ බහුබූත, විකාර කියමින් බැහැර කළ ලැනියන්ට, ඒ රහස හෙළිකරන්න, ප්‍රතිඵල පෙන්වන්න මගේ කැමැත්තක් තිබුණේ නැහැ." ජෙකිල් කීය. "නමුත් තමන්ගේ ජයග්‍රහණය ලැනියන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න, හයිඩ්ට තිබුණේ දැඩි නොඉවසිල්ලක්. මං හිතන්නේ ලැනියන්ගේ අකල් මරණයත්, මගේ හිසමතට එන තවත් මිනීමැරුමක්"

"ජෙකිල් මහත්මයා. ඔබ අනික් අයට මුහුණ නොදී තනියම ජීවත්වෙන්න පටන්ගත්තෙ ඒ නිසාද?" හෝම්ස් ඇසීය. "මං අදහස් කරන්නේ මෙයයි. ඔබ එක් ආත්මයකින් තවත් ආත්මයකට මාරුවීම, කොයිමොහොතේ සිදුවේවිද කියලා ඔබ දැන නොසිටි නිසාද?"

"භයානක මෙන්ම පිළිකුල් සහගත සත්‍යය එයයි, හෝම්ස් මහත්මයා" ජෙකිල් කීය. "මං ඔබට කලින් කිව්වා වගේ, අර ඖෂධය නිවැරදි ලෙස නිෂ්පාදනය වෙන්න, උත්ප්‍රේරක ශක්තිය ලබාදුන්නේ අපද්‍රව්‍ය ස්වල්පයක් මගින්. එය යම්කිසි මූල ද්‍රව්‍යයක නයෝසල්ෆේට්යක් ලෙසයි මං හඳුනාගත්තේ. නමුත් ඒ මූල ද්‍රව්‍යය ගැලියම්ද කැඩ්මියම්ද ස්කැන්ඩියම්ද මොකක්ද? මට ඒක හඳුනාගැනීමට හැකිවුණේ නෑ. නමුත් ඒ තුනෙන් එකක් බව මට විශ්වාසයි. ඔබ දක්ෂ රසායන විද්‍යාඥයෙක් බව මං අහල තියෙනවා හෝම්ස් මහත්මයා. ඒ නිසා ඔබට තේරෙනවා ඇති, බඩිප් ලවණ වල තියෙන රසායනික අපද්‍රව්‍ය හරිහැටි හඳුනානොගත්තොත්, අපි





ලොකු අමාරුවල වැටෙන බව. එංගලන්තය පුරා ප්‍රධාන නගර වල රසායන ද්‍රව්‍ය වෙළඳුන්ගෙන් මං හොයා බැලුවා; පැරිස් හා බර්ලින් නගරවලටත් ගිහිං හොයා බැලුවා. නමුත් මට උවමනා කරන දේ ලැබුණේ නෑ. ඒ නිසාම මගේ බෙහෙතේ ඉතිරිව ඇති ප්‍රමාණය, ඉතාම අඩු මාත්‍රාවකින් පාවිච්චිකරන්න මට සිදුවුණා. ඒ නිසාමයි මගේ සිරුරේ මේ වෙනස්වීම, නොසිතූ අකාරයට නොසිතූ මොහොතක සිදුවුණේ.

ඔබ දෙදෙනා මගේ නිවසෙන් එළවාදමන්න, මට වෙලාවක් තිබුණේ නෑ. ඊට කලින් ශරීරය වෙනස්වීම පටන්ගත්තා. ජෙකිල් නම් ස්වාමියා පරාජය කරගෙන, බලයත් හිමිකරගන්න, හයිඩ්ට දැන් හැකිවී තියෙනවා, ඒ ඔහු කරන අපරාධ මගින්. ඒ නිසාම අප දෙදෙනාගේ ඉරණමත් තීරණයවී අවසන්. දැන් මට පෙනෙන හැටියට, මේ කාරණා රහසිගතව තියාගන්න, මං උත්සාහ දැරුවත්, මගේ සේවකයනුත් ඒවා දැනගෙන ඉවරයි. ඔවුන් කැලඹීමට පත්වී ඉන්නා ආකාරයෙන්, ඒක මට තේරුම් ගන්න පුළුවනි.

"ඔබ කිව්වා අර පුදුමාකාර වර්ගයේ රසායනික අපද්‍රව්‍යයක් තිබෙන බව" මම කීවෙමි. "ඒක හඳුනාගන්න ඔබ රසායන විද්‍යාඥයකුගේ පිහිට පැතුවෙ නැද්ද?"

"ඇයි නැත්තේ වොට්සන්?" ජෙකිල් කීය.

"කැම්බ්‍රිජ් සරසවියේ රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය ශ්‍රීමත් ග්‍රෙගරි හෝල්ට්වර්නස්ගෙන් මං විමසුවා. ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ ඖෂධවේදය පිළිබඳ මහාචාර්ය ලෝරන්ස් මැකන්සි සමගත් සාකච්ඡා කළා. ඊට අමතරව මියුනිච් හා වියානා නගරවල මෙම ක්ෂේත්‍රවල අධිපතීන් සමගත් කතාබහ කළා. ඔවුන් හැම දෙනෙකුගේම මතය වුණේ එය හඳුනාගැනීම ඉතාම දුෂ්කර කටයුත්තක් විය හැකි බව. විශ්වයේ තිබිය හැකි රසායනික මූලද්‍රව්‍ය ප්‍රමාණය ඉතා විශාල බවත්, එයින් අප හඳුනාගෙන තියෙන්නේ ස්වල්පයක් බවත් ඔවුන් කීවා. අනෙක මෙම අපද්‍රව්‍යය සහිත ලවණ ඉල්ලම පිහිටි රටට ගිහිං, ඒ නිධිය නිස්සාරණය කරන පිළිවෙළ නිරීක්ෂණය කරලා, දිගින් දිගටම පර්යේෂණ කළ යුතු බව ඔවුන් කිව්වා"

"ඒ වුණත්" හෝම්ස් කීය. "කවුද දන්නෙ. සමහර විට ඒ අපද්‍රව්‍යය හඳුනාගැනීම, මනුෂ්‍ය සංහතියේ යහපතට යොදාගැනීමටත් හැකිවේවි. ඔබ ළඟ ඔය ලවණයේ ඉතාම



www.sinhalaelibrary.com

ස්වල්පයක්වත් ඉතිරිවෙලා නැද්ද, ඉදිරියේදී පරීක්ෂණ සඳහා යොදාගන්න?"

"ඉතිරි වෙලා තිබුණේ ඉතාම ස්වල්පයයි" ජේකිල් කීය. "දැන් මං මොහොතකට පෙර පානය කළේ, එය යොදාගෙන සාදාගත් මගේ ඖෂධය - නැත්නම් හලාහල විෂ. අන්න ඒ නිසයි මං ඔබට කිව්වේ, දොස්තර ජේකිල්ගේ කාලය අවසන් වීගෙන යන බව. එඩ්වඩ් හයිඩ්ගේ කුරිරු අවඥා සහගත සිනාහඬ, මේ මොහොතේත් මගේ මොළය තුළ රැව්පිළිරැව් දෙනවා වගේ ඇහෙනවා. ඔහු ජයගත්තොත්? ඒ කියන්නේ, එය අප දෙදෙනාගේම අවසානයයි"

ඔහු එසේ කියද්දීම, ජේකිල්ගේ මුහුණේ පැහැය වෙනස්වී, එය භයානක ලෙස සුදුමැලි වෙන ආකාරයක් දුටුවෙමි. මම අසුනෙන් නැගිට්ටෙමි. මට උවමනා වූයේ එඩ්වඩ් හයිඩ් මතුවීමට පෙර, වහාම එතැනින් පිටවී යාමට යි.

ගිනිළඟින අසල සිටගෙන සිටි හෝම්ස් නොසෙල්වී සිටියේය. ඔහු දෙනෙත් දල්වාගෙන, ජේකිල් දෙස බලාසිටියේ වෛද්‍යවරයෙකු තම රෝගියා දෙස බලා සිටින විමසිලිමත් ආකාරයටය. තවදුරටත් එහි රැඳී සිටිනු මිස, එතැනින් පිටවී යාමට මගේ මිත්‍රයාගේ සූදානමක් නොවීය.

"මට තවමත් නොපැහැදිලි එක තැනක් තියෙනවා ජේකිල් මහත්මයා" හෝම්ස් කීය. "මාස දෙකකට කලින් ලැනියන්ගේ නිවස අසල, මහදවාලේ හයිඩ්ව දකින්න ලැබී තිබුණා. මං දන්නවා නිවසෙන් පිටවෙන්න ඇත්තේ ජේකිල් බව. නමුත් ඔබ ඒ විදියේ අවදානම් කටයුත්තක යෙදුණේ ඇයි?"

"වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ හෝම්ස් මහත්මයා" ජේකිල් කීය. "ලැනියන් රසායන විද්‍යාවේ අති දක්ෂයෙක්. මට තිබුණා ඔහුගේ සහයෝගයෙන්, මේ දුර්ලභ රසායන ද්‍රව්‍යය වෙනුවට, උත්ප්‍රේරකයක් ලෙස, වෙනත් යමක් යොදාගැනීමට හැකිවේවිද කියලා සොයා බලන්න. මොකද සමහර රසායනික ප්‍රතික්‍රියා වලට උත්ප්‍රේරකයක් ලෙස, මොලිබ්ඩිනම් යොදාගැනීම හොයාගත්තේ ලැනියන්. නමුත් ඔහුගේ නිවසට මං ළඟාවෙද්දී, මාව හයිඩ් බවට පත්වෙලා ඉවරයි. අපරාධකාරයා නමින් ඔහුගේ දොරකඩ සිටින බැව් දුටුවාම, ලැනියන් පොලීසිය කැඳවන්න ඉඩතිබුණා. ආපහු හැරී ඒම හැර හයිඩ්ට වෙනත් විකල්පයක් තිබුණේ නෑ.





තවත් මගෙන් ඇසිය යුතු ප්‍රශ්නයක් තියෙනවා හෝම්ස් මහත්මයා. මගේ ඉරණම තීන්දුවෙන අද දවසේම, මෙහෙට එන්න ඔබ තීරණය කළේ ඇයි? මං ජීවිත කාලයක් පර්යේෂණ කරලා සොයාගත් දේ, ඉතා කෙටි කාලයකින් හෙළිකරගන්න ඔබ සමත්වුණාද? කොහොමද ඔබ ඒ හපන්කම කළේ?"

"මං පළමුවෙන්ම මේ ටික කිවයුතුයි" හෝම්ස් කීය. "ඔබ ජීවිත කාලයක් පර්යේෂණ කරලා සොයාගත්, රසායනික ක්‍රියාවලිය හෝ එහි රහස් හැම එකක්ම, ස්වාධීනව හොයාගන්න මට හැකිවුණේ නැහැ. මං සොයාගත්තේ මෙතැන තිබුණු අබිරහස මොකක්ද කියන එක පමණයි. පසුගිය කාලයේ මට දකින්නට හා අහන්නට ලැබුණු දත්ත එකින් එක ගෙන, මං ඒවා විශ්ලේෂණය කළා. එහෙම කරද්දී සම්භාව්‍ය උපකල්පනයක් ගොඩනංවන්න මට හැකිවුණා. එය තහවුරු කරගන්න මට පුළුවන් වුණේ, රසායන විද්‍යාව, ජීව රසායනය, ඖෂධවේදය, ඇල්කෙමි නමින් හැඳින්වුණු පුරාණ රසායනවේදය පිළිබඳ ග්‍රන්ථ රාශියක් අධ්‍යයනය කිරීම මගින්.

ඒ කරුණු එකින් එක සැකසීමට මං පියවර ගත්තා. අන්තිමේදී මට ලැබුණා ප්‍රතිඵලයක්. ඒක මට විශ්වාස කිරීමට පවා අපහසු වුණු දෙයක්. ඔබට හා ලැනියන්ට හැර වෙනත් කෙනෙකුට මං ඒ දේ කිව්වා නම්, ඔවුන් කියාවී මට පිස්සු කියල. ඖෂධයක් මගින් එක මිනිහෙක්, ඊට සම්පූර්ණයෙන්ම වෙනස් කෙනෙකු බවට හරවන්නේ කොහොමද? එහෙම දෙයක් මේ ලෝකෙ කවදාවත් වෙලා නෑ; ඉතින් කොහොමද අපි විශ්වාස කරන්නේ? නමුත් සියලුම නිරීක්ෂණ මගින් මා යොමුකරන්නේ ඒ නිගමනයට නම්, එය නිවැරදි විය යුතුයි. අද රාත්‍රියේ වයලීනය වාදනය කරමින් සිටියදී මට ඒ සත්‍යය අවබෝධ වුණා"

කාමරයේ පැවැතියේ අඩි නිශ්ශබ්දතාවයකි. ඔරලෝසුවක තත්පරයෙන් තත්පරය ගෙවී යන හඬ පමණක් ඇසිණ. මේ හෙන්රි ජේකිල්ගේ ජීවිතයේ අවසාන තත්පර කිහිපයද? ඔහුගේ ජීවිතයේ අවසානය අපට දනුම්දෙන සංඥාවද?

"මොකක්ද ඔබේ මීළඟ පියවර?" හෝම්ස් විමසුවේය.

"හෝම්ස් මහත්මයා, ඔබ දන්නවා කුරාටි ගැන" ජේකිල් කීය. "එයින් ස්වල්පයක් මගේ මේසය උඩ තියෙනවා. ඒක පාවිච්චි කිරීමට ජේකිල්ගේ හිතේ ධෛර්යයක් නැහැ. අනික් අතට



www.sinhalaelibrary.com

ඒක පාවිච්චි කරන්න හයිඩ්ගේ හිතේ, කැමැත්තක් හෝ බලාපොරොත්තුවක් නැහැ. නමුත් මං විශ්වාසකරනවා, එල්ලුම්ගහේ තොණ්ඩුව වෙනුවට හයිඩ්, කුරාරි තෝරා ගනිවි කියලා. ඒ මොකද පොලීසියට අහුවුණාට පස්සේ, ඔහුට යාමට ඉතිරිවෙන්නේ එක ගමන් මගක පමණයි. ඒ පෝරකයට යන ගමන් මග. ඔහුට පැහැදවන්න කිසිම පාරක් ඉතිරිවෙලා නෑ."

මගේ මිත්‍රයා හිස සෙලෙව්වේ, තමා ඒ මතයට එකඟ නොවන බව හඟවමිනි.

"එච්චර හයිඩ්ද? ඔහු කවදාවත් තමන්ගේ ජීවිතය නැතිකරගන්නේ නෑ" හෝම්ස් කීය. "හයිඩ් වැනි අධමයන්ට ආත්ම ගරුත්වයක් හෝ හෘදසාක්ෂියක් කියා දෙයක් නැහැ. එවැනි අයගේ එකම ආශාව කෲරකම් වල යෙදෙමින්, මනුෂ්‍ය ඝාතනයේ යෙදීමටයි. කොයිතරම් මිනිස් ජීවිත විනාශකළත් ඔවුන් සෑහීමට පත්වන්නේ නෑ. ටික කලක් ගතවෙද්දී ඔවුන් බෝම්බ වැනි පුපුරන ද්‍රව්‍ය හෝ විෂ යොදා ගනිමින් සමූල ඝාතන පටන්ගන්නවා. මෙවැනි අපරාධකාරයන්, කාලයෙන් කාලයට ලෝකයට බිහිවුණු බව, මානව ඉතිහාසයෙන් අපට අහන්න ලැබෙනවා. මේ වගේ පුද්ගලයන් හඳුනාගත් වහාම, ඔවුන් මරණීය දණ්ඩනයට යොමුකිරීම ශිෂ්ට සමාජයේ වගකීමක්. කාගේ හෝ ප්‍රමාදයක් නිසා, දුරදක්නා ඥානය නොමැතිකම නිසා, මේ අපරාධකාරයන් බේරෙන්න පුළුවනි. එහෙම වුණොත් මිනිස් ජීවිත දස දහස් ගණනක් ලක්ෂ ගණනක් විනාශ කරන තුරු........"

හෝම්ස් කියමින් සිටි දෙය අවසන් කිරීමට ඉඩ නොලැබිණ. ජෙකිල්ගේ සිරුරේ ඉක්මන් වෙනස්වීමක් අපි දුටුවෙමු. ඔහුගේ මුහුණේ වර්ණය වෙනස් විය. සිරුර හැකිළීමට පටන්ගත්තේය. ශාන්තදාන්ත මුහුණ වෙනුවට යළිත් වරක් අපට දකින්නට ලැබුණේ වියරු මිනිසෙකුගේ කුරිරු මුහුණකි. මඳ වේලාවකදී මුළු රූපයම වෙනස්වී එඩ්වඩ් හයිඩ් මතුවිය.

"හා හා හා හා!" එඩ්වඩ් හයිඩ් මහ හඬින් නැගුවේ අවඥා සහගත සිනාවකි. තමා අහුවන්නට බලාපොරොත්තු වූ සතුරන් අන්තිමේදී මුණගැසුණු බැව් ඔහු කීවේය.

වහාම ගිනි උදුන වෙත ගිය හයිඩ්, එහි ගිනි අඟුරු එහා මෙහා කිරීමට තිබූ යෝධ යකඩඅඬුව අතට ගත්තේය. ඔහුගේ මුහුණට නැගුණු භයානක පෙනුම දුටු අපි තැතිගත්තෙමු.





"අන්තිමේදී උඹල මට කොටුවුණා එහෙනම්? අනුන්ගේ වැඩවලට ඇඟිලි ගහන ෂර්ලොක් හෝම්ස්. දැන් ඉතින් උඹේ දෙවියන් සිහිකර ගනිං!" මෙසේ කියා යළිත් වරක් අවඥාවෙන් සිනාසුණු හයිඩ් පියවරක් ඉදිරියට තැබුවේය. එලෙසට එක් ක්ෂණයකින් ඔහු යකඩ අඬුව අත බඳා ඉහළට එසෙව්වේ, හෝම්ස්ගේ හිසට පහරක් එල්ල කිරීමට සූදානමෙනි.

හෝම්ස් එක් නිමේෂයකින් අඩි දෙකක් පිටිපසට පනිද්දී, යකඩ අඬුව වේගයෙන් පහතට ආවේය. එය හිසේ වැදුණානම් හෝම්ස් එතැනම මරුමුවට පත්වන්නට ඉඩ තිබිණි.

පිටුපසට දිවගිය අප නැවතුණේ වසා තිබූ දොරේ අවහිරය නිසාය. එය ක්ෂණිකව විවෘත කළ නොහැකි ලෙස වසා තිබූ බැව් අපට දකින්නට ලැබිණ.

"හා හා හා! උඹල හිතන්නෙ පැනල යන්නද? තොපේ හපන්කම් අදින් ඉවරයි!" කියා ගර්ජනා කළ හයිඩ්, බිම තිබූ ඇසිඩ් සහිත විශාල බෝතලයක් අතට ගත්තේය. මේ කෲර යක්ෂයාට, අප මරා දැමීමට උවමනා වන්නේ මිනිත්තුවකටත් අඩු කාලයක් බැව් අපට වැටහිණි. එක් නිමේෂයකදී හෝම්ස් කබාසාක්කුවෙන් රිවෝල්වරය එළියට ගෙන හයිඩ් දෙසට එල්ල කළේය.

"හයිඩ්! තව අඩියක් ඉස්සරහට තිබ්බොත් උඹට වෙඩි තියෙනවා!" හෝම්ස් කෑගැසීය. මම මගේ රිවෝල්වරය ද හයිඩ් දෙසට එල්ල කර සූදානම් වීමි.

"උඹව මේ විනාශයෙන් ගළවා ගන්න අපි උත්සාහයක් යොදන්නම්......" එහෙත් ඒ කථාවලින් පලක් නොවිණි.

"හා! මාව ආයෙත් ජෙකිල් කරන්න?" හයිඩ් ගිගුරුවේය. "මට ඒකට කිසිම උවමනාවක් නෑ. මං ඒකට ඉඩතියන්නෙත් නෑ. ඊට කලින් තොපි දෙන්නාව යම ලෝකෙට යවලා........"

එසේ කියූ ඔහු ඇසිඩ් බෝතලය ඉහළට එසවූයේ අප වෙත දමා ගැසීමටය. ඒ මොහොතේම, හෝම්ස්ගේ හා මගේ රිවෝල්වර ක්‍රියාත්මක විය. වෙඩිපහර කෑ හයිඩ් එතැනම බිම ඇදවැටිණි. අප වෙත එල්ල කිරීමට සූදානම් වූ බෝතලය ඔහුට අතහැරී එතැනම බිඳී ගියේය. අප තව මොහොතක් හෝ ප්‍රමාද වූයේ නම් ඔහුගේ ප්‍රහාරයෙන් අප දෙදෙනා එකවම ජීවිතක්ෂයට පත්වනු නොඅනුමානය.

"දෙවියනි! ඔහුගේ ආත්මයට සමාව දෙනු මැන!" මගේ මුවෙන් නිකුත්විය.



www.sinhalaelibrary.com

"අප අතින් මේ දේ නොවෙන්න, තවත් ජීවිත ගණනාවක් විනාශවෙන්න ඉඩ තිබුණා වොට්සන්"

ඒ මොහොතේ අපට අසන්නට ලැබුණේ කවුදෝ දොරට තට්ටුකරන ශබ්දයයි.

"ජෙකිල්! ජෙකිල්!" අටර්සන්ගේ කෑගැසීම ඇසිණ. "කතාකරන්න ජෙකිල්. ඔබට මොකුත් කරදරයක්ද? දෙවියන්ගේ නාමයෙන් දොර අරින්න. නැත්නම් අපි දොර කඩනවා!"

"ජෙකිල් මියගියේ ඔහුගේ පර්යේෂණ සටහන් හා ලිපිගොනු විනාශකරගෙන" හෝම්ස් කීවේ හයිඩ් සිටි තැන දෙසට අත දිගුකරමිනි. ජෙකිල්ගේ පර්යේෂණ සටහන් හා පොත්පත් අසුරා තිබුණේ ඒ අසල වූ ලී රාක්ක කිහිපයකය. සල්ෆියුරික් අම්ල බෝතලය බිඳෙද්දී, විසිවූ අම්ලයෙන් පොත්පත් සියල්ල විනාශවී ගිය ආකාරය අපි දුටුවෙමු.

"එක අතකින් ඒකත් හොඳයි" හෝම්ස් කීය. "මනුෂ්‍ය වර්ගයා විනාශය කරා ගෙනියන්න පුළුවන්, මේ විදියේ විද්‍යාත්මක පර්යේෂණ, තවත් කවුරුවත් නොකළට කමක් නෑ. ඔහුගේ විද්‍යාත්මක රහස් ජෙකිල් සමගම විනාශවුණු එක සමහරවිට........"

හෝම්ස් කියමින් සිටි දෙය නැවතුණේ, දොර වෙත එල්ල වූ පොරෝ පහර කිහිපයක් නිසාය. කඩාහෙළූ දොරෙන් අමුත්තෝ නිවස තුළට කඩාවැදුණහ.



# 20
# පසුවදන

වසන්ත සෘතුව උදාවෙද්දී එක් උදෑසනක මම බිලියඩ් ක්‍රීඩාවේ යෙදීම සඳහා, සමාජශාලාව වෙත පිටත්ව ගියෙමි. බේකර් විදියේ නිවහන වෙත මා ආපසු එද්දී, දහවල් කෑම වේල ලංව තිබිණ. මගේ මිත්‍රයා අමුත්තෙකු සමග කතාබහේ යෙදී සිටියේය. ඔහුට බාධානොකොට, මගේ කාමරයට යාමට සූදානම් වූයෙමි.

"වොට්සන්, මෙහෙ එන්න" හෝම්ස් කීය. "ඔබ කැමැති වේවි මේ මහත්මයා හඳුනාගන්න. ඔහුත් ඔබ වගේම ලේඛකයෙක්. මේ තමයි රොබට් ලුවී ස්ටීවන්සන් මහත්මයා. මේ දොස්තර ජෝන් වොට්සන්"

මා වෙතට අත දිගුකළ අමුත්තා, වයස අවුරුදු හතළිහක පමණ අයෙකි. එහෙත් වයසට වඩා තරුණ පෙනුමක් ඔහුගේ මුහුණේ දිස්විය. එතරම් හැඩිදැඩි සිරුරක් නොතිබූ අමුත්තාගේ, කළු පැහැති කොණ්ඩය මැදින් දෙකට බෙදා, පිටුපසට පීරා තිබිණ.

"ස්ටීවන්සන් කියන නම, ඔබට අහලු පුරුදුයි නේද වොට්සන්?" හෝම්ස් ඇසීය. "අර මුහුදු කොල්ලකාරයින් සහ නිස්පැණියෝලා නම් නොකාව, අටේ කාසි...... කරාව ඔබ මට පොතකින් කියෙව්වේ? මේ ඒ මහත්මයා"

"ආ......... ට්‍රෙෂර් අයිලන්ඩ්!" මට කෑගැසිණ. "මං කොයිතරම් ආසද ඔබේ ඒ කතන්දරයට ජිම් හෝකින්ස්, බෙන්ගන්...... ලෝං ජෝන් සිල්වර්......." මා කියද්දී අමුත්තාගේ මුහුණ ලැජ්ජාවෙන් රතුවිය.

"ඔය මදෑ වොට්සන්" මගේ මිත්‍රයා කීවේ අප දෙදෙනාටම අසුන් ගැනීමට සංඥා කරමිනි.

"මේ මහත්තයා ඇවිත් තියෙන්නේ ඔහුගේ පහුගිය නවකතාව ගැන සාකච්ඡා කරන්න නෙමෙයි; ඔහුගේ මිළග කෘතිය ගැන සාකච්ඡා කරන්න. ජෙකිල් සහ හයිඩ් සිද්ධිය ගැන තොරතුරු මේ මහත්මයාට දැනගන්න උවමනාලු. මං ඒ සම්පූර්ණ විස්තරයම ඔහුට කිව්වා."



www.sinhalaelibrary.com

"ඒක ඇත්තයි" අමුත්තා කීය. ඔහුගේ ඉංග්‍රීසි උච්චාරණයේ ඇමරිකානු බවක් යන්තමින් තිබෙනු මම හඳුනාගතිමි. "මෙම කතාව මට කියන්න කියලා, හෝම්ස් මහත්මයා කැමැතිකරවා ගන්න, මට බොහොම මහන්සිවෙන්න සිද්ධවුණා. මං ඉදිරිපත් කළ තර්ක ඔහු අන්තිමේදී පිළිගත්තා. මේ ගැන තවත් කිහිපදෙනෙකු එක්ක කතාබහ කරලා, අවසර අවශ්‍ය වෙන තැන්වලදී එය අරගෙන, මං ඒක සත්‍ය කතාවක් හැටියට පළ කරන්න, බලාපොරොත්තු වෙනවා." ඔහු කීවේ මේසය මත තිබූ තම සටහන් පොතට අත දිගුකරමිනි.

මා හෝම්ස් දෙස බැලුවේ මේ ගැන මගේ අකමැත්ත හගවමිනි.

"ඒකෙන් ප්‍රශ්නයක් ඇතිවෙන්නෙ නෑ වොට්සන්" හෝම්ස් කීය. "අපට ආරක්ෂා කරන්න කියලා තමයි, යම් යම් අය අපට තොරතුරු කිව්වේ. ඒවා හෙළිනොකරන බවට අපි දිව්රලා පොරොන්දු වුණා. ඒ මොකක්වත් මං හෙළිකළේ නෑ. රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ බොහෝ දෙනෙක්, මේ සිද්ධිය ගැන හොඳින් දන්නවා. ඉතින් අපි නොකිව්වත්, මේක රහසක් හැටියට තියාගන්න හම්බවෙන්නෙ නෑ. අනෙක මේ පිළිබඳව තොරතුරු රාශියක් පුවත්පත්වල පළවුණා."

"ඒ වුණත්.........." අමුත්තා කීය. "මේ ගැටලුවට ෂර්ලොක් හෝම්ස් මහත්මයා සම්බන්ධ වී ඇති ආකාරය, මං දැනගත්තේ නෑ. එහෙත් මෙහෙන් තොරතුරු ටිකක් දැනගන්න ලැබුණු බව ඇත්තයි. ඒත් මේ සිද්ධිය මං පැහැදිලිවම තේරුම් ගත්තේ, ඔබ කළ විස්තරයෙන් පස්සේ. ඒනිසා මේ අබිරහස හෙළිකිරීමට ඔබ කළ මෙහෙය පාඨකයාට පැවසීමට මං.........."

හෝම්ස් තම අසුනෙන් නැගී සිටියේ, දෑතම ඔසවා ඊට විරෝධය පළකරමිනි.

"ස්ටීවන්සන් මහත්මයා" හෝම්ස් කීය. "ඔබට ඒ වැඩේ කරන්න ඉඩදෙන්න නම් මට නොහැකිවේවත් බෑ.......... මං කියන දේ අහන්න. ස්කොට්ලන්ඩ්යාඩ් එකේ එක්තරා පරීක්ෂකවරයෙක්, මේ කටයුත්ත ගැන මා එක්ක අමනාප වුණා. මගේ නම ඔය කතාවේ සඳහන්වුණොත්, ඔහු මට චෝදනා කරාවි. "මිනීමරුවෙක් ගැන සත්‍ය තොරතුරු දැන දැනත් ඒවා පොලීසියට හෙළි කළේ නැහැ" කියලා. අනෙක එල්ලුම්ගස් යන්න හිටි බිහිසුණු අපරාධකාරයෙක් අපේ අතින් වෙඩිකා මියගියා. ඒ වෙලාවේ අපි ඒක කළේ, අපේ





ආත්මාරක්ෂාවට බව ඇත්තයි. නමුත් මේක මිනීමැරුමක් කියලා, අපි දෙන්නා පොලීසියට කැඳවන්න, ඒ යක්ෂයා උත්සාහ කරන බවට සැක නෑ. ඕවා ගැන උසාවිවල රස්තියාදුවෙනවාට වඩා කරන්න වැඩ, අපට ඕනෑතරම් තියෙනවා. එහෙම නේද වොට්සන්?"

"ඇත්තෙන්ම ඔව්" මම කීවෙමි.

"ස්ටීවන්සන් මහත්මයා" හෝම්ස් කීය. "ඔබ ඉතා දක්ෂ ලේඛකයෙක් හැටියට, විශිෂ්ට නිර්මාණයක් දිනාගත් කෙනෙක්. දොස්තර වොට්සන්ගෙ නමයි, මගේ නමයි ඕකට ඇතුළු කළාම, මිනිස්සු කියන්නේ මොනවද දන්නවාද? ඔවුන් කියාවි මේක ඇත්තෙන්ම සිදුවුණු දෙයක්, ස්ටීවන්සන් කරලා තියෙන්නේ වාර්තා කිරීමක් විතරයි කියලා. එහෙම නෙමෙයි. ඕක ඔබේ ප්‍රබන්ධයක් හැටියට ඉදිරිපත් කරන්න. අපි දෙන්නාගෙ නම්වත් සඳහන් කරන්න එපා. ඔය කතාවට විශ්වසනීයත්වයේ ස්ථිර තැනක් තිබේවි. ඒකෙන් පෞද්ගලිකව ඔබටත්, පාඨක ලෝකයටත් ලැබෙන සෙත මිල කළ නොහැකියි."

හෝම්ස්ගේ යෝජනාව ස්ටීවන්සන් සතුටෙන් පිළිගත් බැව්, ඔහුගේ මුහුණෙන් පෙනිණ.

"ඒ වුණත් මං කොහොමද මේ කතාව අවසන් කරන්නෙ?" ඔහු විමසුවේය. "විශේෂයෙන්ම හයිඩ්ගේ මරණය සිද්ධවුණු ආකාරය?"

"ජෙකිල් තම ජීවිතය අවසාන කරගැනීමට, "කුරාරි" සූදානම් කරගෙන සිටි බව මං ඔබට කිව්වා......."

"නමුත් මේ වගේ විද්‍යාත්මක කතාවක්, විශ්වාස කරන්න අමාරු අද්භූත සිදුවීමක්, මගේ ඔළුවට ආවෙ කොහොමද කියලා විචාරකයො ඇහුවොත්?" ස්ටීවන්සන් මහතා විමසුවේ විමතියට පත් අයුරෙනි.

"මහත්මයා" හෝම්ස් කීවේ තම පයිප්පය පසකින් තබා ස්ටැව්බෙරියස් වයලීනය අතට ගනිමිනි. "ඔබ දක්ෂ ලේඛකයෙක්. කියන්න මේක නිර්මාණය වුණේ ඔබේ මනසේ කියල. අපි මෙහෙම හිතමු.

ඔබ සතුන් දවයමේ ගිහින් තුවාල ලබනවා. ඒවා පැසවලා ඔබට තදින් උණ ගන්නවා. ඒ උණ වඩාත් උග්‍රවෙද්දී ඔබ උණවිකාරයෙන් දඟලන්න පටන්ගන්නවා. ඒ නිසා කවුරු හරි ඔබව අල්ලා, බලෙන්



www.sinhalaelibrary.com

බෙහෙත් පොවනවා. තමුන් උණවිකාරය නිසා ඔබේ මොළය තාවකාලිකව විකාර වෙලා. ඔබට පෙනෙන්නේ මොනවාද? භයානක මිනිහෙක් ඔබට පොවන විෂ සහිත සැර බෙහෙත් ඒවායින් ඔබේ සිරුරේ විවිධ විකෘති ඇතිවේවි කියලයි ඔබට [illegible] හිතෙන්නේ. මෙහෙම දෙයක් සිහිනෙන් දුටුවා කියන්න. ඊළඟට ඒක ඔබේ පරිකල්පනයෙන් විචිත්‍රවත් කරලා, නිර්මාණයක් හැටියට ඉදිරිපත්කලා කියන්න. එතකොට කවුරුත් විශ්වාස කරාවි!"

— නිමි —

[illegible]

[illegible]

[illegible]

2010 [illegible] 31

# අභිරහස් දොස්තර සමග ෂර්ලොක් හෝම්ස්

කතා **අතුරුදන් වූ නෞකාව**

වෙඩිලුණු පටවාගෙන
එංගලන්තය බලා යාත්‍රා කළ
යෝධ රුවල් නැව
'සෝෆි ඇන්ඩර්සන්'
අත්ලාන්තික් සාගරයේ දී
අතුරුදහන් වූයේ කෙසේද?

'හෝම්ස් මහත්මයා. පිස්සු හැදුණු මිනීමරුවෙක්,
ලන්ඩන් නගරය පුරා සැරිසරමින් අසරණ මිනිසුන්
කෲර ලෙස ඝාතනය කරනවා. ඔබ මොනවද කරන්නේ?
ඔහු අල්ලා නොගත්තොත්, තවත් අසරණ මිනිසුන්
කී දෙනෙක් මරාදමාවිද අපි දන්නෙ නෑ.'

ISBN 978-955-1262-05-1

මිල රු. 295/-

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන

www.sinhalaelibrary.com